**325 වන කාණ්ඩය - 11 වන කලාපය**
**தொகுதி 325 - இல. 11**
**Volume 325 - No. 11**

**2026 මාර්තු 06 වන සිකුරාදා**
**2026 மார்ச் 06, வெள்ளிக்கிழமை**
**Friday, 06th March, 2026**

# පාර්ලිමේන්තු විවාද

**(හැන්සාඩ්)**

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා** [තීරුව 1928]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1931-1968]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
  2025/2026 වී මිලදී ගැනීම [තීරුව 1969]

**අංක 2185/74 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අවලංගු කිරීම:**
  ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1971]

**රාජ්‍යය සම්බන්ධිත උල්ලංඝනයන් සම්බන්ධයෙන් යුක්තිය සහ වගවීම:**
  මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1973]

**මහජන ආරක්ෂක ආඥාපනත:**
  යෝජනා සම්මතය [තීරු 1978-2100]

**අත්‍යවශ්‍ය මහජන සේවා පනත:**
  යෝජනා සම්මතය [තීරුව 2100]


---

# பிரதான உள்ளடக்கம்


**அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கைகள்** [ப: 1928]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1931-1968]

**தனி அறிவித்தல் மூல வினா:**
  2025/2026இல் நெல் கொள்முதல் [ப: 1969]

**2185/74ஆம் இலக்க அதிவிசேட வர்த்தமானி அறிவித்தலை மீளப்பெறல்:**
  போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரினது கூற்று [ப: 1971]

**அரசு தொடர்புடையதாகக் கூறப்படும் மீறல்களுக்கான பொறுப்புக்கூறலும் நீதியும்:**
  பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரினது கூற்று [ப:1973]

**பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டம்:**
  தீர்மானம் [ப: 1978-2100]

**அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டம்:**
  தீர்மானம் [ப: 2100]


---

# PRINCIPAL CONTENTS


REPORTS OF THE COMMITTEE ON PUBLIC ACCOUNTS [Col. 1928]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1931-1968]

QUESTION BY PRIVATE NOTICE:
  Purchase of Paddy in 2025/2026 [Col.1969]

REVOCATION OF GAZETTE EXTRAORDINARY NO. 2185/74:
  Statement by Minister of Transport, Highways and Urban Development [Col. 1971]

JUSTICE AND ACCOUNTABILITY FOR ALLEGED STATE-CONNECTED VIOLATIONS:
  Statement by Minister of Public Security and Parliamentary Affairs [Col. 1973]

PUBLIC SECURITY ORDINANCE:
  Resolution [Cols. 1978-2100]

ESSENTIAL PUBLIC SECURITY SERVICES ACT:
  Resolution [Col. 2100]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 මාර්තු 06වන සිකුරාදා***
*2026 மார்ச் 06, வெள்ளிக்கிழமை*
*Friday, 06th March, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2026 මාර්තු 06 සිකුරාදා, එනම් අද දින මධ්‍යාහ්න 12.00 ට කාරක සභා කාමර අංක 2හි දී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ

සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ වාර්ෂික වාර්තාව;

(ii) 2024 වර්ෂය සඳහා අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය)හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා
## அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கைகள்
## REPORTS OF THE COMMITTEE ON PUBLIC ACCOUNTS

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු කථානායකතුමනි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සිව්වැනි වාර්තාවේ සිට නවවැනි වාර්තාව දක්වා වන කාරක සභා වාර්තා හයක් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (3)හි විධිවිධාන ප්‍රකාරව ප්‍රකාරව මම අද දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරමි.

මේ අතරින්, සිව්වන, පස්වන සහ හයවන වාර්තාවල ඇතුළත් වන්නේ නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි හා පස්වැනි සභාවාර තුළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් විගණකාධිපති වාර්තා මත පදනම්ව සිදු කරන ලද විමර්ශන පිළිබඳ තොරතුරු වේ. මෙම විමර්ශනවලදී හඳුනාගත් විවිධ දුර්වලතා සම්බන්ධයෙන් කාරක සභාව විසින් ලබා දුන් නිර්දේශ බොහොමයක් සඳහා අදාළ රාජ්‍ය ආයතන විසින් මේ වනවිට යහපත් ප්‍රතිචාර දක්වා ඇති අතර, මෙම කාලය තුළ පැවති කාරක සභාව විසින් ඉටු කරන ලද ප්‍රශංසනීය මෙහෙවර ද මේ අවස්ථාවේ අගය කරමි.

එසේම, දසවැනි පාර්ලිමේන්තුව තුළ "කෝපා" කමිටුව විසින් තෙවරක්ම කොළඹ මහ නගර සභාව කාරක සභාව හමුවට කැඳවා සිදු කරන ලද විමර්ශන පිළිබඳ තොරතුරු හත්වැනි කාරක සභා වාර්තාවේ ඇතුළත් වන අතර, කොළඹ මහ නගර සභාව

[ගරු කබීර් හෂීම් මහතා]

සම්බන්ධයෙන් 2023 වර්ෂයේදී ලබා දුන් ඉතා පැහැදිලි විගණන නිර්දේශ සම්බන්ධයෙන් ආයතනය විසින් මේ දක්වා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොමැති වීම ඉතා බරපතළ කරුණක් ලෙස රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සැලකීමත්, ආයතනය තුළ පැහැදිලිව හඳුනාගත් බරපතළ අක්‍රමිකතා රාශියක් මෙම විමර්ශනවලදී කාරක සභාවට නිරීක්ෂණය වීමත් යන කරුණු මත මෙම වාර්තාව කඩිනමින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන බව ද දන්වමි.

අටවැනි වාර්තාව තුළින් දසවැනි පාර්ලිමේන්තුව තුළ "කෝපා" කමිටුව විසින් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව තෙවරක්ම කාරක සභාව හමුවට කැඳවා සිදු කළ විමර්ශන පිළිබඳ වාර්තා කරනු ලබන අතර, එම විමර්ශනවලදී කාරක සභාව විසින් ලබා දුන් බොහොමයක් නිර්දේශ යුහුසුළුව ක්‍රියාත්මක කිරීමට දුම්රිය දෙපාර්තමේන්තුව කටයුතු කර ඇති බවද නිරීක්ෂණය කරමි. කාරක සභාව විසින් රත්මලාන දුම්රිය වැඩ අංගණය නිරීක්ෂණය කිරීම මඟින් එහි කාර්යයන් පිළිබඳව මනා අවබෝධයක් ලබා ගැනීමට සාමාජික මන්ත්‍රීවරුන්ට හැකි වූ බව ද සඳහන් කරමි.

විශේෂයෙන්ම "කෝපා" කමිටුව විසින් 2023 මුදල් වර්ෂය සඳහා සියලු රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මූල්‍ය අනුගතවීම සහ මෙහෙයුම් කාර්යසාධනය පිළිබඳව මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් සිදු කරන ලද ඇගයීම පිළිබඳ කාරක සභාවේ නවවැනි වාර්තාව අද දින සභාගත කිරීමට ලැබීම පිළිබඳව මම බෙහෙවින් සතුටට පත්වෙමි.

2017 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම මාර්ගගත ඇගයීමේ ක්‍රියාවලිය හරහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිරීක්ෂණයට යටත්වන සියලු රාජ්‍ය ආයතනවල රාජ්‍ය මූල්‍ය නීති -රීති හා අනුගතවීම පිළිබඳව මෙන්ම, එම ආයතන මඟින් මහජනයා වෙත ලබා දෙන සේවාවල කාර්ය සාධන මට්ටම පිළිබඳව පරීක්ෂා කරනු ලබන අතර, ඒ අනුව ආයතන වෙත ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ. 2023 වර්ෂයේදී මෙලෙස මාර්ගගතව පරීක්ෂාවට ලක් කරන ලද රාජ්‍ය ආයතන 836ක් පිළිබඳ නිරීක්ෂණ අද දින සභාගත කරනු ලබන වාර්තාවේ ඇතුළත් වේ.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිරීක්ෂණයට යටත් වන රාජ්‍ය ආයතන සංඛ්‍යාව ඉතා විශාල බැවින් එම සියලු ආයතන කාරක සභාව ඉදිරියට කැඳවීමේ ප්‍රායෝගික අපහසුතාව යම් මට්ටමකට මඟහරවා ගැනීම සඳහා මෙම මාර්ගගත ඇගයීමේ ක්‍රියාවලිය දායක වන අතරම, "කෝපා" කමිටුව ඉදිරියට කැඳවා නොපමාව විමර්ශනයට ලක් කළයුතු කාර්ය සාධනය හා මූල්‍ය අනුගතවීම සම්බන්ධයෙන් දුර්වල මට්ටමක පවතින ආයතන හඳුනා ගැනීමට ද මෙම ඇගයීම් ක්‍රියාවලියෙහි ප්‍රතිඵල වඩාත් හොඳ මාර්ගෝපදේශනයක් ලබා දෙයි. එමෙන්ම සෑම වසරකම මෙම මාර්ගගත ඇගයීම් ක්‍රියාවලියට නවාංග එක්කිරීමටද කාරක සභාව විසින් කටයුතු කරන බවද දන්වා සිටිමි.

අවසාන වශයෙන්, කාරක සභාවේ කර්තව්‍යය ඉටු කිරීමේදී විගණනය නමැති පශ්චාත් ක්‍රියාවලියෙන් ලැබෙන දායකත්වය අගය කරන අතර, විගණකාධිපති ඇතුළු ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලයටත්, කාරක සභාවේ කටයුතු මනා කළමනාකරණයකින් යුතුව පවත්වා අදාළ නිර්දේශ සහ කාර්ය සටහන් අප්‍රමාදව නියමිත අධිකාරීන් වෙත යොමු කළ සහ මෙම සියලු වාර්තා ඉතා උසස් තත්ත්වයක් පිළියෙල කරමින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත මහඟු සේවයක් සපයන ලද කාරක සභාවේ ලේකම්තුමා සහ කාර්ය මණ්ඩලයටත් මා ඇතුළු කාරක සභාවේ ස්තුතිය හිමිවිය යුතු බව සඳහන් කරමින් මෙම වාර්තා හය පහත පරිදි ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමි.

වාර්තා 1 සිට 5 දක්වා

දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සිව්වැනි, පස්වැනි, හයවැනි, හත්වැනි සහ අටවැනි වාර්තා සභාවේ විශේෂ අවසරය ඇතිව සිංහල භාෂාවෙන් පමණක් මම ඉදිරිපත් කරන අතර, ඉංග්‍රීසි සහ දෙමළ භාෂා පිටපත් හැකි ඉක්මණින් ඉදිරිපත් කිරීමට ද කටයුතු කරමි.

වාර්තාව 6

දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නවවැනි වාර්තාව ද මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, "කෝපා" එකේත්, "කෝප්" එකේත් වාර්තා රාශියක් ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, අද දින ඔබතුමාගේ නායකත්වයෙන් පවත්වන Parliamentary Business Committee එකේදී අපි යෝජනාවක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා මේ වාර්තා පිළිබඳව ජනතාවට කරුණු දක්වන්නට මේ සභාවේ දිනයක හෝ දින දෙකක විවාදයක් ලබා ගන්නට.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)
ගරු කථානායකතුමනි, කෙන්ගල්ල, දියබුබුල, මැදවල, අංක 33 යන ලිපිනයෙහි පදිංචි කේ.ඒ.පී. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) පරකඩුව, බෙන්දෑඑව, අංක A/65 යන ලිපිනයෙහි පදිංචි එම්. ජීවන්ති සඳරේඛා පීරිස් මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) රත්නපුර, ගිලීමලේ, ඇඹුල්දෙනිය, අංක 1/380 යන ලිපිනයෙහි පදිංචි යූ.ජේ.පී. කුමාරසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) රත්නපුර, කහංගම, කොස්ගල, අංක A/19 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එච්.ආර්. රූපසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

ගරු කථානායකතුමනි, කොලොන්න, නව නගරය, අංක 707 යන ලිපිනයෙහි පදිංචි කේ.ඒ.සී. කරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)

ගරු කථානායකතුමනි, මොනරාගල, එස්.ඕ.එස් පාර, අංක 33 යන ලිපිනයෙහි පදිංචි එම්.පී.කේ.එච්. පතිරණගේ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### සාමදාන විනිශ්චයකරුවන්: විස්තර
### சமாதான நீதவான்கள்: விபரம்
### JUSTICES OF THE PEACE: DETAILS

23/2024

**1. ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව පුරා සාමදාන විනිශ්චයකරුවන් විශාල සංඛ්‍යාවක් සිටින නමුත් සමහර සාමදාන විනිශ්චයකරුවන්ට සිය රාජකාරි කටයුතු නිසි පරිදි ඉටුකිරීම සඳහා අවශ්‍ය පුහුණුව නොමැති බව පිළිගන්නේද;

(ii) දිවයිනටම බලපැවැත්වෙන පරිදි පත් කර ඇති සාමදාන විනිශ්චයකරුවන් සංඛ්‍යාව සහ අධිකරණ බලප්‍රදේශයකට පමණක් පත් කර ඇති සාමදාන විනිශ්චයකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වාර්ෂිකව අලුතින් පත් කරනු ලබන සාමදාන විනිශ්චයකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) සාමදාන විනිශ්චයකාර තනතුරක් සඳහා ඉල්ලුම් කරනු ලබන ඉල්ලුම්කරුවන් අනිවාර්යයෙන්ම සපුරා තිබිය යුතු මූලික සුදුසුකම් කවරේද;

(v) සාමදාන විනිශ්චයකාර තනතුරු සඳහා නව පත්වීම් ලබා දීමේදී, ඔවුන්ගේ සේවය සම්බන්ධයෙන් විධිමත් පුහුණුවක් ලබා දෙන්නේද;

(vi) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை முழுவதிலும் அதிக எண்ணிக்கையிலான சமாதான நீதவான்கள் உள்ளபோதிலும், ஒரு சில சமாதான நீதவான்களுக்குத் தமது கடமைகளை முறையாக நிறைவேற்றத் தேவையான பயிற்சி இல்லை என்பதை ஏற்றுக்கொள்வாரா;

(ii) அகில இலங்கை ரீதியாக சமாதான நீதவான்களாக நியமனம் செய்யப்பட்டுள்ளவர்களின் எண்ணிக்கையும், நீதிமன்ற நியாயாதிக்க எல்லையொன்றுக்குள் அதிகாரப் பிரதேசமொன்றுக்கு மாத்திரம் நியமனம் செய்யப்பட்டுள்ள சமாதான நீதவான்களின் எண்ணிக்கையும் வெவ்வேறாக யாது;

(iii) வருடாந்தம் புதிதாக நியமனம் செய்யப்படுகின்ற சமாதான நீதவான்களின் எண்ணிக்கை யாது;

(iv) சமாதான நீதவான் பதவிக்கு விண்ணப்பிக்கும் விண்ணப்பதாரிகள் கட்டாயமாகப் பூர்த்தி செய்திருக்க வேண்டிய அடிப்படைத் தகைமைகள் யாவை;

(v) சமாதான நீதவான் பதவிக்குப் புதிதாக நியமனம் வழங்கும்போது, அவர்களின் சேவை தொடர்பில் முறையான பயிற்சி வழங்கப்படுகின்றதா;

(vi) இன்றேல், ஏன்;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House -

(i) whether he admits that although there are a large number of Justices of the Peace throughout Sri Lanka, some of them do not have the necessary training to perform their duties properly;

(ii) the number of Justices of the Peace appointed for the Whole Island and the number of Justices of the Peace appointed to a respective jurisdiction, separately;

(iii) the number of new Justices of the Peace appointed annually;

(iv) the basic qualifications that applicants for the position of Justice of the Peace should compulsorily have completed;

[ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා]

(v) whether a formal training is provided with regard to their service when new appointments are given for the post of Justice of the Peace; and

(vi) If not, why?

(b) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්. මෙක යටත් විජිත සමයේ ආරම්භ කළ තනතුරක්. එසේ ආරම්භ කළත්, සාම විනිසුරුවරුන් සඳහා පුහුණුව ලබා දීමේ ක්‍රමවේදයක් 2025 වර්ෂය තෙක් නොතිබුණා පමණක් නොව, ඔවුන්ව පත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් ද නොවීය. අප ඒ සඳහා දැන් විධිමත් ක්‍රමවේදයක් සකස් කර තිබෙනවා. කෙසේ වෙතත්, ඔවුන්ට මඟ පෙන්වීමට අදාළ වූ කරුණු "සාමදාන විනිශ්චයකාර කාර්යභාරය" නැමැති අත්පොතෙහි අන්තර්ගත කර ඇත. පෙර වර්ෂයන්හි මෙම අත්පොත සාම විනිසුරු පත්වීම් ප්‍රදානය කිරීමේදී අධිකරණ අමාත්‍යාංශය විසින් ලබා දුන් අතර, 2025 වර්ෂයේ සිට එම අත්පොත අධිකරණ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකි අතර, එය අදාළ සාම විනිසුරු වෙත ලබා දෙන පත්වීම් ලිපියේ සඳහන් QR කේතය මඟින් ද බාගත කර ගත හැකිය.

(ii) 2013 වර්ෂයේ සිට මේ දක්වා පවත්වා ගෙන යනු ලබන දත්ත තොරතුරු පද්ධතියට අනුව මුළු දිවයිනටම හා අධිකරණ බල ප්‍රදේශයන්ට වෙන් වෙන් වශයෙන් පත් කර ඇති සාමදාන විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව නිර්ණය කළ නොහැකි අතර, 2013 වර්ෂයේ සිට මේ දක්වා සාමදාන විනිශ්චයකාරවරුන් 66,315ක් පත් කර ඇත. පවත්වාගෙන ගොස් තිබූ දත්ත පද්ධතිය විධිමත්ව පවත්වාගෙන ගොස් නොතිබූ බව නිරීක්ෂණය කළ හෙයින්, එය විධිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර අප විසින් මේ වන විට ගනිමින් පවතිනවා.

(iii) ඇමුණුමෙහි දක්වා ඇති තොරතුරු පදනම් කරගෙන එක් එක් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ජනගහන ඝනත්වය හා භූ විෂමතාව පදනම්ව එක් එක් කොට්ඨාසය සඳහා නිශ්චිත සාමදාන විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව (200:1 අනුපාතයට) නිර්ණය කිරීම 2025 වර්ෂයේ සිට සිදු කළ අතර, ඒ අනුව පුරප්පාඩු වූ සාමදාන විනිශ්චයකාර පත්වීම් 40,000ක පමණ ප්‍රමාණයක් ලබා දිය හැකි බැවින්, මසකට පත්වීම් 500-750 අතර ප්‍රමාණයක් ලබා දීම 2025 ජුනි මස සිට ආරම්භ කරන ලදී.

ඇමුණුම **සභාගත*** කරමි.

(iv) පෙර සඳහන් කළ පරිදි සාමදාන විනිශ්චයකාර සේවය විධිමත් සහ ප්‍රමිතිගත කිරීමේ අරමුණින් ඒ සඳහා ඉල්ලුම්කරුවන් අනිවාර්යයෙන් සපුරාලිය යුතු මූලික සුදුසුකම් 2025 සිට අප හඳුන්වා දෙනු ලැබුවා. ඒ අනුව,

**<u>අධ්‍යාපන සුදුසුකම්</u>**

- අයදුම්කරු අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය එක වරකදී විෂයන් 6කින් සමත්වීම සහ මව් භාෂාව (සිංහල/දෙමළ) ඇතුළුව තවත් එක් විෂයක් සඳහා සම්මාන සාමර්ථයක් ලබා තිබීම.
- යම් හෙයකින් ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙළ කරන ලද ලේඛනයක් සහතික කරන්නේ නම් අදාළ අයදුම්කරුට වෙනත් විෂයකට අමතරව, ඉංග්‍රීසි භාෂාව ද ඔහු/ඇය සමත්ව ඇති විෂයන් 06 ඇතුළත තිබිය යුතුය.
- මුළු දිවයින සඳහාම සාමදාන විනිශ්චයකාර පත්වීම් ලබාදීමේ දී, පත්වීම් ලැබ ඇති කලාපයෙහි සාමදාන විනිශ්චයකාර තනතුරෙහි වසර 5ක සේවා කාලයක් සහිත වීම සහ අධ්‍යාපන සුදුසුකම් ලෙස අ.පො.ස. (උ.පෙළ) අවම වශයෙන් එක් විෂයක්වත් සමත්ව තිබීම.

**<u>වෙනත් සුදුසුකම්</u>**

- අයදුම්කරු විසින් වයස අවුරුදු 30 සම්පූර්ණ කර තිබිය යුතුය.
- අයදුම්කරු වයස අවුරුදු 75ට නොවැඩි විය යුතුය.
- පත්වීම් ලබා දීමේ දී යහපත් කායික හා මානසික තත්ත්වයකින් යුක්ත පුද්ගලයෙකු බවට තහවුරු කිරීම සඳහා රජයේ ලියාපදිංචි වෛද්‍යවරයෙකු විසින් නිකුත් කරන වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.
- අපරාධ චෝදනාවක් නොමැති අයෙකු වීම හා අධිකරණයෙන් දඬුවම් නොලැබූ අයෙකු විය යුතුය.

මීට අමතරව ඔවුන්ගේ සේවය මහජන හිතකාමී කිරීමේ අරමුණින් සාමදාන විනිශ්චයකාරවරයකුගේ යම් ක්‍රියාකලාපයන් සම්බන්ධව මහජනතාවට ඇති වන ගැටලු හෝ පැමිණිලි ලිඛිතව වාර්තා කිරීමට වට්ස්ඇප් අංකයක් හා ඊ-මේල් ලිපිනයක් හඳුන්වා දෙන්න කටයුතු කරමින් ඉන්නවා. ඊට අමතරව, අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රතිසංස්කරණ අංශයට ලිපියක් මඟින් පැමිණිලි කිරීමටත් අවස්ථාව සකස් කර තිබෙනවා. මේ ලැබෙන පැමිණිලි විමර්ශනය කර ඒ සම්බන්ධ නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනවා.

(v) ඔව්. 2025 වර්ෂයේ නොවැම්බර් මාසයේ සිට සාම විනිසුරු පත්වීම් ලබාදීමේ දී පත්වීම් ලබන සාම විනිසුරුවන් සඳහා විධිමත් පුහුණුවක් ලබා දෙනු ලබයි.

(vi) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
ගරු ඇමතිතුමනි, දීර්ඝ පිළිතුරක් ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මම ගරු ඇමතිතුමාගෙන් පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට මේ කාරණය අහන්න කැමැතියි. ඔබතුමා කිව්වා, 2025 සිට පිළිතුරු ලබා දෙනවා කියලා. ඒ වනතුරු මේ පිළිබඳව නියාමනයක් වුණේ නැහැ, පිළිවෙළට තිබුණේ නැහැ කියන අදහස පිළිතුරේ තිබුණා. ඉතිහාසයේ මේක දේශපාලන පත්වීමක් වෙලා තිබුණාය කියලා මමත් දන්නවා. සමහර දේශපාලන නායකයෝ කෙනෙකුට රැකියාවක් දෙන්න බැරි නම්, සාමදාන විනිශ්චයකාරකමක් දීලා සතුටු කරලා ඒ අයව ඉදිරියට අරගෙන යන තනතුරක් බවට මෙය පත්වෙලා තිබුණා. ඒක සම්පූර්ණ වැරැදි ක්‍රියාවක් කියලා මම පිළිගන්නවා. මේ රටේ සාමදාන විනිශ්චයකාරවරු ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. හැබැයි, ඔබතුමා කියන විධියට 2025 ඉඳලා මේ කටයුතු නියාමනයකට යටත් කරලා තිබෙනවා නම් ඔවුන්ගේ පත්වීම නිවැරදිව ලැබිලා තිබෙනවාද, ඔය කියන සුදුසුකම් ටික තිබෙනවාද, පත්වීම දරන්නාට ඒ අවශ්‍ය කටයුතු කරන්න පුළුවන්ද කියන එක නැවත සොයා බැලීමට ක්‍රමවේදයක් අමාත්‍යාංශයට හදන්න බැරිද? මොකද, අපි දන්නවා Immigration and Emigration Department එක ළඟට ගියාම සාමදාන විනිශ්චයකාරවරු කියලා අත්සන් කරන පිරිසක් සිටින බව. ඒ අයගෙන් ඇත්තම එක්කෙනෙක් අත්සන් කරනවා ද කියලා හොයා ගන්න බැහැ නේ, ගරු ඇමතිතුමනි. සීල් එක ගහලා දුන්නාම එතැනින් එහාට මේක ඇත්තද, බොරුද කියලා හොයන්නේ නැහැ නේ. අධිකරණය හමුවට ගියොත් ඔන්න හොයයි. එම නිසා, මේ තනතුරට වටිනාකමක් දෙන්න, - ඔබතුමා 2025න් පස්සේ කරන කණ්ඩායම විතරක් නොවෙයි - මේ රටේ සිටින සියලු සාමදාන විනිශ්චයකාරවරුන්ට වටිනාකමක් දෙන්න යම් ක්‍රමවේදයක් අමාත්‍යාංශයට හදන්න බැරිද කියලායි මම අහන්නේ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ක්‍රමවේදයක් හදලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මේකම තමයි ප්‍රශ්නය. අවුරුදු ගාණක් අනපුවා හදන්න ගියාම ටිකක් කල් යනවා. මූලිකවම ඔබතුමා කියන එක හරි. මේක දේශපාලනික වැඩක් තමයි. ඡන්දයක් කිට්ටු වෙනකොට තනතුරු 30,000, 40,000 දෙනවා. දැන් ඒක නවත්වලා තිබෙන්නේ. ඔබතුමාත් දන්නවා, අපි තනතුරු දෙන විධිය ගැන. තවදුරටත් දේශපාලනිකව අපි මේ තනතුරු ලබා දෙන්නේ නැහැ. ඒ වාගේම අවුරුදු දෙකකට වරක් ජීව දත්ත අලුත් කිරීම සඳහා නවීන ක්‍රමයක් අපි හදලා තිබෙනවා. ග්‍රාමසේවා සහතිකය, අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සහතික කරන ක්‍රමයකුත් අපි දැන් හදලා තිබෙනවා. ඒ වාගේම අපි මේ වනකොට හදලා ඉවරයි, WhatsApp number එකයි, email address එකයි, telephone number එකයි. ඒ අනුව යම්කිසි සාමදාන විනිශ්චයකාරවරයෙක් - JP කෙනෙක් - වරදක් කරනවා නම් ඒ සම්බන්ධව පැමිණිලි කරන්න පුළුවන්. තොරතුරු යාවත්කාලීන කරද්දි කලින් හිටපු අයගේ මෙම තනතුර එකපාරටම cancel කරන ක්‍රමයක් අපි හදලා නැහැ. මොකද, සමහරු නියමිත සුදුසුකම් නැතත් අවුරුදු 5ක්, 6ක්, 10ක් මේ කටයුතු කරලා අදාළ සුදුසුකම් හදාගෙන තිබෙන නිසා. හැබැයි, ඉතා ඉක්මනින්ම data base එකක් හදන වැඩේ කරනවා. එතකොට කවුරු සීල් එක ගැහුවත්, ඒක ගහපු කෙනා JP කෙනෙක්ද, නැද්ද කියලා අපි දන්නවා. ඒ දත්ත ඇතුළත් කිරීම තමයි මේ දවස්වල කරන්නේ.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ තනතුර සම්බන්ධව යම් නිර්ණායක වගයක් ඉදිරිපත් කළා. ඒකේ තිබුණා, අයදුම්කරුගේ වයස අවුරුදු 75ට වඩා අඩු වෙන්න ඕනෑය කියලා. ඔබතුමාත් නීතිඥවරයෙකු විධියට දන්නවා, අපේ රටේ නීතිඥවරුන්ට උසාවි යන්න වයසක් නැහැ කියලා. අපේ රටේ වයස අවුරුදු 90ක් වුණු අයව ආණ්ඩුකාරවරුන් හැටියට පවා පත් කරලා තිබුණා. නමුත් සාමදාන විනිශ්චයකාරවරයෙකු පත් කරන්න වයස් සීමාවක් දමලා තිබෙනවා. මේක ගෞරවනීය තනතුරක්. ඒ නිසා එය වයසකට සීමා කිරීම සාධාරණයි කියලා මම නම් හිතන්නේ නැහැ. ඔබතුමා ඒකෙන් අදහස් කරන්නේ මොකක්ද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මේක ගෞරවනීය තනතුරක් වාගේම වගකීම් සහිත තනතුරක් වෙන්නත් ඕනෑ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්නකෝ. ගරු මන්ත්‍රීතුමනි, මේක කමිටුවක් මඟින් තමයි තීරණය කළේ. එහෙම නැතිව මම තනියෙන් වාඩිවෙලා මෙය තීරණය කළේ නැහැ. සාමාන්‍ය මතය තමයි, ව්‍යාකූල ලේඛනයක් ආවාම ඒවා කියවා තේරුම් ගන්න නිසි මානසික තත්ත්වයක්, නිසි සෞඛ්‍ය තත්ත්වයක් තිබෙන්න ඕනෑය කියන එක. ඒ නිසා කමිටුව තීරණය කළා, ඉදිරියේදී ලබා දෙන පත්වීම්වලට වයස අවුරුදු 75ක සීමාව ප්‍රමාණවත් කියලා. ඒක වෙනස් කරන්න තරම් සාධාරණ හෝ යුක්ති සහගත කරුණු දැක්වීමක් මට මේ දක්වා ලැබිලා නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඒක වෙනස් කරන්න ඕනෑ නම් ඒ සම්බන්ධව කරුණු දැක්වීමක් කරන්න. එතකොට ඒ කමිටුවට මේක නැවත දීලා සාකච්ඡා කර බලන්න පුළුවන්. නමුත්, දැනට ඒකේ වෙනස් කිරීමක් නම් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -107/2024- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -120/2024- (1), ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -355/2024- (1), ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -565/2025- (1), ගරු රෝහණ බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 -629/2025- (1), ගරු කිංස් නෙල්සන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## 2025දී ආරම්භ කරන ලද හෝ වසා දැමූ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තශාලා: විස්තර
### 2025இல் ஆரம்பிக்கப்பட்ட அல்லது மூடப்பட்ட சிறிய மற்றும் நடுத்தர அளவிலான கைத்தொழிற்சாலைகள்: விபரம்
### SMALL AND MEDIUM-SCALE FACTORIES STARTED OR CLOSED DOWN IN 2025: DETAILS

1177/2025

**7. ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2025 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ආරම්භ කර ඇති සුළු පරිමාණ හා මධ්‍ය පරිමාණ කර්මාන්තශාලා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් කර්මාන්තශාලාවේ නිෂ්පාදනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම කර්මාන්තශාලා අතරින් අපනයනය මූලික කර ගත් කර්මාන්තශාලා සංඛ්‍යාව සහ දේශීය වෙළෙඳ පොළ ඉලක්ක කර ගත් කර්මාන්තශාලා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2025 වර්ෂයේදී වසා දමා ඇති සුළු පරිමාණ හා මධ්‍ය පරිමාණ කර්මාන්තශාලා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් කර්මාන්තශාලාවේ නිෂ්පාදනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම කර්මාන්තශාලා අතරින් අපනයනය මූලික කරගත් කර්මාන්තශාලා සංඛ්‍යාව සහ දේශීය වෙළෙඳ පොළ ඉලක්ක කර ගත් කර්මාන්තශාලා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම කර්මාන්තශාලා වසා දැමීමට හේතු කවරේද;

(v) ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ හා මධ්‍ය පරිමාණ කර්මාන්තශාලා නඟාසිටුවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2025ஆம் ஆண்டில் இலங்கையில் ஆரம்பிக்கப் பட்ட சிறிய மற்றும் நடுத்தர அளவிலான கைத்தொழிற்சாலைகளின் எண்ணிக்கை வெவ் வேறாக யாதென்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு கைத்தொழிற்சாலையினதும் உற்பத்திகள் வெவ்வேறாக யாதென்பதையும்;

(iii) மேற்படி கைத்தொழிற்சாலைகளில் ஏற்றுமதியை நோக்காகக் கொண்ட கைத்தொழிற்சாலைகளின் எண்ணிக்கை மற்றும் உள்ளூர்ச் சந்தையை நோக்காகக் கொண்ட கைத்தொழிற்சாலைகளின் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2025ஆம் ஆண்டில் மூடப்பட்ட சிறிய மற்றும் நடுத்தர அளவிலான கைத்தொழிற்சாலைகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(ii) மேற்படி ஒவ்வொரு கைத்தொழிற்சாலையினதும் உற்பத்திகள் வெவ்வேறாக யாது;

(iii) மேற்படி கைத்தொழிற்சாலைகளில் ஏற்றுமதியை நோக்காகக் கொண்ட கைத்தொழிற்சாலைகளின் எண்ணிக்கை மற்றும் உள்ளூர்ச் சந்தையை நோக்காகக் கொண்ட கைத்தொழிற்சாலைகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(iv) மேற்படி கைத்தொழிற்சாலைகள் மூடப்பட்ட மைக்கான காரணங்கள் யாவை;

(v) இலங்கையில் சிறியளவிலான மற்றும் நடுத்தர அளவிலான கைத்தொழிற்சாலைகளைக் கட்டி யெழுப்புவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல் ஏன்?

asked the Minister of Industry and Entrepreneurship Development:

(a) Will he inform this House the -

(i) number of small and medium-scale factories that have been started in Sri Lanka in the year 2025, separately;

(ii) items manufactured in each of those factories, separately; and

(iii) number of export-oriented factories and the number of factories targeting the domestic market, separately?

(b) Will he also inform this House the -

(i) number of small and medium-scale factories that have been closed down in the year 2025, separately;

(ii) items manufactured in each of those factories, separately;

(iii) number of export-oriented factories and the number of factories targeting the domestic market, separately;

(iv) reasons for the closure of the aforesaid factories; and

(v) steps taken to promote small and medium-scale factories in Sri Lanka?

(c) If not, why?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ සහ ලංකා කාර්මික

සංවර්ධන මණ්ඩලය යටතේ පාලනය වන කර්මාන්තපුරවල 2025 වර්ෂයේදී ආරම්භ කර ඇති කර්මාන්ත පිළිබඳ තොරතුරු පහත ඉදිරිපත් කර ඇත.

| | **කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය** | **ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය** |
|---|---|---|
| සුළු පරිමාණ කර්මාන්ත සංඛ්‍යාව | 17 | 3 |
| මධ්‍ය පරිමාණ කර්මාන්ත සංඛ්‍යාව | 5 | 11 |

(ii) කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින කර්මාන්තපුරවල ස්ථාපිත කර්මාන්තශාලාවල නිෂ්පාදනයන්

| **කර්මාන්තපුරයකර්මාන්තයේ නමනිෂ්පාදනය** | | |
|---|---|---|
| කළුතර ෆුලර්ටන් | ශ්‍රී කූල් ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ් | වායුසමීකරණ යන්ත්‍රවල උපාංග නිෂ්පාදනය |
| | සුරේෂ් සප්ලයර් ප්‍රයිවට් ලිමිටඩ් | සිමෙන්ති බිම් ඇතුරුම් ගල් හා ආශ්‍රිත නිෂ්පාදන |
| | මොෂිබි ඉලෙක්ට්‍රිකල්ස් ප්‍රයිවට් ලිමිටඩ් | විදුලි ස්විච් පුවරු හා විශාල හා කුඩා ප්‍රමාණයේ මධ්‍යගත පාලක පුවරු නිෂ්පාදනය |
| | එස්.කේ. සප්ලයර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | මෙට්ට නිෂ්පාදනය |
| මහර | මෙටල්වුඩ් ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ් | ලෝහ ආශ්‍රිත වාහන අමතර උපාංග නිෂ්පාදනය |
| මතුගම පල්ලෙගොඩවත්ත | ගැලැක්සි ඉන්ඩස්ට්‍රීස් | ඇලුමිනියම් ආශ්‍රිත නිෂ්පාදන |
| දංකොටුව | අයිරෝ සොලියුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පරිවාරක පුවරු නිෂ්පාදනය |
| | නෝවා ටයර් (ප්‍රයිවට්) ලිමිටඩ් | ටයර් නැවත පිරවීම |
| පුත්තලම | මැක්ස් කොකෝ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | වගා මාධ්‍ය නිෂ්පාදනය හා ඒ සඳහා අමුද්‍රව්‍ය නිෂ්පාදනය |
| | රේන්බෝ ඇලුමිනියම් | ඉවතලන ඇලුමිනියම් භාවිතයෙන් ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය |
| කරන්දෙනිය | සුමිත් මාකටින් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | ටයර් නැවත පිරවීම (Tyre retreading) |
| බටඅත | සැම්සන් රික්ලේම් රබර්ස් ලිමිටඩ් | භාවිත කරන ලද රබර් ප්‍රතිචක්‍රීකරණය |
| | අරාවා (ප්‍රයිවට්) ලිමිටඩ් | කොහු ආශ්‍රිත නිෂ්පාදන |
| බුත්තල | ටොප් සිලෝන් එක්ස්පෝර්ට් (පුද්) සමාගම | දේශීය එළවලු හා පලතුරු වර්ග අගයදාම නිෂ්පාදන |
| ඌවපරණගම | ලුවිස් ඉංජිනියරින් (පුද්) සමාගම | වානේ හා දැව ගෘහ භාණ්ඩ නිෂ්පාදනය |
| නවගම්පුර-අම්පාර | සෙන්චි ෆැෂන් වෙයාර් | කාන්තා ඇඟලුම් |
| ත්‍රිකුණාමලය | ඊස්ටන් ෆර්ටිලයිසර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් | පොහොර මිශ්‍ර කිරීම සහ පොහොර මලුගත කිරීම |
| නාලන්ද එල්ලාවල කර්මාන්තපුර අදියර 01 | ග්‍රීන් ලංකා ෆීඩ්ස් (පීවීටී) එල්ටීඩී | සත්ව ආහාර නිෂ්පාදනය |
| නාලන්ද එල්ලාවල කර්මාන්තපුර අදියර 02 | එම්.වී. ඉලෙක්ට්‍රොනික් (ප්‍රයිවට්) ලිමිටඩ් | රථවාහන, මෝටර් සයිකල් සහ කර්මාන්තවල යන්ත්‍ර උපකරණ සඳහා විදුලි වයර් හානස් නිෂ්පාදනය කිරීම |
| | කේ ඇන්ඩ් කේ රබර් කම්පවුන්ඩ් ඇන්ඩ් රබර් ප්‍රඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | රබර් කම්පවුන්ඩ් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන |
| | සිලෝන් එමරල් වේ (ප්‍රයිවට්) ලිමිටඩ් | ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන |
| | සමනළ ෆුඩ් ඉන්ඩස්ට්‍රීස් | සහල් පිටි, නූඩ්ල්ස් හා පපඩම් නිෂ්පාදනය |

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පවතින කර්මාන්තපුරවල ස්ථාපිත කර්මාන්තශාලාවල නිෂ්පාදනයන්

| **කර්මාන්තපුරය** | **කර්මාන්තයේ නම** | **නිෂ්පාදනය** |
|---|---|---|
| ඒකල | තිලකා ට්‍රේඩර්ස් සහ ඉංජිනියරින් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් | ප්‍රතිදාන නිෂ්පාදන - foundry products |
| පන්නල | සිලෝන් හවුර්මාට් (ප්‍රයිවට්) ලිමිටඩ් | ආහාර ආශ්‍රිත නිෂ්පාදන - food-based products |
| අච්චුවේලි | සහරා ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | යකඩ ඇණ - wire nails |
| | යූපීඑල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | ජෛව පොහොර - organic fertilizer |
| ඇල්පිටිය - කොටස B | ඉමෙන්ස් ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ් | ආහාර ආශ්‍රිත නිෂ්පාදන |
| | ජොයිෆක්සෙල් (ප්‍රයිවට්) ලිමිටඩ් | ආහාර ආශ්‍රිත නිෂ්පාදන (පොල් ආශ්‍රිත පානය) - food-based products (coconut energy drinks) |
| | කෙන්ටෝ වෙට් ෆාමසියුටිකල් (ප්‍රයිවට්) ලිමිටඩ් | සත්ව ආහාර හා ඖෂධ - animal food and medicine |
| | ෆැඩිනා ටී (ප්‍රයිවට්) ලිමිටඩ් | ග්‍රීන් ටී ආශ්‍රිත නිෂ්පාදන - green tea-based products |
| | බිග්නො ට්‍රේඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | ආහාර ආශ්‍රිත නිෂ්පාදන |

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

| | | |
|---|---|---|
| පල්ලේකැලේ | ඒකස්පිලෝසා කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් | කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන |
| | වෙව් හෝල්ඩිංග්ස් | කියත් කුඩු නිෂ්පාදන - saw dust products |
| පානලුව | මිරකල් ඇග්‍රෝ කෙමි (ප්‍රයිවට්) ලිමිටඩ් | කෘෂි රසායන, පොහොර - agrochemicals, fertilizers |
| | බීපී ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | ගෑස් කුකර් - gas cookers |
| කොටගල | එම්ජීඑම් ප්‍රඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | කුළුබඩු - spices |

(iii)

| | **කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කර්මාන්තපුරවල ස්ථාපිත කර්මාන්ත** | **ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන කර්මාන්තපුරවල ස්ථාපිත කර්මාන්ත** |
|---|---|---|
| අපනයනය මූලික කරගත් කර්මාන්තශාලා සංඛ්‍යාව | 2 | 4 |
| දේශීය වෙළෙඳ පොළ ඉලක්ක කරගත් කර්මාන්තශාලා | 19 | 10 |
| අපනයනය හා දේශීය වෙළෙඳ පොළ ඉලක්ක කරගත් කර්මාන්තශාලා සංඛ්‍යාව | 01 | - |

(ආ) (i)

| | **කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කර්මාන්තපුරවල ස්ථාපිත කර්මාන්ත** | **ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන කර්මාන්තපුරවල ස්ථාපිත කර්මාන්ත** |
|---|---|---|
| වසා දමා ඇති සුළු පරිමාණ කර්මාන්තශාලා සංඛ්‍යාව | 01 | 01 |
| වසා දමා ඇති මධ්‍ය පරිමාණ කර්මාන්තශාලා සංඛ්‍යාව | 01 | 01 |

(ii) කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින කර්මාන්තපුරවල ස්ථාපිත 2025 වර්ෂයේදී වසා දමා ඇති කර්මාන්තශාලාවල නිෂ්පාදනයන්

| කර්මාන්තපුරය | කර්මාන්තයේ නම | නිෂ්පාදනය |
|---|---|---|
| පුත්තලම | ලංකා ඒජීසී (ප්‍රයිවට්) ලිමිටඩ් | Fly ash bricks කියන ගඩොල් නිෂ්පාදනයක් |
| ත්‍රිකුණාමලය | ලක්මී එක්ස්පෝට් ලංකා කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | ආහාර අතිරේක නිෂ්පාදනය (Cereal legume mixture) |

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පවතින කර්මාන්තපුරවල ස්ථාපිත 2025 වර්ෂයේදී වසා දමා ඇති කර්මාන්තශාලාවල නිෂ්පාදනයන්

| කර්මාන්තපුරය | කර්මාන්තයේ නම | නිෂ්පාදනය |
|---|---|---|
| පල්ලේකැලේ | ඒඑස් ෂාමා (ප්‍රයිවට්) ලිමිටඩ් | රසායනික මූලික ඩොලමයිට් පවුඩර් - Chemical-based dolamite powder |
| පුස්සැල්ල | සුහද හාඩ්වෙයාර් | සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන |

(iii)

| | කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කර්මාන්තපුරවල ස්ථාපිත 2025 වර්ෂයේදී වසා දමා ඇති කර්මාන්ත | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන කර්මාන්තපුරවල 2025 වර්ෂයේදී වසා දමා ඇති කර්මාන්ත |
|---|---|---|
| අපනයනය මූලික කර ගත් කර්මාන්තශාලා සංඛ්‍යාව | 01 | 0 |
| දේශීය වෙළෙඳ පොළ ඉලක්ක කර ගත් කර්මාන්තශාලා සංඛ්‍යාව | 01 | 02 |

(iv) කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති කර්මාන්ත ශාලා

| කර්මාන්තපුරය | කර්මාන්තයේ නම | වසා දැමීමට හේතුව |
|---|---|---|
| පුත්තලම | ලංකා ඒජීසී (ප්‍රයිවට්) ලිමිටඩ් | ඉදිකිරීම් කර්මාන්තයේ පසුබෑම හේතුවෙන් fly ash ගඩොල් සඳහා ඉල්ලුම අඩු වීම |
| ත්‍රිකුණාමලය | ලක්මී එක්ස්පෝට් ලංකා කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | නිෂ්පාදන අමුද්‍රව්‍ය නොමැති වීම |

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ ඇති කර්මාන්තශාලා

| කර්මාන්තපුරය | කර්මාන්තයේ නම | නිෂ්පාදනය |
|---|---|---|
| පල්ලේකැලේ | ඒඑස් ෂාමා (ප්‍රයිවට්) ලිමිටඩ් | ව්‍යාපාර කරගෙන යාමට නොහැකි අයුරින් මූල්‍යමය අර්බුදයකට මුහුණ දීමට සිදු වීම |
| පුස්සැල්ල | සුහද හාඩ්වෙයාර් | |

(v) අපි මෙහිදී කාරණා ගණනාවක් සාකච්ඡා කරලා තිබෙනවා.

- මූලික වශයෙන්ම අපේ අමාත්‍යාංශය යටතේ කර්මාන්තපුර 33ක් දැනට ස්ථාපිත කරගෙන කටයුතු කරමින් යනවා. යටිතල පහසුකම් සංවර්ධනය කරපු අක්කර 20ක භූමි ප්‍රමාණයකින් යුත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව කර්මාන්තපුරයේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු අවසන් අදියරේ දැනට තිබෙන්නේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ සඳමල්ගම - රඹෑව කර්මාන්තපුරයේ අක්කර 16ක් හා ගම්පහ දිස්ත්‍රික්කයේ අළුතැපොල කර්මාන්තපුරයේ ඉඩම් සුදුසු ආයෝජකයින්ට ලබා දෙන්න පුළුවන් මට්ටමට දැන් අපි කටයුතු සකස් කරලා තිබෙනවා.

- ඒ වාගේම පරන්තන්වල අම්ල හා ක්ෂාර ඇතුළු රසායනික නිෂ්පාදන සඳහා වෙන් වූ කර්මාන්තපුරයේ වැඩකටයුතු අපි ආරම්භ කරලා එහි ඉදිකිරීම් කටයුතු කරගෙන යනවා.

- මඩකලපුව දිස්ත්‍රික්කයේ වාලච්චේනයේ අපි අලුතින්ම සම් හා සම් ආශ්‍රිත කර්මාන්තපුරයක් ආරම්භ කරනවා. ඒකට අදාළ කරන පාරිසරික ඇගැයීම් වාර්තා අපි සකස් කරලා අවසානයි. ඒ සඳහා අවසන් අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටිනවා. ඒ වාගේම යටිතල පහසුකම් සඳහා වන මූල්‍ය පහසුකම් වෙන් කරලා තිබෙන්නේ. ඒ ගෙවීම් කරන්න නියමිතයි.

- මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල කර්මාන්තපුරය ස්ථාපිත කිරීමේ සියලු කටයුතු අපි ආරම්භ කරලා, මූලික කාර්යයන් සම්පූර්ණ කිරීම දැන් අවසන් අදියරේ තිබෙන්නේ. ගම්පහ දිස්ත්‍රික්කයේ කටුනායක හා කළුතර දිස්ත්‍රික්කයේ ඉංගිරිය කර්මාන්තපුරවල කටයුතු මේ දවස්වල අවසන් කෙරෙමින් තිබෙනවා.

- ඒ වාගේම යටිතල පහසුකම් සංවර්ධනය කිරීමෙන් තොරවද සුදුසු ආයෝජකයින් වෙත ඉඩම් ලබා දීමට පුළුවන් කර්මාන්තපුර ගණනාවක් දැන් අපට තිබෙනවා. ඒවා පහතින් දැක්වෙනවා.

  1. අනුරාධපුර දිස්ත්‍රික්කයේ නොච්චියාගම කර්මාන්තපුරය අක්කර 50යි.
  2. මොනරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය කර්මාන්තපුරය අක්කර 9.25යි.
  3. පුත්තලම දිස්ත්‍රික්කයේ බංගදෙනිය කර්මාන්තපුරය අක්කර 7.5යි.
  4. මාතර දිස්ත්‍රික්කයේ තිහගොඩ කර්මාන්තපුරය අක්කර 6.5යි.

ඒවා දැනට යටිතල පහසුකම් සංවර්ධනය නොකර වුණත් අපිට ආයෝජකයින්ට දෙන්න පුළුවන්කම තිබෙනවා.

- විශේෂයෙන්ම කර්මාන්තපුරවල රජයේ ඉඩම්, රජයේ තක්සේරුව මත අවුරුදු 35කට තක්සේරු කරලා, දීර්ඝ කාලීන බදු පදනමින් අපි ලබා දෙනවා.

- එක් ඉඩමක් සඳහා එක් වරක් පමණක් ලබා දෙනු ලබන අවුරුදු 5ක බදු සහන කාලයක් අපි ලබා දෙනවා.

- කර්මාන්ත සඳහා අවශ්‍ය විදුලිය, ජල පහසුකම් සහ මාර්ග පද්ධති පුළුල් කිරීම වැනි යටිතල පහසුකම් අපි ලබා දෙනවා.

- ගරු මන්ත්‍රීතුමනි, කර්මාන්තපුර "කර්මාන්ත ප්‍රදේශ" ලෙස ගැසට් කිරීමට තිබෙන බාධා ඉවත් කරලා, ඒ අයට අවශ්‍ය සියලු යටිතල පහසුකම් සකස් කර දීලා, ඒවා නීත්‍යානුකූල කරන කටයුතුත් අපිම කර දීලා කර්මාන්තපුර හදා දෙන්න තමයි සැලසුම් කරලා තිබෙන්නේ. ඒ සඳහා අදාළ වන අනෙකුත් රාජ්‍ය ආයතන වන විදුලිබල මණ්ඩලය, National Water Supply and Drainage Board එක සහ UDA එක සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව අපි දැන් ඒ කටයුතු කරමින් යනවා.

ගරු කථානායකතුමනි, එතුමා ආයතනික ප්‍රතිසංස්කරණ ගැනත් අහනවා. අපි කර්මාන්තවලට අවශ්‍ය කරන එකම කටයුතු කරන ආයතන ටික හඳුනාගෙන තිබෙනවා. අය වැයේදී ජනාධිපතිතුමාත් මේ ගැන කිව්වා. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය - SEDD, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය - NEDA, IDB කියන ඒ ආයතන තුන ඒකාබද්ධ කරලා වඩා පහසුවෙන් වැඩකටයුතු කරන්න පුළුවන් ආකාරයට එකම කාර්යයන් කරන ආයතන ඒකාබද්ධ කරලා ශ්‍රී ලංකා කාර්මික පරිවර්තන හා නවෝත්පාදන අධිකාරිය - ITIA - කියලා අධිකාරියක් සකස් කරන්න අපි දැන් කටයුතු කරමින් යනවා. අපි ජනවාරි මාසයේ මේ සඳහා කැබිනට් අනුමැතිය ලබා ගත්තා. දැන් අවසාන කටයුතු ටික කරන්න තමයි අපට තිබෙන්නේ. ඒ වෙනුවෙන් Act එක සකස් කරමින් තිබෙනවා. එතකොට මේ තිබෙන අසංවිධානාත්මකභාවය තුරන් කරලා ජාතික වේදිකාවක් - national platform එකක් - හදන්න පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා, සියලු කර්මාන්තකරුවන්ට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න.

අපි ප්‍රතිපත්තිමය තීරණ ගණනාවක් අරගෙන තිබෙනවා. ගොඩක් කාරණා තිබෙනවා. නමුත්, මූලික වශයෙන් මේ කාරණා ටික මම ඉදිරිපත් කරනවා. ප්‍රතිපත්ති සහ උපායමාර්ගික රාමුව, නියාමන සහ ව්‍යාපාරික පරිසර ප්‍රතිසංස්කරණ, ව්‍යවසාය පරිසර පද්ධති සංවර්ධනය මෙන්ම විශේෂයෙන්ම අලුතින් ව්‍යාපාර - startups - ආරම්භ කරන අයට ඉලක්කගත SME සහයෝගිතා වැඩසටහන් හැටියට අපි වැඩසටහන් කිහිපයක් කරගෙන යනවා. ඒ පිළිබඳව තිබෙන සවිස්තරාත්මක පිළිතුර මම **සභාගත*** කරනවා.

(ඈ) අදාළ නොවේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා, දීර්ඝ පිළිතුරක් ලබා දීම සම්බන්ධයෙන්.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තශාලා, කර්මාන්ත අමාත්‍යාංශයත්, IDB එකත් එක්ක කරන වැඩ කටයුතු ටික ගැනයි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට මම එක කාරණයක් ගැන අහන්න කැමැතියි. ඔබතුමා කර්මාන්ත ඇමති. ඒ නිසා BoI එකට අයත් නොවන මුළු ලංකාවේම තිබෙන කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සම්පූර්ණයෙන් ඔබතුමාගේ අතට එන්න ඕනෑ. මම හිතන විධියට ඒ සම්බන්ධව කටයුතු කරන ආයතන කිහිපයකුත් තිබෙනවා. දැනට කාරක ප්‍රාග්ධනය තමයි ලොකුම ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. දැන් තිබෙන කර්මාන්තවලටත් ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ ඒකයි. විශේෂයෙන්ම ඒගොල්ලන්ගේ turnover එක වැඩි වුණාට, නිෂ්පාදනය වැඩි වෙලා නැහැ. ඒ වාගේම අනෙක් පැත්තෙන් ගත්තොත් overheads වැඩි වෙලා තිබෙනවා. නමුත් පාරිභෝගිකයින්ගේ ප්‍රමාණය වැඩි වෙලා නැහැ. හැබැයි, විදුලි ගාස්තු, අරවා මේවා එක්ක ගත්තාම පිරිවැය වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම ඔබතුමන්ලා tax දිගින් දිගටම වැඩි කරනවා. ඊළඟට, විදුලි බිල වැඩි කරනවා. මේවාත් එක්ක කුඩා companies විශාල අසීරුතාවකින් තමයි ඒගොල්ලන්ගේ කර්මාන්ත කරගෙන යන්නේ. ඉන්දියාව, බංග්ලාදේශය වැනි රටවල් ඒගොල්ලන්ගේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් විශාල වශයෙන් රකින වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. හැබැයි, ලංකාවේ තිබෙන තත්ත්වය බලන්න. ලංකාවේ තිබෙන බැංකු ඇපකර ඉල්ලන එකත් එක්ක තමයි විශාල අර්බුදයක් ඇති වෙලා තිබෙන්නේ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම අපේ රටට පිටරටවලින් භාණ්ඩ ගෙන්වනවා. ලංකාවේ නිෂ්පාදනය කරන්න පුළුවන් භාණ්ඩ වෙනුවට විශාල වශයෙන් පිටරටින් භාණ්ඩ ගෙනෙනවා. මේ හේතුව නිසා දැන් ලංකාව dumping site එකක් බවට පත් වෙමින් පවතින තත්ත්වයක් තිබෙන්නේ. ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ඇඟලුම් කර්මාන්තශාලා ගැන බලන්න. මම ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ ලංකාව තුළ නිෂ්පාදනය කරන්න පුළුවන් ඇඟලුම් පිටරටින් ගෙන්වන එක නවත්වන්නට ඒවාට විශාල tax එකක් ගැහුවා.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, SMILE වැඩසටහන හරහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට දෙන ණය පහසුකම් සම්බන්ධව. මොකද, ඇමතිතුමාගේ ලිපියක් නැතුව ඒ අයට ණය දෙන්න බැහැ කියා තිබෙනවා. නමුත් සමහර අයට රුපියල් ලක්ෂ 10ත් දීලා තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, දැනට පවතින කර්මාන්ත සම්බන්ධයෙන් දෙන්න පුළුවන් සහනය මොකක්ද කියලා. ඒ කියන්නේ, "දිට්වා" සුළි කුණාටුවෙන් හානි වුණු අයටත් තවමත් අවශ්‍ය කරන සහනය දීගන්න බැරි වුණා. රුපියල් මිලියන 20ක විතර පාඩුවක් වුණු අයට රුපියල් 250,000යි දුන්නේ. ඒ නිසා දැනට පවත්වාගෙන යන ඒවා - අලුත් ඒවා ගැන ඔබතුමා කථා කළා - සම්බන්ධයෙන් ඔබතුමා ගන්නා පියවර මොකක්ද, ආණ්ඩුව විධියට ඒගොල්ලන්ට දෙන්න පුළුවන් සහනය මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය ඇත්ත. කර්මාන්ත අමාත්‍යාංශය හැටියට අපි පවත්වාගෙන යන කර්මාන්ත, ව්‍යාපාර තිබෙනවා. ඒවා පිළිබඳව තමයි මම පැහැදිලි කළේ. ඒ වාගේම, කර්මාන්ත තිබෙනවා, ක්ෂේත්‍ර හැටියටම. දැනට ක්ෂේත්‍ර 26ක ඒ වාගේ හඳුනාගත්ත කර්මාන්ත තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, Apparel industry, automobile industry, boat manufacturing වැනි ඒවා ගැන ඔබතුමාත් දන්නවා. අපේ අමාත්‍යාංශය යටතේ ඒ කර්මාන්තවලට තිබෙනවා, උපදේශක කාරක සභා 26ක්. ඒවායේදී අපි හැම කර්මාන්තයකම තිබෙන ගැටලු සාකච්ඡා කරනවා. ඒවායේ අපනයන වෙළෙඳ පොළ ගැන තිබෙන සාකච්ඡාවලට අපි අපනයන සංවර්ධන මණ්ඩලය සම්බන්ධ කරගන්නවා, BoI එක සම්බන්ධ කරගන්නවා. අපේ අමාත්‍යාංශයෙන් බාහිරව ලියාපදිංචි වෙච්ච කර්මාන්ත සහ ව්‍යාපාර නාම යටතේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඳලාම ලියාපදිංචි වෙච්ච ඒවා තිබෙනවා. BoI එකේ ලියාපදිංචි වෙච්ච ඒවා තිබෙනවා. ඒ අයට තිබෙන ප්‍රශ්නත් අපි සාකච්ඡා කරනවා.

ඒවායේදී ඒ ඒ ක්ෂේත්‍ර ගැන අපි සාකච්ඡා කරන අතරේ ඔබතුමා අහපු ප්‍රශ්නය වන ණය පහසුකම් ලබා දෙන එක ගත්තාම, අපේ අමාත්‍යාංශයේ ණය යෝජනා ක්‍රම තුනක් තිබුණා. ඒ ණය යෝජනා ක්‍රම තුනට වෙනම මුදල් වෙන් වුණාට අපි ඒ ණයවලට අවශ්‍ය කරන ලේඛන ඉදිරිපත් කළත්, බැංකුවලින් ඊට අවශ්‍ය කරන සහයෝගය ලැබෙන්නේ නැහැ. මොකද, බැංකුවට තමයි ණය අය කර ගැනීමේ වගකීම තිබෙන්නේ. ඒ නිසා බැංකුව හැම තිස්සේම බැංකුවල තිබෙන ණය යෝජනා ක්‍රම promote කරනවා. අපෙන් දෙන ණයවලට ඒ පහසුකම ලැබෙන්නේ නැහැ. මොකද, අපෙන් දෙන ඒවායේ තිබෙන පහසුකම වැඩියි, ඇත්තටම. නමුත් බැංකුවේ තමයි අවසාන වගකීම තිබෙන්නේ. ඒ නිසා පසුගිය අය වැයේදී ජනාධිපතිතුමාත් එක්ක සාකච්ඡා කරලා අපි තීරණය කළා, අපේ අමාත්‍යාංශයේ තිබෙන ණය යෝජනා ක්‍රමත්, මුදල් අමාත්‍යාංශයේ ණය යෝජනා ක්‍රමත් ඒකාබද්ධ කරන්න. එහෙම ඒකාබද්ධ කරලා දැන් අපි ඒ ණය පහසුකම යටතේ මේ අවුරුද්දේ ණය පහසුකම් දෙන්න රුපියල් බිලියන 95ක ප්‍රතිපාදන වෙන් කරගෙන තිබෙනවා. ඒ වෙන් කර ගත්ත ප්‍රතිපාදන යටතේ, අපි හැම මාසයකම review එකක් කරනවා. බැංකු සියල්ලම කැඳවා ගන්නවා. මහ බැංකුව කැඳවනවා. ඒ වාගේම මුදල් අමාත්‍යාංශය යටතේ තිබෙන ණය කළමනාකරණ අංශය කැඳවනවා. ඒ සියලු ආයතන කැඳවලා, බැංකුත් එක්ක අපිත් ඉඳගෙන එකට සමාලෝචනයක් කරනවා. දැන් අපි කරන්නේ, ඒ නිර්දේශ ලබා දෙන එක. ඇත්තටම ඇමතිතුමාගේ ලියුමක් අවශ්‍ය නැහැ, කොහෙත්ම. අපේ ණය අංශය වෙනම තිබෙනවා. අපට එන කර්මාන්තවලට ඒ ණය අංශය නිර්දේශ ලබා දෙනවා. ඒ නිර්දේශ මුදල් අමාත්‍යාංශය අරගෙන, මුදල් අමාත්‍යාංශය තමයි බැංකුත් එක්ක ඒක සම්බන්ධීකරණය කරන්නේ. මොකද, බැංකුවලට නියාමනයන් ඉදිරිපත් කිරීම, බැංකුවලට නිර්දේශ ඉදිරිපත් කිරීම මුදල් අමාත්‍යාංශයේ සෘජු වගකීම. ලබන මාර්තු 11 හවස 2.00ටත් අපේ Committee එක තිබෙනවා. එතකොට මුදල් අමාත්‍යාංශයයි, කර්මාන්ත අමාත්‍යාංශයයි, මහ බැංකුවයි, බැංකු ප්‍රධානීනුයි එකට වාඩි වෙලා තමයි දැන් ඒ තීරණය ගන්නේ. ඒ නිසා මම විශ්වාස කරනවා, ඔබතුමා ඔය කියන ගැටලුව දැන් විසඳිලා තිබෙනවාය කියලා. ඕනෑම කෙනෙකුට කර්මාන්තයේ ණය සම්බන්ධ ප්‍රශ්නවලදී අපේ අමාත්‍යාංශය හරහා සම්බන්ධීකරණය කරන්න පුළුවන්. මුදල් අමාත්‍යාංශය එක්ක ඒක ලබා ගැනීමට සාකච්ඡා කරන්න පුළුවන්. මොකද, ඒ සාකච්ඡාවට අපි යනවා; මමත්, නියෝජ්‍ය ඇමතිතුමාත් යනවා. හැම ණය අයදුම්පතක් ගැනම, අපට ලැබෙන හැම ඉල්ලුම්පත්‍රයක් ගැනම අපි බැංකු එක්ක වෙන වෙනම සාකච්ඡා කරනවා.

මෙතැන තිබෙන ප්‍රශ්නය ගරු මන්ත්‍රීතුමා, සමහර අය බලාපොරොත්තු වෙනවා, පොලියත් කපාගෙන, වාරිකයත් කපාගෙන, ඔක්කෝම අයින් කර ගන්න. එහෙම බැහැ. මොකද, බැංකුවලත් තිබෙන්නේ තැන්පත්කරුවන්ගේ සල්ලි. එතකොට බැංකුවටත් වගකීමක් තිබෙනවා, ණය දුන්නාට පස්සේ තැන්පත්කරුවන්ට අවශ්‍ය කරන පොලිය නැවත අය කර ගන්න. ඒ නිසා සියයට 100ක් ඒ අයට පහසුකම් දෙන්න අපට අමාරුයි. නමුත් මම විශ්වාස කරනවා, දැනට සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සැලකිය යුතු ප්‍රමාණයක් අපේ ණය යෝජනා ක්‍රමය යටතේ ඒකාබද්ධ කරලා තිබෙන නිසා අපහසුවකින් තොරව ණය ලබා ගන්නවාය කියලා. අපි මේ වෙන් කරලා තිබෙන රුපියල් බිලියන 95ම මම හිතන විධියට මේ අවුරුද්ද අවසාන වෙනකොට ඒ සියලුදෙනාට දෙන්න පුළුවන්කම තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන ඒ ගැටලුව තිබුණා. ඒ ගැටලුව ආවේ ඇයි? කර්මාන්ත අමාත්‍යාංශයෙන් නිර්දේශ කළාට එම නිර්දේශය බැංකුව භාර ගන්නේ නැහැ. මොකද, බැංකුවට කර්මාන්ත අමාත්‍යාංශයේ නිර්දේශයට වඩා වැදගත් වන්නේ, ණය අය කර ගන්නේ කොහොමද කියන ප්‍රශ්නයයි. බැංකුව පැත්තෙන් ගත්තත් ඒක සාධාරණයි. දැන් ඒ දෙක ඒකාබද්ධ කරලා තිබෙන නිසා ගැටලුවක් නැහැ. කාගේ හෝ ණය සම්බන්ධ ගැටලු පිළිබඳව ඔබතුමන්ලාටත් තොරතුරු තිබෙනවා නම් ඒවා අමාත්‍යාංශයට යොමු කරන්න. අමාත්‍යාංශය හරහා ඒවා විසඳන්න අපට පුළුවන්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු ඇමතිතුමනි, ඒ පිළිතුර ලබා දුන්නාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

අපි SMILE I, SMILE II, SMILE III කියන ණය යෝජනා ක්‍රම පටන් ගත්තේ ADB එකෙන් අපට දුන්නු මුදල්වලිනුයි. එම නිසා ඉස්සර අපේ අතේ control එක තිබුණා. පළමුවැනි ණය යෝජනා ක්‍රමය පටන් ගත්තේ 1998දී. ඒකෙන් අපි විශාල support එකක් දුන්නා. ඇත්තෙන්ම අපි බැංකුවලට ඕනෑ විධියට වැඩ කරන්න දුන්නේ නැහැ. අපි තමයි guidelines යැව්වේ, මෙන්න මේ මේ කාරණා මත දෙන්න කියලා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ, ඒක ඔබතුමාගේ පාලනය යටතේ තිබෙන දෙයක් වන නිසා කරුණාකර ඒකට හයියක් දෙන්න කියලායි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අපි ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හොඳයි, ගරු ඇමතිතුමා.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මෙය ඔබතුමාගේ දිස්ත්‍රික්කයට අදාළයි. දික්වැල්ලේ, බතීගම තිබුණා ටින් මාළු නිෂ්පාදනය කරන කර්මාන්තශාලාවක්. බොහොම අමාරුවෙන් එම කර්මාන්තශාලව පවත්වාගෙන ගියේ. එහි 50ක විතර සේවක සංඛ්‍යාවකුත් හිටියා. එම කර්මාන්තශාලාව අවුරුදු ගණනක් වැඩ කටයුතු කරගෙන ගිය තැනක්. නමුත්, එම කර්මාන්තශාලාව වහන්න කියලා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයට ලියා තිබෙනවා, දික්වැල්ල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිතුමා. සම්බන්ධීකරණ කමිටුවේදී ඒ ගැන කථා කරලා, මධ්‍යම පරිසර අධිකාරියට දන්වලා තිබෙනවා එය වහන්න කියලා. ගරු ඇමතිතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා විධියට ඔබතුමා ඒ ගැන සොයා බැලුවොත් හොඳයි. මොකද, ලංකාවේ ටින් මාළු කර්මාන්තශාලාවක් ආරම්භ කරලා පවත්වාගෙන යනවා කියන්නේ ලේසි වැඩක් නොවෙයි. එය අමාරු වැඩක්. නමුත්, ඒ අය එය හොඳින් පවත්වාගෙන ගියා. සේවකයෝත් 50ක් විතර වැඩ කළා. දැන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවෙන්ම කථා කරලා කියා තිබෙනවා, එයට පරිසර බලපත්‍රය දෙන්න එපා කියලා. ගරු ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙන් යම් සොයා බැලීමක් කරලා එම කර්මාන්තශාලාව නැවත පටන් ගන්න අවශ්‍ය කරන වැඩකටයුතු ටික කරන්න පුළුවන්ද කියලා මම අහනවා. මොකද, ටින් මාළු ලංකාවට ආනයනය කරලා බෙදනවාට වඩා මේ වාගේ කර්මාන්තශාලාවක් ආරම්භ කරන එක විශාල වටිනාකමක් තිබෙන දෙයක්. යම් යම් පරිසර ප්‍රශ්න තිබෙන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම විශේෂයෙන්ම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධව ගන්නා පියවර පිළිබඳව දැනුවත් කරන්න කියලා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු මන්ත්‍රීතුමා, අපි හිතා මතා කිසිම කර්මාන්තශාලාවක් වහන්න කටයුතු කරන්නේ නැහැ. එතැන පාරිසරික ගැටලු මතු වෙලා තිබෙනවා නම් ඒවා ගැන සොයා බලා ඒ අයට නිර්දේශ ලබා දෙන්න පුළුවන්, පාරිසරික කාරණා සම්පූර්ණ කරන්න කියලා. ඔබතුමා මට තොරතුරු ටික දෙන්න. මම අනිවාර්යයෙන්ම අද දවස ඇතුළත ඒ ගැන සොයා බලන්නම්.

## 2024 පෙබරවාරි සිට 2025 මාර්තු දක්වා NCMEC වෙත ලැබුණු විදේශ ආධාර: විස්තර
2024 பெப்ருவரி தொடக்கம் 2025 மார்ச் வரை NCMECக்குக் கிடைக்கப்பெற்றுள்ள வெளிநாட்டு உதவி: விபரம்
FOREIGN ASSISTANCE RECEIVED BY NCMEC FROM FEBRUARY, 2024 TO MARCH, 2025: DETAILS

1310/2025

**8. ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අතුරුදහන් වූ හෝ සූරාකෑමට ලක් වූ ළමුන් සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCMEC) සඳහා ආධාර ලබා දෙන රට හා ආයතනය කවරේද;

(ii) 2024 පෙබරවාරි මාසයේ සිට 2025 මාර්තු මාසය දක්වා එම මධ්‍යස්ථානයට ලැබී ඇති ආධාර මුදල ඇමෙරිකානු ඩොලර් කොපමණද;

(iii) එම මුදල ශ්‍රී ලංකාව තුළ පරිහරණය කිරීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අවසරය ලබා ගෙන තිබේද;

(iv) මේ සඳහා පූර්ව අනුමතිය ආරක්ෂක ලේකම්වරයාගෙන් ලබා ගෙන තිබේද;

(v) ඉහත මධ්‍යස්ථානය නියාමනය කරනු ලබන ළමා හා කාන්තා කටයුතු කාර්යාංශය භාරව 2024 පෙබරවාරි සිට 2025 මාර්තු දක්වා කටයුතු කරනු ලැබුවේ කවුරුන්ද;

(vi) ඉහත ආධාර මුදල් වැය කර ඇති ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காணாமற்போன அல்லது சுரண்டலுக்குள்ளான சிறுவர்களுக்கான தேசிய மத்திய நிலையத்துக்கு (NCMEC) உதவி வழங்கும் நாடு மற்றும் நிறுவனம் யாது என்பதையும்;

(ii) 2024 பெப்ருவரி தொடக்கம் 2025 மார்ச் வரை இந்த மத்திய நிலையத்துக்குக் கிடைக்கப் பெற்றுள்ள நிதியுதவி அமெரிக்க டொலரில் எவ்வளவு என்பதையும்;

(iii) அந்நிதித் தொகையை இலங்கையில் பயன்படுத் துவதற்கு வெளிநாட்டு வளங்கள் திணைக் களத்தின் அனுமதி பெறப்பட்டுள்ளதா என்ப தையும்;

(iv) இதற்கான முன்அனுமதி பாதுகாப்புச் செயலா ளரிடமிருந்து பெற்றுக்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(v) மேற்படி மத்திய நிலையத்தை ஒழுங்கு முறைப்படுத்தும் சிறுவர் மற்றும் மகளிர் விவகார

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

பணியகத்துக்கு 2024 பெப்ருவரி தொடக்கம் 2025 மார்ச் வரை பொறுப்பாகச் செயற்பட்ட வர்கள் யாவர் என்பதையும்;

(vi) மேற்படி நன்கொடைத் தொகை செலவு செய்யப் பட்டுள்ள கருத்திட்டங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) the names of the country and the institution that provide assistance to the National Centre for Missing and Exploited Children (NCMEC);

(ii)` the value of the assistance received by the above-mentioned Centre from February, 2024 to March, 2025 in US Dollars;

(iii) whether permission has been obtained from the Department of External Resources to utilize the said amount within Sri Lanka;

(iv) whether prior approval of the Secretary to the Ministry of Defence has been obtained for the same; and

(v) the names of the persons who were in charge of the Children and Women Bureau, which regulates the above-mentioned centre, during the period from February, 2024 to March, 2025; and

(vi) the names of the projects on which the said amount of assistance has been spent?

(b) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) රට - ජපානය

ආයතනය - ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානය - IOM

(ii) මුදල් වශයෙන් ආධාර ලැබී නොමැති අතර, ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානය - IOM - විසින් ශ්‍රී ලංකා පොලීසිය සඳහා සිදු කරන ලද ව්‍යාපෘති අධීක්ෂණය කරන ලදී.

ශ්‍රී ලංකා පොලීසියේ ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන කාර්යාංශය යටතේ පවත්වාගෙන යන අතුරුදහන් වූ සහ සූරාකෑමට ලක් වූ දරුවන් සඳහා වූ ජාතික මධ්‍යස්ථානයට - NCMEC, ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානය (IOM) හරහා ජපන් රජය විසින් ආධාර ලබා දීම සිදු කර ඇත.

මෙම ආධාර ලබා දීම ජපාන රජය විසින් ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානය - IOM - හරහා ක්‍රියාත්මක වූ "UPLIFT" ව්‍යාපෘතියේ (අවදානමට ලක්වන සංක්‍රමණිකයින් සහ ප්‍රජාවන්ට ඔවුන්ගේ ජීවනෝපායන් නංවාලීමට, ඔවුන්ගේ කුසලතා වැඩිදියුණු කිරීමට සහ නිවැරදි ක්‍රමවේදයන් අනුව සංක්‍රමණ ප්‍රවර්ධනය කිරීමට සහය වීමේ ව්‍යාපෘතිය) එක් අදියරක් ලෙස ක්‍රියාත්මක කර ඇත.

(iii) අදාළ නොවේ.

(iv) ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානය - IOM - විසින් ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශයේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා පරිත්‍යාග කිරීමට කැමැත්ත පළ කරන ලද උපකරණ භාරගෙන බඩු වට්ටෝරු ලේඛනයේ ලේඛනගත කිරීමට මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන ඇත.

(v) ළමා හා කාන්තා අපයෝජන වැළැක්වීමේ සහ විමර්ශන කාර්යාංශයේ, නියෝජ්‍ය පොලිස්පති - රේණුකා ජයසුන්දර මහත්මිය

අධ්‍යක්ෂවරුන් ලෙස:

1. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නුවන් සුරංග මෙන්ඩිස් මයා.
2. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඩබ්ලිව්.එල්.පී.එම්. අබේසේකර මයා.
3. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඒ.ජේ. ගුණසේකර මයා.

(vi) මූල්‍යමය ආධාර ලැබී නොමැත. එහෙත් ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානය - IOM - විසින් පහත කාර්යයන් ඉටු කර ඇත.

1. ප්‍රධාන කාර්යය ලෙස ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන කාර්යාංශ මෙහෙයුම් ධාරිතාව සහ සේවා සැපයීම වැඩිදියුණු කිරීම සඳහා උපකරණ ලබා දීම.
2. මිනිස් වෙළඳාම් මර්දන ඒකකය - Anti-human Trafficking Unit, අතුරුදහන් වූ සහ සූරාකෑමට ලක් වූ ළමුන් සඳහා වූ ජාතික මධ්‍යස්ථානය සහ කාන්තාවන්ට හා ළමුන්ට සිදුවන අපරාධ සම්බන්ධ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා වන 109 මහජන පැමිණිලි ඒකකය - 109 Public Complaint Desk - ප්‍රතිසංස්කරණය කිරීම.
3. ප්‍රචණ්ඩත්වය හා හිංසනයට භාජන වූ කාන්තාවන් සඳහා තාවකාලිකව නවාතැන් ගැනීමට අවශ්‍ය පහසුකම් ඇති ස්ථානයක් ළමා හා කාන්තා කාර්යාංශ මූලස්ථානයේ ස්ථාපිත කිරීම.
4. ළමා හා කාන්තා කාර්යාංශ මූලස්ථානයට පැමිණෙන දරුවන්හට රැඳී සිටීමට ඇති ආරක්ෂිත ස්ථානය පහසුකම් සහිතව ප්‍රතිසංස්කරණය කිරීම.
5. 109 ක්ෂණික දුරකථන ඇමතුම් මධ්‍යස්ථානයේ ක්‍රියාකරන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

(ආ) පැන නොනඟී.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරේදී කිව්වා, ඒ වෙනුවෙන් මුදල් ලැබිලා නැහැ කියලා. මුදල් ආධාර පරිත්‍යාග කරපු රටවලින් ඒවා ලැබිලා නැහැ කියලා ඔබතුමා කිව්වා. හැබැයි, ඩොලර් 166,000ක් දීලා තිබෙනවාය කියනවා. ශ්‍රී ලංකා මුදලින් රුපියල් මිලියන 49.8ක්. මේ මධ්‍යස්ථානය ගැන ඔබතුමා හරියට හොයලා බලන්න. DIG රේණුකා ජයසුන්දර කියන අය තමයි මෙතැන හිටියේ. සාමාන්‍යයෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ගන්න ඕනෑ, පිට රටකින් අපේ රටට මුදල් ආධාර ගන්නවා නම්. මම හිතන හැටියට 2019දී විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් අවසර අරගෙන නැහැ. රුපියල් මිලියන 49.8ක් ලැබිලා තිබෙනවා. ඔබතුමාට දීපු තොරතුරු ඔබතුමා නැවත බලන්න. ඔබතුමාට ඒ තොරතුරු හරියට ලබා දීලා තිබෙනවාද කියන්න මම දන්නේ නැහැ. මේ තිබෙන තොරතුරු අනුව මම කියන්නේ. ඕනෑ නම් ඒ සම්පූර්ණ විස්තරය මම ඔබතුමාට දෙන්නම්. රුපියල් මිලියන 49.8න් රුපියල් මිලියන 12කවත් වැඩක් වෙලා නැහැ කියන එක තමයි මම කියන්නේ. ඒ සම්බන්ධයෙන් මොකක්ද කියන්න තිබෙන්නේ, ගරු ඇමතිතුමනි?

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයෙන් අහලා තිබුණා මේකට ආධාර ලබා දුන්නාද කියලා. ජපන් රට තමයි IOM සංවිධානය හරහා මේකට උපකාර කරලා තිබුණේ. උපකරණ විශාල ප්‍රමාණයක් ලබා දී තිබෙනවා; desktops, laptops, furniture ඇතුළු උපකරණ විශාල ප්‍රමාණයක් ලබා දී තිබෙනවා. මා වෙත ලැබී තිබෙන තොරතුරු අනුව කිසිදු මුදල් පරිත්‍යාගයක් සිද්ධ වෙලා නැහැ, ජපන් රට හෝ IOM ආයතනය හරහා. ඔබතුමා කියපු කාරණය මා සොයා බලන්නම්. කොහොම වුණත්, මුදල් ආධාරයක් ලැබුණොත් ඒ පිළිබඳව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා කටයුතු කළ යුතුයි. නමුත්, මුදල් ආධාර ලැබී නැහැ. අමාත්‍යාංශය වෙත උපකරණ විශාල ප්‍රමාණයක් ලැබී තිබෙනවා. ඒ පිළිබඳ වාර්තාවක් තිබෙනවා, ඒ උපකරණ මොනවාද කියලා. නමුත්, ගරු මන්ත්‍රීතුමනි, මුදල් ලැබීමක් ගැන වාර්තා වන්නේ නැහැ. අවශ්‍ය නම් නැවතත් සොයා බැලීමක් කරන්න පුළුවන්.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මුදල් ලැබී නැත්තේ නැහැ, ලැබී තිබෙනවා, ගරු ඇමතිතුමනි. මේ තුළ ලොකු වංචාවක් වෙලා තිබෙනවා කියලා තමයි කියන්නේ. DIG Renuka Jayasundara සහ තවත් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙක් මීට සම්බන්ධයි කියනවා. සමහරවිට පොලිස්පතිතුමා දන්නේත් නැතිව ඇති, මේ ගැන. ඔබතුමාට ඇවිල්ලා නැතුවත් ඇති, මේ තොරතුරු. මේ ගැන සොයා බලන්න. මේ තුළ ලොකු මුදල් වංචාවක් වෙලා තිබෙනවා. ලංකාවේ මුදලින් රුපියල් මිලියන 49.8ක් ලැබිලා තිබෙනවා. මේ මුදලින් වියදම් කරලා තිබෙනවා, ටෙන්ඩර් දාලා බඩු අරගෙන තිබෙනවා. රුපියල් මිලියන 12ක විතර තමයි බඩු අරගෙන තිබෙන්නේ. රුපියල් මිලියන 35ක විතර ප්‍රශ්නයක් තිබෙනවා කියලා තමයි කියන්නේ. ඒ ගැන සොයා බලන්න. මොකද, සමහරවිට එහෙම නොවෙන්නත් පුළුවන්, වෙන්නත් පුළුවන්. වුණත් එකයි, නොවුණත් එකයි. යම් තොරතුරක් දැනගෙන ඔබතුමාට ඒ කරුණු සොයාගන්න පුළුවන් නම් හොඳයි. මොකද, මේක ළමා හා කාන්තා සුරැකීමේ මධ්‍යස්ථානයක්. අපේ රටට ආධාර ලැබෙන්නේ, ළමයින්ගේ ප්‍රශ්න වෙනුවෙන්. මේක ළමයින් වෙනුවෙන් දෙන මුදලක්. ඒ නිසා මේ ගැන හොඳට සොයා බලා කටයුතු කරන්න කියන ඉල්ලීම තමයි මම කරන්නේ.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු මන්ත්‍රීතුමනි, ඔය වාගේ කාරණයක් සම්බන්ධයෙන් පැමිණිලි කිහිපයක් ලැබී තිබුණා. ඒ පැමිණිලි පරීක්ෂා කර බැලුවා. ඒ පැමිණිලිවල සත්‍යතාවක් තිබුණේ නැහැ. නමුත්, ඔබතුමා නැවත නැවත කියනවා මුදල් ලැබීමක් සිද්ධ වුණාය කියලා. නමුත්, භාණ්ඩ වට්ටෝරුවක් ලැබී තිබෙනවා අමාත්‍යාංශයට. අමාත්‍යාංශයේ ලේකම්වරයා ඒ භාණ්ඩ වට්ටෝරුව භාරගන්නා ලෙස ළමා හා කාන්තා කාර්යාංශයට දැනුම් දී තිබෙනවා. මුදල් නොලැබුණු බව තමයි දිගින් දිගටම තහවුරු වුණේ. කෙසේ වුවත්, නැවත වතාවක් සොයා බැලීමට කිසිදු බාධාවක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සහ ශ්‍රී ලංකා විදුහල්පති සේවය: පුරප්පාඩු
## இலங்கை கல்வி நிருவாக சேவை மற்றும் இலங்கை அதிபர் சேவை: வெற்றிடங்கள்
SRI LANKA EDUCATION ADMINISTRATIVE SERVICE AND SRI LANKA PRINCIPALS' SERVICE: VACANCIES

1638/2025

**9. ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය හා ශ්‍රී ලංකා විදුහල්පති සේවය තුළ, මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) ශ්‍රී ලංකා ගුරු සේවයේ සිට විදුහල්පති සේවයට සීමිත පදනම මත පවත්වන තරග විභාගයකින් බඳවා ගැනීමේදී, එය උසස්වීමක් ලෙස සලකන්නේද;

(iv) එසේ නොවන්නේ නම්, ඊට හේතු කවරේද;

(v) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින්ගේ ඵලදායිතාව හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை கல்வி நிருவாக சேவை மற்றும் இலங்கை அதிபர் சேவையில், இன்றளவில் காணப்படுகின்ற வெற்றிடங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

[ගරු රුවන් විජේවීර මහතා]

(ii) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) இலங்கை ஆசிரியர் சேவையிலிருந்து அதிபர் சேவைக்கு மட்டுப்படுத்தப்பட்ட அடிப்படையில் நடாத்தப்படும் போட்டிப் பரீட்சைமூலம் ஆட் சேர்ப்பு செய்யும்போது, அது ஒரு பதவியுர்வாகக் கருதப்படுமா என்பதையும்;

(iv) அவ்வாறு இல்லாவிடின், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) இலங்கை அதிபர் சேவையிலுள்ள அலுவலர் களின் ஆக்கத்திறன் மற்றும் தரத்தை மேம்படுத்து வதற்கு மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of vacancies that exist in the Sri Lanka Education Administrative Service and the Sri Lanka Principals' Service, separately;

(ii) the measures that will be taken to fill the said vacancies;

(iii) whether recruitment to the Sri Lanka Principals' Service from the Sri Lanka Teachers' Service through a limited competitive examination is considered a promotion;

(iv) if not, the reasons therefor; and

(v) the steps that have been taken to improve the productivity and efficiency of the officers of the Sri Lanka Principals' Service?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය - පුරප්පාඩු 903

ශ්‍රී ලංකා විදුහල්පති සේවය - පුරප්පාඩු 3,790

(ii) **ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය**

විවෘත, සීමිත සහ සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත 2021.06.30 දිනට පැවති පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පැවති තරග විභාග හා වාචික සම්මුඛ පරීක්ෂණ මත පිළිවෙළින් විවෘත පදනම මත පත්වීම් 88ක් 2025.07.01 දින ද, සීමිත පදනම මත පත්වීම් 411ක් 2025.10.23, 2025.09.01, 2025.12.01 දිනවල ද, සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත පත්වීම් 67ක් 2024.07.01, 2025.03.03 දිනවල ද ලබා දී ඇති අතර, ඇතැම් නිලධාරීන් එම පත්වීම් භාර නොගැනීම හා අවසාන කඩඉම් ලකුණට සම ලකුණු ලැබූ නිලධාරීන් විශාල සංඛ්‍යාවක් සිටීම මත තවදුරටත් ඉහත දිනට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා 2026 මාර්තු මස දෙවන සතිය තුළදී සාමාන්‍ය හා වාචික සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිතය. (සීමිත පදනම මත පුරප්පාඩු 3ක්, විවෘත පදනම මත පුරප්පාඩු 25ක් සඳහා)

එම පුරප්පාඩු සම්පූර්ණ කිරීම අවසන් කිරීමෙන් අනතුරුව විවෘත, සීමිත සහ සේවා හා කුසලතා පදනම් යටතේ, 2021.06.30 - 2025.06.31 දින දක්වා අලුතින් ඇති වී ඇති පුරප්පාඩු යනුවෙන් ඉදිරියේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත තරග විභාග පවත්වා බඳවා ගැනීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කරනු ලැබේ.

**ශ්‍රී ලංකා විදුහල්පති සේවය**

අංක 1885/31 හා 2014.10.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථාවට හා එහි සංශෝධනවලට අනුකූලව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නව බඳවා ගැනීම් සඳහා අංක 2463 හා 2025.11.14 දිනැති රජයේ ගැසට් පත්‍රය මඟින් සීමිත ලිඛිත තරග විභාගයට අයදුම්පත් කැඳවා ඇති අතර, ඉදිරියේදී ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණ පැවැත්වීමට නියමිතය.

(iii) ශ්‍රී ලංකා විදුහල්පති සේවයට නිලධාරීන් බඳවා ගැනීම උසස්වීමක් ලෙස නොසලකන අතර, නව බඳවා ගැනීමක් ලෙස සලකා කටයුතු කෙරේ.

(iv) ශ්‍රී ලංකා ගුරු සේවය හා ශ්‍රී ලංකා විදුහල්පති සේවය වෙන වෙනම සේවා ව්‍යවස්ථා දෙකක සඳහන් විධිවිධාන අනුව ක්‍රියාත්මක වන වෙනස් සේවාවන් දෙකකි.

(ශ්‍රී ලංකා ගුරු සේවය අංක 1885/83 හා 2014.10.23 දිනැති රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත (පසුව සංශෝධිත) ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව අනුව ක්‍රියාත්මක වන අතර ශ්‍රී ලංකා විදුහල්පති සේවය අංක 1885/31 හා 2014.10.22 දිනැති රජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත (පසුව සංශෝධිත) ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව ක්‍රියාත්මක වේ.) තවද, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයට පිවිසීමට හැකියාව ඇත්තේ විදුහල්පති ව්‍යවස්ථා සංග්‍රහය අනුව මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති, ශ්‍රී ලංකා ගුරු සේවයේ තනතුර ස්ථිර කරන ලද ගුරු සේවයේ නිලධාරීන්ට පමණි.

අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 03/2014 අනුව සහ ආයතන සංග්‍රහයේ පළමු කාණ්ඩයේ VII පරිච්ඡේදයේ 4 වගන්තිය අනුව නව බඳවා ගැනීමක් සේ සලකා ශ්‍රී ලංකා විදුහල්පති සේවයට

පිවිසෙන නිලධාරීන්ගේ වැටුප සකස් කිරීම කළ යුතුය.

නමුත්, ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි ශ්‍රී ලංකා විදුහල්පති සේවයට පිවිසෙන ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධරයකුගේ වැටුප පරිවර්තන කිරීමේදී ඒ සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2017 හි විධිවිධාන අදාළ කර ගැනීමට (එනම් නිශ්චිතව නම් කළ වෙනත් සේවාවක/තනතුරක සිට පත්වීම් ලබන නිලධරයකුගේ වැටුප සකස් කිරීම යටතේ ආයතන සංග්‍රහයේ පළමු කාණ්ඩයේ VII පරිච්ඡේදයේ 5 වගන්තිය පරිදි උසස්වීමක් සේ සලකා වැටුප සකස් කිරීමට) අනුමැතිය විමසමින් නව කැබිනට් සංදේශයක් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කෙරෙමින් පවතී.

(v) ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 13 වගන්තිය අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ නිපුණතා හා ධාරිතා සංවර්ධනය සඳහා පහත සඳහන් පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.

- සේවාරම්භක පුහුණුව ලබාදීම
- ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව I (II ශ්‍රේණියට උසස්වීමට පෙර)
- ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව II (I ශ්‍රේණියට උසස්වීමට පෙර)

ඊට අමතරව පළාත්, කලාප හා කොට්ඨාස මට්ටමින් කාලීන අවශ්‍යතා මත විවිධ ධාරිතා සංවර්ධන වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සිදු කරනු ලබයි.

(ආ) අදාළ නොවේ.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)

ගරු අග්‍රාමාත්‍යතුමියනි, ප්‍රශ්න කිහිපය සම්බන්ධව ඉතා පැහැදිලි සහ සවිස්තරාත්මක පිළිතුරක් ලබාදීම ගැන ඔබතුමියට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම විදුහල්පති සේවය මෙන්ම සමස්ත අධ්‍යාපන පද්ධතිය වෙනුවෙන් ගනු ලබන්නා වූ ධනාත්මක තීන්දු සම්බන්ධවත් ගෞරවනීය ස්තුතිය පුද කරන ගමන්, මගේ පළමු අතුරු ප්‍රශ්නයට යොමු වෙනවා.

අපි දන්නවා, විදුහල්පති සේවය ගත්තාම ශ්‍රී ලංකා විදුහල්පති සේවයට නිලධාරීන් බඳවා ගනු ලබන්නේ ගුරු සේවයේ යෙදී සිටින නිලධාරීන් වෙනුවෙන් පවත්වනු ලබන යම් යම් පූර්ව අවශ්‍යතා - requirements - මත පවත්වනු ලබන තරග විභාගයකින් බව.

ගරු අග්‍රමාත්‍යතුමියනි, මෙහෙම බඳවා ගන්න නිලධාරීන් පාසලේ විදුහල්පතිවරයා බවට පත්වෙනවා කියන එක ඇතුළේ තිබෙන්නේ පාසලේ නියමුවා ලෙස සමස්ත කාර්යභාරය පිළිබඳ වගකීම ඔහුට පැටවෙනවා කියන එක බව අපි දන්නවා. එතැනදී විදුහල්පතිවරයෙකුට තිබෙන කාර්යභාරය ගත්තොත්, පරිපාලන කාර්යභාරය, විශේෂයෙන්ම කළමනාකරණ කාර්යභාරය, භෞතික සම්පත්, මානව සම්පත් සහ අනෙකුත් සමස්ත සම්පත් කළමනාකරණය සිදු වෙනවා. විශේෂයෙන්ම ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා නායකත්වය දෙන ගමන් පාසල තුළ පුළුල් ප්‍රජාවක් - ශිෂ්‍ය ප්‍රජාව, ගුරු මණ්ඩලය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ විශේෂයෙන්ම ආදි ශිෂ්‍යයන්, දෙමව්පියන් කියන සමස්තය - කළමනාකරණය කරමින්, අපේක්ෂිත ඉලක්ක කරා පාසල ගෙනයාම විදුහල්පතිවරයාගේ බරපතළ වගකීමක් වෙනවා.

ගරු අග්‍රමාත්‍යතුමියනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපි විදුහල්පති සේවයට නිලධාරීන් බඳවා ගත්තාට පස්සේ විශේෂයෙන්ම ගුරු සේවයේ II, ගුරු සේවයේ 2-II, 2-I සහ I ශ්‍රේණියේ සිටින ගුරුවරු - නිලධාරීන් - විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගත්තාට පස්සේ මේ වැටුප් තල දෙක අතර අර්බුදයක් මතු වී තිබෙනවා. එම නිසා විදුහල්පතිවරුන්ගේ පැත්තෙන් බරපතළ ඉල්ලීමක් තිබෙනවා, මේ සම්බන්ධව ධනාත්මකව සලකා බලන්න කියලා. අධ්‍යාපනය ගුණාත්මකව ඉහළට ඔසවන්න රජය බරපතළ විධියට මැදිහත්වීම් කරනවා. එතැනදී විදුහල්පතිවරයා බලගැන්වීම සම්බන්ධයෙනුත් ඔබතුමියලා මැදිහත්වන බව අපි දන්නවා. මේ තිබෙන්නා වූ වැටුප් විෂමතාව බරපතළ, සැලකිය යුතු මට්ටමේ එකක්. එම නිසා රජයක් විධියට ඔබතුමිය මේ සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව දැනගන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி **அமரசூரிய**)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, විදුහල්පති සේවයේ පවතින වැටුප් විෂමතා පිළිබඳව අපි දීර්ඝව සාකච්ඡා කර තිබෙනවා. විදුහල්පති සංගම් සමඟත්, විදුහල්පතිවරුන් සමඟත් මේ විෂමතා පිළිබඳව දිගින් දිගටම සාකච්ඡා කරමින් යම් විසඳුමක් සොයන්න අපි උත්සාහ කරමින් ඉන්නවා. රජයේ ප්‍රතිපත්තියක් හැටියට මේ අවුරුද්දේ වැටුප් කොමිසමක් පත් කරන්න නියමිතයි. එම වැටුප් කොමිසම හරහා තමයි මේ සඳහා තිරසාර විසඳුමක් ලබාදෙන්න අපට පුළුවන් වන්නේ. ඇත්ත වශයෙන්ම පසුගිය කාලය තුළ වැටුප් වර්ධක ලබාදීම සිද්ධවෙලා තිබෙන විධියත් එක්ක බැලුවාම, විදුහල්පති සේවයේ විතරක් නොවෙයි, අධ්‍යාපන ක්ෂේත්‍රයේ විතරක් නොවෙයි, ක්ෂේත්‍ර ගණනාවක අර්බුද, විෂමතා ඇතිවෙලා තිබෙනවා. මේකට සමස්ත තිරසාර විසඳුමක් අවශ්‍ය වන නිසා තමයි අර වැටුප් කොමිෂන් එක හරහා විසඳුමක් හොයා දෙන්න අපි බලාපොරොත්තු වෙන්නේ. විශේෂයෙන් විදුහල්පතිවරුන්ගේ ප්‍රශ්නය පිළිබඳව වැටුප් කොමිෂන් එකට යෝජනා ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)

ඒ මැදිහත්වීම සම්බන්ධව ගරු අග්‍රාමාත්‍යතුමියට මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අග්‍රාමාත්‍යතුමියනි, විදුහල්පති සේවය කියන්නේ මාණ්ඩලික සේවයේ තනතුරක්. සාමාන්‍ය ආයතන ප්‍රධානියෙක් විධියට කටයුතු කරන විදුහල්පතිවරු, සාමාන්‍ය මාණ්ඩලික සේවයේ අනෙක් ආයතන ප්‍රධානියෙකුට ලැබෙන දීමනාවල - දුරකථන දීමනාවල - ප්‍රමාණය සම්බන්ධයෙන් දීර්ඝ කාලයක් තිස්සේ ඉල්ලීම් ඉදිරිපත් කර තිබෙනවා. මේක මාණ්ඩලික සේවයේ තනතුරක් නිසා විදුහල්පති සේවයටත් යම්කිසි ආකාරයකට දීමනාවක් ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියගේ පැත්තෙන් සාකච්ඡාවක් තිබෙනවාද, මැදිහත්වීමක් තිබෙනවා ද කියලා මම දැන ගන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ඒ ගැන සාකච්ඡා කරමින් යනවා, ගරු කථානායකතුමනි. විදුහල්පති සංගම් විසින් එවැනි ඉල්ලීම් ඉදිරිපත් කර තිබෙනවා. අපි ඒ ඉල්ලීම් පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

සමඟ සාකච්ඡා කරමින් සිටිනවා. ඒ අනුව ලැබෙන ප්‍රතිචාර මත එම ඉල්ලීම් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන්න පුළුවන් වුණොත්, ඒ විධියට ක්‍රියාත්මක කරන්න අපි තීරණය කරලා තිබෙනවා. අපි මේ වෙනකොට එම සාකච්ඡාව ආරම්භ කරලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 10 -1839/2026- (1), ගරු නිතිඥ රවුෆ් හකීම් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 2 -107/2024- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, මෙය දීර්ඝ ප්‍රශ්නයක් නිසා මට තවම පිළිතුර ලැබුණේ නැහැ. එම නිසා ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මඩකලපුව ශික්ෂණ රෝහල: උපකරණ සහ පහසුකම් හිඟය

### மட்டக்களப்பு போதனா வைத்தியசாலை: உபகரணங்கள் மற்றும் வசதிகள் பற்றாக்குறை

### BATTICALOA TEACHING HOSPITAL: SHORTAGE OF EQUIPMENT AND FACILITIES

355/2024

**4. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் சார்பாக)
(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මඩකලපුව ශික්ෂණ රෝහල ආසන්න වශයෙන් මිලියන 1.78කට අධික ජනතාවකට සේවය සලසන බවත්;

(ii) එම රෝහලේ ප්‍රමාණවත් උපකරණ/පහසුකම් නොමැති බැවින් රෝගීන් දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ පා සිටින බවත්;

(iii) එම රෝහලේ චුම්බක අනුනාද රූපකරණ ස්කෑනරය - Magnetic Resonance Imaging - MRI—Scanner, හෘද කැතීටර්කරණ රසායනාගාරය - Cardiac Catheterization Laboratory - Cath Lab, CT ස්කෑන් පරීක්ෂණ - Computed Tomography - CT - Scanner - සහ Brachytherapy Unit වැනි පහසුකම්/උපකරණ නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) එසේ නම්, එම රෝහලට අවශ්‍ය උපකරණ/පහසුකම් ඉතා කඩිනමින් ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடாக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு போதனா வைத்தியசாலை அண்ணளவாக 1.78 மில்லியனுக்கும் அதிகமான மக்களுக்குச் சேவையாற்றி வருவதையும்;

(ii) அந்த வைத்தியசாலையில் போதிய உபகர ணங்கள்/வசதிகள் இல்லாததால் நோயாளர்கள் பாரிய சிரமங்களை எதிர்கொண்டு இருப் பதையும்;

(iii) மேற்படி வைத்தியசாலையில் காந்த நாடி அதிர்வு உருக்காட்சி நுணுகிநோக்கி - Magnetic Resonance Imaging - MRI - Scanner, இதய அழுத்த அளவீட்டு ஆய்வுக்கூடம் - Cardiac Catheterization Laboratory - Cath Lab -, கணிப்பொறி ஊடுகதிர் உள்தளப் படமுறை பரிசோதனை -Computed Tomography - CT - Scanner மற்றும் உள்கதிரியக்க சிகிச்சைப் பிரிவு - Brachytherapy Unit - போன்ற வசதிகள் / உபகரணங்கள் இல்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) அவ்வாறாயின், அந்த வைத்தியசாலைக்குத் தேவை யான உபகரணங்கள்/ வசதிகளை மிக விரைவில் வழங்க நடவடிக்கை எடுக்கப்படுமா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Is he aware that -

(i) the Batticaloa Teaching Hospital provides services to approximately more than 1.78 million people;

(ii) patients are facing severe difficulties due to the lack of adequate equipment/facilities in the aforesaid hospital; and

(iii) the aforesaid hospital does not have facilities/equipment such as Magnetic Resonance Imaging - MRI - Scanner, Cardiac Catheterization Laboratory - Cath Lab, Computed Tomography - CT - Scanner and a Brachytherapy Unit?

(b) If so, will he inform this House whether steps will be taken to provide the necessary equipment/ facilities to the aforesaid hospital as soon as possible?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதார பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ඔව්.

මඩකලපුව ශික්ෂණ රෝහල නැගෙනහිර පළාතට මෙන්ම බදුල්ල, පොළොන්නරුව හා මොනරාගල වැනි ආසන්න දිස්ත්‍රික්කවල ජනතාවටද සෞඛ්‍ය සේවාවන් සපයනු ලැබේ.

(ii) රෝහලේ දැනට හිඟව පවතින උපකරණ/පහසුකම් සේවා ආසන්න රෝහල්වලින් සපයා ගැනීමට රෝගීන් යොමු කිරීම සිදු කරන අතර හිඟ උපකරණ ලබා ගැනීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු දැනටමත් සිදු කරමින් පවතී.

(iii) 1. MRI Scanner - MRI Scanner යන්ත්‍රයක් ලබාගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භකර ඇති අතර, මෙම වසර තුළ එම යන්ත්‍රය ලබා ගැනීමේ හැකියාව පවතී.

2. CT Scanner - රෝහලේ දැනට CT Scanner යන්ත්‍රයක් ඇත.

3. Cath Lab - මීට අදාළ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති අතර, මේ වනවිට ලංසු ඇගයීම් කමිටු වාර්තාව සකස් කරමින් පවතී.

4. Brachytherapy Unit - ADB ව්‍යාපෘතිය මඟින් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.

(ආ) පවත්නා මූල්‍ය ප්‍රතිපාදන අනුව අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා වන ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) පැන නොනඟී.

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව: 2020 සිට අතිකාල දීමනා සඳහා වැය කළ මුදල

சிறைச்சாலைகள் திணைக்களம்: 2020இலிருந்து மேலதிக நேர கொடுப்பனவுகளுக்காகச் செலவிடப்பட்ட தொகை

DEPARTMENT OF PRISONS: MONEY SPENT ON OVERTIME SINCE 2020

565/2025

**5. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහණ බණ්ඩාර මහතා වෙනුවට)**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரோஹண பண்டார சார்பாக)

(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. Rohana Bandara)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් සේවක වැටුප් සහ අනෙකුත් දීමනාවලට අමතරව අතිකාල දීමනා ගෙවීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මුදල ඉහළ ගොස් තිබේ නම්, ඒ සඳහා බලපාන ලද සාධක කවරේද;

(iii) 2023.01.27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛය මඟින් අතිකාල දීමනා ගෙවීම දැඩි ලෙස පාලනය කර තිබූ තත්ත්වයක් තුළ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අතිකාල දීමනා ගෙවීම සඳහා මෙතරම් මුදල් ප්‍රමාණයක් වැය කිරීම සම්බන්ධයෙන් ස්ථාවරය කවරේද;

(iv) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අතිකාල දීමනා ගෙවීම පාලනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2020ஆம் ஆண்டு முதல் இற்றைவரை சிறைச்சாலைகள் திணைக்களத்தால் சம்பளம் மற்றும் ஏனைய கொடுப்பனவுகளுக்கு மேலதிகமாக, மேலதிக நேர கொடுப்பனவுகளைச் செலுத்துவதற்காகச் செலவிடப்பட்ட தொகை ஆண்டு வாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) அந்தத் தொகை அதிகரித்திருப்பின், அதனைப் பாதிக்கும் காரணிகள் யாவை என்பதையும்;

(iii) 2023.01.27ஆம் திகதிய 01/2023ஆம் இலக்க வரவு செலவுத்திட்ட சுற்றுநிருபத்தின் பிரகாரம், மேலதிக நேர கொடுப்பனவுகளைச் செலுத்துவதானது கடுமையாகக் கட்டுப்படுத்தப்பட்டிருந்த நிலையில் சிறைச்சாலைகள் திணைக்களத்தின் மேலதிக நேர கொடுப்பனவுகளைச் செலுத்துவதற்காக இந்த அளவான தொகை செலவிடப்பட்டிருப்பது பற்றிய நிலைப்பாடு யாது என்பதையும்;

(iv) சிறைச்சாலைகள் திணைக்களத்தில் மேலதிக நேர கொடுப்பனவுகள் செலுத்துவதைக் கட்டுப்படுத்துவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House -

(i) the amount of money spent by the Department of Prisons on overtime allowances, in addition to salaries and other emoluments from 2020 to date, separately for each year;

(ii) if the said amount has increased, the factors that have contributed to such an increase;

(iii) the stance regarding the spending of such a large amount of money on overtime allowances by the Department of Prisons in a situation where the payment of overtime allowances was strictly regulated under Budget Circular No. 01/2023 dated 27.01.2023; and

(iv) the measures that will be taken to regulate the payment of overtime allowances in the Department of Prisons?

(b) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2020 වර්ෂයේ ජනවාරි 01 සිට 2025 දෙසැම්බර් 31 දක්වා 1002 වැය විෂය යටතේ අතිකාල වියදම් වාර්තාව

| අනු අංකය | වර්ෂය | වාර්ෂික ප්‍රතිපාදනය (රු) | වාර්ෂික වියදම (රු) | ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණය (රු) |
|---|---|---|---|---|
| 01 | 2020 | 804,895,000.00 | 785,115,144.60 | 19,779,855.40 |
| 02 | 2021 | 900,000,000.00 | 806,246,052.82 | 93,753,947.18 |
| 03 | 2022 | 888,240,000.00 | 875,597,350.44 | 12,642,649.56 |
| 04 | 2023 | 1,015,000,000.00 | 982,351,308.34 | 32,648,691.66 |
| 05 | 2024 | 1,349,000,000.00 | 1,346,083,274.46 | 2,916,725.54 |
| 06 | 2025 | 1,940,000,000.00 | 1,912,486,606.19 | 27,513,393.81 |

(ii) 2020 වර්ෂයේ සිට මේ දක්වා බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් අතිකාල දීමනා ගෙවීම සඳහා වැය කරන ලද මුදල වසරින් වසර ඉහළ යාමට බලපාන ලද සාධක කිහිපයක් පවතින බව නිරීක්ෂණය වේ.

- ශ්‍රී ලංකාවේ වර්තමාන බන්ධනාගාර පද්ධතියට කොළඹ පිහිටි බන්ධනාගාර මූලස්ථානය යටතේ පාලනය වන ආවෘත බන්ධනාගාර 04ක්, රක්ෂිත බන්ධනාගාර 18ක්, වැඩ කඳවුරු 10ක්, එළිමහන් සිරකඳවුරු 02ක්, තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථාන 02ක්, තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල 01ක්, බන්ධනාගාර සිරි මැදිරි 24ක්, පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානය යටතේ වූ නිලධාරි පුහුණු පාසල යනාදී වශයෙන් සමස්ත දිවයිනම ආවරණය වන පරිදි ආයතන ජාලයකින් සමන්විත වේ.

- ජාතික ආරක්ෂාව සම්බන්ධව වගකිව යුතු රාජ්‍ය ආයතනයක් වීම හේතුවෙන් වසරේ දින 365 පුරාම හා දවසේ පැය 24 පුරාම සක්‍රියව රැඳවියන්ගේ ආරක්ෂාව හා පුනරුත්ථාපනය සඳහා මෙහෙයුම් කටයුතු ක්‍රියාශීලී හා අඛණ්ඩතාවයකින් යුතුව රාජකාරි ඉටු කිරීම සිදු කෙරේ.

- දැනට සමස්ත බන්ධනාගාර පද්ධතිය තුළම රැඳවිය හැකි සංඛ්‍යාව 11,000ක් පමණ වුවත් මේ වනවිට රැඳවියන් 40,000ක පමණ ප්‍රමාණයක් රඳවා සිටීම තුළින් නිලධාරීන්ගේ අමතර රාජකාරි ප්‍රමාණය ඉහළ යාම. (එනම් දෛනිකව සිරකරුවන්/සැකකරුවන් අධිකරණ සඳහා ඉදිරිපත් කිරීම, රෝහල් සායන සඳහා ඉදිරිපත් කිරීම හා ආයතන අතර සිරකරුවන්/සැකකරුවන් මාරු කිරීම වැනි රාජකාරි රාශියක් ඉටු කිරීමට පැවතීම)

- බන්ධනාගාර නිලධාරීන්ගේ වැටුප් අනිකුත් රාජ්‍ය නිලධාරීන්ට වඩා අඩුවීම හේතුවෙන් සේවය අතහැර යෑම, විදේශ ගතවීම, විශ්‍රාම ගැනීම සිදුවන අතර දිවයින පුරා අධිකරණ වැඩිවීම මඟින් එම අධිකරණ රාජකාරි සඳහා නිලධාරීන් යෙදවීමට සිදුවීම යන කරුණු හේතුවෙන් නිලධාරීන් අඛණ්ඩ සේවයේ යෙදවීම මත ඔවුන්ට අතිකාල ගෙවීම් කිරීමට සිදු වී තිබේ. බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා අනුමත සමස්ත නිලධාරීන් සංඛ්‍යාව 7,867 වන නමුත් දැනට සිටින නිලධාරි සංඛ්‍යාව 5,378ක් පමණි. නමුත් එම පිරිස අනුමත සියලු නිලධාරීන් විසින් සිදුකරන ඉහත සඳහන් කාර්යයන් සිදු කරනු ලබයි.

- එසේම රාජ්‍ය සේවක වැටුප් වැඩිවීම මත අතිකාල පැයක් සඳහා ගෙවන මුදල් ප්‍රමාණය (රේට්) වැඩිවීම වැනි හේතු ගණනාවක් මත අතිකාල දීමනා සඳහා ගෙවන මුදල ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය වේ.

(iii) අතිකාල දීමනා ගෙවීම් කළමනාකරණය කිරීමට කටයුතු කළ යුතු බව අපගේ ස්ථාවරයයි.

(iv)
- බන්ධනාගාර සඳහා පවතින අනුමත පුරප්පාඩු සඳහා නව නිලධාරීන් බඳවා ගැනීම. (දැනටමත් බඳවාගැනීම් සිදුකරමින් පවතී)

- සිරකරුවන් අධිකරණවලට රැගෙන යාම වෙනුවට බන්ධනාගාරය තුළ සිටියදී ම VIRTUAL COURT පෙනී සිටීමේ ක්‍රමය ඇති කිරීම.

- පුනරුත්ථාපන මධ්‍යස්ථාන ඉදිකර සිරකරුවන්/ සැකකරුවන් පුනරුත්ථාපනය කිරීම තුළින් නැවත නැවත බන්ධනාගාරගත වීම අවම කිරීමට පියවර ගැනීම.

- රස පරීක්ෂණ වාර්තා ලබා දීම කඩිනම් කිරීමට පියවර ගැනීම සහ ප්‍රජා විශෝධනය සඳහා යොමු කරන සංඛ්‍යාව තවදුරටත් ඉහළ නැංවීම මඟින් අධික තදබදය අවම කිරීම

යනාදිය අතිකාල දීමනා සීමා කිරීමට ගන්නා ක්‍රියාමාර්ග ලෙස පෙන්වා දිය හැකියි.

(ආ) අදාළ නොවේ.

## පොළොන්නරුව, පලුගස්දමන මහා විද්‍යාලයේ ශ්‍රවණාගාරය: වත්මන් තත්ත්වය
## பொலன்னறுவை, பலுகஸ்தமன மகா வித்தியாலயத்தில் கேட்போர்கூடம்: தற்போதைய நிலைமை
## AUDITORIUM AT PALUGASDAMANA MAHA VIDYALAYA, POLONNARUWA: CURRENT STATUS

629/2025

**6. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු කිංස් නෙල්සන් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு கிங்ஸ் நெல்சன் சார்பாக)
(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. Kins Nelson)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ `පලුගස්දමන මහා විද්‍යාලය' නමින් රජයේ පාසලක් තිබෙන බව දන්නේද;

(ii) එම පාසලේ ශ්‍රවණාගාරයක් ඉදිකිරීම සඳහා මුල්ගල තබන ලද දිනය කවරේද;

(iii) එම ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා මේ වනවිට වැය කර ඇති මුදල කොපමණද;

(iv) මේ වනවිට එම ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් නවතා දමා ඇති බව දන්නේද;

(v) ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) பொலன்னறுவை மாவட்டத்தில் "பலுகஸ்தமன மகா வித்தியாலயம்" என்ற பெயரில் அரசாங்கப் பாடசாலையொன்று உள்ளதென்பதை அறிவாரா என்பதையும்;

(ii) அந்தப் பாடசாலையில் கேட்போர் கூட மொன்றை நிர்மாணிப்பதற்காக அடிக்கல் நாட்டப்பட்ட திகதி யாது என்பதையும்;

(iii) அந்தக் கேட்போர் கூடத்தை நிர்மாணிப்பதற்காக இதுவரை செலவிடப்பட்டுள்ள பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iv) இன்றளவில் அந்தக் கேட்போர் கூடத்தின் நிர்மாணப் பணிகள் நிறுத்தப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(v) இவ்விடயம் தொடர்பாக மேற்கொள்ளப்பட விருக்கும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether she is aware that there is a government school in the Polonnaruwa District named "Palugasdamana Maha Vidyalaya";

(ii) the date on which the foundation stone was laid for the construction of an auditorium in the school concerned;

(iii) the amount that has been spent by now on the construction of the auditorium;

(iv) whether she is aware that the construction of the auditorium has been stopped at present; and

(v) the actions that will be taken in this regard?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

පොළොන්නරුව අධ්‍යාපන කොට්ඨාසය තුළ මෙම විද්‍යාලය පිහිටා ඇත.

(ii) 2017.04.05 දින ව්‍යාපෘතිය සඳහා මුල් ගල තබා වැඩ ආරම්භ කර ඇත.

(iii) මේ සඳහා රුපියල් මිලියන 100 (වැට් රහිත) අත්තිකාරම් මුදලක් ගෙවා ඇත. ඉන් රුපියල් මිලියන 92ක කළ වැඩ සඳහා බිල්පත් ඉදිරිපත් කර ඇත.

(iv) ඔව්.

මෙම ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් මිලියන 542ක් පමණ වන අතර, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මඟින් 2017 වර්ෂයේ රුපියල් මිලියන 120ක්ද 2018 වර්ෂයේදී රුපියල් මිලියන 5ක් ලෙසද මුදල් වෙන්කර තිබූ අතර, එම මුදලින් වැඩ ආරම්භ කර තිබුණි. ඉන්පසු 2018 වර්ෂයේදී උතුරු මැද පළාත් සභාව විසුරුවා හැරීමත් ඉන් අනතුරුව රට පුරා ඇති වූ කොවිඩ් වසංගතය හා ආර්ථික අර්බුදය හේතුවෙන් මම ව්‍යාපෘතිය සඳහා මුදල් වෙන්කර ගැනීමේ දුෂ්කරතාවන් නිසා ව්‍යාපෘතියේ වැඩකටයුතු ඇණහිට ඇත.

(v) මෙම ව්‍යාපෘතිය ඇණහිටීම හේතුවෙන් ඒ සඳහා අවධානය යොමුකොට ඇති උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් මෙවැනි රංග ශාලාවක් මෙම පාසලට අවශ්‍ය වන්නේද යන්න ගැටලු සහගත මෙන්ම ඒ සඳහා ප්‍රතිපාදන සලසා ගැනීම ද ගැටලුවක් වී ඇති හෙයින් ව්‍යාපෘතියේ මෙතෙක් ඉටු කර ඇති වැඩ කොටස්වලින් ඵලදායී කටයුත්තක් සඳහා භාවිතයට ගත හැකි වන ලෙස අවශ්‍යසැලසුම් සකස් කිරීමට උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් වෙත උපදෙස් ලබා දී ඇත.

(ආ) අදාළ නොවේ.

## 2025 නොවැම්බර් මාසයේ ඇති වූ සුළි කුණාටුවෙන් හානියට පත් රජයේ පාසල්: මහනුවර දිස්ත්‍රික්කය
2025 நவம்பரில் சூறாவளி காரணமாக சேதமடைந்த அரச பாடசாலைகள்: கண்டி மாவட்டம்
GOVERNMENT SCHOOLS DAMAGED BY CYCLONE IN NOVEMBER, 2025: KANDY DISTRICT

1839/2026

**10. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රවුෆ් හකීම් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரஊப் ஹகீம் சார்பாக)
(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. Rauff Hakeem)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසුගිය නොවැම්බර් මාසයේදී ඇතිවූ ගංවතුර ගැලීම්, නාය යෑම් සහ සුළි කුණාටුවෙන් සම්පූර්ණයෙන් හානියට පත් මහනුවර දිස්ත්‍රික්කයේ රජයේ පාසල් කවරේද;

(ii) එම සිදුවීම් හේතුවෙන් අර්ධ ලෙස හානියට පත් පාසල් කවරේද;

(iii) එම පාසල්වල ඉගෙනුම ලබන සිසුන්, ගුරුවරුන් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව එක් එක් අධ්‍යාපන කලාප මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පාසල් අතරින් ඉදිරියේදී නාය යාමේ අවදානමට ලක්විය හැකි බවට හඳුනාගෙන ඇති පාසල් කවරේද;

(v) එම පාසල් වෙනත් ස්ථානවල ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගෙන තිබේද;

(vi) එසේ නම්, අවදානම් සහිත ප්‍රදේශවල පිහිටා ඇති පාසල් අතරින් වෙනත් ආරක්ෂිත ස්ථානවල ස්ථාපිත කිරීම සඳහා නිර්දේශ කර ඇති පාසල් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த நவம்பர் மாதம் ஏற்பட்ட வெள்ளம், மண்சரிவு மற்றும் சூறாவளி காரணமாக முற்றாகச் சேதமடைந்துள்ள கண்டி மாவட்ட அரச பாடசாலைகள் யாவை;

(ii) மேற்படி சம்பவம் காரணமாக பகுதியளவில் சேதமடைந்துள்ள பாடசாலைகள் யாவை;

(iii) மேற்படி பாடசாலைகளில் கல்வி பயிலும் மாணவர்கள், ஆசிரியர்கள் மற்றும் கல்விசாரா பணியாட்டொகுதி எண்ணிக்கை ஒவ்வொரு கல்வி வலய ரீதியாக வெவ்வேறாக யாது;

(iv) மேற்படி பாடசாலைகளில் எதிர்காலத்தில் மண்சரிவு அபாயத்துக்கு உட்படலாமென இனங் காணப்பட்டுள்ள பாடசாலைகள் யாவை;

(v) மேற்படி பாடசாலைகளை வேறு இடங்களில் தாபிப்பது தொடர்பாக கொள்கைசார் தீர்மானம் மேற்கொள்ளப்பட்டுள்ளதா;

(vi) ஆமெனில், அபாய அச்சுறுத்தல் நிலவும் பிரதேசங்களிலுள்ள பாடசாலைகளில், வேறு பாதுகாப்பான இடங்களில் தாபிக்கச் சிபாரிசு செய்யப்பட்டுள்ள பாடசாலைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the names of the government schools in the Kandy District that were completely damaged by the floods, landslides and the cyclone that occurred last November;

(ii) the names of the schools that were partially damaged due to those incidents ;

(iii) the number of students studying in the aforesaid schools along with the number of teachers and non-academic staff serving therein, separately, at each education zone level;

(iv) the names of the schools, out of the schools mentioned above, that have been identified as being at risk of landslides in the future;

(v) whether policy decisions have been taken regarding the establishment of the aforesaid schools in other locations; and

(vi) if so, the names of the schools, out of the schools located in vulnerable areas, that have been recommended for establishment in other safe locations?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම සභාගත* කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පසුගිය නොවැම්බර් මාසයේදී ඇති වූ ගංවතුර ගැලීම්, නාය යෑම් සහ සුළි කුණාටුවලින් මහනුවර දිස්ත්‍රික්කයේ සම්පූර්ණයෙන් හානියට පත් රජයේ පාසල් නොමැත.

(ii) අර්ධ ලෙස හානියට පත් මහනුවර දිස්ත්‍රික්කයේ රජයේ පාසල් පහත ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 01

මහනුවර දිස්ත්‍රික්කයේ අර්ධ හානියට පත් පාසල් සංඛ්‍යාව 57කි.
එම පාසල් ලේඛනය පහත පරිදි වේ.

| අනු අංකය | කලාපය | පාසල |
|---|---|---|
| 1 | දෙනුවර | ස්වර්ණජෝති ජාතික පාසල |
| 2 | දෙනුවර | අල් අක්ෂා මහ විදුහල |
| 3 | දෙනුවර | ශ්‍රී සුසීල මහ විදුහල |
| 4 | දෙනුවර | විමලධර්මසූරිය විදුහල |
| 5 | දෙනුවර | උඩවෙල කනිටු විදුහල |
| 6 | දෙනුවර | හේන්දෙනිය මුස්ලිම් විදුහල |
| 7 | දෙනුවර | ශ්‍රී ධීරානන්ද මධ්‍ය මහා විදුහල |
| 8 | දෙනුවර | ශ්‍රී පඤ්ඤාරතන මහ විද්‍යාලය |
| 9 | කටුගස්තොට | ජමාලියා මහ විදුහල |
| 10 | කටුගස්තොට | පූජාපිටිය ප්‍රාථමික විදුහල |
| 11 | කටුගස්තොට | ගල්කන්ද කනිටු විදුහල |
| 12 | කටුගස්තොට | ඉනිගල මුස්ලිම් විදුහල |
| 13 | කටුගස්තොට | මොළගොඩ ශ්‍රී පියදස්සි විදුහල |
| 14 | කටුගස්තොට | අකුරණ අසාර් මහ විදුහල |
| 15 | කටුගස්තොට | පල්කුඹුර මුස්ලිම් මහ විදුහල |
| 16 | කටුගස්තොට | තෙළඹුගහවත්ත මුස්ලිම් ප්‍රාථමික විදුහල |
| 17 | වත්තේගම | අලකොල්ල ප්‍රාථමික විදුහල |
| 18 | වත්තේගම | කෙන්ගල්ල දෙමළ විදුහල |
| 20 | වත්තේගම | උඩගම මහ විදුහල |
| 21 | වත්තේගම | ලියන්ගස්වගුර ප්‍රාථමික විදුහල |
| 22 | වත්තේගම | වත්තේගම මධ්‍ය මහා විදුහල |
| 23 | වත්තේගම | භාරතී දෙමළ විදුහල |
| 24 | වත්තේගම | මහවැලි ද්විතියික විදුහල |
| 25 | වත්තේගම | වළල ඒ රත්නායක මහා විද්‍යාලය |
| 26 | වත්තේගම | එස.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක විදුහල |
| 27 | වත්තේගම | මාවුස්සාව දෙමළ විදුහල |
| 28 | ගම්පොල | බරණගල දෙමළ විදුහල |
| 29 | ගම්පොළ | පරගල සිංහල විදුහල |
| 31 | ගම්පොළ | පල්ලෙදෙල්තොට කනිටු විදුහල |
| 32 | ගම්පොළ | අල් හික්මා විදුහල |
| 33 | ගම්පොළ | ගම්පොළ මුස්ලිම් විදුහල |
| 34 | ගම්පොල | ජිනරාජ බාලිකා විදුහල |
| 35 | ගම්පොළ | පටිතලාව කනිටු විදුහල |
| 36 | ගම්පොළ | අල්මිනා මුස්ලිම් විදුහල |
| 37 | ගම්පොළ | රජතලාව කනිටු විදුහල |
| 38 | මහනුවර | තලාතුඔය ප්‍රාථමික විදුහල |
| 39 | මහනුවර | මහමැදගම මහ විදුහල |
| 41 | මහනුවර | ශ්‍රී ගයත්‍රි දෙමළ විදුහල |
| 42 | මහනුවර | ධර්මරාජ විද්‍යාලය |
| 43 | මහනුවර | කලෛයිමගල් දෙමළ විදුහල |
| 44 | මහනුවර | රම්මුන්ගොඩ විදුහල |
| 45 | මහනුවර | අල් හිලාල් මුස්ලිම් විදුහල |
| 46 | මහනුවර | විද්‍යාර්ථ විද්‍යාලය |
| 47 | මහනුවර | පේරාදෙණිය හින්දු විදුහල |
| 48 | මහනුවර | පුෂ්පදාන බාලිකා විදුහල |
| 49 | තෙල්දෙනිය | මැටිදෙනිය ප්‍රාථමික විදුහල |
| 50 | තෙල්දෙනිය | උඩගලදෙබොක්ක කනිටු විදුහල |
| 52 | තෙල්දෙනිය | කලවල ප්‍රාතමික විදුහල |
| 53 | තෙල්දෙනිය | මිනුවන්ගමුව ප්‍රාථමික විදුහල |
| 54 | තෙල්දෙනිය | බඹරබැද්ද ප්‍රාථමික විදුහල |
| 55 | තෙල්දෙනිය | රංගල ප්‍රාථමික විදුහල |
| 56 | තෙල්දෙණිය | නාමගල් දෙමළ විදුහල |
| 57 | තෙල්දෙණිය | නමදගල ප්‍රාථමික විදුහල |

(iii) එම පාසල්වල ඉගෙනුම ලබන සිසුන්, ගුරුවරුන් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව එක් එක් අධ්‍යාපන කලාප මට්ටමින් වෙන් වෙන් වශයෙන් පහත ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 02

එම පාසල්වල ඉගෙනුම ලබන සිසුන්, ගුරුවරුන්, අනධ්‍යයන කාර්යමණ්ඩල සංඛ්‍යාව පහත පරිදි වේ.

| අනු අංකය | කලාපය | පාසල | සිසුන් ගණන | ගුරුවරුන් ගණන | අනධ්‍යයන සේවකයන් ගණන |
|---|---|---|---|---|---|
| 1 | දෙනුවර | ස්වර්ණජෝති ජාතික පාසල | 2357 | 105 | 35 |
| 2 | දෙනුවර | අල් අක්ෂා මහ විදුහල | 151 | 16 | 3 |
| 3 | දෙනුවර | ශ්‍රී සුසීල මහ විදුහල | 62 | 15 | 3 |
| 4 | දෙනුවර | විමලධර්මසූරිය විදුහල | 130 | 22 | 8 |
| 5 | දෙනුවර | උඩවෙල කනිටු විදුහල | 115 | 18 | 2 |
| 6 | දෙනුවර | හේන්දෙනිය මුස්ලිම් විදුහල | 53 | 10 | 4 |
| 7 | දෙනුවර | ශ්‍රී ධීරානන්ද මධ්‍ය මහා විදුහල | 2291 | 104 | 10 |
| 8 | දෙනුවර | ශ්‍රී පඤ්ඤාරතන මහ විද්‍යාලය | 1020 | 61 | 11 |
| | | **එකතුව** | **6179** | **351** | **76** |
| 9 | කටුගස්තොට | ජමාලියා මහ විදුහල | 346 | 19 | 3 |
| 10 | කටුගස්තොට | පූජාපිටිය ප්‍රාථමික විදුහල | 651 | 24 | 5 |
| 11 | කටුගස්තොට | ගල්කන්ද කනිටු විදුහල | 112 | 16 | 4 |
| 12 | කටුගස්තොට | ඉනිගල මුස්ලිම් විදුහල | 268 | 26 | 3 |
| 13 | කටුගස්තොට | මොළගොඩ ශ්‍රී පියදස්සි විදුහල | 724 | 39 | 12 |
| 14 | කටුගස්තොට | අකුරණ අසාර් මහ විදුහල | 2049 | 70 | 22 |
| 15 | කටුගස්තොට | පල්කුඹුර මුස්ලිම් මහ විදුහල | 116 | 14 | 3 |
| 16 | කටුගස්තොට | තෙළඹුගහවත්ත මුස්ලිම් ප්‍රාථමික විදුහල | 457 | 17 | 4 |
| | | **එකතුව** | **4723** | **225** | **56** |
| 17 | වත්තේගම | අලකොල්ල ප්‍රාථමික විදුහල | 83 | 4 | 0 |
| 18 | වත්තේගම | කෙන්ගල්ල දෙමළ විදුහල | 412 | 33 | 4 |
| 20 | වත්තේගම | උඩගම මහ විදුහල | 193 | 19 | 7 |
| 21 | වත්තේගම | ලියන්ගස්වගුර ප්‍රාථමික විදුහල | 601 | 32 | 3 |
| 22 | වත්තේගම | වත්තේගම මධ්‍ය මහා විදුහල | 2741 | 64 | 6 |
| 23 | වත්තේගම | භාරතී දෙමළ විදුහල | 397 | 36 | 2 |
| 24 | වත්තේගම | මහවැලි ද්විතියික විදුහල | 536 | 39 | 6 |
| 25 | වත්තේගම | වළල ඒ රත්නායක මහා විද්‍යාලය | 1593 | 74 | 21 |
| 26 | වත්තේගම | එස.ඩබ.ආර්.ඩී.බණ්ඩාරනායක විදුහල | 816 | 87 | 24 |
| 27 | වත්තේගම | මාවුස්සාව දෙමළ විදුහල | 70 | 6 | 0 |
| | | **එකතුව** | **7442** | **394** | **73** |
| 28 | ගම්පොල | බරණගල දෙමළ විදුහල | 160 | 13 | 2 |
| 29 | ගම්පොළ | පරගල සිංහල විදුහල | 66 | 2 | - |
| 31 | ගම්පොළ | පල්ලෙදෙල්තොට කනිටු විදුහල | 80 | 11 | 2 |
| 32 | ගම්පොළ | අල් හික්මා විදුහල | 299 | 21 | 2 |
| 33 | ගම්පොළ | ගම්පොළ මුස්ලිම් විදුහල | 601 | 32 | 3 |
| 34 | ගම්පොල | ජිනරාජ බාලිකා විදුහල | 2173 | 85 | 13 |
| 35 | ගම්පොළ | පටිතලාව කනිටු විදුහල | 63 | 8 | 6 |
| 36 | ගම්පොළ | අල්මිනා මුස්ලිම් විදුහල | 84 | 23 | 2 |
| 37 | ගම්පොළ | රජතලාව කනිටු විදුහල | 84 | 6 | 1 |
| | | **එකතුව** | **3610** | **201** | **31** |
| 38 | මහනුවර | තලාතුඔය ප්‍රාථමික විදුහල | 797 | 26 | 12 |
| 39 | මහනුවර | මහමැදගම මහ විදුහල | 155 | 16 | 3 |
| 41 | මහනුවර | ශ්‍රී ගයත්‍රී දෙමළ විදුහල | 147 | 5 | 1 |
| 42 | මහනුවර | ධර්මරාජ විද්‍යාලය | 4664 | 209 | 44 |
| 43 | මහනුවර | කලෛයිමගල් දෙමළ විදුහල | 122 | 21 | 0 |
| 44 | මහනුවර | රම්මුන්ගොඩ විදුහල | 61 | 16 | 1 |
| 45 | මහනුවර | අල් හිලාල් මුස්ලිම් විදුහල | 59 | 14 | 1 |
| 46 | මහනුවර | විද්‍යාර්ථ විද්‍යාලය | 2886 | 109 | 11 |
| 47 | මහනුවර | පේරාදෙණිය හින්දු විදුහල | 238 | 25 | - |
| 48 | මහනුවර | පුෂ්පදාන බාලිකා විදුහල | 2254 | 161 | 10 |
| | | **එකතුව** | **11383** | **602** | **83** |
| 49 | තෙල්දෙනිය | මැටිදෙනිය ප්‍රාථමික විදුහල | 32 | 3 | 0 |
| 50 | තෙල්දෙනිය | උඩගලදෙබොක්ක කනිටු විදුහල | 13 | 3 | 1 |
| 52 | තෙල්දෙනිය | කලවල ප්‍රාතමික විදුහල | 11 | 1 | 1 |
| 53 | තෙල්දෙනිය | මිනුවන්ගමුව ප්‍රාථමික විදුහල | 12 | 2 | 1 |
| 54 | තෙල්දෙනිය | බඹරබැද්ද ප්‍රාථමික විදුහල | 252 | 17 | 1 |
| 55 | තෙල්දෙනිය | රංගල ප්‍රාථමික විදුහල | 92 | 7 | 1 |
| 56 | තෙල්දෙණිය | නාමගල් දෙමළ විදුහල | 98 | 11 | 2 |
| 57 | තෙල්දෙණිය | නමදගල ප්‍රාථමික විදුහල | 27 | 2 | 3 |
| | | **එකතුව** | **539** | **46** | **10** |
| | | **මුළු එකතුව** | **33874** | **1819** | **329** |

(iv) එම පාසල් අතරින් ඉදිරියේදී නාය යාමේ අවදානමට ලක්විය හැකි බවට හඳුනාගෙන ඇති පාසල් පහත වගුව මඟින් දක්වා ඇත.

ඉදිරියේදී නාය යාමේ අවදානම හඳුනාගෙන ඇති පාසල් ලේඛනය.

| අනු අංකය | කලාපය | පාසල |
|---|---|---|
| 1 | දෙනුවර | ස්වර්ණජෝති ජාතික පාසල |
| 2 | දෙනුවර | අල්අක්ෂා මුස්ලිම් විදුහල |
| 3 | දෙනුවර | හේන්දෙණිය මුස්ලිම් විදුහල |
| 4 | කටුගස්තොට | ජමාලියා විදුහල |
| 5 | ගම්පොල | මොළගොඩ ශ්‍රී පියදස්සි විදුහල |
| 6 | ගම්පොල | තෙළඹුගහවත්ත මුස්ලිම් ප්‍රාථමික විදුහල |
| 7 | ගම්පොල | අල් හික්මා විදුහල |
| 8 | ගම්පොල | *පරගල සිංහල විදුහල |
| 9 | ගම්පොල | *රජතලාව කනිටු විදුහල |
| 10 | ගම්පොල | *බරණගල දෙමළ විදුහල |
| 11 | ගම්පොල | *පල්ලෙදෙල්තොට කනිටු විදුහල |
| 12 | වත්තේගම | මහවැලි ද්විතියික විදුහල |
| 13 | මහනුවර | විද්‍යාර්ථ විද්‍යාලය |
| 14 | මහනුවර | අල් හිලාල් මුස්ලිම් විදුහල |
| 15 | මහනුවර | පුෂ්පදාන බාලිකා විද්‍යාලය |
| 16 | මහනුවර | ගයත්‍රි දෙමළ විදුහල |
| 17 | මහනුවර | මහමැදගම විදුහල |
| 18 | තෙල්දෙණිය | *උඩගලදෙබොක්ක කනිටු විදුහල |
| 19 | තෙල්දෙණිය | *කලවල ප්‍රාථමික විදුහල |
| 20 | තෙල්දෙණිය | *මිනුවන්ගමුව ප්‍රාථමික විදුහල |
| 21 | තෙල්දෙණිය | *බඹරබැද්ද ප්‍රාථමික විදුහල |
| 22 | තෙල්දෙණිය | *මැටිදෙණිය ප්‍රාථමික විදුහල |
| 23 | තෙල්දෙණිය | *රංගල ප්‍රාථමික විදුහල |
| 24 | තෙල්දෙණිය | කලෛයිමගල් දෙමළ විදුහල |
| 25 | තෙල්දෙණිය | නාමගල් දෙමළ විදුහල |

සටහන - * ලකුණ යොදා ඇති පාසල් NBRO වාර්තා ඇනුව අධි අවදානම් පාසල් ලෙස ඉවත් කිරීමට නිර්දේශ කර ඇත.

(v) එම පාසල් වෙනත් ස්ථානවල ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සිදු කරමින් පවතී.

(vi) අවදානම් සහිත ප්‍රදේශවල පිහිටා ඇති පාසල් අතරින් වෙනත් ආරක්ෂිත ස්ථානවල ස්ථාපිත කිරීම සඳහා නිර්දේශ කර ඇති පාසල් පහත දක්වා ඇත.

මේ වනවිට වෙනත් ආරක්ෂිත ස්ථානවල ඉදිකිරීමට නිර්දේශ කර ඇති පාසල් පහත පරිදිය.

i. පරගල සිංහල විදුහල, ගම්පොල කලාපය
ii. අල් හික්මා විදුහල, ගම්පොල කලාපය
iii. බරණගල දෙමළ විදුහල, ගම්පොල කලාපය
iv. බඹරබැද්ද විදුහල, තෙල්දෙණිය කලාපය
v. කලෛයිමගල් දෙමළ විදුහල, තෙල්දෙණිය කලාපය
vi. නාමගල් දෙමළ විදුහල, තෙල්දෙණිය කලාපය
vii. අල් අක්ෂා විදුහල, දෙනුවර කලාපය

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
**(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)**
**(The Hon. Speaker)**

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

### 2025/2026 වී මිලදී ගැනීම
2025/2026இல் நெல் கொள்முதல்
PURCHASE OF PADDY IN 2025/2026

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ අද ප්‍රශ්නය යොමු කරන්නේ වී වගාව පිළිබඳවයි; පොරොන්දු වුණු සහතික මිල පිළිබඳවයි.

අද අපේ රටේ වී ගොවීන් වගා කටයුතු සිදු කරන්නේ ලාභ උපයන ජීවන වෘත්තියක් වශයෙන් නොව, හුදෙක් ජීවිතය රැක ගැනීම සඳහා කරන අරගළයක් වශයෙන් පමණි. වගාවට පෙර ද වගා කරන අතරතුර ද ණය බරින් මිරිකෙන ගොවියා, අස්වැන්න නෙළාගත් පසු රජය පොරොන්දු වූ සහතික මිල ලබා ගත නොහැකිව, අස්වැන්න අඩු මිලට අතරමැදියන්ට විකුණා දමයි.

මේවාට අමතරව අපි අවබෝධ කරගෙන හමාරයි, වන අලි හා මිනිස් ගැටුම නිසාත් - වන සතුන් හා මිනිස් ගැටුම නිසාත් - විශාල වශයෙන් වගා හානි සිද්ධ වෙන බව. ඒ ගැටලුවලට ඇත්ත වශයෙන්ම ගොවි ජනතාවට විසඳුමක් ලැබී නැහැ. ඒ නිසා අතිවැදගත් ප්‍රශ්නයක් හැටියට මේ කාරණා මම ඉදිරිපත් කරනවා.

1. 2025 යල කන්නයේදී රජය මිලදී ගත් සමස්ත වී ප්‍රමාණය සහ ඒ සඳහා වැය කළ මුදල කොපමණද? එම ප්‍රතිපාදන වෙන් කළේ අය වැය මඟින්ද, නැතහොත් ණය පහසුකම් හරහාද?

2. එසේ මිලදී ගත් වී තොග මේ වන විට වෙළඳපොළට නිකුත් කර තිබේද? නැතිනම් දීර්ඝකාලීනව ගබඩා කිරීම හේතුවෙන් ගුණාත්මකභාවයට හානි වීම නිසා මූල්‍ය අලාභයක් රජයට සිදුව ඇත්ද? අලාභයක් තිබෙන්නේ නම් එයට වගකිව යුත්තේ කවුද?

3. 2025/2026 මහ කන්නය සඳහා වී මිලදී ගැනීමේ රජයේ අපේක්ෂිත ඉලක්කය කොපමණද? රජය සතු ගබඩා ධාරිතාව ඒ සඳහා ප්‍රමාණවත්ද? නැතහොත්, අමතර ගබඩා පහසුකම් කුලියට ගැනීම මඟින් අතිරේක මහජන මුදලක් වැය කිරීමට රජය අපේක්ෂා කරන්නේද?

   ගරු කථානායකතුමනි, නැඟෙනහිර, රජරට බල ප්‍රදේශවල ගොයම් කපන්න පටන්ගෙන තිබෙනවා. අස්වැන්න නෙළනවා. දැන් වී මිලදී ගන්නේ, රුපියල් 70ට, 80ට. හැබැයි පොරොන්දු වුණේ, රුපියල් 120ට. ඒ වාගේම රජය ප්‍රකාශ කළා වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න කුඩා හා මධ්‍ය පරිමාණයේ මෝල්හිමියන්ට සහන ලබා දෙනවා කියලා. එය එසේ සිදුවෙනවාද, නැද්ද කියන එක අපි අහන්න කැමැතියි.

4. මේ දක්වා සත්‍ය ලෙස මිලදී ගෙන ඇති වී ප්‍රමාණය රජයේ ඉලක්කගත මිලදී ගැනීමෙන් කවර ප්‍රතිශතයක්ද? රජයේ සංඛ්‍යා ලේඛන සහ සත්‍ය මිලදී ගැනීම් අතර පරතරයක් තිබෙනවාද? මේ පිළිබඳව ගොවීන් දක්වන විරෝධතා සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය කුමක්ද?

   මොකද රජය කියනවා, වී කිලෝව රුපියල් 120 ගණනේ මිලදී ගන්නවා කියලා. හැබැයි, ගොවියාට ලැබෙන්නේ වී කිලෝවකට රුපියල් 70ක්, 80ක් වාගේ ඉතාම පහළ මිලක්. මේ පරතරය පිළිබඳව රජයේ පිළිතුර සහ විසඳුම මොකක්ද?

5. මහ කන්නයේ සහතික මිල තීරණය කිරීමේදී ගොවියාගේ සැබෑ නිෂ්පාදන වියදම ගණනය කිරීමට භාවිත කළ සූත්‍රය කුමක්ද? ගොවියාට ලාභයක් ඉතිරි නොවන මිලක් "සහතික මිල" ලෙස හැඳින්වීම ජනතාව මුළා කිරීමක් නොවේද?

   යූරියා, MOP, TSP යනාදී යෙදවුම්වල මිලත් ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම පොහොරවල, රසායනික ද්‍රව්‍යවල ගුණාත්මකභාවය පහළ ගිහිල්ලා තිබෙනවා. මේ තත්ත්වය තුළ නිෂ්පාදන වියදම ගණනය කරන්න උපයෝගී කර ගන්නා සූත්‍රය මොකක්ද සහ එයට සරිලන ආකාරයට රජය ලබා දෙන සහතික මිල කීයද?

   මොකද අපට පසුගිය දවස්වල දැනගන්න ලැබුණා අමාත්‍යවරයා කියනවා, මේ වතාවේ පොරොන්දු වුණු මිලට වී ගන්න බැහැ, රුපියල් 120 සහතික මිල ලබා දෙනකල් තව අවුරුදු දෙකක් බලාගෙන ඉන්න වෙයි කියලා. ඒකේ සත්‍යතාවක් තිබෙනවාද?

6. වර්ෂාව, රෝග හා පෝෂක ඌනතා හේතුවෙන් මහ කන්නයේ අහිමි වනු ඇතැයි අපේක්ෂිත අස්වැන්න කොපමණද?

   ඒ කියන්නේ, වර්ෂාව, රෝග හා පෝෂක ඌනතා හේතුවෙන් මහ කන්නයේ අහිමි වනු ඇතැයි අපේක්ෂිත අස්වැන්න කොපමණද කියලා ගණනය කර තිබෙනවාද?

   එම අඩුව ජාතික සහල් සැපයුමට බලපාන ආකාරය පිළිබඳව රජය ඇගැයීමක් සිදු කර තිබේද? නැතහොත්, රජයට ආහාර සුරක්ෂිතතාව පිළිබඳ සැලැස්මක් නොමැතිද?

   ගරු කථානායකතුමනි, මැද පෙරදිග උද්ගත වෙලා තිබෙන තත්ත්වයත් එක්ක අනිවාර්යයෙන්ම මේ යෙදවුම්වල මිල ඉහළ යනවා. මේ යෙදවුම්වල මිල ඉහළ යනකොට ඇත්තවශයෙන්ම පවතින මිලට වඩා ඉහළ ස්ථාවර මිලක් ගොවි ජනතාවට ලබා දිය යුතුයි. එම නිසා මේ පිළිබඳව රජය ගණනය කිරීමක් කර තිබේද කියන එක අපි අහන්න කැමැතියි.

7. මහ කන්නයේ සමස්ත අස්වැන්න දේශීය අවශ්‍යතාවට ප්‍රමාණවත් බව රජය සහතික කරන්නේද?

   "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් විශාල හානි සිද්ධ වුණා. ඇත්තවශයෙන්ම පොහොර සහනාධාරයත් ලැබුණේ අර්ධ වශයෙන්. ඒ පොහොර සහනාධාරයත් හේදිලා ගිහිල්ලා තිබෙනවා. ඇත්තවශයෙන්ම රජය අලුතින්ම ඒ සහනාධාරය ලබා දීම සිදු කරන්න ඕනෑ.

   මේ අස්වැන්නේ යම්කිසි අඩුවක් පවතින්නේ නම්, 2026 වසරේ සහල් ආනයනය කිරීමට රජය සැලසුම් කර තිබෙනවාද, එසේ නම් ආනයනය කිරීමට නියමිත සහල් වර්ග, ප්‍රමාණ සහ කාලසටහන කුමක්ද?

මේ ප්‍රශ්නය ඉතාම කාලීන ප්‍රශ්නයක්. ඒ නිසා අපි රජයෙන් අද දවසේම ප්‍රතිචාර බලාපොරොත්තු වනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් දැනුම් දීලා තිබෙනවා, මේ ප්‍රශ්නයට උත්තර ලබා දීමට කල් අවශ්‍ය බව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

අමාත්‍යාංශ නිවේදන - ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය ගරු බිමල් රත්නායක මහතා.

## අංක 2185/74 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අවලංගු කිරීම: ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## 2185/74ஆம் இலக்க அதிவிசேட வர்த்தமானி அறிவித்தலை மீளப்பெறல்: போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரினது கூற்று
## REVOCATION OF GAZETTE EXTRAORDINARY NO. 2185/74: STATEMENT BY MINISTER OF TRANSPORT, HIGHWAYS AND URBAN DEVELOPMENT

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, 2025.08.06වන දින ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. ඔව්.

යාපනය දිස්ත්‍රික්කයේ, යාපනය මහ නගර සභාව ඇතුළු නගර සභා සහ ප්‍රාදේශීය සභා 13ක් නාගරික සංවර්ධන බල ප්‍රදේශ ලෙස 2024.07.24 දින ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර ඇත. මේ තුළින් සාමාන්‍ය ජනතාව වෙත ආර්ථික බරක් පැටවීමට අදහස් නොකරන අතර, ඉදිකිරීම් විධිමත් ආකාරයට සිදු කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ලබා දෙනු ලැබේ. විශේෂයෙන් යාපනය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභා නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර, එම බලතල සියල්ලම අදාළ ප්‍රාදේශීය සභා වෙත පැවරීම විධිමත්ව සිදු කර ඇත. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේ පූර්ණ බලතල එම ප්‍රාදේශීය සභාව වෙත ලබා දී ඇති බව අවධාරණය කරමි.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් සැලසුම් අනුමත කිරීම මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කරනු ලබන බැවින්, එම කාර්යයන් කාර්යක්ෂමව හා විනිවිදභාවයෙන් සිදු වේ. තවද, නාගරික සංවර්ධන අධිකාරියේ මාර්ගගත සැලසුම් අනුමත කිරීමේ ක්‍රමවේදය මේ වන විට යාපනය දිස්ත්‍රික්කයේ සියලුම පළාත් පාලන ආයතන වෙත හඳුන්වා දී ඇති අතර, අදාළ නිලධාරීන් පුහුණු කර එම ක්‍රමවේදය සාර්ථකව ක්‍රියාත්මක වේ. මේ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මේ වන විට විශාල පිරිවැයක් දරා ඇති අතර, එම පළාත් පාලන ආයතන වෙත නොමිලයේම එම සේවා ලබා දීම සිදු කෙරේ.

ගරු කථානායකතුමනි මේ සම්බන්ධව මම වාර්තාවක් ඉදිරිපත් කරන්න කැමැතියි, ගරු මන්ත්‍රීතුමාගේ අවබෝධය සඳහා. ලංකාවේම වර්ග අඩි 9,000ට අඩු සියලු සැලසුම් අනුමත කරන්නේ ප්‍රාදේශීය සභාවලින්. උතුරු පළාතේ තිබෙනවා, ප්‍රාදේශීය සභා 36ක්. ඒ 36ම නිලධාරීන් මේ සඳහා අපි පුරුදු කරලා තිබෙනවා. UDA එකට අදාළ සියලු approvals කරන්නේ online හරහා. ඒකේ වර්ග දෙකක් තිබෙනවා. වර්ග අඩි 9,000ට වැඩි ඒවා UDA එකෙන් තමයි approve කරන්නේ. වර්ග අඩි 9,000ට අඩු ඒවා ප්‍රාදේශීය සභාවලින් කරන්නේ. ප්‍රාදේශීය සභාවල සියලු නිලධාරීන් පුරුදු කරලා තිබෙන්නේ නාගරික සංවර්ධන අධිකාරියෙන්. මොකද, ඔවුන්ට තමයි විශේෂඥතාව තිබෙන්නේ, online ක්‍රමයට මේ රාජකාරිය කරන්න.

ඒ නිසා වාර්ෂිකව ගත්තාම, ඒ online apply කරන එක වැඩි වෙලා තිබෙනවා. ඒවාට අදාළ විසඳුම් ලබා දීමත් ඉක්මන් වෙලා තිබෙනවා. ඒ වාගේම වර්ග අඩි 9,000ට වැඩි ඒවා තමයි නාගරික සංවර්ධන අධිකාරියෙන් කරන්නේ. Jaffnaවල තිබෙන UDA Office එකට ඒගොල්ලන් apply කළාම කොළඹදී ඒ කටයුත්ත ඉතා හොඳින් කරනවා. දැනට මේ කටයුත්ත ඉතාම සාර්ථකව වෙන්නේ උතුරු පළාතේ. ඒ නිසා ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයේ පළමුවන කොටසට අදාළව ඒ පිළිතුරත් මම එකතු කරනවා.

02. කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත සඳහා අදාළ පළාත් පාලන ආයතන තුළින් නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන රෙගුලාසිවලට අනුකූලව අදාළ අනුමැතීන් ලබා දීම තුළින් එම කර්මාන්තකරුවන්ට මෙන්ම අවට ජනතාවට සිදුවන පීඩාවන් වැළැක්වීමට හැකි වේ.

03. ජාතික භෞතික සැලැස්මට අනුව ප්‍රධාන බහුවිධ නගර - multimodal cities - හතරක් හඳුනාගෙන ඇති අතර, එම නගර වන්නේ, කොළඹ, හම්බන්තොට, ත්‍රිකුණාමලය හා යාපනය වේ. ඒ අනුව උතුරේ ජනතාවගේ ආර්ථික සංවර්ධනය නඟාසිටුවීමේ අරමුණින් සහ විධිමත් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමේ අරමුණින් නාගරික සංවර්ධන අධිකාරි බලප්‍රදේශ ලෙස මෙම දිස්ත්‍රික්කය ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව ආර්ථික, සමාජයීය, භෞතික හා පාරිසරික සමතුලිතතාවෙන් යුතු විධිමත් නාගරික සැලැස්මක් - Greater Jaffna Development Plan - සියලුම පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් සකස් කර ඇත. එම සැලැස්ම යාපනය දිස්ත්‍රික්කයේ සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ඉදිරිපත් කර ඒ පිළිබඳව ඔවුන්ගේ අදහස්ද ලබා ගෙන අදාළ සංශෝධන සිදු කර ඇත.

2025 මැයි 27වන දින පැවති එම සාකච්ඡාවට ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමාත් සහභාගි වෙලා ඊට අනුමැතිය ලබා දීලා තිබෙනවා.

2025 දෙසැම්බර් 26 දින පැවති යාපනය දිස්ත්‍රික්කයේ සම්බන්ධීකරණ කමිටුවේදී ද මෙයට නැවත අලුතින් අනුමැතිය අරගෙන තිබෙනවා. ඉදිරියේදී මෙම සැලැස්ම ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරමින් පවතී.

04. නාගරික සංවර්ධන අධිකාරියෙන් වර්ග අඩි 9,000ට වැඩි ගොඩනැඟිලි සඳහා පමණක් අදාළ අනුමැතීන් ලබා දෙන අතර, ඉතිරි සියලුම ගොඩනැඟිලි සැලසුම් සඳහා අදාළ පළාත් පාලන ආයතනවලින් අදාළ අනුමැතිය ලබා දෙනු ලැබේ.

මම ඒ පිළිබඳව කලින් පැහැදිලි කළා.

05. එම ගැසට් නිවේදනය අවලංගු කිරීම සිදු කරන්නේ නැත.

[ගරු බිමල් රත්නායක මහතා]

06. ඉහත පැහැදිලි කිරීම් සිදුකර ඇති ආකාරයට යාපනය දිස්ත්‍රික්කය විධිමත් නාගරික සංවර්ධනයකට අනුකූලව සිදු කිරීමට විධිමත් සංවර්ධන සැලැස්මක් අත්‍යවශ්‍ය වේ. එබැවින් එම ගැසට් නිවේදනය අවලංගු කළ නොහැකි අතර, මේ තුළින් සාමාන්‍ය ජනතාවට පීඩනයක් ඇති නොවන බව අවධාරණය කෙරේ.

ගරු කථානායකතුමනි, මීට අමතරව ගරු ජනාධිපතිතුමාගේ අය වැය යෝජනාවක් මඟින් නගර 10ක විශේෂ සංවර්ධන සැලැසුම් ඉදිරිපත් කළා. ඒ නගර 10ට උතුරු පළාතෙන් යාපනයත් අයිතියි, වවුනියාවත් අයිතියි. ඒ සඳහා මේ වසරේ රුපියල් මිලියන 250ක් අමතරවත් වෙන් කරලා තිබෙනවා. දැනට යාපනය දිස්ත්‍රික්කය තුළ SLLDC එක ගිහිල්ලා ඒ නගරය පිළිබඳව අධ්‍යයනයක් කරමින් පවතිනවා. මොකද, හදිසි වර්ෂාවකදී පවා යාපනය නගරය යට වෙනවා. ඒ, යාපනය නගරයේ තිබෙන කුඩා පොකුණු සහ කානු පද්ධති පසුගිය කාලයේදී හරියාකාරව සංවර්ධනය කර නැති නිසායි. එම නිසා ඒ සම්බන්ධව මේ දිනවල අධ්‍යයනයක් කරගෙන යනවා, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මඟින්. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, යාපනය නගරය දිගු කාලීනව සංවර්ධනය කරන්නත්. ඒ සඳහා රුපියල් මිලියන 250ක් මේ වසර වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා. ඒක තමයි, මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට පිළිතුර.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ අමාත්‍යාංශ නිවේදනය, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය ගරු ආනන්ද විජේපාල මහතා.

## රාජ්‍යය සම්බන්ධිත උල්ලංඝනයන් සම්බන්ධයෙන් යුක්තිය සහ වගවීම: මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## அரசு தொடர்புடையதாகக் கூறப்படும் மீறல்களுக்கான பொறுப்புக்கூறலும் நீதியும்: பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரினது கூற்று
## JUSTICE AND ACCOUNTABILITY FOR ALLEGED STATE-CONNECTED VIOLATIONS: STATEMENT BY MINISTER OF PUBLIC SECURITY AND PARLIAMENTARY AFFAIRS

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා විසින් 2026.03.05වන දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි. එම ප්‍රශ්නය මඟින් මීට වසර 12කට පෙර සිදු වූ සිදුවීම් කිහිපයක් සම්බන්ධයෙන් තමයි අහලා තිබෙන්නේ.

1. 2014.04.11වන දින අලුයම් කාලයේදී පදවිය පොලිස් වසමේ අංක 05, බුද්ධංගල ග්‍රාමසේවා වසමේ කම්බිලි වැව උතුරු කැලෑබද ප්‍රදේශයේදී වන්නි ආරක්ෂක සේනාංකයේ සෙබළ පිරිසක් විසින් කරන ලද සෝදිසි මෙහෙයුමකදී එම සෙබළ පිරිස් වෙත එල්ල කරන ලද වෙඩි ප්‍රහාරයකදී සෙබළ පිරිස් විසින් ආත්ම ආරක්ෂාව සඳහා ප්‍රතිප්‍රහාර එල්ල කිරීමේදී තිදෙනෙකු මිය ගොස් ඇත.

 මේ සම්බන්ධයෙන් 2014.04.11වන දින පැය 11.10ට 19 වන ගජබා රෙජිමේන්තුවේ කැලෑ බෝගස් වැව යුද හමුදා කඳවුරේ යුද හමුදා මේජර් ඒකනායක මුදියන්සේලාගේ අජිත් ඒකනායක යන අය විසින් පදවිය පොලිස් ස්ථානය වෙත මෙම සිද්ධියට අදාළව පැමිණිල්ලක් කර ඇති අතර, එම පැමිණිල්ල GCIB 319/98 යටතේ සටහන් කර බල අපරාධ අංක 20/2014 යටතේ ලේඛනගත කර ඇත.

 එම පැමිණිල්ල සම්බන්ධයෙන් පදවිය පොලිස් ස්ථානය මඟින් හා අනුරාධපුර අපරාධ ස්ථාන පරීක්ෂණ නිලධාරීන් විසින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කර විමර්ශන පවත්වා ඇති අතර, එම නිලධාරීන් විසින් මරණකරුවන්ගේ රුධිර සාම්පල ලබා ගෙන ඇති අතර, මරණකරුවන් සන්තකයේ තිබී අංක 6223029 දරන පැති අවිය හා ඇඳ සිටි ඇඳුම්ද, හිස් පතරොම් කොපුවක්ද, නඩු භාණ්ඩ වශයෙන් භාරයට ගෙන ඇත.

 මේ සම්බන්ධයෙන් 2014.04.11වන දින නඩු අංක බී 239/2014 යටතේ කැබිතිගොල්ලෑව ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර මෙම මරණකරුවන් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු මරණකරුවන්ගේ මෘත දේහයන් සම්බන්ධයෙන් පශ්චාත් මරණ පරීක්ෂණය අනුරාධපුර ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරියා මඟින් පැවැත්වීමටත් පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසුව මරණකරුවන්ගේ ඥාතීන් ඉදිරිපත් වේ නම් මෘත දේහයන් ඔවුන් වෙත භාර දීමටත්, එසේ ඉදිරිපත් නොවේ නම් රජය මඟින් ආදාහන කටයුතු කිරීමටත් අනුරාධපුර අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත නියෝගයක් නිකුත් කරන ලෙස හා විශේෂ පොලිස් කණ්ඩායමක් මඟින් මේ පිළිබඳව වැඩිදුර විමර්ශන පවත්වා ගරු අධිකරණය වෙත වාර්තා කර ඇති බවට අප වෙත තොරතුරු ලබා දී ඇත.

 මෙම සිද්ධියට අදාළව 2014.07.02 දින කැබිතිගොල්ලෑව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී 239/2014 යටතේ ගරු අධිකරණය වෙත වැඩිදුර කරුණු වාර්තා කර ඇති අතර, මෙම නඩුකරය අධිකරණයේ විභාග කර රයිෆල් වර්ගයේ ගිනි අවියකින් ආත්ම ආරක්ෂාව සඳහා ප්‍රතිප්‍රහාර එල්ල කිරීමේදී සිදු වූ මරණයන් බවට තීරණය කර නඩු කටයුතු අවසන් කරමින් ගොනුව වසා තබා ඇත.

ගරු මන්ත්‍රීතුමා විසින් අසා තිබෙන දෙවන ප්‍රශ්නයට පිළිතුරු සැපයිය යුත්තේ ආරක්ෂක අමාත්‍යාංශයෙන්. ඒ නිසා ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට අදාළ තොරතුරු පිළිබඳව තවදුරටත් සොයා බලා, ඉදිරිපත් කරන්න හැකි තොරතුරු ඉදිරියේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා. මොකද, මෙම ප්‍රශ්නයෙන් අසා තිබෙන කාරණයට අදාළව දැනට විමර්ශන කිහිපයකුත් පැවැත්වෙනවා. ඒ නිසා ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් පිළිතුරු ලැබුණු පසුව ඉදිරිපත් කරන්න පුළුවන් තොරතුරු තිබෙනවා නම්, ඉදිරියේදී එම තොරතුරු මේ සභාවට ඉදිරිපත් කරන්නම්.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, පක්ෂ නායක රැස්වීමේදී අපි තීරණය කළ පරිදි අද පස් වරු 5.00 සිට 5.30 දක්වා නියමිතව තිබුණේ ආණ්ඩු පක්ෂය විසින් ගෙන එන සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳව සාකච්ඡා කිරීමයි. නමුත්, ආණ්ඩුව එය ඉදිරිපත් නොකරන්න තීරණය කළ නිසා විපක්ෂය වෙනුවෙන් ඒ පැය භාගයත් මේ හදිසි නීති විවාදයට ලබා දෙන්න කියලා අපි කාරුණිකව ඉල්ලනවා. කොහොමත් තිබුණු එක නේ. අද කථිකයෝ ගණනාවක් ඉන්නවා, අදහස් ප්‍රකාශ කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපි ඒ ගැන Parliamentary Business Committee එකේදී කථා කරමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ ගැන Parliamentary Business Committee එකේදී කථා කරමු.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, මට මේ පිළිතුර ඉදිරිපත් කරන්න අවස්ථාව තිබුණේ මීට පෙරයි. ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා විසින් අද දින ස්ථාවර නියෝග 27(2) යටතේ ඇසීමට ප්‍රශ්නයක් යොමු කර තිබුණා. එතුමා අද දින පාර්ලිමේන්තු රැස්වීමට සහභාගි නොවුණත්, ඒ ප්‍රශ්නය කාලීනව වැදගත්කමක් තිබෙන එකක් නිසා, ඔබතුමාගේ අනුමැතිය ලැබෙනවා නම් මේ පිළිතුර සභාගත කරන්න අවසරය ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා පිළිතුර සභාගත කරන්න.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
බොහොම ස්තුතියි. ගරු කථානායකතුමනි, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අද දින ඇසීමට නියමිතව තිබුණු ප්‍රශ්නයට අදාළ පිළිතුර මම **සභාගත*** කරනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 120 යටතේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව පවත්වාගෙන යන බව අපි දන්නවා. හැබැයි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා ඊයේද, පෙරේදාද මේ පාර්ලිමේන්තුවේදී ගල් අඟුරු වංචාව සම්බන්ධව කථා කරමින් එතුමාගේ පෞද්ගලික අභිමතය අනුව එම කාරණය සුද්ද කළ ආකාරයක් අපි දැක්කා. අද එතුමා නොරොච්චෝලේට ගිහින් තිබෙනවා, ඒ සුද්ද කරන වැඩේ දෙවැනි අදියර කරන්න. ඊයේ නොරොච්චෝලේ අර්බුද දෙකක් ඇති වෙලා තිබෙනවා. එකක් තමයි, ගල් අඟුරු අඹරන යන්ත්‍ර දෙකක් කැඩිලා තිබුණා. ආණ්ඩුවට බොරු කියන්න පුළුවන්. හැබැයි, යන්ත්‍ර සූත්‍රවලට බොරු කරන්න බැහැ. ඒ ගෙනාපු බාල ගල් අඟුරු නිසා එක බලාගාරයක එක පැත්තකින් දුම් යනවා, ඒ වාගේම fly ash පිට වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කරන එක නොවෙයි, ගල් අඟුරු පිළිබඳව නිවැරදි පරීක්ෂණයක් කරන්න සහයෝගය දෙන එක.

***  පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකුට අදාළව තමයි ඒ චෝදනාව ඉදිරිපත් කළේ. එතුමාට එහෙම චෝදනා කරන්න බලයක් නැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ පිළිබඳව සොයා බලා කටයුතු කරන්න කියලා.

දෙවැනි කරුණ මෙයයි. ගරු මන්ත්‍රීතුමනි, කට තිබුණු පලියට හැම වෙලාවේම එක එක වාචාල කථා කියන්න පුරුදු වෙන්න එපා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විධියටත්, වෙනත් ඕනෑම කාරක සභාවක සභාපතිවරු විධියටත් ඉන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු. ඒගොල්ලන්, ඒගොල්ලන්ගේ දේවල් ගැන කථා කරනවා. ඒගොල්ලන්ට තමයි ඒවායේ වගකීම පැවරී තිබෙන්නේ. ඒගොල්ලන් බොරුවක් කිව්වොත් ඒක ඒගොල්ලන්ටම බලපාවි. ඒ නිසා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ඇතුළු හැම කාරක සභාවකම සභාපතිවරු වගකීමෙන් තමයි කටයුතු කරන්නේ. මොකද, ඒගොල්ලන් මන්ත්‍රීවරු. ඒ නිසා මම කරුණාවෙන් ඉල්ලීමක් කරනවා. තමුන්නාන්සේලාගේ දේශපාලන වුවමනාවලට තමුන්නාන්සේලා දේශපාලනය කරන්න. ගරු මන්ත්‍රීතුමනි, නමුත් මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් නැති කරන්න ඔබතුමාට බලයක් නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කාරණාව සම්බන්ධයෙන් ස්ථාවර නියෝගවලට අනුකූලව තිබෙන ප්‍රතිපාදනවලට අනුව තමයි ඉල්ලීම් කළාට පසුව කථානායකවරයා විසින් අවසරය ලබා දී තිබෙන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point එක මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ කාරණය ගැන කියන්න මට විනාඩියක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Point එක විතරක් කියන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා කට්ටියටම වෙලාව දුන්නා නේ. ඒ නිසා මටත් පොඩි වෙලාවක් දෙන්න. ගරු කථානායකතුමනි, මම කියන්නේ,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "අද දින ආණ්ඩුවේ වැඩකටයුතු මුලාස්ථානය ගත යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 81 සහ 82 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 81, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතය ඉදිරිපත් කිරීමට, ගරු අග්‍රාමාත්‍යතුමිය.

## මහජන ආරක්ෂක ආඥාපනත: යෝජනා සම්මතය
## பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டம்: தீர்மானம்
## PUBLIC SECURITY ORDINANCE: RESOLUTION

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2026 පෙබරවාරි 28 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය."

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Major General (Rtd.) Aruna Jayasekera to start the Debate. You have 13 minutes.

[පූ.භා. 10.44]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, අද දින විශේෂයෙන්ම විවාදයට ගැනීමට කටයුතු කර තිබෙනවා, හදිසි අවස්ථා තත්ත්වය ප්‍රකාශයට පත් කිරීම සහ එකී කාලය දීර්ඝ කර ගැනීම පිළිබඳවත්, ඒ වාගේම අත්‍යවශ්‍ය මහජන සේවා ප්‍රකාශයට පත් කිරීම සහ තවදුරටත් ඒවා පවත්වාගෙන යෑම පිළිබඳවත්.

අපි කවුරුත් දන්නවා, පසුගිය නොවැම්බර් මාසයේ අපේ රටට බලපෑ "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් අපේ රටේ ජන ජීවිතයටත්, රටේ එදිනෙදා කටයුතුවලටත් දැඩි ලෙස බලපෑම් ඇති වුණු බව; දරුණු තත්ත්වයන් ඇති වුණු බව. ඒ අනුව අපි පසුගිය නොවැම්බර් මාසයේ 28වැනි දා මේ හදිසි නීතිය ප්‍රකාශයට පත් කළා, ඒ ආපදා තත්ත්වයෙන් ජන ජීවිතය ගොඩ ගැනීමේ කටයුතු විධිමත් කිරීම සඳහා. ඒ අනුව අපි දැන් දෙසැරයක් මේ හදිසි නීතිය දීර්ඝ කරලා තිබෙනවා. ඉදිරියේදීත් දීර්ඝ කිරීම අත්‍යවශ්‍ය වෙනවා, මේ කටයුතු තවත් විධිමත්ව කරගෙන යාම සඳහා.

ඒ වාගේම, මේ ආපදා තත්ත්වයත් සමඟ හටගෙන ඇති අපේ සමාජ, ආර්ථික අභියෝගාත්මක තත්ත්වයන්, වාතාවරණයන් හමුවේ මහජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන්, මහජන සේවාවන් පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයෙක් පත් කළා; ඔහුට විශේෂ බලතල ලබා දුන්නා. ඒ අනුව මුළු දිවයිනම ආවරණය වන පරිදි ග්‍රාම නිලධාරි මට්ටමේ සිට දිස්ත්‍රික් ලේකම්වරුන් දක්වා -දිස්ත්‍රික් ලේකම්වරුන්, ඒ වාගේම ප්‍රාදේශීය ලේකම්වරුන්, ග්‍රාම නිලධාරින්- විශේෂ කර්තව්‍යයක් ඉටු කළා, "දිට්වා" සුළි කුණාටුවෙන් පසු ඇති වෙච්ච තත්ත්වයන්වලදී මහජනතාවට සහන ලබා දෙන්න; ඔවුන් ඒ තත්ත්වයන්ගෙන් ගොඩ ගැනීම සඳහා. මෙම අත්‍යවශ්‍ය සේවාවන් අඛණ්ඩව සිදු කරගෙන යාම ඉතාම වැදගත්.

වර්තමානයේ මැදපෙරදිග ඇති වෙලා තිබෙන යුදමය වාතාවරණය හමුවේ අපට අත්‍යවශ්‍ය සේවාවන් පවත්වාගෙන යාම සඳහා ඇති වන බලපෑම්, ඒ කටයුතු අඩපණවීම් සම්බන්ධ කාරණා පසුගිය සතියක විතර කාලය තුළදීත් අපි දැක්කා. අපේ ඉන්ධන පිරවුම්හල්වලට මහජනතාව එකතු වෙලා ඉන්ධන එක්රැස් කිරීම් කළා, ඇති වී තිබෙන තත්ත්වය හමුවේ ජන ජීවිතවලට බලපෑම් ඇති වෙයි කියන තත්ත්වය උඩ. ඒ අනුව අපේ දෛනික කටයුතුවලට බලපෑම් සිද්ධ වෙන එක ස්වාභාවිකයි. නමුත් රජයක් හැටියට, වග කියන රජයක් හැටියට අපි මහජනතාවට ඉඳුරාම, අඛණ්ඩව ඒ අත්‍යවශ්‍ය සේවාවන් සැපයීම විශේෂත්වයක්.

මේ ඇති වී තිබෙන වර්තමාන යුදමය වාතාවරණය හමුවේ නැව් ගමනාගමනයටත්, ගුවන් ගමන් කටයුතුවලටත් සීමා පනවා තිබෙනවා; සීමා පනවන්න වෙලා තිබෙනවා. ඒ අනුව අපි ඉල්ලුම් කරන ලද අත්‍යවශ්‍ය සේවා සැපයීමේදී සමහර විට ප්‍රමාදයන් සිදු වෙන්නත් ඉඩ තිබෙනවා. ඉදිරි සති කිහිපය තුළ ඉතා තීරණාත්මකයි. එම නිසා මේ අත්‍යවශ්‍ය සේවා සඳහා අපි විශේෂ අවධානයක් යොමු කළ යුතුයි. ඒ අනුව තමයි හදිසි නීතිය තවදුරටත් පවත්වාගෙන යාමට අපි හිතලා තිබෙන්නේ.

අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාමට, අවශ්‍ය භාණ්ඩ අඛණ්ඩව සැපයීමට අපි විධිමත් සැලැස්මක් සකස් කරලා තිබෙනවා. චක්‍රලේඛ මඟින්, මාර්ගෝපදේශ මඟින් කටයුතු කරනවා වාගේම අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයාට විශේෂ උපදෙස්, විශේෂ බලතල ලබා දීලා තිබෙනවා. ඔහුත් සෑම දිස්ත්‍රික්කයකටම වාගේ ගිහිල්ලා රාජ්‍ය නිලධාරින් එක්ක එකතු වෙලා කටයුතු කරනවා. මේ අවස්ථාවේදීත් මම කියන්න ඕනෑ, අපේ රාජ්‍ය නිලධාරින් පසුගිය මාස තුනක වැනි කාලය තුළදී "දිට්වා" සුළි කුණාටුවෙන් ආපදාවට පත් වුණු ජනතාව වෙනුවෙන්, ඒ ජන ජීවිත ගොඩනැඟීම වෙනුවෙන් උදේ, දවල්, රෑ ඉතා වෙහෙසකාරී කටයුතුවල නිරත වුණු බව. ඒ තත්ත්වය මත තමයි අපි අවශ්‍ය කටයුතු සම්පාදනය කරගෙන රජය හමුවේ තිබෙන අභියෝග ජය ගැනීමට කටයුතු කරගෙන යන්නේ. එහිදී මේ හදිසි නීතිය මඟින් ලබා දෙන ඒ ප්‍රතිපාදන ඉතාම වැදගත්. අවතැන් වුණු ජනතාව අපේ සහන කඳවුරුවල තවමත් ඉන්නවා. ඒ ජන ජීවිත නඟා සිටුවන්න අවශ්‍ය අත්‍යවශ්‍ය සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමට මෙය ඉමහත් රුකුලක් වනවා.

විශේෂයෙන් වගකීමෙන් යුතුව කටයුතු කරන රජයක් හැටියට අපි ජනතාවගේ මූලික අයිතීන්, ඔවුන්ගේ හිමිකම් කිසිදු ලෙසකින්වත් ඇහිරීමට අපේක්ෂා කරන්නේ නැහැ. අපි මහජන යහපත වෙනුවෙන් පමණක් මේ අත්‍යවශ්‍ය සේවාවලින් ලබා දෙන ප්‍රතිපාදන භාවිත කිරීමට කටයුතු කරන බව ඉතා පැහැදිලිව කියන්න ඕනෑ. නමුත්, අපේ රජය විසින් හදිසි නීතිය අනවශ්‍ය ලෙස පාවිච්චි කරනවා කියමින් විරුද්ධ පක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු නොයෙක් විවේචන, චෝදනා එල්ල කරනවා. අපි හදිසි නීතිය අනවශ්‍ය ලෙස පාවිච්චි කරමින් කිසිදු දෙයක් කරලා නැහැ. අපි මේ භාරගෙන තිබෙන්නේ, අන්ත දූෂිත දේශපාලන සංස්කෘතියක් තිබුණු රටක්. අපි ඒක දැක්කා. ඒ හින්දාම තමයි අපි වැනි අය ඉදිරියට ඇවිල්ලා මේ රට වෙනුවෙන්ම කැප වෙන්න උනන්දු වුණේ.

අපිට තිබෙන ප්‍රමුඛතම කාර්යය තමයි අපේ ජනතාව වෙනුවෙන් කටයුතු කිරීම. මහජන ආරක්ෂාව, ජන ජීවිත නඟා සිටුවීම, ඔවුන්ගේ යහ පැවැත්ම වෙනුවෙන් කටයුතු කිරීම තමයි අපේ මූලික වගකීම. ඒ නිසා මහජන ආරක්ෂාව සම්බන්ධව කටයුතු කිරීමේදී අපේ නීතියේ විධානය, ආධිපත්‍යය කොයි වෙලාවෙත් ප්‍රමුඛතම කාර්යයක් හැටියටයි අපි සලකන්නේ.

ගරු කථානායකතුමනි, අපේ රටේ අවුරුදු 30ක පමණ කාලයක් යුද්ධයක් තිබුණා. ඒ යුද්ධය වෙලාවෙත් අපිට විශාල බලපෑම් ඇති වුණා. 2009දී යුද්ධය අවසන් කරලා අදට අවුරුදු 17ක් පමණ වෙනවා. දැන් අපට චෝදනා කරන, අපිව විවේචනය කරන, අපේ කටයුතුවලට බාධා කරන අය සිටි ඒ පැවැති රජයන් 2009දී යුද්ධය අවසන් කළාට පස්සේ අවුරුදු 17ක් ඇතුළත මේ සියලු දේවල් සැලකිල්ලට භාජන කරගෙන පස් අවුරුදු සැලසුම් තුනක් හැදුවා නම් අද කොච්චර හොඳ රටක් අපිට තිබෙනවාද? නමුත්, ඒවා කිසිම දෙයක් කළේ නැහැ. අන්තිමට අපි දැක්කේ මොකක්ද? කඩා වැටුණු, නීතියේ විධානය, ආධිපත්‍යය නැති, ජාතික ආරක්ෂාවට මහා තර්ජනයක් එල්ල වෙච්ච, ජන ජීවිතය කඩා වැටුණු, බංකොලොත් රටක්. එවැනි රටක් තමයි අපිට ලැබුණේ. ඒ නිසා අපි ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් හොඳ අධ්‍යයනයක් කරලා හොඳ අවබෝධයක් ඇතිව, ජාතික ආරක්ෂාව සම්බන්ධව තිබෙන ඒ විශේෂ කරුණු සියල්ලක්ම සැලකිල්ලට ගෙන තමයි තීන්දු තීරණ ගන්නේ. අපි තනියෙන් තීන්දු තීරණ ගන්නේ නැහැ. මේ හදිසි නීතිය ප්‍රකාශයට පත් කළෙත් එහෙමයි.

අපි පසුගිය වසරේ අගෝස්තු මාසයේ ජාතික ආපදා කළමනාකරණ කවුන්සලය කැඳෙව්වා. එය අවුරුදු හතක් තිස්සේ කැඳවා තිබුණේ නැහැ. ඒ වාගේම ජාතික ආරක්ෂක කවුන්සලයත් පසුගිය පාස්කු ප්‍රහාරය එල්ල වන කාලය වනකොටත් කැඳවා තිබුණේ නැහැ. සමහර අවස්ථාවලදී අගමැතිතුමාටත් ආරාධනා

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේක මහතා]

කර තිබුණේ නැති කාල වකවානුවක් තමයි අපි දැක්කේ. නමුත් අපි කටයුතු කරන්නේ එහෙම නොවෙයි. වර්තමානයේ මේ පැන නැඟිලා තිබෙන මැදපෙරදිග අර්බුදයත් එක්ක පසුගිය ඉරිදා උදයේ ජාතික ආරක්ෂක කවුන්සලය කැඳවා අපි කරුණු කාරණා සැලකිල්ලට ගෙන ඒ තිබෙන භූ දේශපාලනික, භූ උපායිය කරුණු, සාධක සියල්ලක්ම සැලකිල්ලට භාජන කරලායි තීන්දු තීරණ ගත්තේ. ඒ ඇති වෙච්ච අර්බුදය තුළ අපේ රටේ ජාතික ආරක්ෂාවට, අපේ රටේ කටයුතුවලට ඇති වෙන්න පුළුවන් බලපෑම් ඉතාම හොඳින් අධ්‍යයනය කරලායි රාජ්‍යකරණය තුළ අපි ඒ තීන්දු තීරණ ගත්තේ. ඒ වාගේම ඒ තත්ත්වයන් තුළ නැවතත් ඊයේ උදයේත් 8.00ට අපි ජාතික ආරක්ෂක කවුන්සලය හදිසියේම කැඳවා, අපේ ගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමියත් සමඟ අපි සියලු දෙනා එකතු වෙලා සියලු කරුණු කාරණා සාකච්ඡා කළා, පැය දෙකක් පමණ. අපේ ත්‍රිවිධ හමුදාපතිවරුන්, පොලිස්පති, විදේශ කටයුතු භාරව කටයුතු කරන ලේකම්තුමිය යන අය සමඟ එකතු වෙලා අපි ඒ අවශ්‍ය කටයුතු සිද්ධ කළා. ඒ අනුව තමයි අපි තීන්දු තීරණ ගන්නේ. අපි තීන්දු තීරණ ගන්නේ අපේ මහජනතාව වෙනුවෙන්. අද ගන්නා තීන්දු තීරණ ඉදිරියේදී විශාල ලෙස බලපානවා. ඒ නිසා අදූරදර්ශී ලෙස, අපිට ඕනෑ විධියට පැයකින්, දෙකකින් ඒ තීන්දු තීරණ ගන්න බැහැ. විශේෂයෙන් වර්තමානයේ ජාත්‍යන්තර වශයෙන් ඇති වී තිබෙන තත්ත්වයේදී අපි ඒ කරුණු කාරණා සියල්ලක්ම සැලකිල්ලට භාජන කරලා දීර්ඝ ලෙස සාකච්ඡා කරන්න ඕනෑ; හැම පාර්ශ්වයකටම කථා කරන්න ඕනෑ; හැම පාර්ශ්වයකින්ම ලැබෙන කරුණු කාරණා, ඉල්ලීම් සැලකිල්ලට භාජන කරන්න ඕනෑ. එහෙම කරලා තමයි අපි ආරක්ෂක කවුන්සලය විධියට ඒ තීන්දු තීරණ ගන්නේ. අපි සෑම වෙලාවකම අපේ රටේ ස්වෛරීත්වයට, භෞමික අඛණ්ඩතාවට මුල් තැන දීලායි කටයුතු කරන්නේ.

අපි දැක්කා, පසුගිය සුමාන දෙක තුනකට කලින් යාපනයේ ආරක්ෂක සේනා මූලස්ථානය ඉවත් කරනවා කියා ඉතාම සාවද්‍ය - බොරු, අසත්‍ය - ප්‍රකාශ කරලා මහා වලනයක්, ප්‍රශ්නයක් ඇති කරන්න සමහරු උත්සාහ කළ ආකාරය. ඒ විධියට කටයුතු කරන්නේ පටු, බාල, අදූරදර්ශී, දැක්මක් නැති, කුහක දේශපාලන ආකල්ප තිබෙන අය.

උතුර සහ නැඟෙනහිර, එහෙම නැත්නම් ලංකාවේ ඕනෑම තැනක පාවිච්චි කරන ඉඩමක්, පාවිච්චි කරපු ඉඩමක් නැවත මහ ජනතාවට ලබා දෙන කොට අපි හැම සාධකයක්ම සැලකිල්ලට ගන්නවා. අපේ ජාතික ආරක්ෂාවට, එහෙම නැත්නම් ජාතික අවශ්‍යතාවන්ට මුල් තැනක් දීලා, ඒ කටයුතුවලට කිසිම බාධාවක් ඇති නොවන විධියට, තර්ජනයක් ඇති නොවන විධියට කටයුතු සම්පාදනය කරලා තමයි අප ඒ ඉඩම් මුදා හරින්නේ. ඒ වාගේම පාර්ලිමේන්තුවේ ආරක්ෂක කමිටුවටත් ඒ කරුණු කාරණා ගෙනැල්ලා, ඒ මන්ත්‍රීතුමන්ලාත් සමඟත් සාකච්ඡා කරලා තමයි අපි ඒ තීන්දු තීරණ ගන්නේ.

ගරු කථානායකතුමනි, සංවිධානාත්මක අපරාධ රැල්ලක් හදලා රාජ්‍ය යන්ත්‍රණය දූෂිත කරලා තිබ්බ රටක්, මෙය. රාජ්‍ය යන්ත්‍රණයේ ඇති වී තිබුණු දූෂිත තත්ත්වය නිසා "දිට්වා" සුළි කුණාටුවෙන් ඇති වෙච්ච ඒ මහා බලපෑමට මුහුණ දීමට සහ ඒ කටයුතු කිරීමට ඉතාම අපහසු වුණා. නමුත් රාජ්‍ය නිලධාරින් වගකීමෙන්, ඉතාම උනන්දුවෙන් දිවා රෑ නොබලා ඉතාම හොඳින් කටයුතු කළා, අපේ ත්‍රිවිධ හමුදා එක්ක, පොලීසිය එක්ක, මහ ජනතාව එක්ක වාගේම සිවිල් සංවිධානත් එක්ක. ඉතින් මේ අවස්ථාවේ විශේෂයෙන්ම අපි කියන්න ඕනෑ, "දිට්වා" සුළි කුණාටුවෙන් පසුව ඇති වෙච්ච ඒ තත්ත්වය අප ඉතාම හොඳින් කළමනාකරණය කරපු නිසා අපට ලෝකයෙන් හොඳ ප්‍රතිචාර ලැබුණු බව. ඒ වාගේම විදේශ ආධාරත් අපට සැලකිය යුතු වශයෙන් ලැබුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Deputy Minister, your time is over.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

අපි ඉහත කී පරිදි ඉතාම හොඳින් කටයුතු කළා. "දිට්වා" සුළි කුණාටුවෙන් පසුව ඇති වෙලා තිබෙන තත්ත්වය අනුව "Rebuilding Sri Lanka" කියන සංකල්පයත් සමඟ රට නැවත ගොඩනැඟීම සඳහා මේ හදිසි අවස්ථා තත්ත්වය තවදුරටත් දීර්ඝ කිරීම ඉතාම හොඳ යෝජනාවක් හැටියට ප්‍රකාශ කරමින් මම මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The next Speaker is the Hon. J.C. Alawathuwala. You have nine minutes.

[පූ.භා. 10.57]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම හදිසි නීතිය දීර්ඝ කරන යෝජනාවේදී ගරු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිවරයා ඉදිරිපත් කරපු කාරණා දිහා බැලුවාම, එම කාරණා සම්බන්ධයෙන් කිසිසේත් සෑහීමකට පත් වෙන්න බැහැ. මොකද, හදිසි නීති තත්ත්වය දීර්ඝ කළ යුතුයි කියන එකට එතුමා හේතු කාරණා ඉදිරිපත් කළේ නැහැ. එතුමා දිගින් දිගටම කිව්වේ, ආරක්ෂක කවුන්සලය ඊයේත් හම්බ වුණා; පෙරේදාත් හම්බ වුණා වාගේ දේවල්. එය හමු වෙන්න හදිසි නීතියේ අවශ්‍යතාවක් නැහැ.

මෙහිදී පැහැදිලිව කාරණයක් කියන්න ඕනෑ. ඔබතුමන්ලාගේ ආණ්ඩුව බලයට එන්න පෙර ඔබතුමන්ලා දීර්ඝ කාලයක් මේ රටේ දේශපාලනය කළා. හැම අවස්ථාවකම -මේ රටේ යුද්ධයක් තිබුණු වෙලාවේත්- ජනතා විමුක්ති පෙරමුණ හැටියට හදිසි නීතියට විරුද්ධව ඡන්දය දුන්නා; එළියේ picket කළා. ඔබතුමන්ලා බලයට පත් වෙලා කෙටි කාලයක් තුළ තමන් අවුරුදු ගණනක් කරපු සියල්ල පැත්තකට දාලා කටයුතු කරන්න පටන් ගත්තා. ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කථාවේදී පැහැදිලිව කිව්වා, "පසුගිය දවස්වල තෙල් පෝලිමක් තිබුණා. එවැනි අවශ්‍යතා සමහර වෙලාවට අපට සපුරා ගන්න බැරි වේවි" කියලා. අන්න ඒ නිසා මේ හදිසි නීතිය දමනවා වාගේ කථාවක් තමයි මට තේරුණේ. මට මතකයි, පසුගිය ඡන්දය කාලයේ එතුමා කියපු දේවල්. මේ රටේ පාතාලය ඉවර කරන්න යන්නේ පෝය දෙකයි කිව්වා; උපදෙස් දෙන්න බංකු අරගෙන එන්න කිව්වා. අද හදිසි නීති තත්ත්වයක් පවත්වාගෙන යෑමේ කිසිම අවශ්‍යතාවක් අපට නම් පෙනෙන්නේ නැහැ. දැන් තමුන්නාන්සේලාට වෙලා තිබෙන්නේ මොකක්ද? තමුන්නාන්සේලා 76 අවුරුද්දකට බැණලා, දොස් පවරලා බලය ලබා ගත්තා. බලය ලබා ගත්තාට පසුව විපක්ෂයට බණිමින්, යම් යම් තැන්වලදී ජනතාවට යම් යම් දෝෂාරෝපණ එල්ල කරමින්, රාජ්‍ය නිලධාරින්ට දෝෂාරෝපණය කරමින් අන්තිමේදී පාර්ලිමේන්තුවට ඇවිල්ලා තමන්ගේ රටටත් "හුණ්ඩුවක්" කියලා අපවාදයට ලක් කරන්න උත්සාහ කරනවා.

ගරු කථානායකතුමනි, මම පැහැදිලිව මේ කාරණයත් කියන්න ඕනෑ. ආණ්ඩුවේ තමුන්නාන්සේලා මේ හදිසි නීතිය පාවිච්චි කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදී රටක ජනතාවගේ ඉල්ලීම්, එහෙම නැත්නම් ජනතාවගේ අවශ්‍යතා මර්දනය කරන්නයි.

ඒක තමයි පැහැදිලිව පෙනෙන්නේ. මොකද, "දිට්වා" සුළි කුණාටුව නිසා පීඩාවට පත් වූ ජනතාවට සහන දෙන්න, එහෙම නැත්නම් තමුන්නාන්සේලා පොරොන්දු වුණු කාරණා ඉෂ්ට කරන්න හදිසි නීතියේ අවශ්‍යතාවක් අද වනකොට නැහැ. ඒ කියපු දේවල් කරනවා නම්, රාජ්‍ය නිලධාරින් හරහා ඒ කටයුතු කරන්න තමුන්නාන්සේලාට පුළුවන්කම තිබෙන්න ඕනෑ. හැබැයි, ඒ කියපු දේවල් නොකරනවා නම් තමයි ඒ දීපු පොරොන්දු සම්බන්ධයෙන් ජනතාවගේ ඉල්ලීම් එනකොට ජනතාව මර්දනය කරන්න හදිසි නීතිය අවශ්‍ය වන්නේ. ඒ නිසා මම පැහැදිලිවම කියනවා, හදිසි නීතිය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් තමුන්නාන්සේලා ඉදිරිපත් කරන කාරණා පිළිගන්න බැරි බව. මොකද, ජනතාවගේ ආරක්ෂාව සම්බන්ධයෙන් කිසිසේත්ම හදිසි නීතිය අවශ්‍ය වන්නේ නැහැ. තමුන්නාන්සේලාට විධායක ජනාධිපතිතුමා ඉන්නවා. ඒ වාගේම, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකකට එහා ගිය බලයක් තිබෙනවා; ඒ කියන්නේ, 159ක මන්ත්‍රීවරු පිරිසක් ඉන්නවා. ඊට අමතරව, ගමට ගියාම ප්‍රාදේශීය සභාවල බලයත් තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේලාට හදිසි නීතියක් අවශ්‍ය නැහැ, ජනතාවට වැඩ කරන්න. ඒ අනුව බැලුවාම, මෙය සම්පූර්ණයෙන්ම ආණ්ඩුවට එන විරෝධය මර්දනය සඳහා කරන දෙයක්. රාජ්‍ය සේවකයන්ගේ පැත්තෙන් ගත්තාම, මේ වනකොට ග්‍රාම නිලධාරින් ඇතුළුව ගමේ වැඩ කරන නිලධාරින් සියලු දෙනා යම් යම් කාරණා සම්බන්ධයෙන් ආණ්ඩුව දැනුවත් කර තිබෙනවා; විශේෂයෙන්ම රාජ්‍ය පරිපාලන ඇමතිවරයාව දැනුවත් කර තිබෙනවා; "දිට්වා" සුළි කුණාටු ආපදා කටයුතු සම්බන්ධ රාජකාරි කටයුතුවලින් ඒ අය ඉවත් වෙලා තිබෙනවා. ඉතින්, ඔවුන් එක්ක සාකච්ඡා කරලා, ඔවුන්ගේ සාධාරණ ඉල්ලීම්වලට අදාළව අවශ්‍ය පියවර ගන්නේ නැතිව හදිසි නීතිය පැනවුවා කියලා මේ කාරණාවලට සාධාරණ පිළියමක්, ජනතාවට සාධාරණයක් ඉෂ්ට කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න හැකි වන්නේ නැහැ. ඒ සියලු නිලධාරින් එකතු වෙලා, ඔවුන්ගේ වෘත්තීය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වෘත්තීය සමිති 8ක ලේකම්වරුන් සහ සභාපතිවරුන් අත්සන් කළ ලිපියක් අපටත් එවලා තිබෙනවා. මම මේ අවස්ථාවේදී එම ලිපිය **සභාගත*** කරනවා.

මේ ලිපියේ සඳහන්ව තිබෙන්නේ මොකක්ද? මේ මේ කාරණා ඉෂ්ට කරන්න නම් තමන්ට මේ මේ අවශ්‍යතා ඉටු කර දෙන්න කියලායි. ඉතින් ආණ්ඩුවේ ඉන්න ඇමතිවරුන් මේවා සම්බන්ධයෙන් සාකච්ඡා කරලා මේවාට අවශ්‍ය පිළියම් යොදන්නේ නැතිව, හදිසි නීතිය දැම්මාම මේ ඔක්කෝම හරියි කියලා හිතනවා නම්, ඒක ඵලදායි දෙයක් නොවෙයි. දැන් ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා කියපු විධියට ජනතාවගේ වැඩ කටයුතු ඉෂ්ට කරන්න තමයි හදිසි නීතිය දීර්ඝ කරන්නේ. ඉතින්, ඒවා ඉෂ්ට කරන්න හදිසි නීතිය අවශ්‍ය වන්නේ නැහැ. සාමාන්‍ය නීතිය යටතේ ඒවා කරන්න පුළුවන්. එහෙම නම්, මෙහි යටි අරමුණ මොකක්ද? විශේෂයෙන්ම මේ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග, ප්‍රජාතන්ත්‍රවාදී රටක වෙසෙන ජනතාවගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් මර්දනය ක්‍රියාත්මක කරන්න තමයි හදිසි නීතිය දීර්ඝ කිරීමෙන් තමුන්නාන්සේලා බලාපොරොත්තු වන්නේ.

ගරු කථානායකතුමනි, මම මෙහිදී විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න ඕනෑ. අපට මේ වෙලාවේ පැහැදිලිව පෙනෙනවා, මේ රටේ ඇති වුණු "දිට්වා" සුළි කුණාටුව නිසා වෙන්න පුළුවන්, එහෙම නැත්නම් යම් යම් වෙනත් කාරණා නිසා වෙන්න පුළුවන්, රජයේ ජනප්‍රියතාව දැන් එන්න එන්නම අඩු වෙලා තිබෙන බව. ඒක පැහැදිලියි. මේ වනකොට ග්‍රාමීය මට්ටමේ තිබෙන හැම සමුපකාර සමිතියකම ඡන්දවලින් රජය පරාජයට පත් වෙලා තිබෙනවා; විපක්ෂය සියයට 99ක්ම ඒවා ජයග්‍රහණය කරලා තිබෙනවා. මේ තත්ත්වය තුළ හදිසි නීතිය යොදාගෙන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට බලපෑම් කරමින්, ඒවා මර්දනය කරමින් කටයුතු කරන්නද, ආණ්ඩුව හදිසි නීතිය මෙසේ දීර්ඝ කරන්නේ කියන ප්‍රශ්නය තමයි අපට අහන්න තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, ඉහත කරුණු අනුව විශේෂයෙන්ම විපක්ෂය හැටියට අපි මේ යෝජනාවට අපේ විරෝධය ප්‍රකාශ කරනවා. රටේ ජනතාව වෙනුවෙන් වැඩ කරන්න, ජනතාවගේ ප්‍රශ්න විසඳන්න අවශ්‍ය පියවර ගන්නේ නැතිව, වෙනත් වෙනත් කාරණා සම්බන්ධයෙන් තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරමින් කටයුතු කිරීම තුළ අද ප්‍රශ්න ගණනාවක් ඇති වෙලා තිබෙනවා. උදාහරණයකට ගනිමු, විදුලිය නිපදවීම සම්බන්ධ ප්‍රශ්නය; නොරොච්චෝලේ බලාගාරය හා සම්බන්ධ කාරණය. අද උදේත් මේ සම්බන්ධයෙන් කථා කළා. වයඹ පළාතේ පුරවැසියන් හැටියට අපි පැහැදිලිවම කියන්න ඕනෑ, මේ සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් අද ඇති වෙලා තිබෙන බව.

එක් පැත්තකින් මේ ගෙනෙන බාල ගල් අඟුරු නිසා අද රුපියල් කෝටි ගණනක පාඩුවක් සිදු වෙලා තිබෙනවා වාගේම, පරිසර ප්‍රශ්නයකුත් මතු වෙලා තිබෙනවා. අපේ ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා ඊයේ පැහැදිලිව ප්‍රකාශ කළා, මේ බාල ගල්අඟුරු දහනය නිසා එතුමා නියෝජනය කරන ප්‍රදේශයේ විශාල දුමක් පිට වෙනවා කියලා. මේ ප්‍රශ්නය එන්න එන්නම වැඩි වෙන්න පුළුවන්. මේ හරහා සිදු වන පාඩුව වාගේම, අනෙක් පැත්තෙන් මේ යන්ත්‍රෝපකරණවලට විශාල හානියක් සිද්ධ වෙනවා කියලාත් ඉංජිනේරු මහත්වරු පැහැදිලිව මාධ්‍ය ප්‍රකාශ තියලා කියා සිටියා. එහෙම තිබියදී ආණ්ඩුවක් හැටියට මේ සඳහා පියවරක් ගන්නේ නැතිව දිගින් දිගටම ඒ ගල් අඟුරු තවදුරටත් ගෙන්වමින් තිබෙනවා. ඒ නිසා පැහැදිලිව අපි මේ කාරණයත් කියන්න ඕනෑ. මෙන්න මේ කාරණා දිහා බැලුවාම ඇත්තටම තමුන්නාන්සේලා මේ හදිසි නීතිය දීර්ඝ කර කර යන්නේ මෙවැනි තත්ත්වයක් තුළ. ඇත්තටම මැදපෙරදිග ඇතිවෙලා තිබෙන තත්ත්වයත් එක්ක ඉන්ධන සැපයුමත් යම් ප්‍රමාණයකට අඩාළ වෙන්න පුළුවන්. එතකොට අඩුම ගාණේ මේ ගල් අඟුරු බලාගාරය නිසියාකාරයෙන් ක්‍රියාත්මක වුණේ නැත්නම් අපේ රටේ දැවැන්ත විදුලි අර්බුදයක් ඇති වෙන්න පුළුවන්. මේවා සම්බන්ධයෙන් තමුන්නාන්සේලා අවධානය යොමු කරන්න. අපි මේ ගැන මීට පෙරත් ප්‍රකාශ කර තිබෙනවා. මොකද, මේක වුණේ ඊයේ පෙරේදා නොවෙයි නේ. මාස ගණනක ඉඳන් බාල ගල් අඟුරු සම්බන්ධයෙන් ප්‍රශ්න ඉදිරිපත් වුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාට තව එක විනාඩියක් දෙන්න.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු කථානායකතුමනි, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා කියනවා, මට තව විනාඩියක් වැඩිපුර දෙන්නම් කියලා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

මේ ප්‍රශ්නවලට තමුන්නාන්සේලා අවශ්‍ය පියවර ගන්නේ නැතිව, ඒවාට වෙනත් විකල්ප, තර්ක ඉදිරිපත් කරමින් රටේ ජනතාවගේ මනස වෙනතකට යොමු කරමින්, මේවා සම්බන්ධයෙන් තිබෙන ඇත්ත තත්ත්වය වසන් කරමින් කරගෙන යන වැඩ පිළිවෙළ තුළ තමයි මේ ප්‍රශ්න උග්‍රවෙලා තිබෙන්නේ. තමුන්නාන්සේලා මොන විධියට කථා කළත්, තමුන්නාන්සේලා මේ රට බාර ගන්නකොට අපේ රටේ තෙල් පෝලිම්, ගෑස් පෝලිම් තිබුණේ නැහැ. ඒ පෝලිම් තිබුණේ තමුන්නාන්සේලා මේ රට බාර ගන්න කලින්. ඒවා තිබුණේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ කාලයේ. නමුත්, ඒ තත්ත්වය නැවත වතාවක් පසුගිය දවස්වල අපේ රටේ පාරවල්වල දකින්න ලැබුණා. අපි පසුගිය දවස්වල ගෑස් පෝලිම් දැක්කා. ඒ වාගේම, ඉන්ධන පෝලිම් දැක්කා. ඒ නිසා පැහැදිලිවම මේ කාරණයත් කියන්න ඕනෑ. තමුන්නාන්සේලාගේ නියෝජ්‍ය ඇමතිවරයා කියපු ආකාරයට හදිසි නීතිය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් අපට කිසිසේත්ම සෑහීමකට පත් වෙන්න බැහැ. ඒකේ යටි අරමුණක් තිබෙනවා. ඒ නිසා විපක්ෂයක් හැටියට අපි පැහැදිලිව කියනවා, මේ හදිසි නීති තත්ත්වය දීර්ඝ කිරීම පිළිබඳව අපේ දැඩි විරෝධතාව ප්‍රකාශ කරන බව. එසේ ප්‍රකශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Prime Minister. You have 15 minutes.

[පූ.භා. 11.08]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු කථානායකතුමනි, විපක්ෂය විසින් දිගින් දිගටම එල්ල කරන එකම චෝදනාව තමයි, මේ හදිසි නීතිය දීර්ඝ කිරීම තුළින් මර්දනයක් සිද්ධ වෙනවා, ප්‍රජාතන්ත්‍රවාදයට අභියෝගයක් එල්ල වෙනවාය කියන එක. ඒක තමයි විපක්ෂය දිගින් දිගටම එල්ල කරන චෝදනාව. ගරු කථානායකතුමනි, මම විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් මෙන්න මේ කාරණය අහන්න කැමැතියි. ඔබතුමන්ලාට නිශ්චිතව කියන්න පුළුවන් ද, තොරතුරු සපයන්න පුළුවන් ද, පසුගිය මාස 3ක කාලය තුළදී මේ නීතිය හරහා මර්දනය එල්ල වුණු සිද්ධි හෝ ඒ හා සමාන ක්‍රියා පිළිබඳව? විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් මම අහන්න ඒ කාරණය අහන්න කැමැතියි. ගරු කථානායකතුමනි, මේ මාස තුනක කාලය තුළදීත් අපේ රට තුළ විවිධ විරෝධතා සිද්ධ වුණා. ප්‍රජාතන්ත්‍රවාදී රටක ජනතාව සංවිධානය වෙමින් විවිධ මාතෘකා මත විරෝධතා ඉදිරිපත් කරන්න සම්පූර්ණ අයිතිය තිබෙනවා නේ, ගරු කථානායකතුමනි. අපි මේ පසුගිය මාස තුනක කාලය තුළදීම ඒක දුටුවා. විපක්ෂයත් සම්බන්ධ වෙමින් විවිධ දේවල් කරනවා අපි දැක්කා. ජනාධිපති කාර්යාලය ඉදිරිපිටත් විරෝධතා කරනවා. එවැනි එක අවස්ථාවකදීවත් මර්දනයක් සිද්ධ වුණා ද? ඔබතුමාත් දන්නවා, සමාජ මාධ්‍ය තුළ, පත්තරවල, වෙනත් මාධ්‍ය තුළ විවිධ චෝදනා මතු වෙලා තිබෙනවා කියලා. වැරදි තොරතුරු ඉදිරිපත් වෙමින් රජය විවේචනය කර තිබෙනවා; ජනාධිපතිතුමා විවේචනය කර තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා විවේචනය කර තිබෙනවා; අපේ අමාත්‍ය මණ්ඩලයේ විවිධ ඇමතිවරුන්ට චෝදනා එල්ල කර තිබෙනවා. විවිධ මාධ්‍යවලින් බොරු තොරතුරු එල්ල කර තිබෙනවා. නමුත්, ඒ කිසිවිටෙක, ඒ කිසිම එකකට අපි මර්දනය ක්‍රියාත්මක කරලා තිබෙනවා ද? සමාජ මාධ්‍යයෙන් එල්ල වන අභූත චෝදනාවලට එරෙහිව අපි මොකක් හරි ක්‍රියාමාර්ගයක් අරගෙන තිබෙනවා ද? මොකක්ද මේ මර්දනය? මර්දනය, මර්දනය, මර්දනය කියමින් නිකම් ඒක ජප කරනවා වෙනුවට, ඇත්තටම මර්දනය එල්ල වෙච්ච නිශ්චිත සිද්ධි අපට ඉදිරිපත් කරන්න. මේ මාස තුන ඇතුළත එවැනි සිද්ධි නිසා කොහේද, කවුරු හෝ මර්දනය වුණේ? කොහේද, කවුරුවත් මේ රෙගුලාසි යටතේ අත් අඩංගුවට ගත්තේ? අපට ඒවා ඉදිරිපත් කරන්න කෝ. එහෙම නැතුව නිකම් සංකල්පයක් හැටියට මර්දනයක් සිද්ධ වෙන්න බැහැ නේ. ඒක ක්‍රියාවෙන් පෙන්නුම් කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, ජනතා විමුක්ති පෙරමුණත්, ජාතික ජන බලවේගයත් විපක්ෂයේ ඉන්න අවස්ථාවලදී හදිසි නීතියට විරුද්ධ වුණා තමයි. අපි එහෙම විරුද්ධ වුණේ නිශ්චිත වශයෙන්ම හදිසි නීතිය හරහා මර්දනය සිද්ධ වුණු අවස්ථාවලදී. ඒවාට අපට උදාහරණ තිබුණා. සාක්ෂි තිබුණා. ඒ සිද්ධි විස්තර කරන්න අපට පුළුවන් වුණා. ඒ අනුව තමයි අපි ඒවාට විරුද්ධ වුණේ. ඉතින් ගරු කථානායකතුමනි, සංකල්පයක් හැටියට අපට මර්දනය කරන්න බැහැ. මර්දනය ක්‍රියාවෙන් සිද්ධ වෙන අවස්ථා, ඒ සිද්ධි මේ විපක්ෂයෙන් ඉදිරිපත් කරනවා නම්, අඩුම තරමින් අපට ඒවා හොයලා බලන්න පුළුවන්. ඒ නිසා සංකල්පීය ලෙස මර්දනය විය හැකියි කියන එක කථා කරන්නේ නැතුව, විශේෂයෙන්ම පසුගිය කාලය තුළ ඒ මර්දනය සිද්ධ වෙච්ච අවස්ථා මේ සභාවටත්, මුළු රටටමත් දන්වා සිටින්න කියලා මම ආරාධනා කර සිටිනවා.

ගරු කථානායකතුමනි, අද අපි මේ යෝජනා සම්මතය ඉදිරිපත් කරන්නේ අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යෑමේ අවශ්‍යතාව නිසා. අපේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා ඉතාම පැහැදිලිව ඒ කරුණු ඉදිරිපත් කළා. ගරු කථානායකතුමනි, මෙවැනි බරපතළ ආපදාවක් සිද්ධ වුණු වේලාවක ඒකේ අවධි තිබෙනවා. Emergency response එකකින් සහ rescue operation එකකින් පස්සේ යටිතල පහසුකම්, ජනතාවගේ ආර්ථික ජීවිතය යන මේ සියල්ලටම විශාල හානියක් සිද්ධ වුණු අවස්ථාවක් දවසින් දෙකකින් ගොඩ දාන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒක ඊට එහා ගිය එකක්. ජන ජීවිතය නැවත වතාවක් සාමාන්‍ය තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සහ අවශ්‍ය පරිසරය අපට දවසින් දෙකින් හදන්න බැහැ. ඒකට අදාළ අත්‍යවශ්‍ය සේවා ගණනාවක් පවත්වාගෙන යෑමට අවශ්‍ය වැඩ පිළිවෙළක් එක්ක තමයි අපි මේ හදිසි නීතිය පවත්වාගෙන යන්නේ.

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ විවිධ අවශ්‍යතා හඳුනා ගැනීම - needs assessment - සඳහාත් කටයුතු කරන්න ඕනෑ. Disaster එක වෙච්ච ගමන්ම කරන needs assessment එකක්, ඊට පස්සේ කෙටි කාලීන මැදිහත්වීම් සඳහා කරන needs assessment එකක්, මධ්‍ය කාලීනව කරන needs assessment එකක් සහ දීර්ඝ කාලීනව කරන needs assessment එකක් අවශ්‍යයි. මේ අවස්ථාවේ ගරු කථානායකතුමනි, අපි ජාත්‍යන්තර සංවිධානවලත් සහාය ඇතුව ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුව, මෙවැනි ආපදා තත්ත්ව තුළ සිද්ධ විය යුතු ප්‍රමිති අනුව, post-disaster needs assessment එකක් කරගෙන යනවා. ඒ post-disaster needs assessment එකේදී ඒ සොයා ගත්ත කරුණුවල වලංගුභාවය - validation - තීරණය කිරීම සඳහා විශේෂයෙන්ම මේ ආපදාවට මූලික වශයෙන් ලක්වෙච්ච දිස්ත්‍රික්කවල ඒ වැඩකටයුතු මේ දවස්වල කරමින් ඉන්නේ. ඒ වාර්තාව අපට ඉදිරිපත් වෙන්නේ මේ මාසයේ අන්තිමට. ඒ වාර්තාව තුළින් තමයි අපට ඉදිරිපත් වෙන්නේ මේ disaster එක වෙනුවෙන් මධ්‍ය

කාලීනව සහ දීර්ඝ කාලීනව ගත යුතු පියවර මොනවාද, කළ යුතු මැදිහත්වීම් මොනවාද කියන එක. නිශ්චිත වශයෙන්ම අපට ඒ මැදිහත්වීම් මොනවාද කියලා හඳුනා ගන්න සිද්ධ වෙන්නේ ඒ අනුවයි. අපි නැවත නැවත මේ සභාවට මතක් කරන්න ඕනෑ නැහැ, මේ ආපදාව තුළින් සිද්ධ වෙච්ච ඒ බැරෑරුම් හානිය ගැන. අපේ රටේ ආර්ථිකයට, ජන ජීවිතයට, යටිතල පහසුකම්වලට ඒ වෙච්ච ප්‍රහාරය ගැන මම හිතන හැටියට අපි කාටවත් මතක් කරන්න අවශ්‍ය නැහැ. ඒ වාගේම අපි මේ ආපදාවේ rebuilding strategy එක හැටියට තෝරා ගත්තේත් තිබ්බ තැනට වඩා අඩියක් හරි ඉදිරියට යන්න පුළුවන් විධියට, ඒ විධියට තමයි අපි මේක නැවත ගොඩනගා ගත යුත්තේ කියන එක.

උදාහරණයක් හැටියට අපේ ප්‍රවාහන ඇමතිතුමා මේ සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා, අපි කෝච්චි පාර නැවත හදනකොට ඒ තිබුණු කෝච්චි පාර නැවත හදන එක විතරක් නොවෙයි, ඒ embankments අපි secure කරන්නේ කොහොමද, නාය යෑම්වල අවදානම අඩු කරන්නේ කොහොමද, ඒවාට ඔරොත්තු දෙන විධියට අපි පාලම් හදන්නේ කොහොමද කියන මේ සියල්ලම සලකා බලමින් තමයි අපි මේ rebuilding strategy එක ක්‍රියාත්මක කරන්නේ කියන එක. දෙවියන්ගේ පිහිටෙන්, ඉතාම සුළු පාසල් ප්‍රමාණයක් තමයි සම්පූර්ණයෙන්ම විනාශවෙලා relocate කරන්න අපට සිද්ධවෙලා තිබෙන්නේ. අධ්‍යාපන ක්ෂේත්‍රයේ වුණත් අපි ඒ ගැන සැලසුම් කරනකොට, ඉදිරියේදී මෙවැනි සිද්ධීන්; මෙවැනි ආපදාවලට මුහුණ දෙන්න සිද්ධ වුණොත් පාසල් පද්ධතිය තුළ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යන විධියට rebuild කරන්න පුළුවන් ද කියලා අපි බලනවා. ඒ කියන්නේ dual-purpose ලෙස මේ පාසල් පවත්වාගෙන යන විධියට අපට ඒ යටිතල පහසුකම් හදන්න පුළුවන්ද කියන එක. සමහර පාසල් ඒ විධියට පවත්වාගෙන යා හැකි වුණාට, ඒ පාසල්වල වටපිටාවේ තිබෙන අවදානම ගැනත් අපට සංවේදී වෙන්න සිද්ධ වෙනවා, ඒවාට මැදිහත් වෙන්න සිද්ධවෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ පාසල වන ධර්මරාජයට ඒ හානිය සෘජුවම සිද්ධ වුණේ නැති වුණාට, වටේ සිද්ධ වුණු නාය යෑමේ තර්ජනයට අධ්‍යාපන ක්ෂේත්‍රය හැටියට අපට මැදිහත් වෙන්න සිද්ධවෙලා තිබෙන බව ඔබතුමාත් හොඳින් දන්නවා. ගරු කථානායකතුමනි, මේ වෙච්ච හානිය බරපතළයි. එතකොට ඒ වෙච්ච structural damage එකට මාස දෙක, තුනකින් පිළිතුරු හොයන්න ලේසි නැහැ. අපි ඒක සිදු කරමින් යනවා. ඒක විද්‍යාත්මකව කළ යුත්තක්. ඒකට geological assessment එකක් අවශ්‍යයි. ඒකට විද්‍යාත්මකව මැදිහත් වෙන්න අවශ්‍යයි. මෙවාට කල් යනවා. Rebuilding තුළ මේ අවස්ථාවේ සිද්ධ වෙන කටයුතුවලටත් අත්‍යවශ්‍ය සේවාවන් අවශ්‍ය වන නිසා තමයි අපි මේක මේ විධියට දිගු කරන්න හදන්නේ.

ගරු කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමා මේ පිළිබඳව ඉදිරි කටයුතු කිරීම සඳහා Presidential Task Force එකකුත් පත් කරලා තිබෙන බව ඔබතුමාත් දන්නවා. අනුකමිටු 8ක් සහිත Task Force එකක් පත් කරලා තිබෙනවා. එක් එක් ක්ෂේත්‍රවල වැඩ පිළිවෙළ සකස් කිරීම සඳහාත්, ක්‍රියාත්මක වෙන වැඩ පිළිවෙළ අධීක්ෂණය කිරීම සඳහාත්, සම්බන්ධීකරණ කටයුතු කිරීම සඳහාත් Task Force එකක් පත් කරලා තිබෙනවා. ඒ Task Force එක හරහා තමයි මේ ක්‍රියාවලිය සිද්ධ වෙන්නේ. නිරන්තර අධීක්ෂණ කටයුතු කරනකොට ඒ Task Force එකට තොරතුරු ඉදිරිපත් වෙනවා. ඊයේ සවසත් Presidential Task Force එක රැස්වුණා. එතැනදී ඉදිරිපත් වුණු කරුණු අනුව, සුළු ප්‍රමාණයක් වුණත් අපේ ජනතාවගෙන් යම්කිසි ප්‍රමාණයක් තවම කඳවුරුවල ඉන්නවා කියන එකට අපට තොරතුරු ලැබුණා. ඒකට වහාම මැදිහත් වෙන්න අවශ්‍යයි කියන එක අපි ඊයේ කථා කළා. ඒ කඳවුරුවල සිටින අය මාස දෙක තුනක් ඒ විධියට ඉන්න එක එච්චර සුදුසු නැහැ, ඒකට මොකක් හරි මැදිහත් වීමක් අවශ්‍යයි කියලා අපි කථා වුණා. ඒ අනුව තමයි කොමසාරිස්තුමා සහ එම ක්ෂේත්‍රවලට අදාළ ලේකම්වරුන් ඒ දිස්ත්‍රික්කවලට ගිහිල්ලා අදාළ ප්‍රාදේශීය ලේකම්තුමා මුණ ගැහිලා මේ සඳහා යම්කිසි ප්‍රතිචාරයක් දැක්විය යුතුයි කියන එක අපිත් සාකච්ඡා කළේ. තවම මේ තත්ත්වයට විශේෂ මැදිහත්වීම් කරන්න වෙන අවස්ථා තිබෙනවා.

ඔබතුමා දන්නවා, අපේ මාර්ග පද්ධතිය සම්බන්ධ අධිකාරී දෙකක් තිබෙන බව. Line ministry එක හරහා Road Development Authority එක සහ Provincial Road Development Authority කියලා දෙකක් තිබෙනවා. නමුත්, සමහර ප්‍රාදේශීය මාර්ගවලට සිදුවෙලා තිබෙන හානියට මැදිහත් වීමේ capacity එක PRDA එකට තිබෙනවාද කියන එක ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. එතකොට RDA එකටත් ඒවාට මැදිහත් වෙන්න වෙනවා. සැලකිය යුතු නෛතික පසුබිමක් මෙතැන තිබෙනවා. මෙතෙක් කල් ආයතනවලට ඒ වගකීම් බෙදී ගිය විධියටම අපට මැදිහත් වෙන්න බැරි වෙනවා. සමහර වෙලාවට ඒ ප්‍රාදේශීය පාරවල්වලට සිදු වෙලා තිබෙන හානියට මැදිහත් වෙන්න ත්‍රිවිධ හමුදාවේ උපකාර ගන්න දැනටත් අපට සිද්ධ වෙලා තිබෙනවා. මෙවැනි අවස්ථාවලට ත්‍රිවිධ හමුදාව මැදිහත් කිරීම සඳහා තමයි අපි මේ ආඥාපනත පාවිච්චි කරන්නේ. වෙන මොකක්වත් කරන්න නොවෙයි. ගරු කථානායකතුමනි, මේ විධියට සැහැල්ලු ලෙස, කරුණු නැතිව මේක ගැන කථා කරන එක එච්චර හොඳ නැහැ කියලායි මම හිතන්නේ. මොකද, "දිට්වා" ආපදාවෙන් සිද්ධ වෙච්ච බලපෑම ඉතාම බරපතළයි. එතැනදී අපි ඉතාම සුපරීක්ෂාකාරීව, අනාගතය ගැන සිතමින් ඒ අනුව ක්‍රියාත්මක වීම සඳහා ඉතාම අවධානයෙන් වැඩ කළ යුතුයි.

අද ගෝලීය වශයෙන් ඇති වෙලා තිබෙන අස්ථාවරභාවය පිළිබඳව ඔබතුමන්ලා දන්නවා. ඒ අස්ථාවරභාවයත් එක්ක තමයි අපට මෙවැනි ආපදාවකින් recover වෙන්නත් සිද්ධ වෙලා තිබෙන්නේ. යුදමය තත්ත්වයක් ඇති වෙලා තිබෙනවාය කියලා මේ ආපදාවෙන් වුණු හානිය recover කිරීම අපට පැත්තකට දමන්න බැහැ; කල් දමන්න බැහැ. ඒ නිසා මේ තත්ත්වයන් දෙකටම මේ වෙලාවේ මේ රට මුහුණ දෙමින් තිබෙනවා. ජනතාවගේ ජීවිත ගොඩ නඟන්නත්, ඔවුන්ගේ ජීවනෝපාය මාර්ග නැවත වතාවක් හරියාකාරව හදාගන්නට අවශ්‍ය පසුබිම හදා දෙමින්, ඉදිරියට සිදු වන්නට පුළුවන් තත්ත්වයන් මඟහරවා ගැනීම සඳහාත් තමයි අපි මේ සැලසුම් සකස් කරගෙන යන්නේ. ගරු කථානායකතුමනි, ඒ නිසා මේ මර්දනය සඳහා මේ නීතිය පාවිච්චි කිරීමේ අවශ්‍යතාවක් රජයට කිසිසේත්ම නැහැ කියන එක මේ වෙනකොට පැහැදිලි වෙන්න ඕනෑ. අපි මාස තුනක් මේ නීතියත් එක්ක තමයි වැඩ කරලා තිබෙන්නේ. ඒ නිසා මර්දනය කරනවා කියලා නම් විපක්ෂය මේකට විරුද්ධ වෙන්නේ, ඒ මර්දනය කරපු අවස්ථා අපට පැහැදිලි කරන්න කියලා මම ගරු විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා. මේ නීතිය හරහා මොකක් හරි මර්දනකාරී වැඩක් කළා නම් ඒක පැහැදිලි කරන්න. එහෙම නම් ඔබතුමන්ලා ගෙනෙන තර්කය හරි. එහෙම නැත්නම් ඔබතුමන්ලා කියන්න ඕනෑ "දැන් දිට්වා සුළි කුණාටුව ඉවරයි. දැන් ප්‍රශ්නය විසඳිලා. මොකක්වත් නැහැ" කියලා. එහෙම වුණත් අපි තමයි ජයග්‍රහණය කරලා තිබෙන්නේ. අපි - මේ ආණ්ඩුව - ශීඝ්‍රයෙන් මේ ප්‍රශ්න ඔක්කොම විසඳලා තිබෙනවා. එහෙනම් ඒක පිළිගන්න ඕනෑ. හැබැයි, ආණ්ඩුවක් හැටියට අපි ඊට වඩා වගකිව යුතු විධියටයි මේ තත්ත්වයට මුහුණ දෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Prime Minister, your time is over now.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
I am winding up, Sir.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

ජනතාවගේ මේ ප්‍රශ්නවලට අපි තිරසාර විසඳුම් හොයමින් යනවා. ඒ නිසා මෙවැනි ආපදා ඉදිරියටත් සිද්ධ වීමේ අවදානමක් තිබෙන බව අපි සියලුදෙනා දන්නා නිසා, ඒකට මුහුණ දෙන්න ඕනෑ කොහොමද කියන එක ගැනත් හිතමින් මේ තත්ත්වය තුළ අපි වැඩ කටයුතු කරන නිසා අත්‍යවශ්‍ය සේවා ටික පවත්වා ගෙන යෑම සඳහා පමණයි අපි මේ යෝජනා සම්මතය ඉදිරිපත් කරන්නේ කියන එක නැවත වතාවක් මා අවධාරණය කරනවා.

මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Thurairasa Ravikaran. You have seven minutes.

Order, please! Before he starts, the Hon. Deputy Speaker will take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[மு.ப. 11.24]

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, அவசரகாலச் சட்ட நீடிப்புச் சம்பந்தமான விவாதத்தில் முதலில் எங்களுடைய வலியை ஒரு கணம் இங்கே குறிப்பிட்டுவிட்டு அந்த விடயத்துக்கு வருகின்றேன். வலிந்து காணாமல் ஆக்கப்பட்ட உறவுகளுக்கு நீதி கோரி அவர்களின் உறவுகளால் முல்லைத்தீவில் முன்னெடுக்கப்பட்டு வரும் போராட்டம், நாளை மறுநாளோடு ஒன்பது ஆண்டுகளை நிறைவுசெய்து பத்தாவது ஆண்டாகத் தொடரவுள்ளது. தன்னுடைய மகன் வருவான், தன்னுடைய மகள் வருவாள், தன்னுடைய கணவன் வருவார், தன்னுடைய மனைவி வருவாள், தன்னுடைய அப்பா வருவார், தன்னுடைய அம்மா வருவார் என்ற எதிர்பார்ப்போடு நாளும் காத்திருந்து, மாறிமாறி வரும் அரசுகளையும் நம்பி ஏமாந்து, பன்னாடுகளிடமும் நீதி கேட்டு, ஏங்கி ஏங்கியே ஒவ்வோர் உறவினரும் ஏக்கத்தோடு மரணிக்கின்றனர். இலங்கை அரசின் பிள்ளை உளவியல், பெண்ணிய விடுதலை, பாலினச் சமத்துவம், மனித உரிமைகள், முதியோர் நலன் பேணல் அனைத்துமே காணாமல் ஆக்கப்பட்ட எங்கள் உறவுகளுக்கான உங்களின் நீதியில் பொய்த்துப்போய் உள்ளது. மத்திய கிழக்கின் அதிர்வுகளுக்கே அவசர நிலை தேடும் உங்களுக்கு, அருகிலுள்ள எங்களின் அவதிகள் எப்போதுதான் புரியப் போகிறதோ? என்று இந்தச் சபையிலே நான் கேட்டுக்கொள்வதோடு, அவசரகாலச் சட்ட நீடிப்பு சம்பந்தமான விடயத்துக்கு வருகின்றேன். மற்றோர் அவசரகாலச் சட்ட நீடிப்பையும் மறுப்பதே எமது இலங்கைத் தமிழரசுக் கட்சியின் கடன்!

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டத்தின்கீழ், 2026.02.28ஆம் திகதிய 2477/46ஆம் இலக்க அதிவிசேட வர்த்தமானியின் மூலம், இலங்கையின் அரச தலைவரால் கொண்டுவரப்பட்ட அவசரகால நிலை கடந்த 2026.02.28ஆம் திகதி தொடக்கம் நீடிக்கப்பட்டுள்ளது. நாட்டின் மீதான இறைமை கேள்விக்கு உள்ளாக்கப்பட்டு, மத்திய கிழக்கில் நிலவுகின்ற போர்ச் சூழல் இலங்கைத் தீவையும் பாதிப்பதை நாம் எல்லோரும் உணர்கின்றோம்.

தீவுக்குரிய எரிசக்தி வழங்கல், வெளிநாட்டு வேலை வாய்ப்பு, சுற்றுலாத்துறை கடலியல் சேவைகள், நாட்டுக்குரிய அந்நியச் செலாவணி போன்ற விடயங்கள் உலகளாவிய சூழமைவோடு நெருக்கமாகப் பிணைக்கப்பட்டிருப்பதால், இத்துறைகளில் ஏற்படுகின்ற பாதிப்பு எமது நாட்டு மக்களின் வாழ்வாதாரத்தையும் நேரடியாகப் பாதிக்கின்றது. உலக ஒழுங்கில் ஏற்படுகின்ற பொருளாதார அதிர்வுகளுக்கு ஏற்ப நாடு தயார்படுத்தப்படுவதாக கடந்த 2026.03.03ஆம் திகதி மாண்புமிகு சனாதிபதி அவர்களால் தெரிவிக்கப்பட்டது. கிட்டத்தட்ட ஒரு மாதம் அளவுக்கான தாங்குதிறன் தொடர்பாகவும் எதிர்கால விரிவாக்கம் தொடர்பாகவும் எடுத்துரைக்கப்பட்டது. எரிபொருள் சேமிப்பு, சுத்திகரிப்புத் திறன், அத்தியாவசிய சேவைகளின் பராமரிப்பு, கடந்த கால நெருக்கடி நிலை தொடராதிருக்கும் வகையிலான இயல்தகு ஏற்பாடுகள் தொடர்பாகவும் மாண்புமிகு சனாதிபதி அவர்களின் உரையில் தெரிவிக்கப்பட்டது. மேற்படியான இடர் நிலைகளை எதிர்கொள்வதிலும் அவற்றைக் கடந்து வருவதிலும் அவசரகால நடைமுறைகளுக்கு அப்பால் பாராளுமன்ற உறுப்பினர்களாக, வட, கிழக்கின் சார்பாளர் களாக இவ்வரசாங்கத்தின் நேரிய முயற்சிகளுக்கு எமது ஆதரவு உண்டு என்பதை இந்தப் பேரவையில் தெரிவிக்க விரும்புகின்றேன். ஏனெனில், பொருளாதார நெருக்கடியையும் எரிபொருளுக்கான தட்டுப்பாட்டையும் தெற்கைவிட நாங்கள் நன்கறிந்தவர்கள்; சொந்தத் தீவுக்குள்ளாகவே அரசின் பொருளாதாரத் தடைக்குள்ளும் தற்சார்போடு வாழ்ந்தவர்கள். எனவே, அத்தகைய சூழல் மீண்டும் ஒருபோதும் ஏற்படாதிருப்பதை உறுதிப்படுத்துவதுதான் இந்தச் சபை யிலுள்ள எம்மனைவரதும் பொறுப்பு.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எவ்வாறு பொருளாதார நெருக்கடியும் அதன் விளைவுகளும் எங்களுக்கு புதிதானவை அல்லவோ அதுபோலவேதான் இந்த அவசரகால நடைமுறையும். தற்போது நீடிக்கப்பட்டுள்ள அவசரகால நிலை, தற்போதைய உலகளாவிய சூழ்நிலையில் அத்தியாவசிய சேவைகள், பொருளாதார உறுதி, தேசிய பாதுகாப்பை உறுதிப்படுத்தல் போன்ற கூறப்பட்ட நோக்கங்களுக்காக மட்டும் பயன்படுத்தப்படுவதை இந்த அரசாங்கமும் இந்தப் பேரவையும் உறுதிப்படுத்த வேண்டும். அதிகாரிகளுக்கு வழங்கப்படும் மீயுயர் அதிகாரம் தேசிய நெருக்கடி காலங்களில் மக்களின் இயல்பு வாழ்வை இயலுமானவரையில் உறுதிப்படுத்த மட்டும் பயன்படுத்தப் படுவதாக இருக்க வேண்டும். மாறாக, அவை கடந்த காலங்களைப் போன்று தமிழர் குரல் வளையை நெரித்து, கட்டமைக்கப்பட்ட இன அழிப்பு நடைமுறைகளை வட, கிழக்கில் தொடர்வதற்கான கருவியாக அமைதல் கூடாது. விடுதலைப் போராட்ட வரலாற்றில் பல ஆண்டு காலம் நாங்கள் அவசரகால விதிமுறைக்குள்ளாகவே வாழ்ந்தவர்கள். எனவே, இத்தகைய சட்டங்கள் மீண்டும் அறிமுகப் படுத்தப்படும்போதெல்லாம் அது தேசியளவில் இடர்நிலையை ஒழுங்கமைக்கும் செயற்பாடாக அல்லாது, தமிழர்

உரிமைகளை நசுக்கும் ஒரு வல்லாதிக்கக் கருவியாகவே எமது மக்களால் பார்க்கப்படுகின்றது. இது எமது மக்கள் மத்தியில் இயல்பாகவே அச்சத்தையும் நிச்சயமற்ற தன்மையையும் உருவாக்குகிறது. சட்ட ஏற்பாட்டுடனான மக்கள் மயப்பட்ட நடவடிக்கைகள், அமைதியான போராட்டங்கள், வடக்கு, கிழக்கில் உள்ள மக்களின் அன்றாட இயல்பு வாழ்வைக் கட்டுப்படுத்தும் வகையில் இந்த ஒழுங்குவிதிகள் பயன்படுத்தாதிருப்பதை உறுதிப்படுத்துங்கள்!

போருக்கு முன்னரும் போரின்போதும் போருக்குப் பின்னரும் எங்கள் இறைமைக்காக, தேசிய இருப்புக்காக, நிலத்துக்காக, வாழ்வாதார மூலங்களுக்காக போராட்டமே வாழ்வாக தமிழர்கள் நாங்கள் போராடிக் கொண்டிருக்கிறோம். போரின்போது இலங்கை அரசால் நிகழ்த்தப்பட்ட இனப் படுகொலைக்கான நீதி வேண்டிப் போராடிக் கொண்டிருக் கின்றோம். உங்களிடம் நம்பி ஒப்படைத்து தொலைந்துபோன எங்கள் உறவுகளுக்கான நீதி வேண்டிப் போராடிக் கொண்டிருக்கின்றோம். போரிலே அரசியல் கைதிகளாகிச் சிறையில் வாடும் எங்கள் உறவுகளின் விடுதலையை வேண்டிப் போராடிக் கொண்டிருக்கின்றோம். வெள்ளம் வந்தாலும் மண்சரிந்தாலும் தீப்பிடித்தாலும் ஏன், உலக ஒழுங்கில் எந்தக் குழப்பம் நேர்ந்தாலும் ஓயாது தமிழர் நிலங்களை அபகரித்துக்கொண்டிருக்கும் மகாவலி அபிவிருத்தி அதிகார சபை, வனப் பாதுகாப்புத் திணைக்களம், வனசீவராசிகள் பாதுகாப்பு திணைக்களம், படையினர் போன்ற அரசின் குடியேற்றக் கட்டமைப்புகளிடம் இருந்து எங்கள் சொந்த நிலத்தைக் காப்பாற்றவும் எங்கள் உரிமைகளைத் தக்கவைக் கவும்தான் நாளும் போராடிக் கொண்டிருக்கிறோம்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Sir, give me one more minute, please.

தீவுக்குள்ளாக உங்களுடனும், தீவுக்கு வெளியே இந்திய இழுவைப் படகுகளோடும் போராடுதலே வாழ்வாகிப்போகும் எங்களின் போராட்டங்களை மட்டுப்படுத்தும் வல்லாதிக்கக் கருவியாக இந்த அவசரகாலச் சட்டம் பயன்படுத்தப்படா திருப்பதை நீங்கள் நிச்சயமாக உறுதிசெய்யுங்கள்!

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த உலகளாவிய நிச்சயமற்றபொழுதிலே, இந்த நாட்டிலுள்ள அனைத்துச் சமூகங்களும் தாம் பாதுகாக்கப்பட்டவர்களாகவும் மதிக்கப் படுபவர்களாகவும் உணர வேண்டியது கட்டாயத் தேவை. சட்டம் நியாயமாகவும் பொறுப்புடனும் பயன்படுத்தப்படும் என்ற நம்பிக்கையை ஒவ்வொரு குடிமகனும் கொண்டிருக்கும் போது மட்டுமே தேசிய உறுதிப்பாட்டை அடைய முடியும். எனவே, தற்போதைய உலகளாவிய நெருக்கடியின் பொருளாதார மற்றும் சமூகப் பாதிப்புகளில் இருந்து நாட்டைப் பாதுகாப்பதற்கான அரசாங்கத்தின் முயற்சிகளுக்கு, அவசர காலச் சட்ட முறைகளுக்கு அப்பால் நாம் ஆதரவளிக்கும் அதேவேளை, அவசரகால விதிமுறை களுக்கு உள்ளும் புறமுமாக எங்களுக்கான கடந்தகால நீதியே இன்னும் தேக்க நிலையிலுள்ளபோது, அவற்றுக்கான போராட்டமே எங்களின் வாழ்வாகும்போது, மேலும் அவசரகால சட்ட நீடிப்பை மறுப்பதுதான் எங்களுடைய கடமை! தேசிய பாதுகாப் பென்பது மக்களின் உரிமைகளோடு ஒத்திசைவதே என்பதை உங்கள் அரசாங்கத்தின் அவசரகால நிலையேனும் மெய்ப் பிக்கட்டும். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Harshana Nanayakkara. You have 14 minutes.

[පූ.භා. 11.33]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ 2වන වගන්තිය ප්‍රකාරව ගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අතිවිශේෂ ගැසට් පත්‍රයේ යෝජනා සම්මතයක් පළ කර තිබෙනවා. එය සම්මත කිරීම සඳහා අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ජන ජීවිතය පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වන සහ එකී සේවාවන්ට අවහිරයක් හෝ බාධාවක් විය හැකි දේවල් වැළැක්වීමට මෙම අත්‍යවශ්‍ය සේවා ප්‍රකාශයට පත් කර තිබෙනවා. මෙහි මූලික හරය මෙයයි. අද දින විපක්ෂය විසින් අවස්ථා ගණනාවක පැහැදිලි කරන්නට යෙදුණේ අප විසින් විපක්ෂය හෝ ජනතාව මර්දනය කිරීමට මෙම අණ පනත්, රෙගුලාසි ගෙනෙන බවයි. මා ඉස්සෙල්ලාම යෝජනා කරන්න කැමැතියි, එහෙම මර්දනය කළ අවස්ථාවක් තිබෙනවා නම් කියන්න කියලා. මෙම රෙගුලාසි භාවිත කරලා අපි කොයි අවස්ථාවේ, කාවද අත්අඩංගුවට ගත්තේ, කාටද හිරිහැර කළේ? මතක තබාගන්න, මේ රටේ ජනතාවට මේ රජය ආදරෙයි. ඒ වාගේම මහජනතාවත් මේ රජයට ආදරෙයි. අපට මිනිසුන් මර්දනය කිරීමේ වුවමනාවක් කිසිදු අවස්ථාවක නැහැ.

මෙම හදිසි අවශ්‍යතාව සම්බන්ධයෙන් සීමාසහිත ක්ෂේත්‍ර කිහිපයක් තමයි ආවරණය වන්නේ. ඒ, විදුලි බලය සැපයීම සම්බන්ධව සියලු සේවාවන්; ඛනිජ තෙල් නිෂ්පාදන, ගෑස් ඇතුළුව ඉන්ධන සැපයීම හෝ බෙදාහැරීම; රෝහල්වල, සාත්තු නිවාසවල, බෙහෙත්ශාලා සහ වෙනත් සමාන ආයතනවල රෝගීන් නඩත්තු කිරීම සහ පිළිගැනීම, රැකවරණය පෝෂණය කිරීම සහ ප්‍රතිකාර කිරීම සම්බන්ධව අවශ්‍ය හෝ කළ යුතු ඕනෑම විස්තරයක සියලු සේවා, වැඩ හෝ ශ්‍රමය; මගීන් හෝ බඩු ප්‍රවාහනය සඳහා වූ පොදු ගමනාගමන සේවා; මංමාවත්, පාලම්, බෝක්කු, ගුවන් තොටුපළවල්, වරාය සහ දුම්රිය මාර්ග ඇතුළුව, මංමාවත්, දුම්රිය මාර්ග හෝ ගුවන් මගින් ගමනාගමන සේවා, සංචාරක සේවා සඳහා පහසුකම් සැලසීම සහ පවත්වාගෙන යාම; ජලය සැපයීම සහ ජලාපවහනය සම්බන්ධ සියලු සේවාවන්; ආහාර හා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයීම, ආරක්ෂා කිරීම සහ බෙදා හැරීම සම්බන්ධ සියලු සේවාවන්; සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරින්, සමෘද්ධි සංවර්ධන නිලධාරින්, කෘෂි පර්යේෂණ සහකාර, ප්‍රජා සවිබලගැන්වීමේ නිලධාරින්, ක්ලීන් ශ්‍රී ලංකා කේන්ද්‍රීය කණ්ඩායම් නිලධාරින් ඇතුළු සියලු දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරින් විසින් ඉටු කළ යුතු වන්නා වූ හෝ ඉටු කිරීමට අවශ්‍ය වන්නා වූ කවර වුව ස්වභාවයේ සියලුම සේවාවන්, වැඩ හෝ ශ්‍රම දායකත්වය; ගිලන් රථ සේවාවන්; ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළුව සියලුම රාජ්‍ය බැංකු හා රක්ෂණ සේවා කටයුතු; ජලය සැපයීම, විදුලිය බලය, ජලාපවහනය සහ කසළ කානු ක්‍රමය, ගිනි නිවීමේ

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

හා ගිලන් රථ සේවය, කසළ ශෝධනය සහ කුණු ඉවත් කිරීම සඳහා යම් පළාත් පාලන ආයතනයක් මඟින් කරගෙන යනු ලබන යම් කාර්යභාරයක් සහ පළාත් පාලන ආයතන මඟින් සිදු කරන සියලුම සේවාවන්; වාරිමාර්ග සම්බන්ධ සියලු සේවාවන්; දුරකථන, විදුලි සංදේශ සහ මාධ්‍ය සම්බන්ධ සියලු සේවා; පහත් බිම් ගොඩකිරීම සහ සංවර්ධනය කිරීම සම්බන්ධ සියලුම සේවාවන්; කෘෂි සහ කෘෂි රක්ෂණ සේවා සම්බන්ධ සියලු සේවාවන් යනාදියයි. මේ රටේ ජනතාව තේරුම් ගන්න ඕනෑ, මේ අංශ 15 තිබෙන්නේ රටේ ජනතාවට පහසුවක්, සාධාරණයක් ඇති කරන්න මිස කවුරුවත් මර්දනය කරන්න නොවෙයි කියන එක.

ඒ වාගේම අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයාගේ කාර්යභාරයත් අපට ඉතා වැදගත් වනවා. "දිට්වා" සුළි කුණාටුව ඇති වූ වහාමත්, ඉන් පසුවත් රටේ ජනතාවට අවශ්‍ය සහන සියල්ල ලැබුණේ මේ අත්‍යවශ්‍ය තත්ත්වය declare කිරීම මතයි. ඔබතුමන්ලා දන්නවා, රජයේ පරිපාලන චක්‍රලේඛ වැනි නොයෙකුත් දේවල් නිසා ප්‍රදේශයකින් ප්‍රදේශයකට සම්පත් හෝ පුද්ගලයින් හුවමාරු කරන්න හැකියාව ලැබුණේත් මේ නිසාය කියලා. ඒ නිසා තමයි අපේ පළාත් පාලන ආයතනවල භාණ්ඩ සහ පුද්ගල ශ්‍රමය අඩු වනකොට බදුල්ල පැත්තට හම්බන්තොටින් සහාය දෙන්න පුළුවන් වුණේ; කොළඹින් කොළොන්නාවට සහාය දෙන්න පුළුවන් වුණේ.

ඒ අනුව මෙම අත්‍යවශ්‍ය රෙගුලාසි සියල්ලම රටේ මහ ජනතාවගේ උන්නතිය වෙනුවෙන් කල්පනා කරලා ඉදිරිපත් කරන දේවල් විනා වෙන කිසිවක් නොවේ. ඒ නිසා විපක්ෂය විසින් කරන අසත්‍ය චෝදනා ජනතාව ඒ බරින්ම අසත්‍ය බව තේරුම් ගත යුතුයි. අපට කිසිවෙක් මර්දනය කරන්න අවශ්‍ය නැහැ. අවාසනාවන්ත ලෙස අපට ඉන්න විපක්ෂය ඇත්ත, සාධනීය කරුණු සම්බන්ධයෙන් රජය විවේචනය කරමින් එය නිවැරදි මඟට ගන්නවා වෙනුවට පැය 24ක්වත් පවත්වාගෙන යන්න බැරි අසත්‍ය, විකෘති කරපු කරුණු මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා හුවා දැක්වීම අලුත් දෙයක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක පසුගිය අවුරුද්ද තුළම සිදු වුණා. හැබැයි, මුල් අවස්ථාවලදී මමත් යම් ප්‍රමාණයකට කලබල වුණා, මේගොල්ලන් කියන දේ ජනතාව පිළිගත්තොත් මොකක්ද වෙන්නේ කියලා. නමුත්, දැන් පැහැදිලිව පෙනෙනවා, ඒගොල්ලන් කියන බොරුවක් ඒගොල්ලන්ට පැය 24ක්වත් පවත්වා ගෙන යන්න බැහැ කියන එක. හැබැයි, ජනතාව දැන් විපක්ෂ කියන දේවල් අහලා කලබල වෙන්නේත් නැහැ. නමුත්, ජනතාව ඒවා අහලා කලකිරෙනවා.

විපක්ෂයේ කාර්යභාරය මොකක්ද? විපක්ෂය දේශපාලනය කරන්නේ. ඔවුන්ට බලයට එන්න ඕනෑ නම් ඇත්ත කථා කරමින්, රටට ප්‍රතිපත්ති ඉදිරිපත් කරමින්, වැඩ පිළිවෙළක් හදලා ජනතාවගේ හිත දිනා ගත යුතුයි. නමුත්, ඔවුන් ජනතාව භය කරන, ඒ අය කුපිත වන විධියේ අසත්‍ය, විකෘති කරුණු කියනවා. ඒ වාගේම එකම කරුණ ගැන දෙවතාවකට දෙවිධියකට කියන කට්ටියකුත් ඉන්නවා. එක්තරා අවස්ථාවකදී අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් රටට විශාල හානියක් වෙනවාය කිව්වා. ඊට පස්සේ ඒ කටවලින්ම කියනවා, අපි ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනෙන්න එපා කිව්වේ නැහැ කියලා. මතක තියා ගන්න, මේ රටේ මිනිස්සු මැරිලා ඉපදිලා නැහැ කියන එක, ඔය කට්ටියව තේරුම් නොගන්න. මම මේ කියන්නේ විපක්ෂයේ හැම මන්ත්‍රීවරයා ගැනම නොවෙයි. සාධනීය කරුණු ඉදිරිපත් කරන මන්ත්‍රීවරු කිහිපදෙනෙක් ඉන්නවා. නමුත් සමස්තයක් වශයෙන් විපක්ෂය දක්වන කරුණු ද්වේෂසහගත සහ විකෘති කළ ඒවා. බොහෝ අදහස්වල අලියා ගිලපු දිවුල වාගේ තත්ත්වයක් තිබෙන්නේ. අපි ඔබතුමන්ලා කියන දේවල්වලට කන් දෙන්නම්. නමුත්, ඒවායින් පිළිගන්නේ මොනවාද, ඒ අනුව වැඩ කරන්නේ කොහොමද කියන එක ගැන අපිට කල්පනා කර බලන්නට වෙනවා.

ඒ වාගේම අපේ ආණ්ඩුව බලයට එනකොට ඔවුන් කිව්වේ මොකක්ද? මේ අයට ජාත්‍යන්තර සම්බන්ධතා නැහැ, පෙට්ටි කඩයක්වත් කර ගන්න බැහැ, IMF එකත් රට දාලා යයි කිව්වා. මම මේ කාරණය නිතරම කියනවා. නමුත්, දැන් ඔවුන්ට දරා ගන්න බැහැ, අපේ ජනාධිපතිතුමාගේ රාජ්‍ය තාන්ත්‍රිකත්වය සහ අන්තර්ජාතික ප්‍රජාව අපේ ජනාධිපතිතුමාත්, ආණ්ඩුවත් කෙරෙහි තබා ඇති විශ්වාසය.

දැන් බලන්න, ඒ අය කියන අසත්‍ය කරුණු සම්බන්ධයෙන්. අපි දන්නවා, ඉරානය සහ ඇමෙරිකාව අතර තිබෙන ගැටුම මුළු ලෝකයටම බලපාන දෙයක් බව. කොයි රටේ යුද්ධයක් තිබුණත් ඒකෙන් හානි වෙන්නේ මනුෂ්‍ය ජීවිතවලට. අන්න ඒ හින්දා තමයි අපේ විදේශ කටයුතු ඇමතිතුමාත්, ජනාධිපතිතුමාත් නිතරම ආයාචනා කරන්නේ හැකි ඉක්මනින් සාමය ගෙනෙන්න කියලා. අපි කුඩා දූපතක් වුණත්, කුඩා රටක් වුණත් මේ ආණ්ඩුව නියෝජනය කරන අපේ ආත්ම විශ්වාසය, හෘදය සාක්ෂිය ඉතා විශාලයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ලෝකයේ කිසිම මනුෂ්‍යයෙක් කිසිම හේතුවක් නිසා මැරෙනවාට අපි ආසා නැහැ. ඒ වාගේම අන්තර්ජාතික නීති අනුව, අන්තර්ජාතික ප්‍රඥප්තීන් අනුව අපි හැමවිටම මධ්‍යස්ථව කටයුතු කරන රටක්. පක්ෂග්‍රාහීව කිසිදු රටකට අපේ භූමිය, අපේ අහස, අපේ වතුර දෙන්න අපි සූදානම් නැහැ. ඒ වාගේම තව කෙනෙකුට හානි කරන්න ඒවා පාවිච්චි කිරීම සඳහා ඉඩ දෙන්නත් අපි සූදානම් නැහැ. අපි මධ්‍යස්ථයි වාගේම මානුෂීයයි. ඒ මානුෂීය තත්ත්වයෙන් තමයි අපි මේ කටයුතු කරන්නේ.

අපි මෙසේ මහන්සි වෙනකොට විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු අහනවා, නැවක් ඇවිල්ලා තිබෙනවා, ඒකේ ළමයි 300ක් ඉන්නවා, ඒ අය බේරා ගන්න මොකක්ද කරන්නේ කියලා. දැන් ඒ ළමයි ලොකු වෙලාද දන්නේ නැහැ. මොකද, 208ක් ඉන්න නැවකට අපේ ජනාධිපතිවරයාගේ මැදිහත් වීම සහ රාජ්‍ය තාන්ත්‍රික මැදිහත් වීම හරහා ආරක්ෂාව සපයා තිබෙනවා, මනුෂ්‍යයන් වශයෙන්. නමුත්, ඒ නැවේ ළමයි හිටියේ නැහැ. පැය 24ක්වත් පවත්වාගෙන යන්න බැරි බොරුවක් කියන්නේ ඇයි? ඇත්තටම ඒගොල්ලන් Facebook එකෙන් කරුණු හොයා ගන්නවා මිසක් පොඩ්ඩක්වත් හරියට ඒවා ගැන හොයා බලන්නේ නැහැ. මොකද, මම දැක්කා, ඔය ළමයි 300 කථාව නයි නාළිකාවේ නිවේදක මහත්තයෙක් කියනවා. හැබැයි, ඊට සුළු වේලාවකට පස්සේ ළමයි කියන කෑල්ල හලලා 300ක් විතරක් කියා කියනවා. හැබැයි, අදාළ මන්ත්‍රීවරයා දැක්කේ කලින් පළ කරපු තොරතුර විතරයි. මේ පාර්ලිමේන්තුව වැදගත්, ගෞරවනීය, ඇත්ත කියන්න ඕනෑ තැනක්. ඒ නිසා හදිසියේ එහෙන් මෙහෙන් කෑලි මේ පාර්ලිමේන්තුවට උස්සාගෙන එන්න එපා. මොකද, ඒක ජනතාවට කරන අසාධාරණයක්. එවන් අසත්‍ය, විකෘති තොරතුරු ඉදිරිපත් කරමින් කෙසේ හෝ රටේ ජනතාව කලබල කරන්න හදනවා. මේ නිශ්චිත මොහොතේ Facebook එකේ කාරණා දෙකක් පළ වනවා. ඒ, මොකක්ද? එක්තරා විධියකට කියනවා, ඉරානයේ නැවට ගහන්න ඔත්තු සැපයුවේ ලංකා රජය කියලා. එහෙම බොරු ප්‍රවෘත්තියක් දැන් පළ වෙනවා. ඊට පැය කිහිපයකට පස්සේ ඒ කණ්ඩායමේම තවත් කෙනෙක් මුහුණු පොතේ ප්‍රවෘත්තියක් පළ කරනවා අපි දැක්කා. ඒ, මොකක්ද? ඉරානයේ නැවට ගහන්න ලංකාව කුමන්ත්‍රණය කරපු නිසා, තොරතුරු දීපු නිසා, ඉරානය ලංකාවට තෙල් දෙන්නේ නැතුව ඉන්න හදනවා, පුළුවන් තරම් ඉක්මනට ෂෙඩ්වලට ගිහිල්ලා තෙල් ගහගන්න කියලා. Facebook එකේ එහෙම ප්‍රවෘත්තියක් පළ වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බලන්න මේ අය මොන තරම්

කාලකණ්ණි, බංකොලොත් මිනිස්සුද කියලා. ඔබතුමන්ලා දේශපාලනය කරන්න, ඔබතුමන්ලා බලයට එන්න. හැබැයි, ඇත්ත කියලා එන්න; ප්‍රතිපත්තියක් ඇතුව එන්න; ක්‍රමයක් ඇතුව එන්න. නමුත්, ඔවුන් බලාපොරොත්තු වෙන්නේ රට ගිනි අරගෙන හෝ අපට බලය ලැබෙනවා නම් කමක් නැහැ කියායි. ඒ වාගේ පොඩි පොඩි හනුමලා හැම තැනම ඉන්නවා. ඔවුන් මේ රට ගිනි තියන එක කරන්නේ. ජනතාව අපටත් දොස් කියනවා, "ඔබතුමන්ලා ආණ්ඩුවේ නේද ඉන්නේ, ඔබතුමන්ලාට තුනෙන් දෙකක් තිබෙනවා නේද, මේ අය අත්අඩංගුවට ගන්න බැරිද?" කියලා. නමුත්, අපි එහෙම කරන්නේ නැහැ. භාෂණයේ නිදහස තිබෙනවා. විපක්ෂයටත්, රටේ ඕනෑම කෙනෙකුටත්, අපි අකැමති මිනිස්සුන්ටත් ඒ භාෂණයේ නිදහස ඒ ආකාරයෙන්ම තිබෙනවා. මම ආයාචනා කරන්නේ ඒක වගකීම් සහිතව පාවිච්චි කරන්න කියලා විතරයි. මම මේ කියන එක විපක්ෂයේ ඉන්න හැම මන්ත්‍රීවරයෙක්ම භාර ගන්න ඕනෑ නැහැ. මොකද, විපක්ෂයේ වැදගත් මිනිස්සු කිහිපදෙනෙක් ඉන්න නිසායි මම එහෙම කියන්නේ. නමුත්, ඔබතුමන්ලා රට වෙනුවෙන් හිතලා කටයුතු කරන්න ඕනෑ කියලා මම හිතනවා. මොකද, ඔය ක්‍රමයට ඔබතුමන්ලාට බලය ගන්න බැහැ. ඊළඟ මැතිවරණයේදී ජනතාව මේ ආණ්ඩුව ගෙදර යවන්නේ නැහැ. හැබැයි, මේ ඉන්න විපක්ෂය ගෙදර යවලා අලුත් විපක්ෂයක් ගෙන්වා ගන්න ඉඩ තිබෙනවා. මොකද, මේ වාගේ අසත්‍ය කියන පුද්ගලයන්ට ඡන්දය ඉල්ලන්නවත් ජනතාව ගමට එන්න දෙන්න ඕනෑ නැහැ. ප්‍රශ්න කරන්න ඕනෑ, ළමයි 300 කොහේද හිටියේ කියලා.

තෙල් පෝලිම් ටිකක් ආවා. ඒ තෙල් පෝලිම්වල හිටපු ජනතාවට මා දොස් කියන්නේ නැහැ. මොකද, ඔවුන් සැහෙන්න ඒ සම්බන්ධයෙන් බැට කාලා තිබෙනවා. මොකද, කාලයක් තෙල් නැති වුණේ රට බංකොලොත් නිසා නේ. මෙවර තෙල් තිබිලාත් තෙල් පෝලිම් ඇති වුණේ ඉරානයේ යුද්ධය නිසා ජනතාව කලබල වුණු නිසායි. ජනතාව කලබල වන එක ඇත්ත නේ. ජනතාවට පෝලිම්වල ඉඳලා ඉතා කටුක අත්දැකීම් තිබෙනවා නේ. ඒ නිසා මම එහෙම පෝලිම්වලට ආපු ජනතාවට දොස් කියන්නේ නැහැ. නමුත්, ඒකට පොහොර දමමින් දුවන ෆේස්බුක්කරුවන්ට මම මොකක්ද කියන්නේ? ඔවුන් රටට කරන හානියක් තිබෙනවා. ඇත්තෙන්ම මෙතැනදී සිද්ධ වෙන්නේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් විසින් පාර්ලිමේන්තුවේ තිබෙන වරප්‍රසාද භාවිත කරමින්, මෙතැන යම් කරුණු කියලා, ඒවා සමහර නාළිකා හරහා පවත්වාගෙන යන එකයි. මොකද, මේ සභාවේ ඕනෑම බොරුවක් කියන්න පුළුවන්. ඒකට නඩුවක් පැවරෙන්නේ නැහැ.

කෙසේ වෙතත්, මම පැහැදිලිව කිව යුතුයි, හැමෝටම භාෂණයේ නිදහස තිබෙන බව. ඒකට රජය මැදිහත් වෙන්නේ නැහැ. එවන් තත්ත්වයක් යටතේ අපි මේ අවස්ථාවේදී ඉතා සන්තෝෂ වෙනවා. මම හිතන විධියට, බලයට ආපු අනුර කුමාර දිසානායක සහෝදරයාට වඩා දැන් ඉන්න ජනාධිපති ඉතා ජනප්‍රියයි, ඉතා ප්‍රසිද්ධයි, ඉතා ශක්තිමත් බව ජනතාවට පෙන්වන්න අපට අවස්ථාව ලැබිලා තිබෙනවා. "දිට්වා" සුළි කුණාටුව ආපු වෙලාවේ එතුමාගේ රාජ්‍ය තාන්ත්‍රිකභාවයත්, කාර්යශූරභාවයත්, සැබෑ කැපවීමත් රටේම ජනතාව දැක්කා. අන්තර්ජාතිකව අපි ඉතා කුඩා රටක් වුණත්, ආර්ථිකව ලොකු හයියක් නැතත් දැන් මේ නිශ්චිත මොහොතේදී එතුමා ඔළුව කෙළින් තියාගෙන තීන්දු තීරණ ගනිමින්, මානුෂීයත්වයට මැදිහත් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ජන බලවේගයේ කොටස්කරුවෙක් වශයෙන් මම ගොඩක් ආඩම්බර වුණා, අපට මෙවන් මානවවාදී ආණ්ඩුවක් පිහිටුවා ගන්න හැකි වීම සම්බන්ධයෙන්. ඒ කියන්නේ, අවුරුද්දයි මාස කිහිපයකට කලින්. අද මම ගොඩක් සතුටු වෙනවා, අවංක, ජනතාව ගැන හැඟීමෙන්, බුද්ධිමත්ව, කලබල නොවී, ඕනෑම පීඩාකාරී තත්ත්වයකට මුහුණ දෙමින් රට මෙහෙයවන්න පුළුවන් නායකයෙකුගේ කණ්ඩායමක කොටස්කාරයෙක් වීම ගැන. මම ඒ ගැන ආඩම්බර වෙනවා. ඒ වාගේම අපි වයසට ගියාට පසුව කවදා හරි දරුවන්ටත්, පුතාලට, දූලාට කියන්න පුළුවන්, අපිට මෙහෙම ජනාධිපති කෙනෙක් හිටියා කියලා. විපක්ෂය බලාගෙන හිටියේ අපි ඇන ගන්නා තුරු. නමුත්, අපි ඇන ගත්තේ නැහැ. මොකද, අපේ නායකයා අපිව හරියට මෙහෙයවූවා. අපි කුහක නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Leader of the Opposition. You have six minutes.

[පූ.භා. 11.46]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා(විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හදිසි නීතිය දීර්ඝ කළ යුතුයි කියන තර්කය තුළ සාකච්ඡා කරන මේ අවස්ථාවේදී විශේෂයෙන්ම හර්ෂණ නානායක්කාර ඇමතිතුමා කිව්වා, අසත්‍ය කේන්ද්‍ර කරගෙන විපක්ෂය කථා කරනවා කියලා. මම කැමැතියි, ඔබතුමාට සත්‍යවාදී කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න. ඔබතුමන්ලාට පුළුවන්, එතකොට ඒවාට නිසි පිළිතුරු ලබා දෙන්න. ඇත්තවශයෙන්ම "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් වූ අයට සහන ලබා දීම වේගවත් කිරීමටත්, ඒ වාගේම තවදුරටත් රටේ ජාතික ආරක්ෂාව හැම අතකින්ම සුරක්ෂිත කරන්නටත්, ආරක්ෂා කරන්නටත් තමයි දැන් හදිසි නීතිය ක්‍රියාත්මක වෙන්නේ.

ඇත්ත වශයෙන්ම හදිසි නීතිය පනවපු අවස්ථාව රටේ ජාතික ආරක්ෂාව ඉහළම තත්ත්වයක තිබිය යුතු අවස්ථාවක්. ඉතින් මම මේ කාරණය අහන්න කැමැතියි. ජාතික ආරක්ෂාව පිළිබඳ ජාතික ආරක්ෂක කවුන්සලය රැස් වුණා ලු, සාකච්ඡා කළා ලු, ඒ කරුණු කාරණා සියල්ල පිළිබඳව හොඳට විශ්ලේෂණය කළා ලු. ඉතින් ජාතික ආරක්ෂාව උත්සන්නව තිබෙන මොහොතක ඇමෙරිකානු submarine එකක් අපේ අනන්‍ය ආර්ථික කලාපයට ආවා කියලා ඔබ දැනගෙන හිටියේ නැද්ද? "IRIS Dena" කියන frigate එකට - ඒකට කියනවා Moudge-class frigate එකක් කියලා; ඒක නැවක් - submarine එකකින් Mark-48 heavyweight torpedo ප්‍රහාරයක් එල්ල වුණා. ජාතික ආරක්ෂාව ඉතාම ඉහළින් තිබෙන අවස්ථාවක, මොහොතක අපේ රටේ මුහුදු තීරයේ ගොඩබිමේ සිට නාවුක සැතපුම් 40ක් එහාට submarine එකක් එනකොට, ඒක සොයා බලන්නට අපට surface radars නැද්ද, sonobuoys නැද්ද, underwater sonar networks නැද්ද, towed sonar නැද්ද, satellite surveillance නැද්ද? හදිසි නීතිය ක්‍රියාත්මක වෙලා රටේ ජාතික ආරක්ෂාව ඉහළම තලයක තිබෙන අවස්ථාවක තමයි අපේ අනන්‍ය ආර්ථික කලාපයට ඇවිල්ලා මේ සිද්ධිය වෙන්නේ. ඒ විතරක් නොවෙයි. සිද්ධිය වුණාට පස්සේ ආරක්ෂක අමාත්‍යාංශය කියනවා, "නැහැ. අපට කියන්න බැහැ, එහෙම දෙයක් සිදු වුණාද, නැද්ද කියලා" යනුවෙන්. එතැනින්ම තේරෙනවා, අපේ රටේ ජාතික ආරක්ෂාවට අත්පත් වෙලා තිබෙන ඉරණම.

දැන් කිව්වා, 208දෙනෙකු බේරා ගත්තා කියලා. ඒක බොහොම හොඳ දෙයක්. ඒ අය බේරා ගත්ත එක පිළිබඳව අපේ ස්තුතිය පුද කරනවා. හැබැයි, 208දෙනෙකු බේරා ගන්න

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඉස්සෙල්ලා 130කට වැඩි ප්‍රමාණයක් ජීවිත පරිත්‍යාග කළා. ඒක කොහොමද වුණේ? අපේ රටේ territorial sea එකේ නාවුක සැතපුම් 12ක් ඇතුළත ඒ නැව තිබුණා නම්, ඒ 130ක පිරිස බේරෙනවා. ඒ 130ක පිරිස බේරා ගන්න බැරි වුණු මොහොතක අඩුම ගණනේ 208දෙනෙකු බේරා ගත්ත එක ඉතාම ලොකු දෙයක් කියන එක මා ඔබතුමාට මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. මා හිතන විධියට, දැන් අලියා ගිලපු දිවුල වාගේ වෙලා තිබෙන්නේ ආණ්ඩුව. වෙන කවුරුත් නොවෙයි. කෙසේ නමුත්, මා මේ කාරණය අහන්න කැමැතියි. ඔබතුමන්ලා අපේ තානාපති කාර්යාල හරහා රාජ්‍ය තාන්ත්‍රිකව මෙහෙයුමක් දියත් කර තිබෙනවාද? මේ අනන්‍ය ආර්ථික කලාපය කියන එක අපේ රටට අයිතිය තිබෙන කලාපයක්. ඒක තහවුරු කරන්නට ඔබතුමන්ලා අරගෙන තිබෙන රාජ්‍ය තාන්ත්‍රික වැඩ පිළිවෙළ මොකක්ද?

ඒ වාගේම අපි කිව්වා, හෝමුස් සමුද්‍ර සන්ධිය නැව් ගමනාගමනයට ඉඩ නොතබා වහන්න යනවාය කියලා. දැන් දින කිහිපයකට පෙර විදේශ කටයුතු ඇමතිතුමා කිව්වා, එහෙම ප්‍රශ්නයක් නැහැ, එහෙම ගැටලුවක් නැහැ කියලා. නමුත් අන්න ඒක වහලා. ඒ තුළ තෙල් මිලදී ගැනීම ඇත්ත වශයෙන්ම බරපතළ ප්‍රශ්නයක් වෙනවා. ඉලක්කම් දෙකේ ප්‍රතිශතයකින් ඉන්ධන මිල ඉහළට යනවා. හැබැයි මේ අවස්ථාවේ ඇත්තටම ආණ්ඩුවට ගන්න පුළුවන් ක්‍රියාමාර්ගයක් තිබෙනවා. මොකද, ඇමෙරිකා එක්සත් ජනපදය ඉන්දියාවට රුසියාවෙන් තෙල් මිලදී ගැනීමේ අවකාශය සැලසෙන පරිදි දින 30ක කාලයකට තාවකාලිකව සම්බාධක නතර කර තිබෙනවා. කරුණාකරලා විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ රජයේ නියෝජිත කණ්ඩායමක් ඉන්දියාවට යවන්න; රුසියාවට යවන්න. යවලා සම්බාධක ඉවත් වුණු දින 30ක කාලය තුළ අපේ රටට අවශ්‍ය තෙල් ටික නියමිත වෙලාවට ලබා ගන්නට වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියලා මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා. ඒ වාගේම මා අහන්න කැමතියි, මේ දින 30ක කාලය සීමාව භාවිත කරමින් දැනටමත් රාජ්‍ය තාන්ත්‍රික කණ්ඩායමක් යවන්නට කටයුතු කර තිබෙනවාද කියලා.

හෝමුස් සමුද්‍ර සන්ධිය - Strait of Hormuz - වැහුවාම, ඊළඟට තිබෙන සැපයුම් මාර්ගය තමයි Cape of Good Hope. ඒකට කියන්නේ "සුබ ප්‍රාර්ථනා තුඩුව" කියලා. හැබැයි, එතැනින් එනකොට, පහළින් එනකොට සති ගණනාවක් පරක්කු වෙනවා. එතකොට ඉන්ධන මිල ඉහළ යනවා. දැන් මේ මොහොත වන විට Mediterranean Shipping Company එක නිල වශයෙන් ඉන්දීය සාගරයේ දිවයින් වෙත ගමන් කරන නැව් ගාස්තු ඉහළ යන පරිදි යුද අධිභාරයක් නිකුත් කරලා තිබෙනවා. අනිවාර්යයෙන්ම තෙල් මිල ඉහළ යනවා, අනිවාර්යයෙන්ම ගෑස් මිල ඉහළ යනවා. මේ තත්ත්වය සම්බන්ධව ලබා දෙන උත්තරය මොකක්ද? විසඳුම මොකක්ද? ආනයනික ඖෂධ මිල ඉහළ යනවා. ආහාර මිලත් වැඩි වෙනවා.

ඒ වාගේම අපේ සංචාරක කර්මාන්තයටත් ප්‍රශ්න ඇති වෙනවා. විශේෂයෙන්ම Emirates, Qatar Airways, SriLankan Airlines වැනි ගුවන් යානාවලින් සංචාරකයින් ගෙන ඒමේ වැඩ පිළිවෙළට බාධා ඇති වෙනකොට, අභියෝග එල්ල වෙනකොට අපේ සංචාරක කර්මාන්තයටත් බරපතළ ප්‍රශ්නයක් එල්ල වෙනවා. ඊළඟට, අපේ "Ceylon Tea" brand එකට, අපේ තේ අපනයනවලට අනිවාර්යයෙන්ම මේක බලපානවා. දින දෙකකට ඉස්සෙල්ලා කිව්වා, හෝමුස් සමුද්‍ර සන්ධිය -Strait of Hormuz - වහන්නේ නැහැ කියලා. රජයෙන් එහෙමයි ප්‍රකාශ කළේ. නමුත් දැන් ඒක වහලා. ඒ තුළ Liquefied Natural Gas - LNG- ඒ වාගේම LPG වාගේ ගෑස් සම්බන්ධව නිර්මාණය වෙන අනාරක්ෂිතභාවයට රජය ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද? වැඩ පිළිවෙළ මොකක්ද?

ඒ විතරක් නොවෙයි, අර "IRIS Dena" යාත්‍රාවට Mark-48 වාගේ ටෝපිඩෝ එකකින් ගහලා තමයි ගිනිබත් කළේ. ඒ තුළ අද වනවිට සාගර පරිසරයට මහා විනාශයක් වෙලා තිබෙනවා. සාගර පතුලේ දැවැන්ත ධ්වනි තරංග කම්පනයක් ඇති වෙලා තිබෙනවා. දකුණු සාගර මාවත ඔස්සේ සංක්‍රමණය වන විශිෂ්ට ජලජ සත්වයින්ට බාධා ඇති වෙලා තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා, තල්මසුන්, ඩොල්ෆින් වැනි මත්ස්‍යයින් අපේ සංචාරක ව්‍යාපාරයේ වර්ධනයට අවශ්‍ය කොටසක් බව. ඒ සතුන්ට barotrauma, echolocation disruption වැනි පාරිසරික බාධා නිර්මාණය වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඩීසල් සහ ගුවන් යානා ඉන්ධන නිසා සාගරය මතුපිට දැන් තෙල් තට්ටුවක් තිබෙනවා. මොකද, අර ගිල්වූ නැවේ තිබුණු ඉන්ධන අද වනවිට සමුද්‍ර පරිසරය ඇත්තවශයෙන්ම දූෂණයට ලක් කර තිබෙනවා. පක්ෂීන්ගේ ජීවිතවලට තර්ජන ඇති වෙලා තිබෙනවා. මොකක්ද, මේවා සම්බන්ධව රජය ගන්නා ක්‍රියාමාර්ගය? විශේෂයෙන්ම මේ යුද නැව තුළින් තෙල් කාන්දු වීම වාගේම පිපිරුණේ නැති අවි ආයුධ විශාල ප්‍රමාණයක් තිබෙනවා. රජය මේ අවස්ථාවේ වහාම සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය - MEPA එක, පරිසර අමාත්‍යාංශය, ඒ වාගේම ආරක්ෂක අංශ යොදවා මේ ප්‍රශ්නවලට විසඳුමක් දෙන්නට ඕනෑ. එහෙම නැත්නම් මේකත් ආපසු "New Diamond" නැවේ සිදුවීම වාගේ එකක් වෙයි, "X-Press Pearl" සිදුවීම වාගේ එකක් වෙයි. ඒ නිසා කරුණාකරලා මේ ගැටලුවලට විසඳුම් ලබා දෙන්න.

ඊළඟට, අපේ විදේශගත ශ්‍රමිකයින්ගෙන් දසලක්ෂයකට වැඩි ප්‍රමාණයක් මැදපෙරදිග බල ප්‍රදේශවල සිටිනවා. ඔබතුමන්ලාම කියනවා, ඒ ශ්‍රමික ප්‍රේෂණ ඇමෙරිකානු ඩොලර් බිලියන 8.2ක් බව.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Leader of the Opposition, you have exceeded your time.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

I will take some more time, Sir.

එම විදේශගත ශ්‍රමිකයින් ඇමෙරිකානු ඩොලර් බිලියන 8.2ක් අපේ රටට ලබා දෙනවා. බැරි වෙලාවත් මේ අයගේ ජීවනෝපාය, ආදායම් මාර්ග අහිමි වුණොත් මොකක්ද ගන්නා පියවර? මොකද, අපේ රටේ සාර්ව ආර්ථිකයට එය බලපානවා, විශේෂයෙන්ම එය balance of payment සඳහා බලපානවා, උද්ධමනයට බලපානවා, ආර්ථික වර්ධනයට බලපානවා. හැබැයි, ඒ ඔක්කෝටම වඩා වැදගත් අර ලක්ෂ 10ක් පමණ වන පිරිසගේ ජීවිත ආරක්ෂා කිරීම. ඒ ජීවිත අවදානම අවම කරන්නට ඔබ ගන්නා පියවර මොකක්ද?

දැන් මේ ඔක්කෝම සිද්ධ වෙන්නේ හදිසි නීතිය ක්‍රියාත්මක වෙනකොට. ඇත්තවශයෙන්ම ජාතික ආරක්ෂාව ඉහළම තලයක තිබෙන අවස්ථාවක අපේ අනන්‍ය ආර්ථික කලාපයට ඇවිල්ලා නැවකට ගහනවා. එතකොට මොකක්ද මේ ජාතික ආරක්ෂාව? දැන් බංකු කීයක් අවශ්‍යද, මේස කීයක් අවශ්‍යද, පුටු කීයක් අවශ්‍යද ජාතික ආරක්ෂාව පිළිබඳව උපදෙස් දෙන්න, පන්ති පවත්වන්න?

ඒ වාගේම මම මේ කාරණයත් අහන්න කැමැතියි. ඔබතුමන්ලා රාජ්‍ය තාන්ත්‍රිකව මේ ගැන කථා කරන්න. සාගර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ - UNCLOS එකේ - Article 56, Article 58 සහ Article 88 වාගේම San Remo Manual එක, ඒ වාගේම ICRC Customary International

Humanitarian Law එකේ Rule 44 වැනි මේ සියලුම නීති රීති, රෙගුලාසි අනුව, ජාත්‍යන්තර නීතියට අනුව, අපේ අනන්‍ය ආර්ථික කලාපයේ තිබෙන නැවකට මේ වාගේ ප්‍රහාරයක් එල්ල කිරීම ඇත්තවශයෙන්ම ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීමක්. කට ඇරලාවත් කියා තිබෙනවාද, මේ කරපු දේ වැරදියි කියලා? කට ඇරලාවත් කනගාටුව ප්‍රකාශ කර තිබෙනවාද? කට ඇරලාවත් කියා තිබෙනවාද, මේ යුදමය ක්‍රියාදාමය ආරම්භ කරපු එක වරදක් කියලා?

ඔබතුමන්ලා දැන් ජාතික ආරක්ෂාව හොඳටම රැක ගන්නවාලු නේ. අපට කියන්නකෝ බලන්න, ඒ ආපු සබ්මැරීනය ballistic missile submarine එකක්ද, Ohio-class submarine එකක්ද, එහෙමත් නැත්නම් guided-missile submarine එකක්ද කියලා. මේවා ගැන පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් ඉදිරිපත් කරන්න. එය Los Angeles-class of submarine එකක්ද, Seawolf-class submarine එකක්ද, Virginia-class submarine එකක්ද, Attack submarine එකක්ද? දැන් ජාතික ආරක්ෂාව ඉහළින්ම තිබෙනවා නම්, රටේ හදිසි නීතිය ඉහළින්ම ක්‍රියාත්මක වෙනවා නම්, ජාතික ආරක්ෂාව සුරක්ෂිත නම්, කිසි ගැටලුවක් නැත්නම් අර නැවට ගහපු සබ්මැරීනය මොකක්ද කියලා රටට ඉදිරිපත් කරන්නකෝ. ඔබතුමන්ලාට ඒවා ගැන දැනුමක් නැහැ; ඒවා ගැන අවබෝධයක් නැහැ. ඒවා ගැන අවබෝධයක් ලබා ගන්නට ඔබතුමන්ලාට හැකියාවක් නැහැ. නිකම් බොරුවට හැම දාම විපක්ෂයට බණිනවා. විපක්ෂය බියගුලු තත්ත්වයක් ඇති කරනවා ලු, හදිසි නීතිය ගෙනාවේ අපේ විදුලි පද්ධතිය ආරක්ෂා කරන්න ලු, අඛණ්ඩ විදුලි සේවාවක් ක්‍රියාත්මක කරන්න ලු. මට කියන්නකෝ බලන්න, නැව් 10කින් බාපු බාල ගල් අඟුරු තුළින් රටේ ජාතික ආරක්ෂාව සුරක්ෂිත වෙනවාද, රටේ ආර්ථිකය ආරක්ෂා වෙනවාද කියලා. මේ ගෙනාපු බාල ගල් අඟුරු නිසා එම බලාගාරයට සම්පූර්ණ ජනන ධාරිතාව ලබා දෙන්න ඇත්ත වශයෙන්ම බැහැ. සාමාන්‍ය ගල් අඟුරු දහන අනුපාතයට වඩා ඉහළ දහන අනුපාතය, gross calorific value එක අනුව පෙනෙනවා මේ ගෙනැල්ලා තිබෙන්නේ බාල ගල් අඟුරු බව. එක් පැත්තකින්, හදිසි නීතිය ගෙනෙනවා, "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් වුණු ජනතාවට ශක්තිය ලබා දෙන්න කියලා. "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් වුණු ජනතාවට දැන් ශක්තිය ලබා දෙන්නේ බාල ගල් අඟුරු ගෙනැල්ලායි. බාල ගල් අඟුරු ගෙන ඒම තුළ විදුලි බිල වැඩි කරලා විදුලි පාරිභෝගිකයන් 7,500,000ක් අනාථ කිරීම තුළයි තමුන්නාන්සේලා හදිසි නීතිය උපයෝගී කරගෙන කරන්න පුළුවන් ඉහළම අක්‍රමිකතා ටික සිදුකරන්නේ.

ඒ නිසා මම යෝජනාවක් කරනවා. කටාර් රාජ්‍යය ගෑස් ලබා දීම අද නතර කරන්න යනවා ලු. Liquefied natural gas, liquefied petroleum gasවලට සිදු වන හානිය දිහා බලන්න. මේවා ගැන සොයා බලන්න. හැම දාම මෙතැනට ඇවිල්ලා "නැහැ නැහැ. මොනවත් වෙන්නේ නැහැ. ඔක්කෝම හරි. කිසි ප්‍රශ්නයක් නැහැ. ඔක්කෝම ශක්තිමත්. හැම දේටම විසඳුම් තිබෙනවා" කියන බොරු බයිලාව ගහන්නේ නැතුව කරුණාකර රට වෙනුවෙන් ප්‍රායෝගික විසඳුම් ටික ලබා දෙන්න කටයුතු කරන්න කියා අපි ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Minister?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු විපක්ෂ නායකතුමනි, මේ යුධ තත්ත්වය ගත්තොත්, මේ යුද්ධයට අදාළව නිතරම වෙනස් වන, නිතරම වර්ධනය වන ගෝලීය තත්ත්වයක් තිබෙනවා. අවශ්‍ය සියලු විසඳුම් එකවර නොවෙයි, එය වර්ධනය වන අවස්ථා අනුව එයට මුහුණ දෙමින් කටයුතු කරන්න අවශ්‍ය කණ්ඩායම් දැනටමත් ගරු ජනාධිපතිතුමාගේ මෙහෙයවීමෙන් යොදවා තිබෙනවා. එකී ගැටලු ඇති වන්නේ, ආර්ථික තත්ත්වයක් නිසා වෙන්න පුළුවන්, බලශක්ති තත්ත්වයක් නිසා වෙන්න පුළුවන්, වෙනත් විධියේ සම්ප්‍රේෂණ තත්ත්වයක් නිසා වෙන්න පුළුවන්. ඒ සියල්ලටම මුහුණ දෙමින්, ඒ සියල්ලම නිරීක්ෂණය කරමින් දැනටත් අපේ රජය කටයුතු කරනවා. අවශ්‍ය වෙලාවේදී අපි නිසි පියවර ගන්නවා. විපක්ෂ නායකතුමාගේ කථාවෙන් ඇත්තෙන්ම සිද්ධ කළ එකම දෙය, මා කලින් කියපු එක ඇත්ත කියලා පෙන්වපු එක විතරයි.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Chamara Sampath Dasanayake. You have eight minutes.

[අ.භා. 12.02]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ අධිකරණ ඇමතිතුමා මුලින්ම කිව්වා, නයි නාළිකා ගැන කථාවක්. අධිකරණ ඇමතිතුමනි, නයි නාළිකාවල විකාශනය වන ඒවා තමයි දැන් මිනිස්සු බලන්නේ; විශ්වාස කරන්නේ. ඒ අය හෝ නයි නාළිකා හෝ නැත්නම් මොකද වෙන්නේ? ඔය නයි නාළිකා හින්දා තමයි ඔයගොල්ලෝත් ආණ්ඩුවක් හදාගෙන පාර්ලිමේන්තුවේ ආණ්ඩුව පැත්තේ වාඩි වෙලා ඉන්නේ. අපට තමයි ඒ නයි නාළිකා ඒ දවස්වල ගැහුවේ. ඒ, ඔයගොල්ලෝ ෆෝම් කරන්න. ඒ නිසා ඒ නාළිකා ඒ විධියට විවේචනය කරන්න එපා.

ඒ එක්කම මම මේ වෙලාවේ මේ කාරණයත් කියන්න ඕනෑ. අපි හැම වෙලාවේම කොරහේ කිඹුල්ලු දකින්නේ නැහැ, අපි බොර දියේ මාළු බාන්නේත් නැහැ, අධිකරණ ඇමතිතුමා. ඔයගොල්ලෝ විපක්ෂයේ හිටියා නම් අද ඇමෙරිකානු තානාපති කාර්යාලය වට කරලා, මේ වනකොටත් උද්ඝෝෂණ. එදා ඔයගොල්ලෝ ඉන්දියාවට කියපු දේවලුත් අපි දන්නවා.

හැබැයි මම එකක් කියන්නම්. මම නිතරම එය කියනවා. මෙතැන ඉන්න වෙනත් ඕනෑම කෙනෙක් ඉන්දියාවට විරුද්ධව කථා කරන්නේ නැති වෙයි. අද ජනාධිපතිකම කරන්නේ ඔයගොල්ලන්ගේ පක්ෂයේ කෙනෙක්. ඔයගොල්ලෝත් එහෙම තමයි. ඒත් මම එහෙම නැහැ. ඊයේ මම කියපු දේ ආයෙත් අහලා බලන්න. මේ වැඩෙන් අපව අමාරුවේ දැම්මේ කවුද කියලා මම කිව්වා. නාවික හමුදාව ගෙනැල්ලා පුහුණුවක් දුන්නේ අපේ රටේද?

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

නැහැ. පසුගිය 18වැනි දා ඉන්දියාවේ විශාකාපට්නම්වල තමයි ඒ පුහුණුව තිබුණේ. හැබැයි ඔයගොල්ලන්ට තමයි පරිප්පුව දුන්නේ. කරට අත දාගෙන ඉන්න කියන්න, ඉන්දියාවත් එක්ක. ඔයගොල්ලන්ගේ ජනාධිපතිතුමාට කියන්න, ඉන්දියාවත් එක්ක කරට අත දා ගෙන ඉන්න කියලා. පිටිපස්සෙන් ඉඳන් බැටේ දෙන කල් කවුරුවත් දන්නේ නැහැ. මොකද වුණේ? ඔයගොල්ලෝ මේ පාර්ලිමේන්තුවේ වගකීමෙන් කිව්වේ මොකක්ද? ඉන්දියාව දෙවැනි නැව ගන්නවා කිව්වා. ඉන්දියාව හවස 4.00 වෙනකල් ඔයගොල්ලන්ට කිව්වා, "අපි දෙවැනි නැවත් ගන්නවා, මිනිස්සුත් බේරාගන්නවා" කියලා.

නමුත් ගත්තේ නැහැ. අවසානයේදී ඉන්දියාව දෙවැනි නැවට අදාළවත් අපේ රටට බෝලේ පාස් කළා. පළමුවැනි නැවටත් එහෙමයි වුණේ. අපේ රටේද පුහුණුව දුන්නේ? අපේ රටේ නොවෙයි නේ ඒ පුහුණුව දුන්නේ. ඉන්දියාවේ නේ ඒක තිබුණේ. ඉන්දියාව ඒ අය හෙමිහිට තල්ලු කරලා එව්වා. ඒ එව්වු එකෙන් තමයි එහෙම වුණේ. අවසානයේදී දෙවැනි නැවටත් මොකද වුණේ?

ගරු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමනි, ඉරාන තානාපති කාර්යාලයට අපි ඊයේ උදේ ගියා. ලංකාවේ නාවික හමුදාපති ඒ පුහුණුවේ ඉඳලා තිබෙනවා. නාවික හමුදාපති කට වචනයෙන් කියලා තිබෙනවා, ඔයගොල්ලෝ ලංකාවට එන්න කියලා. අන්න, ඉරාන තානාපතිවරයා එහෙම කියනවා. ඒ සම්බන්ධව නාවික හමුදාපති වගකීමක් ඇතුවද කථා කළේ, වගකීමක් නැතුවද කථා කළේ කියන එක ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවට කියන්න. නැත්නම් එයාට අයින් වෙන්න කියන්න. නාවික හමුදාපති එහෙම කිව්වා කියලා කියන්නේ අපි නොවෙයි. ලංකාවේ ඉරාන තානාපති කාර්යාලයේ තානාපතිතුමා තමයි කියන්නේ. ඒ නිසා තමයි අපි වගකීමෙන් මේ කියන්නේ. අපට වැඩක් නැහැ, බොරු කියන්න.

ඉන්දියාව කියන්නේ මොකක්ද? පොඩි රටක්ද? ඉන්දියාව කියන්නේ ලෝකයේ නිෂේධ බලය තිබෙන රටවල් 5න් එකක්. අධිකරණ ඇමතිතුමා, මේක පොඩ්ඩක් අහගන්න. ඉන්දියාව කියන්නේ, නිෂේධ බලය තිබෙන රටක්. නිෂේධ බලය තිබෙන රටක් මුනිවත රකිනවා. මුනිවත රකලා ලංකාවට, ලංකාවේ කට්ටියට හෙමිහිට ඒක භාර දීලා, බොලේ පාස් කරලා ඒ ගොල්ලෝ ඒකෙන් බේරෙන්නයි හදන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඇමතිතුමා, ඒ වුණාට අපි ස්තුතිවන්ත වෙනවා, ඔබතුමන්ලා දෙවැනි නැව හරි බේරා ගත්තු එක ගැන. අපි බොර දියේ මාළු බාන්නේ නැහැ; අපි උද්ඝෝෂණ කරන්නේ නැහැ. මේක ඔබතුමන්ලාගේ රට විතරක් නොවෙයි; මේක අපේත් රට; අප කාගේත් රට. රටට කරදරයක් වුණොත් ඔක්කෝටමයි වෙන්නේ. ඒ නිසා අපි කැමැති නැහැ, එහෙම දේවල් වෙනවාට. අන්න ඒකත් මේ වෙලාවේදී කියන්න ඕනෑ. ඒ ගැන මම ඊට වඩා කථා කරන්නේ නැහැ.

ඊළඟට, හදිසි නීතිය ගැන කියන්න ඕනෑ. අද හදිසි නීතිය මොකටද? හදිසි නීතිය දැම්මේ ඇයි? සලේ දැන් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. පාස්කු ඉරිදා ප්‍රහාරයට අදාළව මහ මොළකාරයෝ කී දෙනෙක් හිටියාද, ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා? ඒ බෝම්බ පුපුරවපු දවසේ ඉඳන්ම මහ මොළකාරයෝ ඉන්න බව කියනවා. දප්පුල ද ලිවේරා මහත්මයා මොනවාද කිව්වේ? දප්පුල ද ලිවේරා මහත්මයා නීතිපති හැටියට හිටියා, ගෝඨාභය මහත්මයාගේ ආණ්ඩුව කාලයේ. ගෝඨාභය මහත්මයාට කිව්වා, දප්පුල ද ලිවේරාට අවුරුද්දක සේවා දීර්ඝයක් දෙන්න කියලා. අවුරුද්දක සේවා දීර්ඝයක් දෙන්න බැහැ කියපු හින්දා තමයි සේවා කාලයේ අවසාන මොහොතේ, එවකට නීතිපති දප්පුල ද ලිවේරා කියලා ගියේ, මහ මොළකාරයෙක් ඉන්නවා කියලා. ඊට පස්සේ මොකද වුණේ? මහ මොළකාරයා කවුද කියන්න කියලා CID එකට එන්න කියන කොට, කට උත්තර දෙන්න වෙනවාට හැංගිලා හිටියා, දප්පුල ද ලිවේරා. නීතිපතිවරයා එවැනි දෙයක් වගකීමෙන් කියනවා නම් නීතිපතිට බලයක් තිබෙනවා, රටේ පොලීසියට, CID එකට orders දීලා ඒ මහ මොළකාරයා අල්ලලා දීලා යන්න. එයා මහ මොළකාරයා අල්ලලා දුන්නේ නැහැ. නීතිපති හැටියට විශ්‍රාම ගිය එයාට CID එකට එන්න කිව්වාම CID එකට ආවේ නැහැ. හිටපු නීතිපති උසාවියට ගිහිල්ලා වාරණයක් ගත්තා, තමා අත්අඩංගුවට ගන්න එපා කියලා. ඔන්න ඕකයි මහ මොළකාරයෝ අල්ලපු විධිය. ඒකත් මම මේ වෙලාවේදී මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ කාරණය නාගරික සංවර්ධන අධිකාරියට අදාළ කාරණයක්. නාගරික සංවර්ධන විෂය භාර ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවාද දන්නේ නැහැ. නාගරික සංවර්ධන අධිකාරියට අයත් කොළඹ 7, ටොරින්ටන් පටුමඟ 187, 189, 225 අංක දරන ඉඩම් තුනක් ගැනයි කියන්නේ. මේ දක්වා අවුරුදු 15ක් විතර ඒ ඉඩම් ගැන කථා කරන්නේ නැතුව ඉඳලා නාගරික සංවර්ධන අධිකාරිය ඒවාට අදාළව රුපියල් කෝටි 15ක් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කරලා තිබෙනවා. ඒ ඉඩම් අවුරුදු 15ක්ම අයිතිකාරයෙක් නැතුවයි තිබුණේ. දැන් එක්කෙනෙක් අයිතිකාරයා කියලා හොර ඔප්පු හදලා. නාගරික සංවර්ධන අධිකාරිය දැන් නාගරික සංවර්ධන අධිකාරියේ මුදල් දෙන්න යනවා. ඒ මුදල් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කරලා තිබෙනවා, කොළඹ 7, ටොරින්ටන් පටුමඟේ 187, 189, 225 අංක දරන ඉඩම් තුනට අදාළව. මෙන්න මේවා තමයි වෙන්නේ. මේවා ගැන හොයන්න; මේවා ගැන බලන්න. අපි කාටවත් බොරු කිය කියා ආණ්ඩු පෙරළන්න යන්නේ නැහැ. මේවා අපට එන තොරතුරු. අපේ unit එකක් තිබෙනවා දැන්. ලංකාව පුරාම තොරතුරු අපට එනවා. අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒවා කියනවා. එහෙම නැතුව අපි ගෙදර ගිහිල්ලා ඒවා කියන්නයැ? අපට එන තොරතුරු පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියන එකයි අපට කරන්න තිබෙන්නේ. ඒ කාරණයත් මම මේ වෙලාවේ ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ කාරණය මේකයි. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අහිංසක මිනිසුන්ගේ වැලි බලපත්‍ර 700ක් තිබුණා; කියුබ් 100ට අඩු වැලි බලපත්‍ර 700ක් තිබුණා. මේ ආණ්ඩුව මොකක්ද කළේ? ඒ අහිංසක මිනිසුන්ගේ වැලි බලපත්‍ර, එනම් පාරුවලින්, බෝට්ටුවලින් ගිහිල්ලා ගොඩ දමන, කියුබ් 100ට අඩු වැලි බලපත්‍ර ඔක්කෝම අහෝසි කළා. බලපත්‍ර 700ක්. ඒ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්තලේ සහ කන්තලේ අවට ප්‍රදේශවල. දැන් ඒක දීලා තිබෙනවා ලොකු කොම්පැනියකට. ඒ මිනිස්සු 700දෙනාගේම බලපත්‍ර අවලංගු කරලා එක කොම්පැනියකට වැලි පර්මිට් ටික දීලා තිබෙනවා. ඒ කොම්පැනියට වැලි කියුබ් 47,000ක් ගන්න පුළුවන්. වැලි කියුබ් 47,000ක් ගන්න පුළුවන් පර්මිට් එකක් ඒ කොම්පැනියට දීලා අර මිනිස්සු ඔක්කෝගේම වැලි බලපත්‍ර අවලංගු කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි අසාධාරණයි කියන්නේ මෙන්න මේවාට තමයි. ඔරුවලින් ගිහිල්ලා, පාරුවලින් ගිහිල්ලා, වැලි ටිකක් ගොඩ දාලා ජීවත් වුණු ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ අහිංසක මිනිස්සු 700දෙනෙකුගේ වැලි බලපත්‍ර අවලංගු කරලා එක කොම්පැනිකාරයෙක් form කරන්න දීලා තිබෙනවා. මොන විධියකට ඒ කොම්පැනිකාරයාට ඒ බලපත්‍ර ටික දුන්නා ද දන්නේ නැහැ. වැලි කියුබ් 47,000ක් ගන්න එක කොම්පැනිකාරයෙක්ට දීලා තිබෙනවා, අර අහිංසක මිනිස්සු ඔක්කෝගේම බලපත්‍ර ටික අවලංගු කරලා. මෙන්න මේවා ගැන තමයි ආණ්ඩුව හොයලා

බලලා පියවර ගන්න ඕනෑ. මේ ආණ්ඩුව බලයට ආවේ කොම්පැනි දියුණු කරන්න නොවෙයි. මේ ආණ්ඩුව බලයට ආවේ මුදලාලිලා පොහොසත් කරන්න නොවෙයි. මේ ආණ්ඩුව බලයට ආවේ ඒ අයගේ ව්‍යාපාරිකයෝ හදන්න නොවෙයි. මේ ආණ්ඩුව බලයට එනකල් බලාගෙන හිටියේ පොඩි මිනිස්සු, අසාධාරණයට ලක් වුණු මිනිස්සු. ඒ අය මේ ආණ්ඩුව විශ්වාස කරලා තිබුණා.

ඊළඟට තවත් කාරණයක් තිබෙනවා. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සාමාන්‍ය නිලධාරින් 10දෙනෙකුට JICA එකෙන් දීලා තිබෙනවා ජපානයේ වැඩසටහනකට යන්න. සාමාන්‍ය නිලධාරින්ට ලැබුණු ඒ අවස්ථාව නැති කරලා ඒකට නම් කරලා තිබෙන්නේ කවුද? ලේකම්ලා සහ සාමාන්‍යාධිකාරිවරු. අර අහිංසක නිලධාරින්ට ඒ අවස්ථාව දෙන්නේ නැහැ. ඒ අවස්ථාව දෙන්නේ කාටද? සාමාන්‍ය පොඩි නිලධාරින්ට ලැබුණු අවස්ථාව ලොකු අය අරගෙන. ඒක හැම දාම වුණා. අපේ ආණ්ඩු කාලයේත් වුණා. හැම දාම මේ වැඩසටහන්වලට ගියේ ලොකු ලොකු නිලතල තිබෙන අය; සභාපතිලා, ලේකම්ලා සහ අධ්‍යක්ෂවරු තමයි ගියේ. අදත් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සාමාන්‍ය පොඩි නිලධාරින්ට JICA එකෙන් ලැබුණු chance එක, පුහුණු වැඩසටහන ලොකු අය අරගෙන. හැමෝටම පුහුණු වැඩසටහන්වලට යන්න අවස්ථාව ලැබෙන්න ඕනෑ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැමෝටම අවස්ථාව ලැබෙන්න ඕනෑ නේ. හැබැයි, අපි මොනවා හරි කිව්වාම අධිකරණ ඇමතිතුමා මෙතැනට ඇවිල්ලා හැම දාම කියන්නේ, විපක්ෂය, නිකම් කෑගහනවා කියලා. විපක්ෂය හොඳද, නරකද කියන එක මේ රටේ ජනතාව ඊළඟ ඡන්දයේදී තීරණය කරයි. ඔබතුමන්ලා ආණ්ඩුව හරියට කරන්නකෝ.

දැන් බලන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පසුගිය දෙසැම්බර් 18වැනි දා තමයි කිව්වේ, ගෑස් හිඟයක් එනවා කියලා. දෙසැම්බර් 18වැනි දා මෙතැනදී කිව්වේ. ඔබතුමා තමයි ඒ වෙලාවේ මූලාසනයේ හිටියේ. දැන් මොකද වුණේ? පෙබරවාරි වනකොට ගෑස් හිඟයක් ආවා. යුද්ධය හින්දා ගෑස් හිඟය ආවේ නැහැ. ගෑස් හිඟය ආවේ ගිය මාසයේ. යුද්ධය පටන් ගත්තේ මේ මාසයේ. ගෑස් හිඟයක් ඇති වෙනවා කියලා මම කිව්වා. මම කිව්වා, නැව් දෙකකින් රටේ අවශ්‍යතාව සම්පූර්ණ කරන්න බැහැ කියලා. නැව් හතරකින් හෝ පහකින් කරන්න ඕනෑ වැඩේ නැව් දෙකකින් කරන්න බැහැ කියලා මම කිව්වා. මොකද වුණේ? රටේ ගෑස් නැති වුණා. ඒ නිසා ආණ්ඩු කරනකොට විපක්ෂය කියන දේවලුත් අහන්න. අපි බොර දියේ මාළු බාන්නේ නැහැ. ඉන්දියාව ලොකු රටක් වුණා කියලා අපට ප්‍රශ්නයක් නැහැ. ඔබතුමන්ලා කරට අත දමාගෙන ඉන්න. ඒකට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, කරට අත දමාගෙන ඉඳලා අන්තිමට මොකද ඉරානයට වුණේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉරානය තනි වුණා. හැබැයි, ඉරානය හිතාගෙන හිටියා උදව්වට චීනය එයි, රුසියාව එයි කියලා. අන්තිමේදී අහිංසක ඉරානය තනි වුණා. ඉරානයට ඉරානය විතරයි. අපටත් කවදා හරි ඒක තමයි වෙන්නේ. අපි ආදරය කරනකොට, අපි ගනුදෙනු කරනකොට අපට අප විතරයි කියලා හිතලා වැඩ කරන්න ඕනෑ. අපට අප විතරයි කියලා තමයි අපි හිතා ගන්න ඕනෑ. ගරු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමනි, ඒක තමයි වුණේ. නැත්නම් එහේ තිබුණු නැව් මෙහේට එන්න ඕනෑ නැහැ නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, please wind up.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ආරාධනා කරලා, ඒගොල්ලන්ගේ වැඩසටහනක ආපු නැව් දෙකක් නේ. එහෙම නම් ඒගොල්ලන්ට තිබුණා නේ ඇමරිකාවට කියන්න, "ඒ අපේ ආරාධනයෙන් අපේ පුහුණු වැඩසටහනකට ආපු නැව් දෙකක්. ඒ නැව් දෙක යුද්ධය ඉවර වන කල් අපේ රටේ තියා ගන්නවා" කියලා. එහෙම කියන්න තිබුණා නේ. මොකද, ඇමෙරිකාව ඉන්දියාව කියන දේකට පිටුපානවාද? නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I have to call upon the next speaker.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
අපි යාන්තම්, බොහොම අමාරුවෙන්, දෙවියන්ගේ පිහිටෙන් ඒකෙන් බේරුණා. දෙවැනි නැව හෝ බේරා ගත්ත එක ගැන අපි ස්තුතිවන්ත වනවා. හැබැයි, ඒකට ඇයි අපි ඔළුව දමන්නේ? අපේ ආණ්ඩුව ඔළුව දමන්නේ ඇයි? මම ආණ්ඩුවට එකක් කියන්න කැමැතියි. ඊයේ සිද්ධිය, පෙරේදා සිද්ධිය ගන්න. ආණ්ඩුවට තිබුණා ජනාධිපතිතුමාට කියලා එවෙලේම- *[බාධා කිරීම්]* ඒ වාගේ දේවල්වලට අපි 225දෙනාම අත් ඔසවලා ආණ්ඩුවට සහයෝගය ලබා දෙනවා.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Mrs.) Anushka Thilakarathne. You have 10 minutes and your time starts now.

[අ.භා. 12.12]

**ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හදිසි අවස්ථා නීතිය දීර්ඝ කිරීමට ආණ්ඩු පක්ෂය ගෙන ඇති තීරණය ගැනයි මේ විවාදය පැවැත්වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගම්වල සමහර පිරිමි අය ඉන්නවා හවසට කට ගොන්නක් බී ගෙන ඇවිල්ලා අහිංසකව දවස පුරා මහන්සි වෙලා වැඩ කරපු, මෙලෝ දෙයක් දන්නේ නැති තමන්ගේ නෝනාට, දරුවාට හොඳටම බණිනවා. සැර පරුෂ වචනයෙන් බැණලා, ගෙදර තිබෙන වළං මුට්ටි ටිකත් කඩා දාලා ගෙදර ඉන්න මිනිස්සුන්ට හිංසා කරනවා. ගම්වල අයට ඒ අත්දැකීම් තිබෙනවා. අන්න ඒ වාගේ එකක් තමයි පාළු ගෙයි වළං බිඳිනවා වාගේ විපක්ෂයත් කරන්නේ. මේ රට, මේ ලෝකය බැරෑරුම් අවස්ථාවක තිබෙන වෙලාවක දී මෙලෝ හසරකට නැති, කිසිම අර්ථයක් නැති - අර්ථ ශූන්‍ය - අදහස් ප්‍රකාශ කරමින් කාලය නාස්ති කරනවා. අපි විපක්ෂයට කියනවා ඇත්තටම ඕනෑ නැති තීරණ ගන්නේ, අවශ්‍ය නැති විධියට වැඩ කරන්නේ ආණ්ඩු පක්ෂයේ අපි නොවෙයි ඔබ සියලුදෙනාය කියන එක. විපක්ෂයේ කාර්යභාරය තේරුම් ගන්න. විපක්ෂයේ කාර්යභාරය තේරුම් අරගෙන කථා කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ පන්තිවල සමහර යාළුවෝ හිටියා රචනා ලියන්න දුන්නාම හරි අමාරු වචන හොයනවා. අමාරු වචන හොයලා ඒ වචන දාලා ලිව්වාම ලස්සනයි කියලා හිතලා රචනාව ලියනවා. ලියපු කෙනා ඒක දන්නෙත් නැහැ, කියවන කෙනාට තේරුම් ගන්නත් බැහැ. අන්න ඒ වාගේ තමයි විපක්ෂයේ සමහර අය කථා කරන්නේ. මොකක් හරි විෂයයක වචන ටිකක් හොයා ගන්නවා. ඒ වචන ටික හොයා

[ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය]

ගෙන ඇවිල්ලා පාර්ලිමේන්තුවේ කථා කරනවා, "ඔයාලා අර මැෂින් එක හයි කළා ද, මේ මැෂින් එක හයි කළා ද, බෝම්බ එන්න කලින් දැක්කේ නැද්ද, කාලතුවක්කුව පෙනුණේ නැද්ද?" කියලා ඒ ඔක්කොම අපෙන් අහනවා. ඒක අහ ගන්න තමුන්ගෙන්ම. මේ රට අවුරුදු 76ක් තිස්සේ මාරුවෙන් මාරුවට, මාරුවෙන් මාරුවට පාලනය කරලා මේ රට ගෙනියන්න පුළුවන් නරකම අගාධයට ගෙනියලා අද ඇවිල්ලා අපෙන් අහනවා, අරක හයි කළේ නැද්ද, මේක හයි කළේ නැද්ද, අරක කළේ නැද්ද, මේක කළේ නැද්ද කියලා. ඒක අහගන්න තමන්ගෙන්ම.

මැද පෙරදිග කලාපයේ ඇති වෙලා තිබෙන මේ යුදමය අවස්ථාවේ දී අපි කටයුතු කරන්නේ මධ්‍යස්ථ රාජ්‍යයක් ලෙසයි. ආණ්ඩුවක් විධියට, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ලෙස අපි පිළිගන්නවා, යුද්ධය කොතැන පටන් ගත්තත් - කොතැන ආරම්භ වුණත් - පළමු අවස්ථාවේදීම ආදරය, ප්‍රේමය අහිමි වෙනවා, නැති වෙලා යනවා කියන එක. ඒ නිසා අපි යුද්ධයට කොතැනදීත් විරුද්ධයි. නමුත්, අපි මධ්‍යස්ථ රාජ්‍යයක්. අපි ජාත්‍යන්තර නීතිවලට, සාගර නීතිවලට හා 1907 හේග් සම්මුතියට අනුව තමයි කටයුතු කරන්න ඕනෑ. විවිධ ජාත්‍යන්තර සම්මුති තිබෙනවා. ඒවාට අනුව තමයි අපි කටයුතු කරන්නේ. අපි කාගේවත් පැත්තක් අරගෙන නැහැ. අපට මිනිස්සු වටිනවා. මනුෂ්‍යත්වය වටිනවා. ඒක බලලා තමයි අපි ඒ නෞකාවල හිටපු නාවිකයන් 208දෙනා බේරා ගත්තේ. ඊට කලින් ආපු නෞකාවේ 84 දෙනෙකුගේ මෘත දේහ අපේ රටට ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම තිස් දෙදෙනෙකුගේ ජීවිත බේරා ගන්නට අපි සමත් වෙලා තිබෙනවා. මම හිතන හැටියට අහිමි වෙන්න ගිය මනුෂ්‍යත්වය සහ ආදරය ආරක්ෂා කර ගනිමින් ස්වාධීන රාජ්‍යයක් ලෙස එතැනදී අපි කටයුතු කර තිබෙනවා. මේ අපෙන් පරිබාහිරව ක්‍රියාත්මක වෙන යුද්ධයක් සහිත රටවල් දෙකක්. අපට ඒක අදාළ නැහැ. අපි ස්වාධීන රාජ්‍යයක් ලෙස ඉතා අපක්ෂපාතී ලෙස කටයුතු කරමින් මිනිස්සු බේරා ගන්න කටයුතු කරලා තිබෙනවා. එහෙම නැතිව අපට මේකට මැදිහත් වෙන්න වෙන කිසිදු වුවමනාවක් නැහැ, කිසිදු අවශ්‍යතාවක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හදිසි නීතියේ අවශ්‍යතාව ගැන විවිධ විවේචන විපක්ෂය විසින් මේ අවස්ථාවේ දී එල්ල කරමින් තිබෙනවා. අපි මේ හදිසි නීතිය පැනවූවාට පසු, "ගොඩනඟමු ශ්‍රී ලංකා" - "Rebuilding Sri Lanka" - කියන ව්‍යුහය ඉතාම විධිමත්ව, ඉතාම ක්‍රමානුකූලව අතිශය බිහිසුණු ලෙස ඇති වෙච්ච මේ ව්‍යසන අවස්ථාවට මුහුණ දෙන්න හදා ගත්තා. "දිට්වා" සුළි කුණාටුව අපි කවුරුත් බලාපොරොත්තු වෙච්ච දෙයක් නොවෙයි. අපට 2024 වෙද්දි ලැබුණේ බංකොලොත් වෙච්ච රටක්; හිස් වෙච්ච රටක්. එහෙම රටක් අරගෙන අපි ඉතා ක්‍රමානුකූලව හොඳ මූල්‍ය විනයක් සහිතව රට හදා ගෙන යද්දී අනපේක්ෂිත අන්දමින් ඉතිහාසයේ දැවැන්තම අනතුරට මුහුණ දෙන්නට සිද්ධ වුණා. ඒ අවස්ථාවේ දී අපි හදිසි නීතිය ක්‍රියාත්මක කරමින් ජනතාව වෙත හොඳම සහන ටික ලබා දෙන්නටයි තීන්දු තීරණ ගනු ලැබුවේ. ඒ එකදු තීරණයකදීවත් අපි කිසි කෙනෙකුට වුවමනා දේ කරන්නට නොවෙයි, අපේ ජනතාවට හොඳම දේ දෙන්න තමයි අපි කටයුතු කළේ. ඒ අවස්ථාවේ දී අපි "Rebuilding Sri Lanka" කියන පුනරුත්ථාපන හා ප්‍රතිසාධන කටයුතු සඳහා සම්බන්ධීකරණයක් සහිත ජාතික යන්ත්‍රණක් ක්‍රියාත්මක කරනු ලැබුවා. මේ ජාතික යන්ත්‍රණය තුළ ප්‍රධාන අනුකමිටු 8ක් යටතේ, විෂය පථ 8ක් යටතේ අපි ජනතාව වෙත සහන සහ ඒ අදාළ උපකාර කරන්නට බලාපොරොත්තු වුණා. පශ්චාත් ආපදා අවශ්‍යතා සහ ඇගයුම් කමිටුව, පොදු යටිතල පහසුකම් ප්‍රතිෂ්ඨාපනය කිරීමේ කමිටුව, දේශීය ආර්ථිකයක් සහ ජීවනෝපායන් පුනර්ජීවනය කිරීමේ කමිටුව, සමාජ යටිතල පහසුකම් ප්‍රතිෂ්ඨාපනය පිළිබඳ කමිටුව, මූල්‍ය සහ අරමුදල් කමිටුව, දත්ත සහ තොරතුරු පද්ධති පිළිබඳ කමිටුව සහ මහජන සන්නිවේදනය පිළිබඳ කමිටුව යන අනුකමිටු අට යටතේ තමයි අපි "Rebuilding Sri Lanka" කමිටුව ගොඩනැඟුණු ලැබුවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිස්ත්‍රික්ක ගණනාවකට මේ ආපදා තත්ත්වය නිසා අතිවිශාල හානි ප්‍රමාණයක් සිදු වුණා. මිනිස් ජීවිත අපට නැති වුණා. මේ මහ පොළොවට කිසිදු වරදක් නොකරපු, තමන්ගේ අතේ හයියෙන්, තමන්ගේ හිතේ වීර්යයෙන් කටයුතු කරපු මිනිස්සු දහස් ගණනක් අපට නැති වුණා. ඒ විතරක් නොවෙයි. තමන් ජීවිතය තුළ උපයා ගත් නිවාස අහිමි වෙච්ච, සමහර නිවාස අර්ධ හානි වෙච්ච, තමන් කරගෙන ආපු කර්මාන්තය අහිමි වෙච්ච, තමන් පවත්වාගෙන ආපු අධ්‍යාපන කටයුතු අඩපණ වෙච්ච, විශ්වවිද්‍යාල කටයුතු කරගෙන යන්නට බැරි වෙච්ච බොහෝ දෙනෙකුට බොහෝ ආපදාවන් ප්‍රමාණයකට මුහුණ දෙන්න සිදු වුණා. අපට මේවාට හදිසියේ උදව් කරන්නට සිදු වුණා. සමහර අවස්ථාවලදී අපට වුවමනා විධියට අපට තීන්දු තීරණ ගන්න බැහැ. විපක්ෂය කියන විධියට අවශ්‍ය වේගයෙන් අපට ඒක කරන්නට බැහැ. මේ ව්‍යසනය ඉතාම බිහිසුණු එකක්. විපක්ෂය ඒක තේරුම් ගත්තේ නැති වුණාට රටේ මිනිස්සු ඒක තේරුම් අරගෙන ඉන්නවා. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන ඒ සහෝදර මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඒ අදාළ දිස්ත්‍රික්කවල තමන්ගේ මැදිහත් වීම කරමින් ඉන්නවා.

රාජ්‍ය යන්ත්‍රණය සමඟ දේශපාලන යන්ත්‍රණය ගැටුමක් හදා ගන්නේ නැතුව, බිමට බැහැලා හදන්න පුළුවන් පාරවල් හදන්න, හදන්න පුළුවන් පාසල් හදන්න, ප්‍රතිසංවිධානය කරන්න අපට කරන්න පුළුවන් උදව් ටික අපි කරගෙන යනවා. මේක හරි ලොකු කටයුත්තක්. සමහර පාරවල් තිබෙනවා, අපට හිතාගන්න බැරි විධියට විනාශ වෙලා තිබෙන. ඒ අවස්ථාවලදී මාර්ග සංවර්ධන අධිකාරිය වාගේ ආයතන සමහර තාක්ෂණ උපදෙස් දුන්නා, "මේ පාරවල් හදන්න අවුරුදු හයක් යනවා; හතක් යනවා, මේක අපට ඕනෑ විධියට කරන්න බැහැ" කියලා. නමුත් ඔවුන්ගේත් උදව් ඇතුව ඒ දේවල් කළා. නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ආසනය වාගේ තැන්වල මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරිනුත් අපිත් එක්ක එකතු වෙලා ඉතාම සහයෝගයෙන් මිනිසුන්ගේත් උදව් ඇතුව එම මිනිසුන්ගේ ජීවිත සාමාන්‍ය තත්ත්වයට පත් කරන්න ඔවුන් උදව් කළා. මේ අවස්ථාවේදී එම නිලධාරීන් මා ඉතා ගෞරවයෙන් මතක් කරනවා. හදිසි නීතිය හරි, තිබුණු නීති හරි පාවිච්චි කරලා මේක කරලා දෙන්න කියලා අපි බලහත්කාරකම් කළේ නැහැ. මනුෂ්‍යත්වය මුල් කරගෙන තමයි අපි වැඩ කළේ. හදිසි නීතිය යටතේ අපි කොතැනක හරි එවැනි වැඩක් කරලා තිබෙනවා නම් විපක්ෂය අපට චෝදනා කරන්න. එහෙම නැතුව කටට එන්නන් වාලේ කිසිම දෙයක් කියලා දාන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ප්‍රකාශ කරන ආකාරයට, මේ ව්‍යසනය නිසා මේ වනකොට - 2026 මාර්තු 03වැනි දා වනකොට - විපතට පත් දිස්ත්‍රික්කවල පවුල් 64,901ක් ඉන්නවා. ඒ වාගේම 2026 මාර්තු 03වැනි දා වෙද්දී පුද්ගලයන් ඉන්නවා 222,044ක්. ඒ වාගේම "දිට්වා" සුළි කුණාටුවේ බලපෑමට ලක් වූ පවුල් ගණන 64,901ක් වෙද්දී තවමත් සුරක්ෂා මධ්‍යස්ථාන 32ක් ක්‍රියාත්මක වෙනවා. ඒ සුරක්ෂා මධ්‍යස්ථානවල දැනටමත් මිනිස්සු 149,927ක් ඉන්නවා. මේ, අපේ රටේ මිනිස්සු. ඔවුන්ගේ අවශ්‍යතා අපි සම්පූර්ණ කරන්නට ඕනෑ. රටේ සාමාන්‍ය මිනිසුන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කරනවාට වඩා එහා ගිය මානුෂීය දෙයක් අපි ඔවුන් වෙනුවෙන් කරන්නට අවශ්‍යයි. ඔවුන්ගේ ජීවිත දැන් අඩපණ වෙලා තිබෙනවා. ඔවුන් තනාගෙන ආපු ජීවිතය නැති වෙච්ච එක අපට භෞතිකව සම්පූර්ණ කරන්න පුළුවන් වෙයි. නමුත් අපට මානසිකවත් ලොකු සහයෝගයක් ලබා දිය යුතු වෙනවා. ඒ වෙනුවෙනුත් අපි කැපකිරීම් කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up now.

**ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
මා අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

විපක්ෂයක් කියලා තිබෙන එකේ කාර්යභාරය හොඳට තේරුම් ගන්න. මේ රට, මේ ලෝකය නරක අඩියක තිබෙන්නේ. ඒ වාගේ වෙලාවක හොඳ රාජ්‍යයකට රාජ්‍ය තාන්ත්‍රික පැවැත්මක්, රාජ්‍ය තාන්ත්‍රික මහජන සම්බන්ධතාවක් පවත්වාගෙන යන්නට ඒ රටේ රාජ්‍ය නායකයාට ඉඩ දෙමින් "මේක අපේ ශ්‍රී ලංකාව" කියලා හිතලා කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා. මට වේලාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින් ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. K. Sujith Sanjaya Perera. You have nine minutes.

[අ.භා. 12.22]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හදිසි නීතිය ගැන විවාද කරන අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන්නට මටත් අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා.

විශේෂයෙන්ම මීට මාස තුනකට ඉස්සරවෙලා "දිට්වා" සුළි කුණාටුව ආපු වෙලාවේ තමයි අපේ සහයෝගයත් ලබා දීලා මේ හදිසි නීතිය සම්මත කර ගන්න කටයුතු කළේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආපදාවට ලක් වෙච්ච අයට කඩිනමින් යම්කිසි සහනයක් සලසා දීලා, ඒ අයට තිබෙන ගැටලු සම්බන්ධව යම්කිසි විසඳුමක් ලබා දෙන්න තමයි විශේෂයෙන්ම ඒ තුළින් අපි බලාපොරොත්තු වුණේ. නමුත්, හදිසි නීතිය සම්මත කර දුන්නා වුණත් ඒ ආපදාවට ලක් වෙච්ච අයට ලබා දීපු සහන සම්බන්ධව අප කාටත් සෑහීමට පත්වෙන්න පුළුවන්කමක් නැහැ කියන එක මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. පසුගිය කාල සීමාව තුළ මේ මැති ඇමතිවරුත් කිව්වා, ආපදාවට ලක් වෙච්ච අයට විවිධාකාරයේ සහන දුන්නාය කියලා. අපට එක දෙයක් කියන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විශේෂයෙන්ම රුපියල් 25,000ක මුදල ලබා දීම සම්බන්ධව නම් සියයට 95ක විතර ප්‍රගතියක් තිබෙනවා. නමුත්, ඊට පස්සේ මේගොල්ලන් මොකක්ද කිව්වේ කියලා අපි දන්නවා. විශේෂයෙන්ම ආපදාවට ලක් වෙච්ච, මුළුතැන්ගෙයි උපකරණවලට හානි වෙච්ච අයට, නිවාස උපකරණවලට හානි වෙච්ච අයට අනිවාර්යයෙන්ම රුපියල් 50,000ක දීමනාවක් දෙනවාය කිව්වා. නමුත් හදිසි නීතිය නොවෙයි, මොන නීතිය තිබුණා වුණත් ඒ රුපියල් 50,000ක දීමනාව ලබා දෙන්න මේ අයට තවම පුළුවන්කමක් ලැබිලා නැහැ. අපට කිව්වා, භාණ්ඩාගාරය පිරෙන්න මුදල්-හදල් තිබෙනවාය කියලා. නමුත්, අපි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ඇහුවාම ඒ රුපියල් 50,000ක මුදල කොටසකට ලබා දී තිබෙනවා, ඉතිරි කොටසට ලබා දෙන්න ප්‍රමාණවත් මුදල් නැහැ කියන එක තමයි අපට දැනගන්න ලැබී තිබෙන්නේ. මට පෙර කථා කරපු මන්ත්‍රීතුමියත් කිව්වා, සුරක්ෂා මධ්‍යස්ථානවල දහස් ගණනක් ඉන්නවාය කියලා. මාස 3ක් ගතවෙලාත් තවම ඒ අයව පිළිවෙළක් කරන්න, ඒ අයගේ ජන ජීවිතය යථා තත්ත්වයට පත් කරන්න කටයුතු කරලා නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හොඳම උදාහරණය තමයි ඒ කඳවුරුවල ඉන්න අයට, තවමත් ඉන්න තැනක්වත් සකස් කර දීලා නැති එක.

ජනාධිපතිතුමා කිව්වා, අර්ධ හානි නොවෙයි සම්පූර්ණයෙන්ම ආපදාවට ලක් වෙච්ච, එහෙම නැත්නම් අධිඅවදානම් කලාපවල පදිංචි අය ඉන්නවා නම් ඒ අයට ඉස්සරවෙලාම ඉඩම සඳහා රුපියල් පනස් ලක්ෂයක් දෙනවා කියලා. ඊට පස්සේ මොකක්ද කිව්වේ? ගෙයක් හදාගන්නත් අනිවාර්යයෙන්ම රුපියල් ලක්ෂ 50ක් දෙනවාය කිව්වා. දැන් ඒ සම්බන්ධව කිසිම කථාවක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අඩුම තරමින් දැන් මේ ආපදාවට ලක් වෙලා, එහෙම නැත්නම් රතු නිවේදන ඇවිල්ලා තිබෙන, අධිඅවදානම් කලාපවල සිටින පවුල්වලට කඩිනමින් මේ රුපියල් ලක්ෂ 50ක මුදල ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. ඒක ක්‍රියාත්මක කරන්න අද වැඩ පිළිවෙළක් නැහැ. විශේෂයෙන්ම නිලධාරින් හොඳට වැඩ කළාය කියලා මෙතුමන්ලා කියනවා. අවශ්‍ය කරන වැඩකටයුතුවලට නිලධාරින් සහයෝගය දුන්නාය කියලා කියනවා. නමුත්, මේ මුදල් ගෙවන්න නිලධාරින්ට අවශ්‍ය කරන පහසුකම් සලසා නැහැ; අවශ්‍ය කරන නීතිමය ආවරණය ලබා දී නැහැ. ඒ වාගේම දවසින් දවස චක්‍රලේඛ වෙනස් කරනවා. එම චක්‍රලේඛවලින් නිලධාරින්ට අවදානමෙන් මිදෙන්න, එහෙම නැත්නම් නිලධාරින්ට ආරක්ෂිතව මේ වැඩකටයුත්ත කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර නැති නිසා තමයි මේ මුදල් ටික ගෙවාගන්න බැරිවෙලා තිබෙන්නේ.

ඊළඟට විශේෂයෙන්ම ආපදාවට ලක් වෙච්ච, අර්ධ හානි වෙච්ච නිවාස විශාල සංඛ්‍යාවක් තිබෙන බව අපි දන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිවාස හදාගන්න ඒ අයට අවශ්‍ය වන්දි මුදල් ටික ලබා දෙන්න අද වෙනකල් තමුන්නාන්සේලාට පුළුවන්කමක් ලැබිලා නැහැ. එතැනත් අර චක්‍රලේඛ තමයි හරස් වෙලා තිබෙන්නේ. මහජන ආරක්ෂක ඇමතිතුමා කිව්වා මට මතකයි, "කමක් නැහැ, තක්සේරු කරන්න අවශ්‍යතාවක් නැහැ, රුපියල් ලක්ෂ 5ක මුදල දෙනවා" කියලා. රුපියල් ලක්ෂ 5ක මුදල දෙනවාය කියලා මේ ඇමතිවරු කට වචනයෙන් කිව්වාට, නිලධාරින්ට පුළුවන්කමක් නැහැ රුපියල් ලක්ෂ 5ක මුදල ලබා දෙන්න. අනිවාර්යයෙන්ම මේ සම්බන්ධව තාක්ෂණ නිලධාරින්ගෙන් තක්සේරු වාර්තාවක් අරගෙන, එහෙම නැත්නම් අදාළ ඉංජිනේරුවන්ගෙන් තාක්ෂණික තක්සේරු වාර්තාවක් අරගෙන ඉවරවෙලා මේ වන්දි මුදල ගෙවන්න තමයි ඒගොල්ලන් එකඟ වෙලා තිබෙන්නේ. නමුත්, මේ මුදල් ටික කොයි ආකාරයෙන් හෝ ගෙවන්න කියලා නිලධාරින්ට නොයෙකුත් ආකාරයෙන් බලපෑම් කරන බව අපි දන්නවා. ඉතින්, මේ එකක්වත් සිදු වෙලා නැහැ.

තමුන්නාන්සේලා දැන් හදිසි නීතිය දීර්ඝ කරන්න කථා කරනවා. ඒ ආපදාව නිසා මරණයට පත් වෙච්ච අයට සම්පූර්ණ වන්දි මුදල් ටිකවත් තවම ගෙවලා නැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පුළුවන් නම් කියන්න, ඒ මරණයට පත් වෙච්ච අයට ඔබතුමන්ලා සම්පූර්ණ වන්දි මුදල් ටික ලබා දුන්නාය කියලා? ඒ වාගේම අතුරුදහන් වෙච්ච අයත් ඉන්නවා. තවම ඒ අයට මරණ සහතිකය ලබා දෙන්න ඔබතුමන්ලාට පුළුවන්කමක් නැහැ. මේ වාගේ ගැටලු රාශියක් තිබෙනවා. ඉතින්, මේවා ඔක්කොම ගැන කථා කරන්න ගියොත් මට තිබෙන කාල වේලාව ඉක්ම යන නිසා මම ඒ සම්බන්ධව කථා කරන්නේ නැහැ.

ඊළඟට වතු කම්කරු ජනතාව ගැනත් මම කියන්න ඕනෑ. ඔබතුමන්ලා හැම අවස්ථාවකදීම වතු කම්කරු ජනතාව ගැන කථා කරනවා. මම දන්නවා, ඒගොල්ලන් ගැන බොහෝම සංවේදීව

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

කථා කරන බව. ඒ අයට රුපියල් 200ක්, 300ක් පඩි වැඩි කළාය කියලා මහ ලොකුවට කථා කරනවා. නමුත්, දැන් ආපදාවට ලක් වෙලා ඉන්න අයට මොකක්ද ලබා දී තිබෙන සහනය? ඒ අය සම්බන්ධයෙන් තවම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර නැහැ. ගම්වල ඉන්න අයට නම් රුපියල් ලක්ෂ 50 ලබාගෙන ඉඩමක් අරගෙන යන්න පුළුවන්කම තිබෙන බව අපි දන්නවා. නමුත් වතු කම්කරුවන්ට ඒ අය වත්තෙන් ලියුමක් ගන්න ඕනෑද, එහෙම නැත්නම් ඒගොල්ලන්ගේ අයිතිවාසිකම් තහවුරු කරන්න ඕනෑද, එහෙම නැත්නම් රජයෙන් ඉඩමක් දෙනවාද කියලා තවම කියලා නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට දැනගන්නට ලැබෙන ආකාරයට මේගොල්ලන්ට කියනවා ලු, Trust එකෙන් මුදල් ගන්න කියලා. ඒ කියන්නේ, වැවිලි මානව සංවර්ධන භාරය හරහා දෙනවාය කියලා. ඉන්දියාවෙන් ආධාර මුදල් ලැබුණොත් තමයි ලු, දෙනවාය කියලා කියන්නේ. මේක අසාධාරණයක්. මොකද, මේගොල්ලනුත් මේ රටේ පුරවැසියන්; ඔවුනුත් මේ රටේ ජන කොටසක්. ඒගොල්ලන්ට වෙනම වැවිලි මානව සංවර්ධන භාරය හරහා මුදල් ගන්න අවශ්‍යතාවක් නැහැ. ආණ්ඩුවට ඔච්චර සල්ලි තිබෙනවා නම්, මහා භාණ්ඩාගාරය පිරිලා ඉතිරිලා ගිහිල්ලා තිබෙනවා නම්, ඇයි ඒ රුපියල් ලක්ෂ 50 දෙන්න බැරි? ඒක ලබා දෙන්න කියලායි අපි ඉල්ලන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මෙතුමන්ලාට වැඩ කරගන්න හදිසි නීතිය ඕනෑය කියනවා නේ. හදිසි නීතිය තියා මොන නීතිය දුන්නත් ඔබතුමන්ලාට නිලධාරින්ගේ සහයෝගය නැත්නම් කොහොමද වැඩ කරන්නේ? දැන් නිලධාරින්ට නොයෙකුත් ආකාරයේ ප්‍රශ්න තිබෙන බව අපි දන්නවා. මේ දවස්වල නිලධාරින් වැඩ කරන්නේ නැහැ. විශේෂයෙන්ම මේ ක්ෂේත්‍රයට සම්බන්ධ, මේ ආපදා තත්ත්වයේදී වැඩ කළ නිලධාරින් විශාල වැඩ කොටසක් සම්පූර්ණ කර තිබෙනවා. ඔවුන් මේ ක්ෂේත්‍රයට සම්බන්ධ වෙලා ඉන්න නිලධාරින්. ග්‍රාම නිලධාරින්, ආර්ථික සංවර්ධන නිලධාරින්, ආපදා කළමනාකරණ නිලධාරින් ඇතුළු මේ අය තමයි පසුගිය කාලය පුරා වැඩ කෙරුවේ. අද ඒ උදවිය වැඩ වර්ජනයක නිරත වෙලා ඉන්නවා. මම හිතන විධියට මේ සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා එක්කත්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්තුමන්ලා එක්කත් සාකච්ඡාවක් කර තිබෙනවා. මේ නිලධාරින් කියන්නේ මොකක්ද? ඔවුන් මාස 3ක් තිස්සේ වෙලාවක් කලාවක් බලන්නේ නැතිව දිවා-රාත්‍රී හැම දාම වැඩ කළා. ඔවුන්ට දෛනික දීමනාවක් හැටියට රුපියල් 2,500ක් දෙන්න කියලා ඉල්ලීමක් කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් රජය තවම යහපත් ප්‍රතිචාරයක් දක්වා නැහැ. එහෙම නැත්නම් අඩුම ගාණේ දින 8ක වැටුප් ලබා දෙන්න කියලා ඔවුන් ඉල්ලා තිබෙනවා. ඒ එකක්වත් මේ ආණ්ඩුව සැලකිල්ලට ලක් කරලා නැති බව මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවට මේ හදිසි නීතිය හෝ ඕනෑම නීතියක් සම්මත කරලා දුන්නා වුණත්, මේ වැඩ ටික කරගන්න නිලධාරින්ගේ සහයෝගය අවශ්‍ය වනවා. එහෙම නම් අන්න ඒ අයගේ සහයෝගය ගැනීමට අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ඕනෑ. මේගොල්ලන් කිව්වා, රජයේ නිලධාරින් හොඳට වැඩ කළා, සියලුම දේවල් ඔවුන් කරලා දුන්නා කියලා. එහෙම නම් එච්චර සේවයක් කරපු මේ ක්ෂේත්‍ර නිලධාරින් ගැන ආණ්ඩුව සොයා නොබලන්නේ ඇයි? ඔවුන්ට යම්කිසි දීමනාවක් නොදෙන්නේ ඇයි? ඔවුන්ට ලබා දෙන යල් පැන ගිය ඉන්ධන දීමනාවක් තිබෙනවා. ඒකත් මාසයකට ඉන්ධන ලීටර් දෙකක් ද කොහේද තමයි දෙන්නේ. ඒ සම්බන්ධයෙනුත් ඔවුන් ඉල්ලීමක් කර තිබෙනවා. ඉන්ධන ලීටර් දෙකෙන් මේ අය ක්ෂේත්‍රයේ වැඩ කටයුතු කරන්නේ කොහොමද? රටම මේ වාගේ ආපදාවකට ලක් වෙච්ච අවස්ථාවකදී ඔවුන් ඉන්ධන ලීටර් දෙකකින් ඒ අවශ්‍ය වැඩ කටයුතු කරන්නේ කොහොමද? ඒ නිසා අඩුම ගාණේ මේ අයට සුදුසු ඉන්ධන දීමනාවක් ලබා දීමේ වැඩ පිළිවෙළක්වත් ක්‍රියාත්මක කරන්න කියලායි අපි කියන්නේ. ඒ වාගේ ඉල්ලීම් කිහිපයක් විතරයි මේ අය ඉල්ලා තිබෙන්නේ.

ආපදා කළමනාකරණ නිලධාරින් ගැනත් මම කථා කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔවුන්ගේත් ඉල්ලීමක් තිබෙනවා, ඔවුන්ගේ සේවාව ඒකාබද්ධ කර දෙන්න කියලා. විශේෂයෙන්ම ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයත්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයත් කියන දෙක ඒකාබද්ධ කරන්න කියලා ඒ අයගේ ඉල්ලීමක් තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැනට මේක තිබෙන්නේ කොටස් දෙකක් හැටියටයි; ආයතන දෙකක් හැටියටයි. මොකද, මේ ආයතන දෙක ඒකාබද්ධ කරලා එකම ආයතනයක් යටතට ගත්තොත්, එකම දෙපාර්තමේන්තුවක් යටතට ගත්තොත් මේ ඔක්කෝටම මීට වඩා කාර්යක්ෂමව වැඩ කටයුතු කරන්න පුළුවන් කියලා ඔවුන් කියනවා. මම මේ අවස්ථාවේදී ඒ ඉල්ලීමත් ඉදිරිපත් කරන්න කැමැතියි.

මේ ආපදාව නිසා විශේෂයෙන්ම වැවිලි කර්මාන්තයටත් ලොකු හානියක් වුණා. විශේෂයෙන්ම තේ කර්මාන්තයට මේ ආපදාවෙන් විශාල හානියක් වෙලා තිබෙනවා. මේ ආපදාව නිසා අපේ තේ කර්මාන්තය බොහොම ප්‍රශ්න සහගත තත්ත්වයකට පත් වෙලා තිබෙන්නේ, විශේෂයෙන්ම අපේ කුඩා තේ වතු හිමියන්. පසුගිය කාල සීමාව තුළ ඒගොල්ලන්ට තේවලට නිසි මිලක් හම්බ වුණේ නැහැ. පොහොර මිලත් අහස උසට නැඟ තිබෙනවා. ඒ මදිවාට දැන් මැද පෙරදිග ඇති වෙච්ච යුද තත්ත්වය නිසා අද තේ ටික විකුණා ගන්න පුළුවන්කමකුත් නැහැ. ඊයේ පෙරේදා ප්‍රවෘත්ති නිවේදනයක් තිබෙනවා මම දැක්කා, තේ මෙට්‍රික් ටොන් 180,000ක් දැන් වරායේ ගුදම්වලත්, අපේ අපනයනකරුවන්ගේ ගුදම්වලත් තිබෙනවා කියලා. මේවාට දැන් මොකක්ද වෙන්නේ? මේ වෙනුවෙන් අපි යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළේ නැත්නම් මේවා විනාශ වෙලා යනවා. දැන් තේ කර්මාන්තශාලා හිමියෝ කියනවා, අපි ලබන මාසයේ ඉඳන් තේ දළු ගන්නේ නැහැ කියලා. තේ දළු ටික නොගත්තොත් කුඩා තේ වතු හිමියන්ට මොකක්ද වෙන්නේ? එහෙම වුණොත් ඒ මිනිස්සු ජීවත් වෙන්නේ කොහොමද? දැනටමත් හම්බ වෙන ඒ සොච්චම් මිලෙන් තමයි ඒගොල්ලන් යන්තම් ජීවිකාව ගැට ගසා ගන්නේ. ඒ පැත්තෙන් පොහොර සහනාධාරයත් නැහැ; මේ පැත්තෙන් අර ප්‍රශ්නයත් පැන නැඟුණොත් මේ අයට කිසිම හච්හරණක් නැති වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙන්න මේ දේවල් ගැන තමයි රජය කල්පනා කරන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් ඉදිරි කාලයේදී කල්පනා කරලා අඩුම ගාණේ කුඩා තේ වතු හිමියන් සඳහා අලුත් තේ වෙළෙඳ පොළක්වත් නිර්මාණය කර ගන්න වෙනවා. අපි මේ මැති ඇමැතිවරුන් ඇතුළු රජයෙන් ඉල්ලා සිටින්න කැමැතියි, ඔබතුමන්ලා මේ සම්බන්ධයෙන් සොයා බලා පුළුල් මැදිහත්වීමක් කරන්න කියලා. මේ සම්බන්ධයෙන් රජය මැදිහත් වෙන්න ඕනෑ. එහෙම මැදිහත් වෙලා අලුත් වෙළෙඳ පොළක් හොයාගෙන, අඩුම ගාණේ මේ කුඩා තේ වතු හිමියන්ට යම්කිසි සහනයක් සලසා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා තමයි මම මේ අවස්ථාවේදී යෝජනා කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කාලය ලබා දුන්නාට ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.*

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA]in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රුවන් විජේවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

හදිසි නීති රෙගුලාසි පිළිබඳව විවාද කරන අද දවසේ ඊට එකතු වන්නට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. විශේෂයෙන්ම මේ හදිසි නීති රෙගුලාසි ගෙන එන්නේ කුමන අරමුණකින්ද, කුමක් සිදු කිරීම සඳහාද කියන කාරණාව සම්බන්ධව පිළිතුරු ලබා දීම අද දවසේදී අපේ ආණ්ඩු පක්ෂය පැත්තෙන් සිදු කරනු ලැබුවා. විශේෂයෙන්ම රටක් විදියට ඉදිරියට ගමන් කරනකොට අපි දන්නවා, 2025 අවුරුද්දේ අප ආර්ථිකය ඉතා හොඳින් කළමනාකරණය කරමින් කටයුතු කළ බව. අභ්‍යන්තරිකව සහ බාහිරව ඇති විය හැකි සියුම් කම්පනයන්ට පවා ඔරොත්තු දීමේ හැකියාවක් නොතිබුණු ආර්ථිකයක්, ශක්තිමත් ආර්ථිකයක් බවට නිර්මාණය කරන්න අවශ්‍ය පදනම ගෙන එමින් අපේ රටේ අපනයන ආදායම, සංචාරක ක්ෂේත්‍රයෙන් උපයන ආදායම, විශේෂයෙන්ම විදේශ ප්‍රේෂණවලින් අපේ රටට ලැබෙන ආදායම, සෘජු විදේශ ආයෝජන කියන හැම ක්ෂේත්‍රයක් සම්බන්ධවම ඉතිහාසයේ අපේ රට විසින් අත්පත් කර ගත් විශිෂ්ටතම දර්ශක බවට පරිවර්තනය කරපු අවුරුද්දක් තමයි, 2025 අවුරුද්ද. එහෙම තැනක ඉඳලා අපි 2026 වර්ෂය බොහොම සුබවාදීව, බොහොම positive outlook එකක් ඇතුව ආරම්භ කළා. එහෙම සුබවාදීව 2026 වර්ෂය ආරම්භ කරගෙන අපි ඉදිරියට ගියත්, අද වනකොට මැද පෙරදිග කලාපය තුළ නිර්මාණය වෙලා තිබෙන යුදමය තත්ත්වයට මුහුණ දෙන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. ඒ යුදමය තත්ත්වයත් සමඟ ඇති වෙලා තිබෙන වටපිටාව තුළ අපේ රටේ ආර්ථිකයට ඇති විය හැකි අනතුර, අභියෝග සහ අපේ රටේ කළමනාකරණයෙන් ඔබ්බේ තිබෙන ඒ භූ දේශපාලනික සාධකත් එක්ක අපි මේ ආර්ථිකය සහ ඒ වටපිටාව කළමනාකරණය කර ගන්නේ කොහොමද කියන කාරණාව අද වනකොට අභියෝගාත්මක තැනකට පත් වෙලා තිබෙනවා. එහෙම තැනකට අපේ රට පත් වෙලා තිබීම අපේ රටේ බලශක්ති සැපයුමට බලපාන බව අපි දන්නවා. ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේදීත් ඒ සම්බන්ධව ඉතාම හොඳින් පැහැදිලි කළා. අපේ රටේ බලශක්ති සැපයුම, ඉන්ධන සහ ගෑස් සැපයුම වාගේම විදේශගත ශ්‍රී ලාංකිකයන් සම්බන්ධ අර්බුදයත් අභියෝගයක්ව පවතිනවා. ඒ වාගේම අපේ රටේ සංචාරක කර්මාන්තය අපේ රටේ ආර්ථිකයෙන් විශාල පංගුවක් ඉෂ්ට කරනු ලබනවා. සංචාරක කර්මාන්තය, නාවික සේවා සැපයුම, ගුවන් සේවා සැපයුම, අපනයන ක්ෂේත්‍රය ඇතුළු සියලු ක්ෂේත්‍ර සම්බන්ධව අපි ඉතාම අවධානයෙන් යුතුව, ඉතාම හොඳින් කල්පනා කරමින්, කළමනාකරණය කරමින්, ඇති වන්නා වූ ගෝලීය තත්ත්වයන් පිළිබඳව ඉතා හොඳ අවබෝධයකින් යුතුව ඉදිරියට ගමන් කළ යුතු වෙනවා. We are just passing a very important and critical juncture in the human history. That is what everyone is talking about.

However, what did the Leader of the Opposition say in the morning? විපක්ෂ නායකතුමා කියන්න උත්සාහ කළා, ගෝලීය වශයෙන් බරපතළ අර්බුදයක් ඇති වෙලා තිබෙනවා, ඒ අර්බුදයත් එක්ක විශේෂයෙන්ම තෙල් මිල ඉහළ යනවා, ඒ එක්කම ආර්ථිකය කඩා වැටෙන්න පුළුවන්, උද්ධමනය ඇති වෙන්න පුළුවන් වාගේ කාරණා ටිකක්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගල්ෆ් කලාපයේ තමයි යුද්ධය ඇති වෙලා තිබෙන්නේ. හෝමුස් සමුද්‍ර සන්ධිය කියන්නේ, ගෝලීය තෙල් සැපයුමෙන් සියයට 20ක් ප්‍රවාහනය කරන ස්ථානයක්. ඒ වාගේම LNG - Liquefied Natural Gas - supply එක ගත්තොත්, සියයට 20ක පමණ ප්‍රමාණයක් ගෝලීය වශයෙන් සපයන ඉතා වැදගත් ස්ථානයක්. ඒ ස්ථාන වහලා, ඒ ස්ථානවලින් නාවික ගමනාගමනය suspend කරලා තිබෙන මොහොතක තමයි මේ අර්බුදය එන්නේ. එහෙම අවස්ථාවක තෙල් මිල ඉහළ යෑම කියන කාරණාව සම්බන්ධව අර්බුදයක් නැහැ. මොකද, මේ සම්බන්ධ කාරණය අලුත් දෙයක් නොවෙයි. ඒක ගමේ ඉන්න මනුෂ්‍යයාට පවා තේරෙනවා. ඒ නිසා තමයි ඊශ්‍රායලය විසින් ඉරානයට පහර දෙනකොට, ඉරානය විසින් ගල්ෆ් කලාපයේ අනෙක් රටවලට පහර දෙනකොට ගම්වල තෙල් පෝලිම් හැදුණේ. ඒකට උදවු කළා, විපක්ෂ නායකතුමා ප්‍රමුඛ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු. එතුමන්ලා මාධ්‍ය සාකච්ඡා පැවැත්වූවා. රටක් අර්බුදයට යනකොට, රටක අර්බුදයක් නිර්මාණය වෙනකොට වගකිව යුතු විපක්ෂයක් නම් කරන්න ඕනෑ මොකක්ද? What is the role of a responsible Opposition? That is what we have to ask. This situation has been observed by everyone in the world. So, in this kind of situation, what should be the role of the Opposition? That role has not been played; I always say that role has not been played. I can remember what the Hon. Ajith P. Perera, Member of Parliament, said. What did he say? He made a statement in Parliament. As a responsible person, he did not make that. That is the most important thing. මොකක්ද, කියපු කාරණාව? අපේ මුහුදු සීමාවට ළං වෙලා ළඟයි 800කට වඩා ඉන්න නැවක් තිබෙනවා, මේ නැව බේරා ගන්න ඕනෑ කියලා නිකම් humanitarian outlook එකක් දෙන්න හැදුවා.

හැබැයි, අපි මොකක්ද කරමින් තිබුණේ? විපක්ෂ නායකතුමා කියපු කාරණාවට ඉතා හොඳ උත්තරයක් දෙනවා, IMF Managing Director Kristalina Georgieva. එතුමිය මීට සතියකට විතර කලින් අපේ රටට ඇවිල්ලා ප්‍රකාශ කළා, ඉතිහාසයේ නිර්මාණය වුණු, ජනතාව විසින් විශ්වාස කරන හොඳම රජයක් තමයි දැන් ශ්‍රී ලංකාවේ තිබෙන්නේ, ආර්ථික වශයෙනුත් ශ්‍රී ලංකාවට ඉතා හොඳ ඉදිරි ගමනක් තිබෙනවා, ඒ ගමන යන්න පුළුවන් කියන කාරණාව. මේ මතු වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව එතුමිය කියනවා. මොකක්ද, එතුමිය කියන්නේ? "Underscoring the IMF's concern at the suffering and loss of life resulting from the Middle East crisis, Georgieva warned that a prolonged conflict could affect energy prices,…" Energy pricesවලට බලපානවා. ඒක බොහොම සරලයි; ඒ ගැන අලුතින් කියන්න දෙයක් නැහැ. එතුමිය තවදුරටත් මෙහෙම කියනවා, "….. market sentiment, economic growth and inflation, 'placing new demands on the shoulders of policymakers everywhere.' " So, on the shoulders of the policymakers, there is a huge responsibility; තීන්දු තීරණ ගන්න ප්‍රතිපත්ති සම්පාදකයන්ට බරපතළ වගකීමක් පැවරී තිබෙනවා. ඒ වගකීම ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩුව ඉෂ්ට

[ගරු රුවන් විජේවීර මහතා]

කරනවා. එම නිසා තමයි නිරන්තරව පාර්ලිමේන්තුව තුළත්, පාර්ලිමේන්තුවෙන් පිටතත් එතුමා 24 hours වැඩ කරමින් ඉන්නේ. He has been working as a responsible President to do his best in this crisis; එතුමා ඒ කටයුත්ත කරමින් සිටිනවා. එතකොට මේකට උත්තරය විධියට එතුමිය මොකක්ද කියන්නේ? උත්තරය විධියට මෙන්න මෙහෙම කාරණාවක් අන්තිමට කියනවා. "She urged Asia to link up more internally..." - රටවල් විධියට අභ්‍යන්තර වශයෙන් සංවිධානගත වෙන්න කියනවා; ආසියාවේ රටවලටයි මෙහෙම කියන්නේ - ".....to shield itself from trade uncertainties that will likely continue. The region can accelerate integration by lowering non-tariff barriers." මෙන්න මේක ඉතා වැදගත්. මේක ඊයේ කරපු ප්‍රකාශයක්. එතුමිය කියනවා, "There is no point lamenting..." කියලා. අඬන එකෙන් වැඩක් නැහැ; Parliament එකට ඇවිල්ලා අඬන එකෙන් වැඩක් නැහැ. විපක්ෂයේ ඉන්න තමන්ගේ ගෝල බාලයෝ දාලා බොරු කියලා වැඩක් නැහැ; වගකීම් විරහිත ප්‍රකාශ කරලා වැඩක් නැහැ. So, there is no use of lamenting. මොකක්ද, එතුමිය කියන්නේ? "There is no point lamenting on what is happening outside your remit,..." අපේ limit එකෙන් එහා තිබෙන එකක් සම්බන්ධයෙන් lament වීමෙන් ප්‍රතිඵලයක් නැහැ, වැඩක් නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේක තමයි විපක්ෂ නායකතුමා දැනගන්න ඕනෑ. මොකක්ද, එතුමිය තවදුරටත් කියන්නේ? "Focus on what is in your hands, on what you can do to get your country, your economy in the best of shapes for this world we have entered". එම නිසා රටක් විධියට අපි ඒක කළමනාකරණය කර ගන්න ඕනෑ; රටක් විධියට ඉදිරියට යන්න ඕනෑ.

අර්බුදයක් තමයි මේ වනවිට තිබෙන්නේ. නැව් දෙක ඇවිල්ලා තිබෙන වෙලාවේදී මොකක්ද කිව්වේ? විපක්ෂ නායකතුමා අද උදෑසනත් වගකීම් විරහිත ප්‍රකාශ කළා. Torpedo එකේ වර්ගය මොකක්ද කියා එතුමා ඇහුවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ලෝකයේ geopolitics කියන එක 70, 80, 90 දශකවලට සාපේක්ෂව දැන් වෙනස් වෙලා තිබෙන්නේ. වෙනිසියුලාවේ ජනාධිපති අරගෙන යනතුරු දන්නේ නැහැ. ඉරානය කියන්නේ, ලෝකයේ යුද ශක්තිය අතින් ඉහළින් හිටපු රටක්. ඒ රටේ අධ්‍යාත්මික නායකයා ඝාතනය කරනතුරු දන්නේ නැහැ. එහෙම වෙලාවක විපක්ෂ නායකතුමා අපෙන් අහනවා, torpedo එකේ වර්ගය මොකක්ද කියලා. එහෙම නම් එතුමාත් ඒක හොයා ගන්න ඕනෑ; එතුමාට contacts තිබෙනවා නම් එතුමාත් ඒක හොයා ගන්න ඕනෑ. Torpedo එකේ වර්ගය එතුමා ඇහුවා. රටක් විධියට අපි මේ මොහොතේදී මොකක්ද කරමින් ඉන්නේ? රටක් විධියට අපි මේ තත්ත්වය ඉතාම හොඳින් කළමනාකරණය කර ගන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපට foreign remittances එවන ලක්ෂ 10ක් ඉක්ම වූ විදේශ ශ්‍රමිකයන් පිරිසක් ඉන්න බව අපි දන්නවා; ඔවුන් අපේ රටේ ආදරණීය ජනතාව; පසුගිය අවුරුද්දේ අපේ රටට ඩොලර් බිලියන 8කට වඩා එවපු ජනතාව.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
තව විනාඩියකින් මම කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මේ ආදරණීය ජනතාව වෙනුවෙන් මැදිහත්වීමක් කළ යුතුව තිබෙනවා. ඔවුන්ගේ ජීවිතවලට වැදගත්කමක් තිබෙනවා. ඔවුන්ගේ ජීවිතවලට වටිනාකමක් දීලා තිබෙනවා. ඒ සම්බන්ධව mechanism එකක් අපි හදා තිබෙනවා. ජනාධිපතිවරයා ඒක පැහැදිලිවම කිව්වා. ඒත් එක්කම මේ අර්බුදය වඩා හොඳින් කළමනාකරණය කරමින් tourism සම්බන්ධවත්, අනෙක් හැම දෙයක්ම සම්බන්ධවත් අපට කරන්න පුළුවන් මොකක්ද කියන කාරණය එතුමා කිව්වා.

අවසාන වශයෙන් මම ජනාධිපතිතුමා කිව්ව මෙන්න මේ කථාව කියලා මගේ කථාව අවසන් කරනවා. රටක් විධියට ඉස්සරහට යනකොට, we have a responsibility of this manner. What did the President say yesterday? He said, "Neutrality and humaneness is the priority. We have responsibilities as a neutral country." Neutral country එකක් විධියට අපට වගකීමක් තිබෙනවා. ඒ වාගේම, "All parties must be committed to peace", is what the President said. ඒ නිසා සියලුදෙනා එකතු වෙලා මේ අර්බුදකාරී අවස්ථාවේදී රට ඉදිරියට ගෙන යන්න එකතු වෙන්න කියන ආරාධනාව මම කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.10]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
நன்றி, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே!

பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டத்தின் கீழான தீர்மானம் மீதான இந்த விவாதத்திலே சில கருத்துகளைச் சொல்ல நினைக்கின்றேன். முதலாவதாக, உயிர்த்த ஞாயிறுத் தாக்குதல் சம்பந்தமாக அரசாங்கம் தொடர்ச்சியாக எடுத்து வருகின்ற நடவடிக்கைகளுக்கு எங்களுடைய முழு ஆதரவை யும் நாங்கள் தெரிவித்துக் கொள்கின்றோம். இந்த உயிர்த்த ஞாயிறுத் தாக்குதலில் சம்பந்தப்பட்டவர்கள் கைதுசெய்யப்பட வேண்டும்; இது சம்பந்தமாக நீதி கிடைக்க வேண்டுமென்ற நிலையிலே சம்பந்தப்பட்டவர்களைக் கைதுசெய்கின்ற, விசாரணை செய்கின்ற அனைத்து விடயங்களுக்கும் எங்களு டைய ஆதரவைத் தருவோம் என்பதை இங்கு குறிப்பிட விரும்புகின்றேன்.

இரண்டாவது விடயம், இப்பொழுது வளைகுடாவில் நடைபெறுகின்ற போர். இது சம்பந்தமாகப் பாராளு மன்றத்திலே பலரும் பல கருத்துகளைச் சொல்கிறார்கள். உண்மையிலே போர் என்பது தவறானது; போரினால் பல உயிர்கள் மரிக்கின்றன; அதை எங்களால் ஏற்றுக்கொள்ள முடியாது. ஏனென்றால், எங்களுடைய நாட்டிலே எங்களு டைய இனம் சார்ந்த அடக்குமுறையால் ஏற்பட்ட போரால் எங்களுடைய மக்கள் பாதிக்கப்பட்டதை நன்கு உணர்ந்ததன் அடிப்படையிலே போர் என்பதை உண்மையிலே நாங்கள் ஏற்றுக்கொள்ளவில்லை. இருந்தாலும் என்னைப் பொறுத்த மட்டிலே, இந்தப் போர் சம்பந்தமாகக் குரல்கொடுக்கின்ற, இது சம்பந்தமாக மிக உச்சக் கட்டமான கருத்துகளைச் சொல்லிவருகின்ற - குத்திமுறிகிறார்கள் என்று தமிழிலே சிலேடையாகச் சொல்வார்கள் - யாராக இருந்தாலும் சரி, அவர்களுடைய அந்த எண்ணக் கருவைப் பார்க்கின்றபோது, எங்களுடைய இனம் சார்ந்த போராட்டம் சம்பந்தமாக

நியாயத்தைக் கதைப்பதற்கு இந்த நாட்டிலே யாரும் இருக்கவில்லையென்ற கவலையை நான் இங்கு பதிவு செய்கின்றேன். இப்பொழுது பேசுகின்றவர்கள், போராட்டம் நடத்துபவர்கள் யாரும் எங்களுடைய இனம் சார்ந்த, உரிமை சார்ந்த பிரச்சினைகள் நியாயமானது என்று சொல்வதற்கு இந்த நாடாளுமன்றத்திலே முன்வரவில்லை. எங்களுடைய இனம் சார்ந்து அடக்குமுறையாகப் போரை நடத்துகின்றபோது, அந்தப் போர் தவறானது, அந்த இனத்தின் பிரச்சினை தீர்க்கப்பட வேண்டும் என்று சொல்கின்ற வகையிலே இங்கு யாருமே குரல் கொடுக்கவில்லை என்பதை நான் இந்த உயரிய சபையிலே எனது பதிவாகச் சொல்லிக்கொள்ள விரும்பு கின்றேன்.

அடுத்ததாக, ஈரானிய போர்க் கப்பல் இலங்கைக்கு அருகே சர்வதேச கடற்பரப்பில் மூழ்கடிக்கப்பட்டது; அதற்கு இந்தியா பொறுப்பு என்றெல்லாம் இங்கு பேசுகிறார்கள். உங்களைப் பொறுத்தமட்டிலே, பொருளாதாரப் பிரச்சினை வருகின்ற போது உங்களுக்கு உதவ இந்தியா இங்கு வரவேண்டும்; இயற்கை அனர்த்தம் ஏற்பட்டபோதும் இந்தியாதான் வரவேண்டும்; அதற்காக இங்கு முதன்முதலில் கால்பதித்தது இந்தியாதான். ஆனால், இந்தியாவிலே நடந்த சிநேகபூர்வமான பயிற்சியிலே பங்குபற்றி, அவர்கள் இங்கு வந்து தங்கவேண்டும் என்று காலம் கடந்து இலங்கை அரசிடம் கேட்டபோது, ஏன் இந்தியாவைக் குறை சொல்லுகின்ற ஒரு நிலைப்பாட்டைக் கொள்கிறீர்கள் என்று எனக்குத் தெரிய வில்லை. என்னைப் பொறுத்தமட்டிலே, இந்த விடயத்திலே இந்தியாவை நீங்கள் குற்றம் சாட்டக்கூடாது, குற்றம் சாட்ட இயலாது. அது தவறான ஒரு விடயம் என்பதை நான் இங்கு சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, பயங்கரவாதத் தடைச் சட்டத்தின் காரணமாக எங்களுடைய மக்களின் வலி சுமந்த நாட்களை இப்பொழுதும் நினைவு கூருகின்றோம். ஏன், ஆயுதமெடுத்துப் போராடிய JVP கூட பயங்கரவாதத் தடைச் சட்டத்தைச் சந்தித்தது; பலர் படுகொலை செய்யப்பட்டார்கள். அந்த வகையில், இப்பொழுதும் எங்களுடைய இனம் சார்ந்த போராட்டங்களை அடக்குவதற்காகத்தான் இந்தச் சட்டம் மீண்டும் நீடிக்கப் படுகிறதா என்ற சந்தேகம் எழுகின்றது. ஒரு சமூகம் தன்னுடைய பிரச்சினையை ஒரு போராட்டத்தினூடாக வெளிப் படுத்தும்போது, அந்தப் போராட்டம் நியாயமானதாக இருக்கும்போது, அந்தப் போராட்டம் நடைபெறக் கூடாது என்பதற்காகவா இந்தச் சட்டம் நீடிக்கப்படுகின்றது? இப்போது நாட்டில் காணப்படுகின்ற சூழல் காரணமாக, பெற்றோல் தட்டுப்பாடு ஏற்படுமென்ற அச்சத்தினால் மக்கள் பெற்றோல் நிலையங்களில் queueஇல் நிற்கின்றார்கள். இப்படியான பிரச்சினைகளைக் கருத்திற்கொண்டுதான் இந்தச் சட்டம் நீடிக்கப்படுகின்றது என்று சொல்லப்படுகின்றது. இதற்கு வேறு சட்டங்கள் இருக்கும்போது ஏன் இந்தச் சட்டத்தை நீடிக்கின்றீர்கள்? பயங்கரவாதத் தடைச் சட்டத்தின் கீழ் ஒருவர் கைது செய்யப்பட்டால், அவரை நீதிமன்றுக்கு ஆஜர்படுத்தால் 3 மாதங்கள்வரை தடுத்து வைத்து விசாரணை செய்ய முடியும். இப்பொழுது எண்ணெய் இல்லை, பெற்றோல் இல்லை என்று மக்கள் போராட்டத்தைச் செய்கின்ற சூழ்நிலை ஏற்படுமாக இருந்தால், அதை நாங்கள் சாதாரண சட்டரீதியாகக் கையாள வேண்டும். அதைவிடுத்து, ஒருவரைக் கைதுசெய்து, DOமூலம் பல மாதங்களாக விசாரணை என்ற பெயரிலே அவரைத் தடுத்துவைத்து நீதிமன்றுக்கு ஆஜர்ப் படுத்தாத சூழலை உருவாக்குகின்ற இந்தச் சட்டத்தை நீங்கள் நடைமுறைப்படுத்துவதை எங்களைப் பொறுத்தமட்டிலே ஏற்றுக்கொள்ள முடியாது.

எங்களுடைய கௌரவ பிரதமர் அவர்கள் தன்னுடைய கருத்தைத் தெரிவிக்கின்றபொழுது சொன்னார், "இந்தச் சட்டம் நீடிக்கப்பட்டிருந்தபோது இதனால் யாராவது பாதிக்கப் பட்டிருக்கிறார்களா என்பதைச் சொல்லுங்கள்" என்று. என்னைப் பொறுத்தமட்டில், உயிர்த்த ஞாயிறுத் தாக்குதல் தொடர்பாகக் கைது செய்யப்பட்டவர்களைப் பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் கைது செய்யப்பட்டதைத் தவறு என்று நான் சொல்லவில்லை. ஆனால், சில சந்தர்ப்பங்களில் போராட்டங்கள் வலுப்பெறும்பொழுது, மக்கள் தங்கள் உரிமைக் கோரிக்கையைப் போராட்டமாக மாற்றுகின்ற பொழுது, இந்தச் சட்டமும் அவர்கள்மீது பாயாது என்ற உத்தரவாதத்தை யாரும் கொடுக்க முடியாது, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! ஆனால், அவர்களை இந்தச் சட்டத்தின்கீழ்தான் கைது செய்ய வேண்டும். ஏனென்றால், சட்டம் நீடிக்கப்பட்டு நடைமுறையில் இருக்கின்றது. அந்த வகையில், இந்தச் சட்ட நீடிப்பைக் கண்டிப்பதற்கும் எதிர்ப்பதற்கும் நாங்கள் தயாராக இருக்கின்றோம். பயங்கரவாதத் தடைச் சட்டத்தினூடாக இன்றைக்கும் வலிகளைச் சுமந்து கொண்டிருக்கின்ற எங்களுடைய இனத்தின் சார்பாக நாங்கள் சொல்கின்றோம், இந்தச் சட்டம் இல்லாதொழிக்கப்பட வேண்டும், நீடிக்கப் படக்கூடாது. பயங்கரவாதத் தடைச் சட்டம் இல்லாதொழிக் கப்பட வேண்டுமென்று எங்களுடைய மக்கள் கையெழுத்து வேட்டைமூலம் தமது கோரிக்கைகளை அனுப்பியிருக் கின்றார்கள். அந்த வகையில், பயங்கரவாதத் தடைச் சட்டம் இல்லாதொழிக்கப்பட வேண்டுமென்ற கோரிக்கையை முன்வைத்து, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.18]

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, விசேஷமாக இன்று இந்தச் சபைக்குக் கொண்டுவரப் பட்டிருக்கும் அவசரகாலச் சட்டம் நீடிப்பின் நோக்கம், தற்போது நாடு எதிர்கொள்ளும் சவால்களிலிருந்து - ஒருபுறம் இயற்கை அனர்த்தத்தின் பிரதிபலனாகவும், மறுபுறம் மத்திய கிழக்கில் உருவாகியுள்ள யுத்த நிலைமையினால் தற்போது உலகளாவிய ரீதியில் நாடுகள் எதிர்கொண்டிருக்கின்ற பாதிப்புகளிலிருந்தும் - இந்த நாட்டை மீட்டெடுக்க வேண்டும் என்பதாகும். உலகளாவிய ரீதியில் அவ்வாறான நிலைமை ஏற்பட்டிருக்கின்றபொழுது, இலங்கையைச் சேர்ந்த அநேகமானவர்கள், விசேஷமாக பணிப் பெண்களாக மத்திய கிழக்கு நாடுகளுக்குச் சென்றுள்ளவர்கள், பாரிய பிரச்சினை களையும் நெருக்கடிகளையும் எதிர்கொள்ளுகின்றார்கள். இங்கிருக்கின்ற அவர்களுடைய குடும்பத்தவர் பாதிக்கப் பட்டிருக்கின்றனர். அவ்வாறான சூழ்நிலையில், இந்த அரசாங்கம் மீண்டும் இந்த அவசரகாலச் சட்டத்தை நீடிப்பதற்கு எடுத்திருக்கும் முடிவானது வரவேற்கத்தக்க ஒன்றாகும்.

இந்த அவசரகாலச் சட்டம் என்பது, முதன்முதலிலே 1953ஆம் ஆண்டிலே கொண்டுவரப்பட்டு அமுல்படுத்தப்பட்ட தென்பது நம்மனைவருக்கும் தெரியும். அப்போதைய

[ගරු කිට්නන් සෙල්වරාජ් මහතා]

அரசாங்கம் ஒரு கொத்து அரிசியின் விலையை 25 சதத்தில் இருந்து 70 சதமாக உயர்த்தியதால், உழைக்கும் பாட்டாளி வர்க்கம் அணிதிரண்டு அதற்கு எதிர்ப்பையும் கண்டனத்தையும் தெரிவிப்பதற்கு முனைந்தபொழுதே, 1953ஆம் ஆண்டு காலப்பகுதியில் அன்றைய ஆட்சியாளர்களால் முதன்முதலில் இந்த நாட்டில் அவசரகாலச் சட்டம் அமுல்படுத்தப்பட்டது. அவ்வாறு கொண்டுவரப்பட்ட அந்த அவசரகாலச் சட்டம் 29 நாட்கள் அமுலில் இருந்தது என நான் நினைக்கின்றேன், கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! அதனைத் தொடர்ந்து, 1958ஆம் ஆண்டு மே மாதம் 27ஆம் திகதி இனக் கலவரத்தைப் பின்புலமாகக் கொண்டு அமுலுக்குக் கொண்டுவரப்பட்ட அவசரகாலச் சட்டம், தொடர்ந்து 10 மாதங்கள் நடைமுறையில் இருந்தது.

அதன் பின்னர், 1966ஆம் ஆண்டில் இந்த அவசரகாலச் சட்டம் மீண்டும் அமுல்படுத்தப்பட்டது. தொடர்ந்து, 1968ஆம் ஆண்டு மீண்டும் புதுப்பிக்கப்பட்டு அமுல்படுத்தப்பட்டது. அதனைத் தொடர்ந்து, 1979ஆம் ஆண்டு அமுல்படுத்தப்பட்ட அவசரகாலச் சட்டம் 1982ஆம் ஆண்டுவரை நீடிக்கப்பட்டது. அதைத் தொடர்ந்து, 1970ஆம் ஆண்டு 50 ரூபாய் மற்றும் 100 ரூபாய் தாள்களை அழிப்பதற்காக அவ்வாண்டின் டிசம்பர் 24ஆம் திகதி வரை அச்சட்டம் அமுலில் இருந்தது. பின்னர் 1978ஆம் ஆண்டு நவம்பர் மாதம் 29ஆம் திகதி இந்த நாடு சூறாவளி இயற்கை அனர்த்தத்தால் பாதிக்கப்பட்டுப் பெரும் சேதத்தை எதிர்கொண்டபோதும் இந்தச் சட்டம் அமுலுக்குக் கொண்டுவரப்பட்டது. அவ்வாறான அசாதாரண நிலைமை தோன்றிய ஒவ்வொரு தருணத்திலும் அவசரகாலச் சட்டத்தைக் கொண்டுவந்து, அதனூடாக நாட்டின் நிலைமையைச் சமநிலைப்படுத்துவதற்கு ஏதுவான நடவடிக்கைகள் காலத்துக்கு காலம் ஆட்சி செய்த அரசாங்கங்களால் முன்னெடுக்கப்பட்டது. அவ்வாறு கொண்டுவரப்பட்ட அந்தச் சட்டத்தால் காலத்துக்கு காலம் ஒரு சிலர் பாரிய பாதிப்புகளைச் சந்தித்திருப்பதும் நாங்கள் அறிந்த விடயம்.

இன்றைய நிலைமையில், கடந்த 'தித்வா' புயலினாலும் வெள்ளத்தினாலும் பாதிக்கப்பட்ட மக்களுக்கு நிவாரணத் தையும் மீள் வாழ்வையும் அளிப்பதற்காக ஒரு கட்டமைப்பை உருவாக்கி, அதனூடாக மக்களைப் பாதுகாத்து, மீட்டெடுத்து அவர்களுடைய வாழ்வை இயல்பு நிலைக்குக்கொண்டு செல்வதற்கு இன்றைய அரசாங்கம் பிரகடனப்படுத்திய இந்த அவசரகாலச் சட்டம் பிரயோசனமாக இருந்தது. கௌரவ பிரதமர் உள்ளிட்ட எங்களுடைய அநேகமான அமைச்சர்கள், இந்த அவசரகாலச் சட்டத்தைத் தேசிய மக்கள் சக்தி அரசாங்கம் பயன்படுத்துவது அல்லது நீடிப்பது மக்களின் நன்மைக்காகவே அன்றி, கடந்த ஆட்சியாளர்களைப்போல் தங்களுடைய ஆதிக்கத்தின் பெயரால் பிற்போக்குத்தனமான நடவடிக்கை களை முன்னெடுப்பதற்காக அல்ல என்பதைத் தெளிவாகக் கூறினார்கள். ஆனால், இங்கு சில பாராளுமன்ற உறுப்பினர்கள் கருத்துகளைத் திரிபுபடுத்தித் தங்களுடைய உரையை நீட்டிச் செல்கின்றார்கள், கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! இன்று அங்கீகாரத்துக்காகச் சமர்ப்பிக்கப்பட்டிருப்பது அவசரகாலச் சட்டமே தவிர பயங்கரவாதத் தடைச் சட்டமல்ல! இங்கு கௌரவ உறுப்பினர் ஒருவர், இது பயங்கரவாதத் தடைச் சட்டமென்ற வகையில் உரையாற்றினார். கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, பயங்கரவாதத் தடைச் சட்டம் வரையறுக் கப்படுவது வேறொரு விதத்திலாகும்.

இந்த 'தித்வா' அனர்த்தின்போது, இந்த அவசரகால நிலைமையைப் பிரகடனப்படுத்தி மக்களுக்கு நிவாரணப் பணிகளைச் செய்தபோது, இலங்கையில் இருக்கின்ற அநேகமான அரச ஊழியர்கள் அதற்கு உதவிக்கரம் நீட்டி னார்கள்; தனியார் துறை ஊழியர்களும் தோள்கொடுத்தார்கள். விசேடமாக, கிராம உத்தியோகத்தர்கள், அபிவிருத்தி உத்தியோகத்தர்கள், பிரதேச செயலாளர்கள், மாவட்டச் செயலாளர்கள் உள்ளிட்ட அனைவரும் இதற்குத் தோள் கொடுத்தார்கள். அதனைக் கருத்திற்கொண்டு, அவர்களுக்கு வழங்கப்படுகின்ற ஊதியம் மற்றும் சலுகைகள் போதாதென அவர்கள் முன்வைத்த விடயத்தைக் கவனத்தில் எடுத்து, இரண்டு நாட்களுக்கு முன்னர் அமைச்சரவையில் அவர்களுக்கு மேலும் கொடுப்பனவுகளை அதிகரிப்பதற்கான நடவடிக்கைகள் முன்னெடுக்கப்பட்டிருக்கின்றது. இங்கு கொண்டுவரப்பட்டிருக்கின்ற அவசரகாலச் சட்டமானது, மக்களுக்கு நன்மை பயப்பதாகவும் நிலைமைக்கேற்றதாகவும் இருக்கின்றபொழுது, சிலர் வெவ்வேறு விதமான கருத்துகளை முன்வைக்கின்றார்கள். இந்த அவசரகாலச் சட்டத்தினூடாகக் கடந்தகால ஆட்சியாளர்கள் முன்னெடுத்ததைப்போன்று பாரிய பாதிப்புகள் ஏற்படப்போவதாக இவர்கள் நீலிக் கண்ணீர் வடிப்பது கவலைக்குரிய விடயமாகும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, தோட்டத் தொழிலாளர்களுக்கு வரவு செலவுத் திட்டத்தின்மூலம் அதிகரிக்கப்பட்ட 200 ரூபாய் நாட் சம்பளத்தைத் திறைசேரியினூடாக வழங்குவதற்கு ஏதுவான நடவடிக்கைகளை இந்த அரசாங்கம் எடுத்தபோது, அவ்வாறு வழங்கக்கூடாது என்று அதற்கு இடையூறாக நின்றவர்கள், இன்று தோட்டத் தொழிலாளர்களைப் பற்றி பேசுகின்றார்கள். அன்று தோட்டத் தொழிலாளர்களின் சம்பள விடயத்தை இந்தச் சபையில் ஆளும் கட்சி முன்மொழிந்தபொழுது, எதிர்க்கட்சியைச் சார்ந்தவர்கள் - விசேடமாக கௌரவ சஜித் பிரேமதாஸ அவர்களின் அணியைச் சார்ந்தவர்கள் - எவ்வாறான எதிர்ப்பைத் தெரிவித்தார்கள் என்பது எங்கள் அனைவருக்கும் தெரியும். அதற்குச் சமமானதொரு எதிர்ப்பைத்தான் இந்த அவசரகாலச் சட்ட நீடிப்பின்பொழுதும் இவர்கள் தெரிவிக்கின்றார்கள். 'கொரோனா' பாதிப்பின் பொழுதும், அதேபோல் மத்திய கிழக்கில் கடந்த காலத்தில் யுத்தங்கள் ஏற்பட்டபொழுதும் எங்களுடைய நாட்டில் அவசரகால நிலைமை பிரகடனப்படுத்தப்பட்டது. இன்று எதிர்க்கட்சியில் இருக்கின்றவர்கள் அன்று அதற்கு எவ்விதமான எதிர்ப்பையும் தெரிவிக்கவில்லை என்பதை நான் இந்தச் சபையில் ஞாபகமூட்ட விரும்புகின்றேன்.

அத்தோடு, கடந்த காலத்தில் பாரிய மண்சரிவுகள் ஏற்பட்டதும் எங்கள் அனைவருக்கும் தெரியும். குறிப்பாக பூனாகலை - கபரகல பிரதேசத்தில் பாரிய மண்சரிவு ஏற்பட்டது. அதில் 50க்கும் மேற்பட்ட குடும்பங்கள் வீடுகள் உட்படச் சகலவற்றையும் இழந்து, தேயிலைத் தொழிற் சாலையில் தஞ்சம் புகுந்தார்கள். அவர்களுக்கான வீடமைப்புத் திட்டத்தை இந்த அரசாங்கம் நிறைவுசெய்து வருகின்றது. கடந்த காலங்களில் மலையகத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் பாராளுமன்ற உறுப்பினர்கள் கூறினார்கள், "50 இலட்சம் ரூபாய் பெரும்பான்மைச் சமூகத்துக்கு வழங்கப்படுகின்றது. எங்களுடைய சமூகத்துக்கு ஒன்றும் கிடைக்கவில்லை" என்று. நான் அவர்களுக்குப் பெருமையோடு தெரிவிக்க விரும்புவது, பூனாகலை பிரதேசத்தில் அமைக்கப்பட்டுள்ள வீடமைப்புத் திட்டம் இன்னும் இரண்டு மாதங்களில் மக்களுக்குக் கையளிக்கப்படத் தயாராக இருக்கின்றது என்பதாகும். அந்த வீட்டின் இன்றைய மொத்தப் பெறுமதி 70 இலட்சம் ரூபாயாகக் கணிக்கப்பட்டுள்ளது. இது இலங்கையின்

வரலாற்றில் மலையகத்தைச் சார்ந்த பெருந்தோட்ட சமூகத்துக்கு - மலையக சமூகத்துக்கு - இந்த அரசாங்கம் வழங்கும் அருமையான பரிசாக இருக்கின்றபொழுது, எதிர்க்கட்சியைச் சார்ந்த, தேசியப் பட்டியலூடாகத் தங்களுடைய பிரதிநிதித்துவத்தை இந்தச் சபையில் வைத்துக் கொண்டு 'மலையக ஜாம்பவான்கள்' என்று கூறிக்கொண்டிருக் கின்ற சில காலாவதியான அரசியல்வாதிகள் இவ்வாறான தொரு பிற்போக்குத்தனமான கருத்தை முன்வைப்பது பிழை என்று கூறி, தேசிய மக்கள் சக்தியின் சார்பாக இன்று கொண்டுவரப்பட்டிருக்கின்ற அவசரகாலச் சட்ட நீடிப்புக்கு நாங்கள் மேலும் வலுவூட்டவேண்டும் என்று கேட்டு, எனது உரையை முடிக்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නිලන්ති කොට්ටහච්චි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි නවයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.28]

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම හිතනවා, ඊයේ දවස ශ්‍රී ලාංකීය පුරවැසියන් වශයෙන් අපට ඉතාම අභිමානයක් ගෙන දුන්නු දවසක් විධියට අපේ ඉතිහාස කථාවට ලියැවෙනවා කියලා. එයට හේතුව, මහා රාජ්‍යයන් පැකිළෙන අවස්ථාවලදීත් ජාත්‍යන්තර සම්මුති රැකගෙන, නොබෑඳි ජාතියක් විධියට, රටක් විධියට මානුෂිකත්වය මොකක්ද කියන එක පෙරදිග අපරදිග ලෝකයේ සෑම රටකටම අපි පූර්වාදර්ශයක් වෙමින් පෙන්වීමයි. හැබැයි එහෙම තිබෙද්දී, මේ "ආපදාවේ දේශපාලනය" මොකක්ද කියන එක වෙනුවට "දේශපාලනයේ ආපදාව" ගැන අපට අද පාර්ලිමේන්තුවේ සභා ගැබ තුළ කථා කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මම හිතනවා ඒක එක අතකට හොඳයි කියලා. මොකද, ආණ්ඩු පක්ෂය කරගෙන යන වැඩ පිළිවෙළ මොකක්ද කියන එක සහ විපක්ෂය එය නිර්දය විධියට විවේචනය කරන එක ගැන මේ රටේ ජනතාවට හොඳ අවබෝධයක් ලබා ගන්න පුළුවන් නිසා.

අපි ආණ්ඩුව විධියට මේ රාජ්‍යය ගොඩ නඟන්නේ කොහොමද කියලා කථා කරනකොට, විපක්ෂයේ මාතෘකාව බවට පත්වෙන්නේ මේ රාජ්‍යය ඇදවට්ටන්නේ කොහොමද කියන එක නම්, අපි මේ ආපදා කළමනාකරණය බොහොම ප්‍රශස්ත මට්ටමකින් කරගෙන රට නැවත ස්ථාවර මට්ටමකට අරගෙන එන්න උත්සාහ කරනකොට, රටේ ජන ජීවිත පැවැති තත්ත්වයටවත් රැගෙන එන්න උත්සාහ කරනකොට, ඒ සඳහා සැලසුම් හදනකොට, විපක්ෂය උත්සාහ කරන්නේ එය බිඳ වට්ටන්න නම්, රටේ ජනතාවට අවබෝධයක් ඇති කරගන්න පුළුවන්, විපක්ෂයේ කාර්යභාරය මොකක්ද සහ ආණ්ඩුව මේ වෙලාවේ කරන දේ මොකක්ද කියන එක පිළිබඳව.

මේ හදිසි නීතිය ඇයි අපට අවශ්‍ය වෙන්නේ කියන එක සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව තුළ වාද විවාද කරනකොට, අපි මුලින්ම බලන්න ඕනෑ ඇත්තටම, ඇයි මේ හදිසි නීතිය අපට අවශ්‍ය වෙන්නේ කියන කාරණය. පොදු මහජනතාවගේ ජන ජීවිතයට සුවිශේෂී තර්ජනයක්, ව්‍යසනයක්, අනතුරක් සිද්ධ වෙලා තිබෙනවා නම්, ඒ තර්ජනයට, අනතුරට, ව්‍යසනයට මුහුණ දෙන්නත්, රටේ දෛනික කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යන්නත් මේ රටේ ඇතැම් මූලික අයිතිවාසිකම් සීමා කිරීම සඳහා සාමාන්‍ය නොවන බලතල රජයට ලබා දීමේ අවස්ථාවක් විධියට අපි මේ හදිසි නීතිය හඳුනා ගන්නවා. අපේ රටේ මූලික, උත්තරීතර නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ හදිසි නීතිය සම්බන්ධයෙන් විධිමත් නිර්වචනයක්, අර්ථ නිරූපණයක් කරලා නැති වුණත්, මහජන ආරක්ෂක ආඥාපනතේ මේ හදිසි බලතල අවශ්‍ය වෙන හේතු මොනවාද කියන එක සවිස්තරාත්මකව දක්වා තිබෙනවා. ඒ කොන්දේසි පිළිබඳව විස්තර කළොත්, එහි සැබෑ අරමුණු, නත්‍ය අරමුණු බවට පත් වෙලා තිබෙන්නේ මොකක්ද? ඒ තමයි ජාතික ආරක්ෂාව සහතික කිරීම, මහජන සාමය ස්ථාපිත කිරීම, අත්‍යවශ්‍ය සේවා නඩත්තු කිරීම සහ පවත්වාගෙන යෑම. අන්න ඒ තුන්වෙනි අරමුණ වන අත්‍යවශ්‍ය සේවා නඩත්තු කිරීම සහ පවත්වාගෙන යෑම කියන කාරණාවේදී අපට මේ හදිසි නීතිය තවදුරටත් දීර්ඝ කරගැනීමේ කාලීන අවශ්‍යතාව මොකක්ද කියන එක කථා කරන්න පුළුවන්.

පසුගිය කාල පරිච්ඡේදය තුළ සිදු වුණු ඒ අඳුරු ස්වාභාවික ව්‍යසනයේ ප්‍රචණ්ඩකාරී බලපෑම නිසා අපි මුහුණ දුන්නු විපාකය කොච්චරද කියනවා නම්, කොන්දේසි විරහිතව ජාත්‍යන්තර ප්‍රජාවගේත් සහයෝගය අපට ලැබුණා ඒ තත්ත්වයෙන් ගොඩ ඒම සඳහා. රජයක් විධියට අපි පිළිගන්නවා, රටක් විධියට ආපදා කළමනාකරණය කියන එක අපට අලුත් විෂයයක් කියන එක. අපට සුනාමිය සම්බන්ධයෙන් අත්දැකීමක් තිබුණත්, ආපදා කළමනාකරණය කියන එක සම්බන්ධයෙන් ප්‍රශස්ත අධ්‍යයනයක්, අවබෝධයක් මෙතෙක් අපට තිබුණේ නැහැ. ඒකට හේතු තිබුණා. නමුත්, එයින් ගොඩ එන්න අපි රජයක් විධියට උත්සාහ කරනවා. ඒ සඳහා අත්‍යවශ්‍ය මෙවලමක් විධියට අපි මේ හදිසි නීතිය පාවිච්චි කළා මිසක්, සද්භාවී චේතනාවකින් ආණ්ඩුවක් විධියට අපි ඒක පාවිච්චි කළා මිසක්, අද වෙනතුරු මර්දන අවියක් විධියට අපි ඒක පාවිච්චි කරලා නැහැ. හානිපූරණය කරන්න, ජනතාවගේ ජීවිත ප්‍රතිස්ථාපනය කරන්න - යළි ගොඩනැඟීමේ අරමුණ වෙනුවෙන් - පමණයි අපි හදිසි නීතිය පාවිච්චි කරලා තිබෙන්නේ.

මම කැමැතියි යම් උපුටා ගැනීමක් කරන්න. ඒ, අපේ අතිගරු ජනාධිපතිතුමා 2025 නොවැම්බර් මාසයේ 30වැනි දා ජාතිය අමතා සිදු කරපු විශේෂ ප්‍රකාශයේ උපුටා ගැනීමක්. එහි මෙසේ සඳහන් වෙනවා:

> "......කාර්යක්ෂම සේවයක් ලබා දීම වෙනුවෙන් මේ ආපදා තත්ත්වය කළමනාකරණය කරගනිමින් වේගවත්, කාර්යක්ෂම ව යළි ගොඩ නැංවීමක් සඳහා අවශ්‍ය වන නීතිමය රැකවරණය සහ ප්‍රතිපාදන අවශ්‍යතාවය වෙනුවෙන් අප හදිසි නීතිය පනවා තිබෙනවා. මා මේ රටේ පුරවැසියන්ට එක සහතිකයක් ලබා දෙන්න කැමැතියි. මෙම හදිසි නීතිය මෙම ආපදාව කළමනාකරණයට ලක් කරගැනීම සහ කාර්යක්ෂමව අපේ රට ගොඩනැඟීම සඳහා ඉවහල් කරගන්නවා හැරුණුකොට වෙනත් කිසිදු මර්දනීය ක්‍රියාදාමයක් වෙනුවෙන් මෙම හදිසි නීතිය අපි උපයෝගී කරගන්නේ නැහැ."

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විපක්ෂය වරින්වර උත්සාහ කරනවා, මේ හදිසි නීතිය අපට තවදුරටත් අවශ්‍ය නැහැ කියන එක මේ රටේ මහජනතාවට ඔප්පු කරන්න. ඔවුන් වරින් වර ඒ සඳහා විවිධ තර්ක ගෙන එනවා.

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත මේ තත්ත්වය සමනය කර ගන්න ප්‍රමාණවත් කියන එක, එක් අවස්ථාවකදී ඔවුන්ගේ ස්ථාවරය බවට පත් වුණා. නමුත්, කියන්න කනගාටුයි. ඒ ව්‍යසන කළමනාකරණ පනත අනුව පිහිටුවනවා, ජාතික සභාවක්. ඒ ජාතික සභාව, පනතේ ප්‍රතිපාදන අනුව අවුරුද්දකට 4 වතාවක් රැස්වෙන්න ඕනෑ. එතකොට 2005 ඉඳලා අද වෙනකොට අඩුම ගණනේ අසූ වතාවක්වත් මේ සභාව රැස්වෙලා තිබෙන්න ඕනෑ. ආපදාවක් කළමනාකරණය කරලා ඒකට මුහුණ දෙන්නේ කොහොමද, රට නැවත ගොඩනඟා

[ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය]

ගන්නේ කොහොමද කියන එක සම්බන්ධ සැලැස්මක් තිබෙන්න ඕනෑ. ඒ සැලැස්ම මේ මහ පොළොවේ යථාර්ථයක් කර ගන්න රාජ්‍ය යන්ත්‍රණය ක්‍රියාත්මක කරන්න ඕනෑ කොහොමද, ඒ සඳහා අපි මොන වාගේ නීතිද සම්මත කර ගන්න ඕනෑ කියන එක සම්බන්ධයෙන් කතිකාවක් තිබෙන්න ඕනෑ. හැබැයි, අද වෙනතුරු මේ සභාව රැස්වෙලා තිබෙන්නේ 14 වතාවක් පමණයි. කනගාටුයි. එතකොට අපට පේනවා, මේ ව්‍යසන කළමනාකරණ පනත හරහා ගොඩනඟපු නීතිය කෙතරම් දුරට අපට අවශ්‍යද, නැද්ද කියන එක. එතකොට, මේ වාගේ අභියෝගයකට මුහුණ දීමට අවශ්‍ය ශක්තිමත් ම නීතිය, මේ ව්‍යසන කළමනාකරණ පනත හා සම්බන්ධ නීතිය නොවෙයි.

ඒ සැලැස්ම පිළියෙල කිරීම රජයේ අමාත්‍යාංශවල, දෙපාර්තමේන්තුවල සහ සෑම රාජ්‍ය සංස්ථාවකම කාර්යභාරයක් විධියට පනතින් හඳුන්වා දී තිබුණත්, අපි ඒ නීතියේ තිබෙන දුබලතාව හඳුනාගත් නිසා හදිසි නීති තත්ත්වය තවදුරටත් දීර්ඝ කළා. මහජනතාවට අත්‍යවශ්‍ය සේවා අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා, ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා, ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රමය සාර්ථකව, සුමටව කරගෙන යෑම සඳහා, යළි ගොඩනැඟීම සඳහා, භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සහ බෙදා හැරීමේ ක්‍රියාවලිය කිරීම සඳහා, මහජනතාවගේ ජීවිත, පොදු දේපොළ සහ පරිසරයට සිදුවෙන හානි අවම කර ගැනීම සඳහා, මේ යන්ත්‍රණ ශක්තිමත්ව පවත්වාගෙන යෑම සඳහා හදිසි නීතිය අත්‍යවශ්‍යයි කියන තැන ඉඳලා තමයි අපි කල්පනා කරන්නේ. නමුත් හදිසි නීතිය ගැන කියනකොට විපක්ෂයට මතක් වෙනවා නම්, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය මර්දනය කිරීම සඳහා, භාෂණයේ නිදහස මොට කිරීම සඳහා, කප්පාදු කිරීම සඳහා, ජනතාවගේ අයිතිවාසිකම් මර්දනය කිරීම සඳහා, මාධ්‍ය නිදහස මර්දනය කිරීම සඳහා මේ නීතිය අවියක් විධියට පාවිච්චි කරනවා කියලා, එහෙමත් නැත්නම් උද්ඝෝෂණ සඳහා ජනතාවගේ පෙළ ගැසීම් නැවැත්වීම සඳහා මේ නීතිය පාවිච්චි කරනවා කියලා, ආණ්ඩුව විධියට අපි කියන්න කැමැතියි සුළි කුණාටුවෙන් පස්සේ මේ වනතෙක් මේ නීතිය දීර්ඝ කරලාවත්, එහෙම තත්ත්වයක් ක්‍රියාත්මක කරලාවත් නැහැ කියලා. විපක්ෂයට හදිසි නීතිය කිව්වාම මතක් වෙන්නේ ඒවා වුණාට, මේ නීතියේ තිබෙන හොඳ පැත්ත දකින්න කියලා අපි ඉල්ලීමක් කරනවා. අපි මේක පාවිච්චි කරන්නේ ජනතාවගේ ජීවිත නැවත ගොඩ නැංවීම සඳහා විතරයි. අපි ඒක නැවත නැවතත් විපක්ෂයට අවධාරණය කරන්න කැමැතියි. මේ ආපදාව නිසා බිඳ වැටුණු කර්මාන්තශාලා සහ ව්‍යාපාර විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඍජු සහ වක්‍ර රැකියා විශාල ප්‍රමාණයක් මේ රටේ මිනිස්සුන්ට අහිමිවෙලා තිබෙනවා. ජීවිතය යන්තම් නූලෙන් ගැට ගහගෙන ඉන්න මිනිස්සු තවමත් අවතැන් කඳවුරුවල ඉන්නවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට වෙන් වූ කාලය අවසානයි.

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
මම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඒ මිනිස්සුන්ගේ බිඳ වැටුණු හීන ටික යළි ගොඩනැංවීමේ අරමුණ විතරක් අපට ආණ්ඩුවක් විධියට තිබෙනවා. ආණ්ඩුවට තිබෙන ඒ අරමුණ, සද්භාවීය අරමුණක්. ඒ අරමුණ, ජනාධිපතිතුමා ජාතිය අමතා කළ විශේෂ ප්‍රකාශයේ ඒ සීමාවෙන් ඔබ්බට අරගෙන යන්න මේ ආණ්ඩුව බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපේ එකම, පරම අරමුණ බවට පත් වෙන්නේ, රට නැවත ගොඩනැඟීම පමණයි කියන එක සපථ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.38]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "දිට්වා" සුළි කුණාටුව වෙලාවේ අපි හදිසි නීතිය ගේන්න කියලා රජයට යෝජනා කළේ, අත්‍යවශ්‍ය සේවා ටික නිසියාකාරව ක්‍රියාත්මක කරන්න මිස, සමාජ මාධ්‍ය මර්දනය කරන්න නොවෙයි. ආණ්ඩුවෙන් පුන පුනා කියනවා, සමාජ මාධ්‍ය මර්දනය කරන්නේ නැහැ කියලා. හැබැයි, පෙරේදා, YouTube channel එකක් කරන සෙඩා බ්‍රෝ ගෙනාවා. එහෙම කරන්නේ ඔහු මොන වරදක් කළාටද? මේ කරන්නේ භය කිරීමක්. එක පැත්තකින් කුලී හේවායන් යවනවා, CID එක භය කරන්න. අනෙක් පැත්තෙන් නීතිය අනුව CID එකට එන්න කියලා මර්දනය කරනවා. අපි පැහැදිලිව කියන්න ඕනෑ, අනුර කුමාර ජනාධිපතිතුමා විපක්ෂය පැත්තේ ඉස්සරහ පුටුවේ වාඩිවෙලා හිටපු කාලයේ හැමදාම මේකට විරුද්ධව කථා කළා කියන එක. බලයට ආපු ගමන් Online Safety Bill එක වෙනස් කරනවා කියලා නේ කථා කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ප්‍රමිතියෙන් තොර, බාල ගල් අඟුරු ලංකාවට ගේනකොටම අපි ඒ ගැන කිව්වා. නමුත් ඒක පිළිගත්තේ නැහැ. අපි ආණ්ඩුවේ මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා, මේකේ ඇත්ත තත්ත්වය මොකක්ද කියලා හොයලා බලන්න කියලා. මහජන උපයෝගිතා කොමිසමේ - PUCSL - වාර්තාව අනුව, ආංශික අධීක්ෂණ කාරක සභාව හමුවේදී ඔප්පු වුණා ආපු නැව් 9න්ම මෙගාවොට් 300 නිෂ්පාදනය කරන්න බැහැ කියලා. රුපියල් මිලියන 8,497ක් පාඩුයි. ඒ වාගේම සියයට 11ක් විධියට තිබෙන්න ඕනෑ අළු ප්‍රතිශතය සියයට 22 සිට සියයට 26 දක්වා වැඩි වෙලා තිබෙනවා. අපට ආරංචියි, අද COPE එකේ සමහර සාමාජිකයන් එහේ ගිහිල්ලා තිබෙනවා කියලා. එතුමන්ලාට සිහිබුද්ධියෙන්, සන්සුන් මනසින් ඒක බලන්නට ලැබේවා කියලා අපි ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 11වෙනි නැවේ ගල් අඟුරු පෙරේදා රෑ නොරොච්චෝලේ බලාගාරයට දැම්මා. ඒ plant එකේ mills 5ක් තිබෙනවා. එහි තුන්වෙනි plant එකේ, මෙගාවොට් 300ක් නිෂ්පාදනය කරන්න ඕනෑ එකේ මෙගාවොට් 240ක් නිෂ්පාදනය කරනකොට, ඒ mills 5න් mills 3ක් වැඩ කරන්නේ නැතිව ගියා. ඇයි වැඩ කරන්නේ නැතිව ගියේ? ඇත්ත වශයෙන්ම කියනවා නම්, මේක belt එකේ ඇවිල්ලා grindersවලට ගියාට පස්සේ grindersවලින් කුඩු කරලා තමයි නිෂ්පාදනය සඳහා යවන්නේ. හැබැයි, මේ බාල ගල් අඟුරු කුඩු වෙන්නේ නැතිව කෑලි තමයි වැඩිපුර ප්‍රමාණයක් ආවේ. එතකොට grind වෙන්නේ නැති නිසා ash filter එක වැහුවා. Ash filter එක වහලා diesel filter එක දැම්මා. ඒ නිසා තමයි ගරු හෙක්ටර් අප්පුහාමි මැතිතුමා ඊයේ කියපු විධියට, විශාල දුමාරයක් ඉහළට

ගියේ. මේ නිසා පරිසර හානියක්, මුදල් නාස්තියක් සිද්ධ වනවා වාගේම අවශ්‍ය විදුලිය ජනනය වෙන්නේත් නැහැ. මේවා හොයලා බලන්න. අපි ඉන්නේ ඔයගොල්ලන්ට ආවඩන්න නොවෙයි, මේවා පෙන්වලා දෙන්න. මේකෙදි උෂ්ණත්වය maintain කරන්න diesel filter එක දැම්මාම දුමාරය ඉහළට ගියා.

ඒ විතරක් නොවෙයි. අපට ආරංචි විධියට, පෙරේදා රෑ යම් කිසි ගිනි ගැනීමකුත් සිද්ධ වෙලා ඒක පාලනය කරන්න හැකියාව ලැබිලා තිබෙනවා. දැන් එය යථා තත්ත්වයට පත්වෙලා තිබුණත් තුන්වෙනි බොයිලේරුවේ මෙගාවොට් 210යි නිෂ්පාදනය වෙන්නේ. ඉතුරු දෙකේ මෙගාවොට් 250 ගණනේ නිෂ්පාදනය වෙනවා. මේ ආණ්ඩුවෙන් අඩුපාඩු සිද්ධ වෙනවා නම්, වැරදි වෙනවා නම් ඔබතුමන්ලාට තමයි ඒවා හදාගෙන ඉදිරියට යන්න වගකීම තිබෙන්නේ. මේකෙන් ජනතාවට සිදු වන හානිය තමයි අපි පෙන්වා දෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ කාරණයත් මම කියන්න ඕනෑ. මේවා හදා ගත්තේ නැත්නම් මේ විධියට දිගින් දිගටම නැව් 11න්ම බාල ප්‍රමිතියෙන් යුක්ත ගල් අඟුරුවලින් අවශ්‍ය මෙගාවොට් ප්‍රමාණය ජනනය කරන්න බැරි නම්, අනිවාර්යයෙන්ම විදුලිය කප්පාදුවකට හෝ ඩීසල් මාෆියාවෙන් විදුලිය මිලදී ගැනීමකට යන්න සිද්ධ වනවා. නැව් 9න් රුපියල් මිලියන 8,497ක පාඩුවක් සිද්ධ වුණා නම්, නැව් 25කට කොච්චර කියලා ගණන් හදලා බලන්නකෝ. මේක ජනාධිපතිතුමාවත්, විදුලිබල ඇමතිතුමාවත්, වෙනත් කවුරුවත් ගෙදරින් ගෙනැල්ලා දමන්නේ නැහැ නේ. ඒ වාගේම නැව් 11ම නියමිත දිනට ආවේ නැහැ. අද වනකල් ප්‍රමාද ගාස්තුව හැටියට රුපියලක්වත් දඩයක් ගහලා නැහැ. අපි තමයි කමිටුවේදී කිව්වේ, දඩ ගහන්න කියලා. ඒ මදිවට අප්‍රේල් මාසයේ 22වැනි දාට නැව් 25ම ගෙනෙන්න බැරි නිසා ප්‍රමාද ගාස්තු දඩය ගහන්නේ නැතිව තව කාලයක් reschedule කර දීලා තිබෙනවා, ගල් අඟුරු සමාගමෙන්. කාවද මේ හුරතල් කරන්නේ? මේ හුරතල් කිරීම නිසා නේද 'දූෂණය' කියන සැකය සමාජය තුළ මතු වෙන්නේ? මේවා සමාජ මාධ්‍යවල, Facebook profiles දාලා වහන්න බැහැ. ඒ නිසා මේ තිත්ත ඇත්ත තේරුම් ගන්න. මේ ඉන්න 159දෙනාම හරි නොරොච්චෝලෙට ගිහිල්ලා බලලා ඇත්ත තේරුම් ගන්න. ඇත්ත තේරුම් අරගෙන වරද නිවැරදි කරන්න. වරද නිවැරදි කරලා, පාරිභෝගිකයා මත විදුලි බිල පැටවීම නවත්වන්න කියා ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[1.42 p.m.]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

Hon. Deputy Chairperson of Committees, we meet today to consider the extension of the state of Emergency under the laws of our Republic. Such measure is never appreciated lightly in a democratic society. Emergency provisions exist not as an instrument of control, but as safeguards which enable the State to act decisively in order to maintain stability, protect essential services and ensure the security of our people when circumstances demand preparedness. Today’s discussion must, therefore, be placed within the broader international environment in which Sri Lanka currently operates.

The world, today, is experiencing a period of heightened geopolitical tension, conflicts and confrontations in different regions and has begun to intersect on critical global trade routes and energy corridors. The rapid escalation of hostilities in the Middle East has raised serious concerns about regional stability and international peace and security. In that context, Sri Lanka has already made its position clear. Our Government has called for utmost restraint and immediate de-escalation, urging all concerned parties to refrain from further provocative actions that would widen the conflict and bring severe humanitarian and economic consequences.

Sri Lanka formally believes that diplomacy must prevail over confrontation. Madam, at the heart of these tensions lies a fundamental question about the international system itself, whether the world will continue to be guided by the international law and a rules -based order or whether the stability of regions and sea lanes will increasingly be shaped by confrontation and unilateral action. For countries such as Sri Lanka, the answer to that question is of vital importance.

Sri Lanka is a maritime nation located at the centre of the Indian Ocean. The waters surrounding our Island form part of one of the most important maritime corridors in the world. Nearly, one-third of global maritime trade passes through the broader Indian Ocean Region. Energy shipments from the Middle East to Asia travel through sea lanes that lie closer to Sri Lanka's maritime neighbourhood. Those routes sustain the global economy; they also sustain Sri Lanka's own economy. Any instability affecting those maritime corridors has the potential to influence global shipping costs, insurance rates, fuel prices and supply chains. Madam, for those reasons, Sri Lanka strongly believes that the Indian Ocean must remain governed by the principles of international law. The United Nations Convention on the Law of the Sea provides the legal framework that governs maritime conduct among nations, establishes the rights and responsibilities of States in territorial waters, Exclusive Economic Zones and international waters, protects freedom of navigation, promotes peaceful use of seas and encourages the settlement of disputes through legal and diplomatic mechanisms. In times of geopolitical tension, respect for these rules become even more important. Sri Lanka, therefore, urges all States to act in accordance with international law, respecting the sovereignty of nations and ensuring that maritime regions such as the Indian Ocean remain safe and open for peaceful navigation. Madam, the Indian Ocean should not become an arena for escalation of rivalries between powerful States. These waters must remain corridors for commerce, cooperation and peaceful interaction among nations. The stability of the region is not only important

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

for the countries bordering the Indian Ocean, it is also essential for the stability of the global economy. Sri Lanka, therefore, calls upon all parties involved in regional tensions to exercise the utmost restraint and pursue dialogue and diplomatic engagement as the primary means of resolving disputes. Escalation of tension benefits no one; peace benefits everyone.

Madam, at the time when the international environment is experiencing uncertainty, responsible governance requires vigilance and preparedness at home. The extension of the state of Emergency must be understood in that context. This measure is not directed against the people of Sri Lanka - I repeat, this measure is not directed against the people of Sri Lanka - nor is it intended to limit the democratic freedom guaranteed under our Constitution. I repeat, nor is it intended to limit the democratic freedom guaranteed under our Constitution. Rather, it provides the Government with the legal and administrative framework necessary to ensure that public order, essential services and national stability are safeguarded during a period when global developments may create unexpected challenges. Emergency provisions allow a State to respond quickly to disruptions affecting critical infrastructure, transportation systems, supply chain and public security. They also strengthen coordination between civil authorities and security institutions when rapid responses become necessary. Preparedness is the responsibility of any government that seeks to protect its people.

Madam, in recent months, our nation itself experienced how quickly unexpected events could test our resilience. The devastation caused by Cyclone "Ditwah" affected communities across the parts of the country. Homes were damaged; livelihoods were disrupted and many families faced difficult circumstances. Yet, during that period, we also witnessed the remarkable strength and solidarity of the Sri Lankan people; citizens supported one another. Public institutions worked tirelessly to resolve services. Our armed forces and civil authorities stood beside the people during their most difficult tasks. And also, the international community came forward to help the Sri Lankan people. That spirit of unity remains one of greatest strengths of our nation. Madam, Sri Lanka may be a small nation in the vast landscape of geopolitics. But, the greatness of a nation is not measured by its size; it is measured by humanity. We may be a small nation, but we are a generous nation. When lives are in danger, we respond with compassion. When people seek assistance, we extend our hand. Our people understand that humanity must always prevail over division.

Madam, in a world where tensions, sometimes, overshadow cooperation, we must continue to hold on to the value that unite humanity. As the words “You may say I am a dreamer, but I am not the only one” of a famous song once reminded the world, the dream of peace is not the dream of one nation alone, but it is a shared aspiration of humanity. Sri Lanka will continue to stand on the side of that dream, a dream of a peaceful Indian Ocean, of international law guiding relations among nations and a dream of dialogue replacing confrontation.

Madam, it is precisely to ensure that Sri Lanka remains stable, secure and prepared during this uncertain international environment that the Government has placed before this House the Resolution under the Public Security Ordinance to extend the state of Emergency. This measure is about preparedness, about safeguarding stability and above all, about protecting the security and well-being of our people in Sri Lanka. For those reasons, Madam, I support the extension of the state of Emergency.

Thank you.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අනුරාධ ජයරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.53]

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදයේදී පළමුවෙන්ම සඳහන් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ යෝජනා සම්මතය සභාවට ඉදිරිපත් කිරීමෙන් පසු මුලින්ම කරුණු දැක්වූයේ ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා. හැබැයි එතුමා මේ සම්බන්ධව කිසිම සාධාරණ අවශ්‍යතාවක් මේ සභාවට ඉදිරිපත් කළා කියලා මම විශ්වාස කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. "දිට්වා" සුළි කුණාටුව ඇති වූ අවස්ථාවේදී ජනාධිපතිතුමා හදිසි නීතිය ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ යෝජනාව ගේනකොට කණ්ඩායමක් හැටියට අපිත් එතුමාට යෝජනා කළා, ඒ වෙලාවේදී හදිසි නීතිය ගෙන ඒම හොඳයි කියලා. හැබැයි අද වනකොට නැවත වතාවක් හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳව සාධාරණ ඉල්ලීමක් හෝ අවශ්‍යතාවක් පැන නැඟිලා තිබෙනවා කියලා අපි විශ්වාස කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද ලෝකයේ ඇති වෙලා තිබෙන තත්ත්වයත් එක්ක විවිධ අර්බුදවලට මුහුණ දෙන්න අපටත් සිද්ධ වෙයි. අපට තිබෙන ගෑස්, පෙට්‍රල්, ඩීසල් තොග කළමනාකරණය කර ගැනීම පිළිබඳව යම් ගැටලු ඇති වෙයි. ඒ නිසා මේ වෙලාවේ හදිසි නීතිය තිබෙන එක හොඳයි කියලා ආණ්ඩුව හිතනවා නම් ඒ කාරණා වෙනම කියලා හදිසි නීතිය දික් කර ගැනීමේ හැකියාව හෝ එහෙම නැත්නම් ජනාධිපතිතුමාට දින 30කට හදිසි නීතිය ගැසට් කර ගැනීමේ හැකියාව තිබෙනවා. හැබැයි "දිට්වා" සුළි කුණාටුව කියන ප්‍රශ්නය ඉස්සරහට දාලා මේ විධියට හදිසි නීතිය දීර්ඝ කරගෙන යනවා නම් ඒක රටට හොඳත් නැහැ, ඒ වාගේම රටේ නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව ජනතාවට තිබෙන විශ්වාසයත් නැති වනවා. ඒ නිසා එය හොඳ වාතාවරණයක් නොවෙයි කියන එක විශේෂයෙන්ම මේ වෙලාවේදී මම සිහිපත් කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. දිට්වා" සුළි කුණාටුව නිසා ඇති වූ ව්‍යසනයන්ට පිළියම් යොදන්න නැවත වතාවක් හදිසි

නීතිය දීර්ඝ කරනවා නම්, එහෙම කරලා මේ සම්බන්ධයෙන් මොකක්ද කරන්න බලාපොරොත්තු වන්නේ කියන කාරණාව පිළිබඳව ආණ්ඩුව නැවත වතාවක් සලකා බැලිය යුතුයි.

මම මේ දේවල් කියන්නේ වෙන මොකුත් නිසා නොවෙයි, අද ඇති වෙලා තිබෙන ප්‍රශ්න ටික ගැන හිතලායි. මහනුවර දිස්ත්‍රික්කය ගත්තොත්, මහනුවරින් මාතලේට තවම කෝච්චියක් ධාවනය වන්නේ නැහැ; මාස 3ක් වෙනවා. මහනුවරින් නාවලපිටියට තවම කෝච්චියක් ධාවනය වන්නේ නැහැ, කොළඹට යන කෝච්චියක් ධාවනය වන්නේත් නැහැ. ඒ වෙනුවට බස් ටිකක් දාලා තිබෙනවා. රජය හැටියට ඔබතුමන්ලා මේක සරලව ගන්න එපා. රාජකාරියට යන මිනිස්සුන්ට බස් ටික යොදවා තිබෙනවා. පැණිදෙනිය හන්දියට ගිහිල්ලා බලන්න, කෝච්චිවල ගිය මිනිස්සු කී දාහක් අද බස්වල නැඟ ගන්න එතැන පිරිලා ඉන්නවාද කියලා. සමහර කාරණා පුපුරලා ගිහිල්ලා විනාශ වෙනකම් අපටත් එදා තේරුණේ නැති අවස්ථා තිබුණා. හැබැයි අඩුම ගාණේ ප්‍රවාහන ඇමතිතුමා හෝ නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශයක් කරන්න ඕනෑ, මේ දුම්රිය මාර්ග හදලා ඉවර වෙන්නේ කවදාද කියලා. අද රෝගියෙක් රෝහලකට ගෙන යෑම පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා, අනෙක් පැත්තෙන්, රාජකාරියට යෑම පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. රජය හැටියට බස් ටික දීලා තිබෙන බව ඇත්ත. හැබැයි ඒ වැඩේ හරියටම වෙනවාද, ඒ සියලුදෙනාට බස්වල රාජකාරියට යන්න පුළුවන් වාතාවරණයක් තිබෙනවාද කියලා ඔබතුමන්ලා පොඩ්ඩක් සොයා බලන්න. මම මේ දේවල් කියන්නේ ගම්පොළ ආසනය නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙකු හැටියටයි. මේක සරලව අරගෙන, හදිසි නීතිය දාලා මිනිස්සු එක එක විධියට පාලනය කරගෙන යාවි. හැබැයි, ඒවා නැවත වතාවක් එන්නේ සුනාමි වෙලා. ඒ නිසා ප්‍රශ්න තේරුම් අරගෙන ඒවාට මුහුණ දුන්නොත් ආණ්ඩුවට හොඳයි කියන එක විශේෂයෙන් මේ වෙලාවේ මම සිහිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගම්පොළ නගරය සම්බන්ධව පළමුවෙන්ම ප්‍රකාශ කළේ යට වුණු, ආපදාවලට ලක් වුණු සියලුදෙනාට වන්දි දෙනවා කියලායි. අද තවම ග්‍රාම නිලධාරිවරයෙකු ගිහින් බලපු නැති ව්‍යාපාරික ස්ථාන ගම්පොළ නගරයේ තිබෙනවා. තවම ඇස්තමේන්තු ටික කරන්න පටන් අරගෙනත් නැහැ. පසුගිය දිනවල නොයෙක් ප්‍රශ්න ඇති වුණා. මතක තියාගන්න, විපක්ෂය හැටියට අපි හන්දි ගානේ ගිහිල්ලා උද්ඝෝෂණ කරන්න, ප්‍රශ්න ඇති කරන්න උත්සාහ කළේ නැහැ; අපි එහෙම විපක්ෂයක් නොවෙයි. හැබැයි මේ කාරණා ටික බලන්න. ගම්පොළ වෙළෙඳාම් කළ පිරිසට වන්දි දෙන, එහෙම නැත්නම් ඇස්තමේන්තු හදන ක්‍රමවේදයක් අද වෙනකම් නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හදිසි නීතිය මේවාට පාවිච්චි වනවා නම් අපි විරුද්ධ නැහැ. ඒකයි මම මේ කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මාවතුර ප්‍රදේශයේ නිවාස 17ක් පමණ නාය ගියා, 28ක් මිය ගියා, 6ක් අතුරුදහන් වුණා. එම ප්‍රදේශයේ ජනතාවට තවම ලැබිලා තිබෙන්නේ රුපියල් 25,000ක් විතරයි. උඩුදුම්බර, ගංගොඩ ප්‍රදේශයේ පවුල් 7ක් ජීවත් වුණු නිවාස නාය ගියා, 23ක් මිය ගියා. එම ප්‍රදේශයේ පවුල් 11ක් ජීවත් වූ නිවාසවලට අදාළව තවම NBRO එකේ වාර්තාව ලැබිලා නැහැ. ඒ වාගේම දොළුව, රජතලාව මුළු ගමම නාය ගියා. හැබැයි ඒ ගමේ කිසිම කෙනෙකුට තව වෙනකම් ඉඩම් ටික සොයා දීලා නැහැ. තවම රුපියල් 25,000වත් නොලැබුණු අයත් ඉන්නවා.

හදිසි නීතිය දාගෙන, මිනිස්සු ටික පාලනය කරගෙන යම් කාලයක් යන්න පුළුවන් කියලා ආණ්ඩුව හිතනවා නම් මේ විධියට යම් කාලයක් යන්න පුළුවන් වේවි. හැබැයි මාස 3ක් කියන්නේත් විශාල කාලයක් කියන එක මතක තියාගන්න. හැම දාම මෙහෙම ඉස්සරහට යන්න පුළුවන්කමක් නැහැ. පේරාදෙණියේ කළු පාලම කඩාගෙන ගියා. ඒ සංවර්ධන කටයුතු ගැන මේ පාර්ලිමේන්තුවට පැහැදිලි ප්‍රකාශයක් කරන්න. දුම්රිය මාර්ග යාවත්කාලීන කරලා නැවත වතාවක් දුම්රිය ධාවනය වනවා නම්, ඒවා පිළිබඳව මේ සභාවට කරුණු ඉදිරිපත් කරන්න. රටේ තිබෙන නීති රීති ටික පාවිච්චි කරලා යම් මර්දනයක් කරනවා නම්, ඒ මර්දනයත් එක්ක ආණ්ඩුවකට ඉදිරියට යන්න පුළුවන්කමක් නැහැ; අපි ඒවා ප්‍රායෝගිකව දැක්කා. ඒ නිසා තමයි මම මේවා සභාවට කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නිසා නැවත වතාවක් යම් විධියකින් වෙනත් ආකාරයක ප්‍රශ්නයක් තිබෙනවාද කියන්න අපි දන්නේ නැහැ. මොකද, ඉරානය එක්ක ඇති වෙච්ච ප්‍රශ්නයත් එක්ක අපට තෙල් ටික ලැබෙයිද කියන එක පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. අද ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා කථා කරද්දි පොඩි ඉඟියක් අපට ලැබුණා. එහෙම වෙන්න පුළුවන් කියලා එතුමා කිව්වා. ඒක හරි, ඒක සාධාරණයි, අපි හැමෝටම ඒක තේරෙනවා. ඒක තේරෙනවා නම්, ඒකට අවශ්‍ය විධියට වැඩ පිළිවෙළ හදනවා වෙනුවට, වෙනත් දේවල්වලින් ඒක වහගන්න කටයුතු කරන්න එපා කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.58]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දිනය පුරාවටම මේ හදිසි නීතිය පිළිබඳව කථා කරමින්, හදිසි නීතිය මේ රටේ විපක්ෂය හෝ වෙනත් පාර්ශ්වයක් මර්දනය කිරීම සඳහා පාවිච්චි කිරීමට සූදානම් වන වග, ඒ imagination එක ලබා දුන්නා. අතීතයේ ඒගොල්ලන් ආණ්ඩු බලයේ ඉන්න වෙලාවේ හදිසි නීතිය පාවිච්චි කරමින් කුමක්ද කළේ කියන කාරණාව පිළිබඳව නැවත අපි හැරී බැලුවා නම්, අපට ඉතා පැහැදිලියි, ඒ කාලයේදී ඒ මර්දනයන් තිබුණු බව. එදා මර්දනකාරී වටපිටාවක් තිබුණේ. එදා ඔවුන්ට එරෙහි අය පිළිබඳව කටයුතු කළේ කෙලෙසද කියන කාරණාව අප හැම කෙනාටම පැහැදිලියි.

උදේ වරුවේ ගරු අගමැතිතුමියත් ඉතා පැහැදිලිව සඳහන් කරපු කාරණාව තමයි, පැහැදිලිව අපට වුවමනා වෙලා තිබුණේ මේ හදිසි නීතිය හරහා "දිට්වා" සුළි කුණාටුවෙන් පසුව රටේ ඇති වුණු තත්ත්වය නැවත යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමයි කියන එක. ඒ වාගේම ජනතාව පිළිබඳව, ඔවුන්ගේ ප්‍රශ්න පිළිබඳව සංවේදී නිසා තමයි, කෝච්චි පාරවල් කැඩී තිබෙන අවස්ථාවලදී වෙනත් විකල්ප ක්‍රමවේදයක් හරහා ඔවුන්ට කළ හැක්කේ කුමක්ද කියන කාරණාව මත ඒ සඳහා අවශ්‍ය පියවර රජයක් ලෙස අපි ගනිමින් ඉන්නේ. ඒ නිසා ආර්ථික වශයෙන් බංකොලොත් වෙලා ඒ තත්ත්වයෙන් මිදෙමින්, මේ "දිට්වා" සුළි කුණාටුවෙන් පසුව ඇති වුණු තත්ත්වය තුළ අපි ඒ සඳහා මුහුණ දෙමින් කටයුතු කරන අවස්ථාවක ඒ සඳහා මේ හදිසි නීතිය අපි පාවිච්චි කර තිබෙනවා.

[ගරු මුනීර් මුලාෆර් මහතා]

இந்தச் சந்தர்ப்பத்தில் நாங்கள் அரசியல் பேதங்களை மறந்து செயற்பட வேண்டும். இது அரசியல் இலாபம் தேடுவதற்கான சந்தர்ப்பமல்ல. இன்று உலகில் பூகோள அரசியலை மையப்படுத்தி போர் மேகம் சூழ்ந்துள்ள நிலை காணப்படுகின்றது. இந்த நாட்டின்மீது பற்றுள்ளவராக, அக்கறையுள்ளவராக இருந்தால், கண்டிப்பாக விமர்சனங் களைத் தாண்டி, நாட்டு மக்களை ஒன்றுபடுத்தி, இன்று உலகில் ஏற்பட்டுள்ள போர் சூழ்நிலைக்கு முகங்கொடுக்கக் கூடிய வகையிலான திட்டங்களை நாங்கள் வகுத்துச் செயற்பட வேண்டும். நாம் இந்த யுத்த சூழ்நிலைக்குள் தள்ளப்படாது, இந்த யுத்தம் மிக விரைவாக முடிவடைய வேண்டுமென்ற எதிர்பார்ப்போடு செயற்பட வேண்டிய கால கட்டத்திலே இருக்கின்றோம்.

நான் இந்தச் சந்தர்ப்பத்தில் மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு நன்றி தெரிவிக்கின்றேன். நேற்றைய தினம் இந்தப் பாராளுமன்றத்தில் பல உறுப்பினர்கள் தாக்குதலுக்கு உள்ளான ஈரானின் கப்பல் சம்பந்தமாகப் பல்வேறு கருத்துகளை முன்வைத்தார்கள். குறிப்பாக, இந்த அரசாங்கம் கருணையற்ற அரசாங்கம், இந்த அரசாங்கம் இப் பிரச்சினையை கருணையின்பால் நோக்கவில்லை எனப் பல்வேறு குற்றச்சாட்டுகளை முன்வைத்தார்கள். யுத்தம் மூண்டுள்ள இந்தச் சந்தர்ப்பத்தில் மாண்புமிகு சனாதிபதி அவர்கள், "நாம் நடுநிலைமைக் கொள்கையைப் பின்பற்று வதோடு, மனிதாபிமானம் உள்ளவர்களாகவும் நடந்து கொள்கின்றோம்" என்ற செய்தியை முழு உலகுக்கும் சொல்லியிருக்கிறார்.

கடந்த அரசாங்க காலங்களில் இந்த நாடு உலகளவில் எவ்வாறு அறியப்பட்டது? அயலவர்களுடன் சண்டையிட்டுக் கொள்கின்ற, அயலவர்களுடைய வீடுகளைத் தீயிடுகின்ற நிலைமைதான் இந்த நாட்டில் காணப்பட்டது. கடந்த கால ஆட்சியாளர்கள் இந்த நாட்டில் மேற்கொண்ட பல்வேறு விடயங்களைக் குறிப்பிடலாம். 1983 யூலை கலவரம், திகனவில் இடம்பெற்ற சம்பவம், அளுத்கமையில் இடம்பெற்ற சம்பவம் என்பன உலகுக்குச் சொன்ன செய்தி என்ன? இந்த நாட்டில் இருக்கின்ற ஏனைய இன மக்களோடு ஒற்றுமையாகச் செயற்படாதவர்கள் என்ற செய்திதான் உலகுக்குச் சென்றது. ஆனால், நேற்று மாண்புமிகு சனாதிபதி அவர்கள் மேற்கொண்ட துணிச்சலான நடவடிக்கை காரணமாக இன்று உலகமே எமது நாட்டைப் பாராட்டுகின்ற நிலைமை காணப்படுகின்றது. இந்த நடவடிக்கைமூலம் நாங்கள், இக்கட்டான சூழ்நிலையிலும் மனிதாபிமானத்தை மதிக்கின்ற, மனிதநேயத்தை மதிக்கின்ற, அதன் அடிப்படையில் செயற்படுகின்ற அரசாங்கம் என்ற செய்தியை உலகுக்குச் சொல்லியிருக்கிறோம்.

நேற்று ஒருசில முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் இந்தச் சம்பவத்தை மையமாகவைத்து, "ஆளுங்கட்சியில் இருக்கின்ற உறுப்பினர்களே, நீங்கள் இது சம்பந்தமாகக் கதைக்காவிட்டால் அமைதியாக இருங்கள்! நாங்கள் இது சம்பந்தமாகக் கதைக்கின்றோம்" என்று கூறியிருந்தார்கள். இந்த நாட்டில் எமது சமூகத்தை மையப்படுத்தி, கடந்த அரசாங்க காலத்தில் மேற்கொள்ளப்பட்ட மிக ஈனத்தனமான செயலை - கொரோனா தொற்று காலத்தில் மேற்கொள்ளப் பட்ட நடவடிக்கையை - இவர்கள் சிலநேரம் மறந்திருக்கலாம். எனினும், இது நாங்கள் அனைவரும் அறிந்த விடயமே! அந்தச் சந்தர்ப்பத்தில் அரசாங்கத் தரப்பில் அல்லாது எதிர்த்தரப்பில் இருந்துகொண்டு, அந்த ஈனத்தனமான செயலைச் செய்கின்றவர்களைப் பலப்படுத்திய கட்சிகளைச் சேர்ந்த வர்கள் இன்று இந்த அரசாங்கத்தின் நிலைப்பாடு பற்றி கேள்வி எழுப்புகின்றார்கள். நாங்கள் ஒரு விடயத்தை மிகத் தெளிவாகச் சொல்லிக்கொள்ள விரும்புகின்றோம். இந்த இக்கட்டான சூழ்நிலையில், காலி - கராப்பிட்டிய வைத்திய சாலைக்கு ஈரானிய கடற்படையினரைக் கொண்டு சென்றபோது, இந்த நாட்டிலுள்ள அனைவரும் ஒன்றிணைந்து ஒத்துழைப்பு வழங்கினார்கள். அவர்கள் அனைவருக்கும் எனது மனமார்ந்த நன்றியை இந்தச் சந்தர்ப்பத்தில் தெரிவித்துக் கொள்கின்றேன்.

இத்தகைய இக்கட்டான சந்தர்ப்பங்களை அரசியல் இலாபம் தேடுகின்ற சந்தர்ப்பங்களாக மாற்றி, அதிலும் அரசியல் செய்கின்ற, தமது பிரதேசத்தில் உள்ளவர்களை சந்தோஷப்படுத்துகின்ற வகையிலான கூற்றுகளைச் சொல்கின்ற ஓர் இடமாக இந்தப் பாராளுமன்றத்தைப் பார்க்க வேண்டாமெனக் கேட்டுக் கொள்கின்றேன். ஏனெனில், இன்று எமது நாடு ஓர் இக்கட்டான சூழலுக்குள் தள்ளப்பட்டு இருக்கின்றது. அதுமாத்திரமன்றி, எமது நாட்டைச் சேர்ந்த 10 இலட்சத்துக்கும் அதிகமானவர்கள் தொழில்புரிகின்ற மத்திய கிழக்கு நாடுகள் இன்று ஆபத்தான நிலையில் இருக்கின்றன. அங்கு 10 இலட்சத்துக்கும் அதிகமான இலங்கையர்கள் தொழில்புரிந்தாலும், இன்னும் பல இலட்சம் பேர் அவர்கள் ஊடாக வாழ்க்கை நடத்துகின்றார்கள். எனவே, இந்தப் போர் முகில் அகன்று, சமாதானம் ஏற்பட வேண்டும் என்பதுதான் எல்லோருடைய எதிர்பார்ப்பாகவும் இருக்கின்றது. அதற்காக நாங்கள் முயற்சிக்க வேண்டிய ஒரு தருணமே ஒழிய, ஒருவரையொருவர் குற்றம் சுமத்தி, அதனூடாக அரசியல் இலாபம் தேடுவதற்கான தருணம் இதுவல்ல. யுத்தத்தின் ஊடாக அழிந்த ஒரு பிரதேசத்தில் ஆட்சி கிடைப்பதில் எமக்கு என்ன பிரயோசனம் இருக்கின்றது? எனவே, நாம் பொறுப்புடன் செயற்பட வேண்டிய ஒரு காலகட்டத்தில் இருக்கின்றோம். நேற்றைய தினம் இரவு மேற்கொள்ளப்பட்ட நடவடிக்கை ஊடாக இந்த அரசாங்கம் எதனைச் சாதிக்க விரும்புகின்றது? இந்த அரசாங்கத்தின் நிலைப்பாடு என்ன? என்பதை முழு உலகுக்கும் மிகத் தெளிவாக உணர்த்திக் காட்டியிருக்கிறது.

நான் இந்தச் சந்தர்ப்பத்தில் இன்னொரு விடயத்தையும் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். எமக்கு 30 வருட கால யுத்தத்தின் கோர அனுபவங்கள் இருக்கின்றன. யுத்தம் முடிந்தாலும்கூட, பிரச்சினைகள் முடிவதில்லை. தற்போது ஏற்பட்டுள்ள இந்த யுத்தம் தொடர்பில் அரசாங்கத்தின் நிலைப்பாடு பற்றி பலரும் கேள்வி எழுப்பியிருந்தார்கள். ஒரு நாட்டின் இறையாண்மையை எதிர்த்துச் செயற்பட இன்னொரு நாட்டுக்கு எந்தவோர் அதிகாரமும் கிடையாது. இதனை எமது அரசாங்கத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற பலரும் பல்வேறு சந்தர்ப்பங்களில் குறிப்பிட்டு இருக்கிறார்கள். ஈரான்மீது தொடுக்கப்பட்ட தாக்குதல் பிழையானது, அதேநேரம் மத்திய கிழக்கு நாடுகளில் பொதுமக்களை நோக்கி மேற்கொள்ளப்படுகின்ற தாக்குதல்களும் பிழையானவை என்ற நிலைப்பாட்டையே எமது அரசாங்கம் எடுத்திருக் கின்றது என்பதை நான் இங்கு சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන් ඊයේ මෙම සභාව තුළ සමහර අයගේ අඳෝනාවක් තිබුණා, මේ රටේ මුස්ලිම් ජනතාව විශාල ප්‍රමාණයක් ඉන්නවා, මේ ඇති වී තිබෙන යුදමය තත්ත්වය පිළිබඳව සහ අපේ රටේ ස්ථාවරය පිළිබඳව පැහැදිලි කරන්න ආණ්ඩුවට වගකීමක් තිබෙනවාය කියලා. ඇත්තටම මම මේ කාරණය මතක් කරන්න කැමතියි. මේ

පාර්ලිමේන්තුව තුළ ඒ පිළිබඳව කථා කරන සමහර අයගේ අතීතය හාරවුස්සලා බැලුවා නම්, ඔවුන්ගේ අතීතය දෙස බැලුවා නම් අපට පෙනී යන්නේ මොකක්ද? ඔවුන් අද ජාත්‍යන්තරයේ ඇති වී තිබෙන තත්ත්වය පිළිබඳව අපේ ස්ථාවරය විමසා සිටිනවා. නමුත්, එදා මේ රට තුළ ඒ ප්‍රජාවට කෙනහිලිකම්, තාඩන පීඩන සිද්ධ වනවිට, ඉතාම නින්දිත විධියට විවිධාකාරයෙන් බාධා සහ පීඩා එල්ල වනවිට ඒ පීඩකයන් සමඟ එක්ව ඔවුන්ගේ දෑත් ශක්තිමත් කරමින් ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු කළ අය අද මැද පෙරදිග ඇති වී තිබෙන යුදමය තත්ත්වය පිළිබඳව අපේ ස්ථාවරය විමසා සිටිනවා. ශ්‍රී ලාංකිකයන් වන අපි හැම දෙනා සදාකාලිකව සාමය, සංහිඳියාව පතන අය; ඒ වෙනුවෙන් කටයුතු කරන අය. අපි ඊයේ රාත්‍රියේ ඔප්පු කර පෙන්වූවා, අපි මධ්‍යස්ථයි වාගේම මානුෂීයයි කියන එක. අපි හැම විටම මානුෂීයව කටයුතු කරන්න සූදානම් ආණ්ඩුවක් වග ඒ හරහා ලෝකයටම ඉතා පැහැදිලිව පණිවුඩයක් ලබා දී තිබෙනවා.

මේ මොහොතේදී ලෝකය තුළ ඇති වී තිබෙන තත්ත්වය අනුව සාමාන්‍යයෙන් මේ රටට ආදරය කරන පුරවැසියන් කළ යුත්තේ රජයත් සමඟ එකතු වෙලා මේ අභියෝගය ජය ගන්න වැඩ කටයුතු කිරීමයි. නමුත්, එසේ කටයුතු කළ යුතු මොහොතක එයිනුත් දේශපාලන වාසි ලබා ගනිමින් නැවත නැවතත් මේ රටත්, ලෝකයත් ඉතාම නරක තැනකට තල්ලු කරන්න උත්සාහ දැරීම ඛේදනීයයි. අපි ඒ තත්ත්වයෙන් මිදී, හැම කෙනාම එකට එකතු වෙලා මේ අභියෝගය ජයගෙන සුන්දර ලෝකයක් තනමු කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.10]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අපේ නියෝජ්‍ය ඇමතිතුමාගේ ස්ථාවරය ජනාධිපතිතුමාගේ ස්ථාවරය නොවෙයි. ඔබතුමා ඉරානයට විරුද්ධ ඇමෙරිකානු ප්‍රහාරය හෙළා දකිනවාද, ඊශ්‍රායල ප්‍රහාරය හෙළා දකිනවාද? ඔබතුමා ඒ විරෝධය දැක්වීම, එය හෙළා දැකීම සිද්ධ කරන්නේ නැහැ. ඔබතුමා කිව්වා හරි. අතීතයේ ආරක්ෂාව පිළිබඳව බැලුවාම, ඒ දවස්වල ඇමෙරිකාවට කටින් කපිරි ගහපු උදවිය මේ ඉදිරි පෙළේ ඉන්නවා. එහෙම නේද? ඉදිරි පෙළේ ගොඩක් එහෙම අය ඉන්නවා. ඉදිරි පෙළේ ඉන්නවා, ඒ දවස්වල කටින් ඩ්‍රෝන ගහපු කට්ටිය. ඒවා ඉතින් පෙන්වන්න ඕනෑත් නැහැ, කියන්න ඕනෑත් නැහැ. මොකද, ඒ ගැන සමාජය දන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආණ්ඩු පක්ෂය හොරකම, තක්කඩිකම, බැරිකම වසා ගැනීමට හදිසි නීතිය ආයුධයක් බවට පත් කරගෙන තිබෙනවා කියන කාරණය තමයි මට හැඟෙන්නේ; දැනෙන්නේ; තේරෙන්නේ. මෙතුමන්ලා හදිසි නීතිය දීර්ඝ කරන්නේ මෙතුමන්ලාගේ නොහැකියාවයි, හොරකමයි, තක්කඩිකමයි ඉදිරියට ගෙනියන්නයි. වෙන මොකකටවත් නොවෙයි. අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා හදිසි නීතියට අදාළ යම් චක්‍රලේඛයක් නිකුත් කළා. ඒ කියන්නේ, "දිට්වා" ව්‍යසනය නිසා ආපදාවට පත් ජනතාවට සහන ලබා දීම වෙනුවෙන් අවශ්‍ය සාධනීය වැඩ පිළිවෙළ යෝජනා කරලා, ඒ වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කරලා, කාලසටහන හදාගෙන, ඒ කටයුතු සියයට 99ක් සාර්ථකව ගෙනයන්න අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරගෙන ගැසට් පත්‍ර නිකුත් කරලා ඉවරයි කියලා තමයි ජනාධිපතිවරයා, මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන අගමැතිවරිය සහ ඇමතිවරු කියන්නේ. ඒක බලාත්මකයි, මේ වැඩ පිළිවෙළ ඉවර වෙනකම්. හදිසි නීති රෙගුලාසිය දීර්ඝ කිරීම අවශ්‍යයි, ඒක ඉදිරියට ගෙනයන්න. ඒ හැර, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා පනවපු නීතියක්, එහෙම නැත්නම් ගැසට්ටුවක් මේ නීතිය පැනවූයේ නැත්නම් අවලංගු වෙනවාද? එහෙම නම් කමක් නැහැ, අපි මේක ඉදිරියට ගෙනියමු. ඇයි, ඒ වැඩේ කරන්න එපායැ. එහෙම නොවෙයි නේ, අපේ කිංස් නෙල්සන් මන්ත්‍රීතුමනි. එහෙම නම් අපි මේකට අත ඔසවන්නම්. ඒ කියන්නේ හදිසියේ අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා ගත්ත නියෝගයක්, ගැසට්ටුවක් අවලංගු වෙනවා නම්, අපි මේකට අත ඔසවනවා. එහෙම වෙන්නේ නැහැ නේ.

දැන් ආණ්ඩු පක්ෂය කිව්වා, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයාට වැඩේ කරගෙන යන්න මේක ඕනෑ කියලා. එහෙම කලින් තිබුණා. දැන් එතුමා ඒ තීන්දු තීරණ අරගෙන නේ. අපි නොවෙයි නේ කිව්වේ. ආණ්ඩු පක්ෂයේ අගමැතිතුමිය, ජනාධිපතිතුමා කිව්වා, "අපි මේ වැඩේ කරලා ඉවරයි, කවුරු කෑ ගැහුවත් අපි දෙනවා, අපි අහසින් ගිහිල්ලා දුන්නා වැඩේ" කියලා. මම අහන්නේ, ඒවා අවලංගු වෙනවාද? හදිසි නීතිය ක්‍රියාත්මක කිරීමට මාස තුනෙන් තුනට දීර්ඝ කර ගන්න ඕනෑ. හැබැයි, ඒකෙත් රෙගුලාසිය මොකක්ද කියන කාරණය තවම ආණ්ඩු පක්ෂයේ කවුරුවත් කියලා නැහැ. දැන් මෙතුමන්ලාගේ ආයුධය මොකක්ද? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආයුධය තියාගෙන, ආයුධය පෙන්වලා මංකොල්ල කන්න පුළුවන්. ආයුධය තිබෙන නිසා ලෙහෙසියි. ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමනි, තුවක්කුවක් පෙන්නුවාම, පිස්තෝලයක් පෙන්නුවාම සේප්පුවේ තිබෙන ටික හරි දෙනවා. ඇයි, අරකෙන් තියයි කියලා හයයි නේ.

ඔබතුමන්ලා මේක දීර්ඝ කරගෙන තියාගෙන ඉන්නවා. ගල් අඟුරු වංචාව ගැන කියනවා, මිනිස්සු පාරට බහිනවා, වැඩේ වරදිනවා. නේද? මේක පෙන්වලා, මේක අනුමත කරගෙන, අපි ළඟ බඩු තිබෙනවා කියලා, මේ හොරකම, වංචාව, දූෂණය වසන් කරන්න ඔබතුමන්ලා මේ හදිසි නීතිය දීර්ඝ කර ගන්නේ. ඔබතුමන්ලාට 159දෙනෙක් ඉන්නවා, බලය තිබෙනවා. ඒ නිසා රටට, සමාජයට ඇත්ත කියන්න. ඔබතුමන්ලා බොරු කියපු නිසා, ඔබතුමන්ලා රට රවට්ටපු නිසා, ඔබතුමන්ලාගේ ජන වරම හොර වරමක්, බොරු වරමක් කියලා අද ජනතාව දන්නවා. මොකද, ජන සමාජය ඔබතුමන්ලා කියපු දේවල් අද මාධ්‍යයෙන් එළියට දමනවා නේ. දැන් මුහුණු පොතේ, ඒ වාගේම ජනමාධ්‍යවල, ඒ වාගේම ජනමාධ්‍ය ක්‍රියාකාරින් ඒවා එළියට දමනවා. ඒවා වසන් කරන්න, එයාලට තර්ජනය කරලා භය කරන්න, "බඩු අපි ළඟ තිබෙනවා, අපි දැන් මාස තුනකට මේක දීර්ඝ කර ගත්තා" කියන්න පුළුවන් නේ. ඒ නිසා අර පිස්තෝලය පෙන්වා පෙන්වා මංකොල්ල කනවා වාගේ මේ වැඩ බැරි ආණ්ඩුව, තමන්ගේ නොහැකියාව, හොරකම වසන් කර ගන්න මේ හදිසි නීතිය දීර්ඝ කර ගන්නවා කියන කාරණය තමයි, අපිට විපක්ෂයක් හැටියට රටට කියන්න වෙන්නේ. වෙන දෙයක් නැහැ නේ. අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා ගත්ත තීන්දුවක්, චක්‍රලේඛයක් අහෝසි වෙනවා නම්, අන්න මේ දීර්ඝ කිරීම වලංගුයි. ඒකට අපි අත ඔසවන්නේ නැත්නම්, අපි විපක්ෂයක් හැටියට වැරැදියි. එහෙම නොවෙයි, මේ කරන්න හදන්නේ. ඒ නිසා හැම

[ගරු චමින්ද විජේසිරි මහතා]

ආණ්ඩුවක්ම වරදින කොට, ජනතාව රවටන කොට ජනතාව වීදි බහින කොට, මේක පාවිච්චි කළා. ඇත්ත. දැන් ඔබතුමන්ලා මොකක්ද කරන්න හදන්නේ? එන්න කලින්, වීදියට බහින්න කලින්, ඒ වැඩ පිළිවෙළ නතර කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා පිළිබඳව අපි ලජ්ජා වෙනවා. අපි එම කාරක සභාවේ සාමාජිකයන්. එම කාරක සභාවේ මුලසුන දරන්නා අද අර ගල් අඟුරු වංචාව ගැන කථා කරන්නේ කොහොමද? ඒක හොඳයි, ඒක වැරදි නැහැ, එම ක්‍රියාදාමය නිවැරදිව සිද්ධ වෙනවා කියනවා. මේ මහ පොළොවේ ඒ වැරැද්ද ප්‍රායෝගිකව ඔප්පු වෙලා තිබියදීත්, අද වනවිට නොරොච්චෝලේ බලාගාරය විනාශ වෙලාය කියන කාරණය දැන දැනත් එහෙම කියනවා. ඒ වැරැද්ද ගැන සඳහන් කළාම, අපේ සභානායකතුමා කියනවා කට තිබුණු පළියට කියනවා කියලා. හැබැයි, තනතුරු තිබුණු පළියට හොරකම වසන් කරන්න දෙන්න බැහැ මේ පාර්ලිමේන්තුවේ, ඒ තනතුරු පාවිච්චි කරලා. ඉතිහාසයේ සමහර ආණ්ඩු එහෙම කරපු නිසා ඒවා ගැන කියා ඔයගොල්ලන් බලය අරගත්තා. පසුගිය කාලයේ මහ බැංකු බැඳුම්කර වංචාව සිදු වුණු වෙලාවේදී සමහරු කිව්වා නේ, අරවා දැම්මා; මේවා දැම්මා කියලා. නමුත් අද ලජ්ජා නැතුව

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වසන් කරන්න, ඒක නිවැරදි කරන්න කථා කරනවා. ඒ තනතුරට ඒක ගැළපෙන්නේ නැහැ. ඒ නිසා මම හිතන විධියට පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේ සභාපතිවරයා ඉල්ලා අස් වෙන්න ඕනෑ. එදා මට යන්න බැරි වුණා. මේ කාරණය ඔප්පු වෙනකම්; මේ වැරැද්ද හොයලා ඒක නිවැරදි කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදනකම් ඒක නිවැරදි කරන්න ඒ සභාපතිවරයාට අයිතියක් නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අද වනවිට ජනාධිපතිතුමා හුණ්ඩුවක් ගැන කථා කරනවා. ජනාධිපතිතුමාට මේක මදිද දන්නේත් නැහැ. අපි ඉල්ලා දෙමුද, ඊශ්‍රායලයවත්? නැත්නම් ඇමෙරිකාව. මේක මදි ඇති, එතුමාට. මේක එතුමාට මදි නිසා මේක හුණ්ඩුව වාගේ කියනවා. ඒ නිසා අපි ට්‍රම්ප්ගෙන්වත් අහලා බලමු, අපේ අනුර කුමාර ජනාධිපතිතුමාට මේක මදි නිසා ඒ රට දෙනවාද කියලා. හැබැයි, "දිට්වා" සුළි කුණාටුවෙන් ආපදාවට පත් වුණු අයට අද සහන දෙන්න බැරි වෙලා තිබෙනවා, මේ හුණ්ඩුවේ වැඩ පිළිවෙළ නිසා. අම්මා, තාත්තා වැරදි කරන්න පුළුවන්. හැබැයි, මේ මාතෘ භූමිය

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නිර්මාණය කළා කියන කාරණය සම්බන්ධව අද ඡන්ද දායකයින් කනගාටු වෙනවා. එවැනි හැසිරීමකට ගිය ජනාධිපතිවරයා පිළිබඳව අපිත් කනගාටුව ප්‍රකාශ කරනවා, විපක්ෂය හැටියට.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද රටම දන්නවා, හොරු අල්ලන්න ආපු ආණ්ඩුව මොනවාද කරන්නේ කියලා. හොරා කනවා හැරෙන්න වෙන කාරණයක් නැහැ. හැබැයි, හැමෝටම මඩ ගහන්න, අවලාද කරන්න නම් වැඩ පිළිවෙළ හදා තිබෙනවා. ඒ නිසා මම එදාත් කිව්වා වාගේ, හරි තාත්තාට ජාතක වෙලා තිබෙනවා නම්, හරි අම්මාට ජාතක වෙලා තිබෙනවා නම්, එසේ මඩ ගසා, අවලාද නගා කියාපාන ඒ හොරකම, වංචාව ඔප්පු කරලා පෙන්වන්න ඕනෑ. ඒක තමයි තමුන්නාන්සේලාගේ වගකීම, යුතුකම වන්නේ. ඒ අභියෝගය අපි ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා හැමෝටම චෝදනා කර කර ඉන්නේ නැතුව, ඒ දේ කරන්න. ඔයගොල්ලන්ට ආණ්ඩු බලය තිබෙනවා; ඔයගොල්ලන්ට 159දෙනෙක් ඉන්නවා. එදා ඔයගොල්ලන් විපක්ෂයේ සිටියදී කිව්වා, "අපිට බලය නැහැ. අපිට බලය දුන්නා නම්, පවතින ආණ්ඩුවේ ඉදිරි පෙළ නොවෙයි, පසු පෙළ නොවෙයි, හැම පෙළම හිරේ විලංගුවේ දමන්න කටයුතු කරනවා" කියලා. අද මොකක්ද කරලා තිබෙන්නේ? ඒ හොරු එදා කරපු හොරකම් අද ඔයගොල්ලන් කරනවා. එදා ඒ හොරකම් සම්බන්ධයෙන් සිදු කළ කථා පැත්තක තියලා, ඒ විධියටම, සමහර විට ඊටත් එහා ගිය මහ දැවැන්ත වංචා, දූෂණ අද රට තුළ සිදු කරනවා. ඒ වංචාව, දූෂණය, හොරකම ඉදිරියට ගෙනියන්න මේ හදිසි නීතිය පනවා ගෙන කටයුතු කරනවා කියන කාරණය තමයි මට හැඟෙන්නේ, දැනෙන්නේ ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මට මේ වෙලාව ලබා දීම වෙනුවෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.18]

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද උදෑසන ඉඳලාම පැවැත්වෙන්නේ හදිසි නීතිය දීර්ඝ කර ගැනීමට අදාළ විවාදයයි. මේ විවාදය තුළදී විපක්ෂයේ මන්ත්‍රීවරුන් සිදු කළ කථා තුළින් අපට තේරුම් යනවා, විපක්ෂය දැන් කොටු වෙලා ඉන්නේ කොතැනටද කියන කාරණය. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම එහෙම කියන්න හේතුව මේකයි. මේ අය කියනවා, හොරකම ඉදිරියට ගෙනියන්න ලු, මේ හදිසි නීතිය දීර්ඝ කර ගන්නේ කියලා. ඒක නිසා වෙන්න ඇති, අපේ ආණ්ඩුව බලයට පත් වෙලා මාස 16ක් යනකොට, දූෂණය පිටු දැකලා කටයුතු කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාව දූෂණ සංජානන දර්ශකයේ රටවල් 14ක් අභිභවා ඉස්සරහට ඇවිත් තිබෙනවා කියලා වෙරිටේ රිසර්ච් ආයතනයෙන් වාර්තාව ඉදිරිපත් කර තිබෙන්නේ. අපි විපක්ෂයෙන් අහනවා, දැන් හොරකම ඉස්සරහට ගෙනෙල්ලාද තිබෙන්නේ කියලා. නැහැ. අපි හොරකම පිටුදැකලා, වංචාව පිටුදැකලා ඉතාම නිවැරදි ලෙස රට ඉදිරියට ගෙන යමින් තිබෙනවා.

අද මේ හදිසි නීතිය දීර්ඝ කර ගැනීමේ අවශ්‍යතාව තිබෙන්නේ වෙන මොකක්වත් නිසා නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපි දන්නවා, පසුගිය නොවැම්බර් මාසය අවසානයේ අපේ රට මුහුණ දුන් ආපදාව ගැන; ඒ විනාශය ගැන. අපේ රට ඒ විනාශයෙන් ගොඩ ගැනීම වෙනුවෙන් කරන්න අපට තව ඉතුරු වෙච්ච වැඩ ගණනාවක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වන කොටත් රට ඇතුළේ තැන් තැන්වල සුරක්ෂා මධ්‍යස්ථාන 17ක විපතට පත් වූවන් ඉන්නවා. මේ වනකොට බදුල්ලේ පවුල් 615ක්; පුද්ගලයන් 1,777ක් සුරක්ෂා මධ්‍යස්ථානවල ඉන්නවා. ඒ වාගේම, නුවරඑළියේ ස්ථාන 16ක පවුල් 383ක්; පුද්ගලයන් 1,142ක් ඉන්නවා. ඒ වාගේම,

කෑගල්ලේ සුරක්ෂා මධ්‍යස්ථාන 7ක පවුල් 136ක් ඉන්නවා. මේ විධියට, "දිට්වා" සුළි කුණාටුවෙන් පීඩාවට පත් වෙච්ච ජනතාව තවමත් සුරක්ෂා මධ්‍යස්ථානවල ඉන්නවා.

හදිසි නීතිය දීර්ඝ කර ගන්න අපට ඕනෑකම තිබෙන්නේ ඇයි? මීට පෙර විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන්ගේ සමහර කථාවලදී කියැවුණා, "දිට්වා" ආපදාවට පත් වූවන්ට ඉඩම් සොයා දෙන්න තවම බැරි වෙලා තිබෙනවා කියලා. ඔව්, සමහර කට්ටියට ඉඩම් සොයා දෙන්න බැරි වෙලා තිබෙනවා. අපි ඒ ඉඩම් ටිකත් සොයා දෙන්න ඕනෑ. අපි ඒ වෙනුවෙන් මැදිහත් වෙනවා. ඒ නිසාවෙන්ම තමයි අපට ඕනෑ කරලා තිබෙන්නේ, හදිසි නීතිය දීර්ඝ කරවා ගන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි තවත් කාරණයක් ගැනත් සතුටු වෙනවා. මීට පෙරත් මන්ත්‍රීවරයෙක් මේ ගැන කිව්වා. අපේ ගරු ජනාධිපතිතුමා පසුගිය දිනයක ඇවිල්ලා මේ පාර්ලිමේන්තුවේ කරපු කථාව ඇතුළේ "හුණ්ඩුව" කියලා කියැවුණු වචනය ගැන විපක්ෂයේ බොහෝ දෙනෙක් දැන් තර්ක විතර්ක හදනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි සතුටු වෙනවා, විපක්ෂයේ මේ සියලුදෙනා හුණ්ඩුව ඇතුළට දාලා, හුණ්ඩුවෙන් එළියට එන්න හුණ්ඩුව දේශපාලනයට අල්ලාගෙන තිබීම ගැන. දැන් හුණ්ඩුවට කොටු වෙලා ඉන්න විපක්ෂයට වෙනත් මාතෘකා නැහැ. හොරුන්ට දඬුවම් දෙනකොට අද විපක්ෂයට රිදෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. නීතිය ක්‍රියාත්මක කරන කොට විපක්ෂයේ බොහෝ දෙනෙකුට රිදෙන තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා. සිල්ලර වචන අල්ලාගෙන, සිල්ලර කථා බහ අල්ලාගෙන විපක්ෂය උත්සාහ කරනවා, මේ තිබෙන තත්ත්වය ඇතුළේ ආණ්ඩුවක් හදන්න, ජනාධිපතිකම ගන්න අවස්ථාවක් පාදා ගන්නේ කොහොමද කියලා බලන්න. විපක්ෂය එහෙම හීන දකිනවා. අපි කියනවා, මාස 16ක් යනකොට රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් කරලා වේගවත් ගමනකට අපි ආරම්භයක් තබා තිබෙනවා කියලා.

ලෝකය ඇතුළේ යුධමය වාතාවරණයක් තිබෙන මොහොතකත් රටක් විධියට ගරු ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩුව ඉතා අභිමානවත් ලෙස එයටත් මුහුණ දෙමින් ඉන්නවා. එතැනදී අප නොබැඳි විදේශ ප්‍රතිපත්තිය අනුගමනය කරමින්, දැත් දිගු කරමින් අනෙකාට සහයෝගය දෙන්නේ කොහොමද, අනෙකාගේ ජීවිත ආරක්ෂා කරන්නේ කොහොමද, අනෙකාට රැකවරණය දෙන්නේ කොහොමද කියා රටක් විධියට ලෝකයට මනාව පෙන්වමින් තිබෙනවා. එවන් මොහොතක තමයි අප අද මේ විවාදය පවත්වමින් තිබෙන්නේ.

අපි හිතනවා, මේ තත්ත්වය හමුවේ හදිසි නීතිය දීර්ඝ කර ගැනීමෙන් අප කිසිදු ලෙසකින් හෝ අත්තනෝමතික ලෙස ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය කර නැහැ කියලා. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් දැන් මතු කරමින් කියන්නේ ඒකයි. අපි හදිසි නීතිය පාවිච්චි කරලා ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය කරන්න හදනවා ලු. ගෑස් පෝලිම් එනකොට හදිසි නීතිය පාවිච්චි කරලා ඒවා මර්දනය කරන්න හදනවා ලු. අපි විපක්ෂයට කියනවා, එවැනි අවස්ථා පෙන්වා දෙන්න කියලා. පසුගිය කාලයේ යම් ප්‍රශ්නයක් මතු වෙච්ච වෙලාවේ සමහර තැන්වල ගෑස් පෝලිම් තිබුණා, තෙල් පෝලිම් තිබුණා. හැබැයි හදිසි නීතිය පාවිච්චි කරලා ඒ කිසිදු තැනක ජනතාව මර්දනය කරන්න අපි උත්සාහ කළේ නැහැ. පසුගිය කාලයේ අපි දැක්කා, සමහර ජනතාව තමන්ගේ ප්‍රශ්න අරගෙන පාරට ආපු ආකාරය. ධීවර ජනතාවට යම් ප්‍රශ්නයක් මතු වුණා. ඔවුන් පාරට ආවා. ජනාධිපතිතුමාත්, විෂය භාර ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් ඔවුන් සමඟ සාකච්ඡා කරලා ප්‍රශ්නයට උත්තරය ලබා දීමට මැදිහත් වීමක් කළා. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සංවර්ධන නිලධාරි මහත්ම මහත්මීන්ගේ ප්‍රශ්නයකුත් තිබුණා. ඒ ප්‍රශ්නය වෙනුවෙනුත් ඔවුන් දිගටම සටන් කළා. ඒ කාරණය ගැනත් අපි සාකච්ඡා කළා, මැදිහත්වීමක් කළා. මේ කෑ මොර දෙන විපක්ෂයට අපි කියනවා, අපි හදිසි නීතිය පාවිච්චි කරලා මර්දනය කරපු එක තැනක් හෝ කියන්න කියලා. එහෙම අවස්ථා නැහැ. ඒ නිසා බොරුවට බෙරිහන් දෙන්න එපා කියලා අපි විපක්ෂයට කියනවා.

ජාතික ජන බලවේගය ආණ්ඩුව විධියට අපි ඉතා හොඳ විනයක් සහිතව කටයුතු කරනවා; මූල්‍ය විනය පවත්වා ගනිමින්, මේ රටේ ආර්ථික තත්ත්වය තේරුම් ගනිමින්, මේ රටේ ආර්ථිකය ගොඩ නැඟීම වෙනුවෙන් මනා කළමනාකාරිත්වයකින් යුතුව ඉස්සරහට යමින් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අප ඉතා කල්පනාකාරීව මේ ගමන යනකොට සමහර තැන්වලදී විපක්ෂයේ බොහෝ දෙනා කියන මේ කථාවත් සඳහන් කරන්න මම කැමැතියි. මා කෘෂිකර්ම ක්ෂේත්‍රය නියෝජනය කරන හින්දා ඒ කාරණය මතු කරන්න ඕනෑ කියා මම කල්පනා කළා. අපි දන්නවා, මෙය අපේ රටේ අස්වැන්න නෙළෙමින් තිබෙන මොහොතක් බව. පසුගිය මාස් කන්නයේ ඒ අමාරුකම්වලට මුහුණ දුන්නු ගොවි ජනතාව දැන් රටේ ජනතාව වෙනුවෙන් අස්වැන්න නෙළීමේ කටයුතු ආරම්භ කර තිබෙනවා. සියයට 30ක්, 40ක් අස්වැන්න නෙළලා අවසන් වෙමින් තිබෙන ප්‍රදේශත් තිබෙනවා. එවන් තත්ත්වයක් තුළ විපක්ෂයේ මන්ත්‍රීවරු තවමත් කියනවා, ආණ්ඩුව වී මිල දී ගන්නේ නැහැ කියලා. එහෙම නොවෙයි, වී අලෙවි මණ්ඩලය විධියට, කෘෂිකර්ම අමාත්‍යාංශය විධියට අපි මේ වෙලාවේ අස්වැන්න නෙළන සෑම ස්ථානයකම වී මිල දී ගැනීමට අදාළ මැදිහත්වීම කරමින් ඉන්නවා. නාඩු කිලෝ එකට රුපියල් 120කුත්, සම්බා කිලෝ එකට රුපියල් 130කුත්, කීරි සම්බා කිලෝ එකට රුපියල් 140කුත් ලබා දෙමින් ඒ ගොවි ජනතාව පීඩාවට පත් නොකර, අපි ඒ අවශ්‍ය මැදිහත්වීම කරමින් ඉන්නවා. ඒ නිසා අපි මේ වෙලාවේ ඉතාම විශ්වාසයෙන් යුක්තව ගොවි ජනතාවට කියනවා, ඔබ අඩු මිලට වී ටික දෙන්න ඕනෑ නැහැ, මේ වන කොට පෞද්ගලික වෙළෙඳ පොළේත් වී මිල යම් ප්‍රමාණයකට ඉහළ ගිහින් තිබෙනවා කියලා.

අපි ගොවි ජනතාව රැක ගන්නවා. ගොවි ජනතාව විතරක් නොවෙයි, අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය මේ රටේ ජීවත් වන සෑම පුරවැසියෙකුම සතුටින් ජීවත් වෙන්න ඕනෑ කියන එකයි. ජනතාවට සතුටින් ජීවත් වෙන්න පුළුවන් රටක් නිර්මාණය කරන එක තමයි අපේ අරමුණ. ඒ අරමුණ ඔස්සේ තමයි අප මේ රට ඉදිරියට ගෙන යමින් තිබෙන්නේ. ඒ නිසා අපි මේ වෙලාවේ පණිවුඩයක් දෙනවා. වී අලෙවි මණ්ඩලය හරහාත්, අපේ ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමාගේ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය යටතේ තිබෙන සතොස ආයතනය හරහාත් අවශ්‍ය මැදිහත්වීම කරමින්, ගොවි ජනතාවගේ වී ටික මිල දී ගැනීමට අදාළ කටයුතු කරමින් සිටිනවා. ආණ්ඩුව විධියට අපි, ආපදාවෙන් පීඩාවට පත් වෙච්ච ජනතාවට අවශ්‍ය පහසුකම් ටික සලසමින්, බිඳ වැටිච්ච රට "Rebuilding Sri Lanka" ව්‍යාපෘතිය හරහා ගොඩ නඟමින් තිබෙනවා. නිවාස අහිමි වෙච්ච ජනතාවට නිවාස ටික හදා දීම වෙනුවෙන් විශේෂ මැදිහත්වීමක් කරන්න ඕනෑකම තිබෙනවා. අන්න ඒ වෙනුවෙනුත් අපට මේ හදිසි නීතිය දීර්ඝ කර ගන්න ඕනෑකම තිබෙනවා. ඒ වෙනුවෙන් ඉඩම් අත්පත් කර ගන්න නම්, අවශ්‍ය වෙලාවට ඒ මැදිහත්වීම් ටික කර ගන්න නම්, අන්න ඒකට අපට හදිසි නීතිය දීර්ඝ කර ගැනීම අවශ්‍ය වෙනවා. ඒ වාගේම, අවශ්‍ය සහන ටික ලබා දීම වේගවත් කරන්න නම්, ඒකටත් අපට හදිසි නීතිය දීර්ඝ කර ගැනීම අවශ්‍ය වෙනවා.

ඊයේත් හවස් වරුවේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු අසත්‍ය කිව්වා. අවාසනාවක මහත, බොරුව කියලා ගෙදර යන්න බැහැ නේ. බොරුව කියලා ගෙදර යන්න බැහැ. ගෙදර යන කොට ඒ බොරුව එළි වෙනවා. ඉතින් පව්! ඒ නිසා හැමදාමත් බොරු අස්සේ හැංගෙන්න උත්සාහ කරන විපක්ෂයට, හැමදාමත් මේ

[ගරු සුසන්ත කුමාර නවරත්න මහතා]

රටේ ජනතාවට බොරුවක් කියලා ව්‍යාකූලත්වයට පත් කරලා, ඒක අස්සෙන් තමන්ගේ දේශපාලනය ගොඩ දමා ගන්න උත්සාහ කරන විපක්ෂයට දවසින් දවස ප්‍රබල කනේ පහරවල් ලබා දෙමින් තිබෙනවා, ලෝකයෙන්, රට රටවලින් එන පණිවුඩ හරහා. ලංකාව සම්බන්ධයෙන් දැන් ලෝකයේ රටවල පිළිගැනීමක් තිබෙනවා. ලංකාවේ ජනාධිපතිවරයා සම්බන්ධයෙන් ලෝකයේ බොහෝ රටවල කථා බහට ලක් වෙමින් තිබෙනවා. ඒ තැනටයි අපේ රට පත් වෙමින් තිබෙන්නේ. ඒ නිසා ප්‍රබල කනේ පහරවල් ටිකක් විපක්ෂයේ ඉන්න බොහෝ දෙනාට දවසින් දවස ලබා දෙමින් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
හොඳමයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මේ ඇති වන තත්ත්වය හොඳින් කළමනාකරණය කර ගනිමින්, ආර්ථිකය ගොඩ නඟමින්, අපේ රටේ ජීවත් වන සෑම පුරවැසියෙකුටම සතුටින් ජීවත් වෙන්න පුළුවන් රටක් නිර්මාණය කිරීමේ පැත්තට ඉතාම විශ්වාසයෙන් යුක්තව, වේගවත් ගමනක් අපි ආරම්භ කර තිබෙනවා. ඒ නිසා විපක්ෂයටත් අපි ආරාධනා කරනවා, ඒ වෙනුවෙන් පුළුවන් අවම සහයෝගයක් හෝ දෙන්න කියලා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.25]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

මේ හදිසි නීති විවාදය සම්බන්ධව මම අද උදේ ප්‍රශ්නයක් මතු කරන්න හැදුවා, අපේ ගරු කථානායකතුමාගෙන්. එතුමාට අඩුම තරමේ ඒකට කන් දෙන්නවත් සූදානමක් තිබුණේ නැහැ. පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමියත් මේ අවස්ථාවේ ඉන්න නිසා මම කියන්න ඕනෑ, මේ ගැසට් එකත් එක්ක මේකට අදාළ නියෝග ටිකත් තිබෙන්න ඕනෑ බව. ඒ නියෝග ටික නැහැ මෙහි. මා අහන්නේ, ඒ නියෝග ටික කෝ කියලායි. මේ ගොල්ලන්ගේ මේ වැරැදි වැඩේ හැමදාම කරන්න ඉඩ දෙනවාද, නැද්ද, මොකක්ද කරන්නේ කියලා කල්පනා කරන්න ඕනෑ. මේවා ගැන අහන්න තමයි අපි උදේ නැඟී සිටින්නේ; විහිළු කරන්න නොවෙයි. මේවා ගැන කථානායකවරයාගෙන් අහන්න ගියාම එතුමා පැත්ත පළාතවත් බලන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
හැමදාම තිබෙන්නේ ගැසට් එක තමයි ලු.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, ඒකත් එක්ක ඒ නියෝග ටික අවශ්‍යයි. මෙහි සඳහන්ව තිබෙනවා, රෙගුලාසි පනවා තිබෙන බව. මොකටද ඒ රෙගුලාසි දමන්නේ? කෝ ඒ රෙගුලාසි ටික? ඒකයි අප අහන්නේ. දැන් කථා කරලා වැඩක් නැහැ ඒ ගැන. මේවා ගැන කථා කරන්න යනකොට කථානායකවරයා එතුමා ගැන තිබෙන චෝදනා සම්බන්ධයෙන් කථා කරනවා කියලා හිතලා අපට කථා කරන්න ඉඩ දෙන්නේ නැහැ. මතක තියා ගන්න ඕනෑ ඉතින්, ඔය පුටුවේ තවත් වැඩි කාලයක් ඉන්නේ නැති බව. එතකොට අපට බලා ගන්න පුළුවන්. ඊට පස්සේ අපට කථා කරන්න පුළුවන් වෙයි කියලා විශ්වාස කරනවා.

කුමාර ජයකොඩි ඇමතිතුමාට එරෙහිව අල්ලස් කොමිසම ක්‍රියා කරලා තිබෙන ආකාරය බැලුවාට පස්සේ අපට බොහොම පැහැදිලිව කියන්න තිබෙන දේ මේකයි. නීතියේ ආධිපත්‍යය සැමට සමානයි කියලා මේ රටේ ජනාධිපතිතුමාගේ ඉඳලා උදේ ඉඳන් රෑ වෙනකන් කියනවා. හැබැයි, මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව රනිල් වික්‍රමසිංහ මහත්තයාට මොකක්ද කළේ? එතුමා අරගෙන ගිහිල්ලා, චෝදනා ටික ගොනු කරලා, මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු ඉදිරිපත් කළාට පස්සේ එතුමාට ඇප දෙනවාද, නැද්ද කියලා තීරණය කරලා අත්අඩංගුවට ගත්තා. ඊට පස්සේ තමයි අධිචෝදනා ගොනු කළේ. හැබැයි, දැන් මොකද වෙලා තිබෙන්නේ? කුමාර ජයකොඩි මහත්තයාගේ නඩුව තිබෙනවා. ඒ නඩුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරලා ඇප දීම හෝ නොදීම සම්බන්ධව කටයුතු නතර කරලා -ඒක මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීම පැත්තකින් තියලා- එතුමාට විරුද්ධව අධිචෝදනා ගොනු කරනවා. ඉතින් මොකක්ද මේ නීතිය? රනිල් වික්‍රමසිංහ මහත්තයාට එක නීතියක්, කුමාර ජයකොඩි මහත්තයාට එක නීතියක්. ඒ, එතුමා ඇමති කෙනෙක් නිසාද? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේක සම්පූර්ණ වැරදියි. මේ අධිචෝදනා ගොනු කරන්න කලින් එතුමා මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරලා අත්අඩංගුවට ගන්නවා නම් අත්අඩංගුවට අරගෙන ඉදිරියේ දී අධිචෝදනා ගොනු කරන්න පුළුවන්. හැබැයි, ඒක සිද්ධ වෙන්නේ නැහැ. මේ තමයි නීතිය නැමිලා තිබෙන හැටි. එතකොට කට්ටිය ඔක්කොම නීතියට උඩින් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ අධිචෝදනා ගොනු කරපු අංකයත් මම කියන්නම්. ඒ, HCB 481/2026. BC file number එක, 1059/2015. මේ සම්බන්ධව තමයි අද ආණ්ඩුව කටයුතු කරන්නේ.

අනෙක් එක, දැන් සලේ මැතිතුමාව අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඔහු අත්අඩංගුවට අරගෙන ප්‍රශ්න කළාට අපට කිසි ගැටලුවක් නැහැ. නීතිය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කටයුතු කරන්න. හැබැයි, වෙලා තිබෙන්නේ මේකයි. මාර්තු 4 වෙනකොටත් මේ නඩුව අහනවා, 35822/24 අංකය යටතේ. විනිශ්චයකාරතුමා අහනවා, "මේ පුද්ගලයා සැකකරුවෙක් කරලා තිබෙනවාද, නැද්ද" කියලා. "නැහැ ස්වාමීනි, ඒ ගැන තවම හිතනවා" කියනවා. සැකකරුවෙක් නොවන පුද්ගලයෙක් අරගෙන ඇවිල්ලා හිර භාරයට පත් කරනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 (1) ව්‍යවස්ථාවට අනුව ගත්තොත්, ත්‍රස්තවාදී මර්දනය කිරීම් පනත යටතේ අත්තනෝමතිකව අත්අඩංගුවට ගෙන තිබෙනවා. මේක ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත දැඩි ලෙස උල්ලංඝනය කිරීමක් විධියටයි අපි දකින්නේ. ඒ වාගේම සලේ මහත්තයා බලන්න එන හැම කෙනෙක්ම පොලිස් වාර්තාවක් අරගෙන එන්න ඕනෑ. එයාගේ පුතාට වයස අවුරුදු 21යි. ඒ අවුරුදු 21ක් වන දරුවා පොලිස් වාර්තාවක් අරගෙන එන්න ඕනෑ සලේ

මහත්තයාව බලන්න. මේක පුදුම නීතියක් ලංකාවේ තිබෙන. එතකොට, ඔහු හමුවෙන්න නීතිඥයෙක් එනවා නම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සෘජු අධීක්ෂණය යටතේ එන්න ඕනෑ. ඔහු බලාගෙන ඉන්නකොට කථා කරන්න ඕනෑ. නීතිඥයෙකුට තමන්ගේ සේවාදායකයා වෙනුවෙන් ඕනෑ වෙලාවක කථා කරන්න හැකියාව තිබිය යුතුයි. හැබැයි, ඒ මොනවාවත් නැහැ. ඒ විතරක් නොවෙයි, සාමාන්‍යයෙන් රැඳවුම් නියෝගයකදී පැය 48ක් ඇතුළත අධිකරණයට කරුණු ඉදිරිපත් කරන්න ඕනෑ. ඒක ඉදිරිපත් වෙලාත් නැහැ. මේවා නිසා මේ රටේ නීතිය පිළිබඳ විශාල අර්බුද ගණනාවක් මතු වෙලා තිබෙනවා.

ඊයේ අපේ ආනන්ද විජේපාල මැතිතුමා කිව්වා, ශානි අබේසේකර ඒගොල්ලන්ගේ කිසිදු දේශපාලන ක්‍රියාවලියකට සම්බන්ධ වුණේ නැහැ කියලා. දැන් එතුමා ඉදිරිපත් කරලා තිබෙන affidavit එක මම කියන්නම්. එතුමා සම්බන්ධ වෙලා හිටපු කාරණය පිළිබඳව මෙහි බොහොම පැහැදිලිව තිබෙනවා: "We state that presently we are engaged in active politics and are members of the Retired Collective of the National People's Power political party." මේ party එකේ වැඩ කරනවා කියලා එතුමා දීපු දිවුරුම් පෙත්සමයි මම මේ ඉදිරිපත් කළේ. දැන් මේ ඇමති කියන්නේ මොනවාද? එතුමාම ඉදිරිපත් කරලා තිබෙන දිවුරුම් පෙත්සමේ සඳහන් කර තිබෙනවා දේශපාලන පක්ෂයකට පක්ෂව දේශපාලනය කරනවා කියලා. වැඩක් නැහැ ඉතින් ඒගොල්ලන් ගැන කථා කරලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට විනාඩියක කාලයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අනෙක් කාරණය මෙයයි. අනුර දිසානායක මැතිතුමා ජනාධිපති වෙන්න කලින් බොහොම පැහැදිලිව කිව්වා, ACSA හා SOFA කියන ගිවිසුම් ඔක්කෝම අයින් කරනවා කියලා. මම සුනිල් වටගල මැතිතුමාගෙන් අහන්න කැමතියි, මාර්තු 2වෙනි දා ඉඳලා American survival aircraft දෙකක් ශ්‍රී ලංකා වෙරළ තීරයේ, නැත්නම් භූමියේ කටයුතු කරලා තිබෙනවාද කියලා. කරුණාකරලා මේකට උත්තරයක් දෙන්න. ඒවා අහෝසි කරනවා කියලා ආපු කට්ටිය අද ඇමෙරිකන් ගිවිසුම ඊට වඩා හොඳට ක්‍රියාත්මක කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි. කාලය අවසන්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
තමුන්නාන්සේලා පාරවල් දිගේ කෑගැහුවා, ඇමෙරිකන් ගිවිසුම අහෝසි කරනවා කියලා. මම අහන්න කැමැතියි මෙතැනදී ගන්න පියවර මොකක්ද කියලා. මේ කාරණයට අපට උත්තර දෙන්න. American survival aircraft දෙකක් මාර්තු 02වැනි දා ඉඳලා ලංකාවේ නිරීක්ෂණ කටයුතුවල යෙදිලා ඉඳලා තිබෙනවා. එතැනින් පස්සේ තමයි මේ පහර දීම සිදු වෙලා තිබෙන්නේ. ඒ කාරණයත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමා.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු කාදර් මස්තාන් මහතා.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நாங்கள் இந்த நேரத்தில் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களுக்கு நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றோம். ஏனெனில், ஏகாதிபத்திய யுத்த வெறி பிடித்தவர்கள் பயமுறுத்தினாலும், அதற்குப் பயப்படாமல் நல்லதொரு தீர்மானத்தை எடுத்து, ஈரானிய கப்பலில் இருந்த 208 பேருடைய உயிரையும் பாதுகாத்து இருக்கிறார். நாங்கள் சர்வதேச சட்டத்தின் அடிப்படையில் மனிதாபிமான நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமே தவிர, யாருக்கும் பயப்படத் தேவையில்லை என்பதை சனாதிபதி அவர்கள் நிரூபித்திருக்கிறார். அதற்காக அவருக்கு மீண்டும் இந்த இடத்தில் நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றோம்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 2.36]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම මම ස්තුතිවන්ත වෙනවා, විපක්ෂයේ වුණත් ගරු කාදර් මස්තාන් මන්ත්‍රීතුමාට ඇත්ත දැනගෙන, ඇත්ත කථා කරන්න ධෛර්යයක් තිබීම හා එය අගය කිරීම ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදය හදිසි නීතිය ගැන වුණත් උදේ ඉඳන් හදිසි නීතිය ගැන වාගේම, යුද විශ්ලේෂණ, සබ්මැරීන්, ටෝපිඩෝ, යුද යාත්‍රා ගැන විශාල සාකච්ඡාවක් ඇති වුණා. ඊයේ රාත්‍රිය වෙද්දී මුළු ලෝකයේම අවධානය අපේ ලංකාව පැත්තට යොමු වුණා රජයේ මැදිහත්වීම ඇතුළුව මේ ක්‍රියාවලිය නිසා. එහි තිබෙන දේශපාලනය ගැන අදහස් කිහිපයක් දැක්වීමට මම බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සිදුවීම් මාලාව ගත්තාට පස්සේ පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව ශ්‍රී ලාංකිකයන් විධියට ආඩම්බර විය හැකි, ශ්‍රී ලාංකිකයන් විධියට ජාත්‍යන්තර ඉදිරියේ ආඩම්බර විය හැකි ආකාරයේ මානුෂීය මැදිහත්වීමක් කරන්න මේ ව්‍යසන ඔක්කෝම මැද්දේ ලංකාවේ ජනාධිපතිතුමා ප්‍රමුඛ රජය කටයුතු කළා.

මැද පෙරදිග කලාපයේ මෑත කාලයේ අපි දැකපු විශාල යුද්ධයක් ඇවිලිලා තිබෙන මොහොතක, රටවල් එකිනෙකා හා යුද වැදී තිබෙන මොහොතක එහි පාර්ශ්වකරුවෙකු වෙන්නේ නැතුව neutrality එක තියාගන්නා ගමන්ම ඒ කටයුතු සිදු කර තිබෙනවා. රටක්, රාජ්‍යයක් විධියට තිබෙන මානුෂීය මැදිහත්වීම බලාපොරොත්තු වුණාට වඩා හොඳට කරන්න පුළුවන් වෙච්ච, සමත් වෙච්ච රාජ්‍යයක් විධියට තමයි අද ලෝකයේ අපි ස්ථානගත වෙලා තිබෙන්නේ. ඒ ගැන අපි සියලු දෙනා ආඩම්බර වෙන්න ඕනෑ. අපට ආසන්න මුහුදු කලාපයට ඇවිල්ලා එක් නෞකාවක් ප්‍රහාරයකට ලක් වුණා. ලංකාවේ නාවික හමුදාවේ, ගුවන් හමුදාවේ පිරිස් වහාම මැදිහත් වෙලා ඔවුන්ගේ ජීවිත පරදුවට තියලා ඒ පිරිස බේරා ගෙන රෝහල්වලට ගෙන එන්න කටයුතු කළා. ජීවිත 32ක් ගලවා ගත්තා. ගාල්ලේ ජනතාව සහ රජය මැදිහත් වෙලා ඒ අසරණ වෙච්ච ඉරාන ජාතිකයන්ට ඒ අදාළ උදව්-උපකාර කරන්න මැදිහත් වුණා.

විශේෂයෙන් ඒ මළ සිරුරු විශාල සංඛ්‍යාවක් අරගෙන එන්න සිදු වෙච්ච වෙලාවක ඔවුන්ගේ ආගමික වතාවත් අනුව ඒ කටයුතු කරන්න අදාළ පහසුකම් සැපයුවා. ඒ වාගේම freezers සැපයුවා. කෑම-බීම, ඇඳුම්-පැළඳුම් රජයෙන් වාගේම මේ රටේ සාමාන්‍ය ජනතාවත් මැදිහත් වෙලා ලබා දුන්නා. අපේ ජනතාව මොන වාගේ ජාතියක්ද කියලා පෙන්වන්න මැදිහත් වෙලා තිබෙනවා. මම හිතන විධියට ඒක අපට ජාත්‍යන්තරය ඉස්සරහා කොන්ද කෙළින් තියාගෙන ආඩම්බර වෙන්න පුළුවන් ක්‍රියාවක්. ඊයේ රාත්‍රිය වන කොට තවත් නෞකාවක් ගැන ජනාධිපතිතුමා විශේෂ ප්‍රකාශයක් කළා. ජාත්‍යන්තර සම්මුති සහ එකඟතා අනුව ඉවසීමෙන්, නිසියාකාරව සහ කඩිනමින් කටයුතු කරලා ඒ නෞකාවේ කාර්ය මණ්ඩලයේ අය මුදා ගැනීමට ලංකා රජය සමත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ප්‍රශ්න ඇති කරන්න නොවෙයි ප්‍රශ්න විසඳන්න මැදිහත් වන ආණ්ඩුවක් - රජයක් - අපට තිබෙනවා කියන එක අපි ලෝකයට පෙන්වමින් ඉන්නවා. ශ්‍රී ලාංකිකයින් කියන්නේ ප්‍රශ්න ඇති කරන්න නොවෙයි, ප්‍රශ්න විසඳන්න මැදිහත් වන ජාතියක් කියන පණිවුඩය ලබා දීම තමයි මෙහි තිබෙන වැදගත්කම. අනෙක් පැත්තෙන්, පසුගිය කාලයක් තිස්සේ පැවැති ආණ්ඩුවල ක්‍රියාකාරිත්වය තුළ, ජාතිවාදී ගැටුම් ඇවිලවීම තුළ - ඒ සියල්ල තුළ - ලංකාවේ reputation එක, ලංකාවේ නම, ශ්‍රී ලාංකිකයින් කියන නම විදේශ රටවල කියැවුණේ, විදේශ පුවත් ඒජන්සිවල කියැවුණේ කොහොමද කියලා අපි දන්නවා. 1983 කළු ජූලිය නිසා වෙන්න පුළුවන්, ඊට පසුව ආණ්ඩුවේ අනුග්‍රහයෙන් ඇති වෙච්ච ජාතිවාදී ගැටුම් නිසා වෙන්න පුළුවන්, අපට මතක කාලයේ දිගන, බේරුවල, ගම්පොල ප්‍රදේශවල මුස්ලිම් ජාතිකයන්ට විරුද්ධව ඇති කරපු ගැටුම්, ඝාතන නිසා වෙන්න පුළුවන්, තමන්ගේ අසල්වාසීන් ඝාතනය කරන, ඝාතනය වන රාජ්‍යයක් ලෙස තමයි මේ රට හංවඩු ගහලා තිබුණේ. හැබැයි, මේ තරම් ව්‍යසනයක් මැද වුණත්, කවර ජාතියකට, කවර දේශයකට අයත් වුණත්, පැත්තක් ගන්නේ නැතිව මිනිස්සු විධියට දිවි පරදුවට තබා කරන්න ඕනෑ මැදිහත් වීම අපි කරනවා කියලා අද අපි ලෝකයට පෙන්වා තිබෙනවා. රටේ නායකයා සහ රාජ්‍යය පාලනය කරන ආණ්ඩුව විධියට ඒ පියවර අරගෙන, රටේ කීර්තිනාමය ඉහළට ඔසවන්න පුළුවන් මැදිහත්වීම අපි කර තිබෙනවා. ඒ ගැන අපි සතුටු වෙනවා.

අපි මේ කටයුතු ටික කරන අතරේ විපක්ෂය මොකක්ද කළේ? රටක්, රාජ්‍යයක් පාලනය කරනවා කියන එක ආණ්ඩුවකට විතරක් තිබෙන වගකීමක් නොවෙයි කියන එක අපි දන්නවා. ඒක විපක්ෂයටත් අදාළයි. හැබැයි ජාත්‍යන්තර නීතියට, ජාත්‍යන්තර සම්මුතීන්වලට, ජාත්‍යන්තර එකඟතාවලට අනුකූලව තමයි ආණ්ඩුවක් කටයුතු කරන්න ඕනෑ. ආණ්ඩුවකට හිතෙන හිතෙන විධියට කටයුතු කරන්න බැහැ. හිතෙන හිතෙන වෙලාවට නැව් රට තුළට ගන්න, හිතෙන හිතෙන වෙලාවට නැව් යවන්න, ටෝපිඩෝවේ වර්ගය හොයන්න යන්න ආණ්ඩුවකට බැහැ. ජාත්‍යන්තර සම්මුතීන්වලට අපි බැඳිලා ඉන්නවා. ජාත්‍යන්තර යුද්ධයක් මැද තමන්ට හිතෙන හිතෙන දේවල්, හිතෙන හිතෙන වෙලාවට කරන්න මේක පොඩි ළමයින්ගේ සෙල්ලමක් නොවෙයි. අපි මිලියන 22ක ජනතාවගේ ඉරණමත් එක්ක මේ කථා කරන්නේ. මිලියන 22ක ජනතාවගේ වගකීම ඔළුවට ගත් ආණ්ඩුවක් විධියට අපි පෙනී ඉන්නවා.

විපක්ෂයේ මහත්වරුන්ට මේක නිකම් ක්‍රීඩාවක් වෙන්න පුළුවන්. නමුත්, ආණ්ඩුව විධියට මේ රටේ ජනතාව ගැන වග කියන්න ඕනෑ. ජාත්‍යන්තර එකඟතා සහ සම්මුතීන්වලට අනුකූලව ඉවසීමෙන්, මිනිස්සු විධියට සියලු මිනිස්සුන්ට වග කියමින්, කඩිනමින් අපි ඒ ක්‍රියාමාර්ග ගනිමින් සිටිනවා. ඒ අතර විපක්ෂය මොකක්ද කළේ?

ඇත්තටම ජාත්‍යන්තර කේලම්කාරයෝ බිහි වෙන්නේ ඔය පැත්තෙන්. පසුගිය දවස් දෙක ගත්තාම, ජාත්‍යන්තර කේලම්කාරයෝ බිහි වුණා. ජාත්‍යන්තර බොරු කිව්වා; ජාත්‍යන්තර කේලාම් කිව්වා. අර නැව පැය 11ක් මුහුදේ තිබුණාය කිව්වා. මුජිබුර් මන්ත්‍රීතුමා කිව්වා මම දැක්කා, ඒ නැව පැය 11ක් මුහුදේ තිබුණා, අරගෙන් ඇවිල්ලා ගැහුවා කියලා සබ්මැරීනය ආපු පාරත් කිව්වා. එහෙම හිතෙන හිතෙන වෙලාවට නැව් රට තුළට ගන්න බැහැ. යුද්ධයක් තිබෙන වෙලාවක තමයි මේ කථා කරන්නේ. එතකොට අදාළ පාර්ශ්ව එක්ක කථා කරලා, අදාළ

සම්මුතීන්, එකඟතා අනුව තමයි රටක් ක්‍රියා කරන්නේ. එහෙම නොකර ඊට පසුව වෙන දේවල්වලට වග කියන්නේ කවුද? අපි අද රාජ්‍යයක් විධියට අපට පුළුවන් ආකාරයට උපරිමයෙන් මැදිහත් වෙලා ඒ පිරිසත් ගලවාගෙන, ලංකාව අනතුරට හෙළන්නේත් නැතිව කටයුතු කරන්න සමත් වෙලා තිබෙනවා.

අපේ නාවික හමුදාව ඇතුළු පිරිස ඊයේ දවසේත් තමන්ගේ ජීවිත පරදුවට තබා අර සාගරයේ සිටි පිරිස ගලවාගන්න අතරේ, අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා මාධ්‍ය සාකච්ඡාවක් පවත්වා "ළමයින් 300ක් ඉන්නවා, ආණ්ඩුව ඒ අයව බේරාගන්නේ නැද්ද, මේක කරන්නකෝ" වාගේ කථා කිව්වා මම දැක්කා. මේගොල්ලන් හිතුවේ නැහැ, අපි ඒක කරයි කියලා. මේගොල්ලන් හිතුවේ නැහැ, ආණ්ඩුව ඒක කරයි කියලා. එහෙම හිතන්නේ නැතිව, "ළමයින් 300ක් ඉන්නවා, මාර ප්‍රශ්නයක් වෙන්නේ, ඒ ගැන සංවේදී නැද්ද?" වාගේ කථා කිය කියා, බොරු කිය කියා ඇවිදින්න පටන්ගත්තා. හැබැයි, ඇත්තටම වෙන්න ඕනෑ දේ දැන් අපි කරලා නේ තිබෙන්නේ. දැන් හැමෝම පිළිගන්නවා, වෙන්න ඕනෑ දේ කරලා තිබෙන්නේ කියන එක. ළමයින් 300ක් නොවෙයි, ඒ නැවේ හිටපු 208ක පිරිස අපි මුදාගෙන තිබෙනවා. ළමයින් 300ක් කියලා කිව්වේ අමු බොරුවක්. ඒ වෙලාවේ ඒ කාරණය පිළිබඳව මිනිස්සු සංවේදී කරමින්, ඒකට ආණ්ඩුව මැදිහත් වෙන්නේ නැතිවෙයි කියලා හිතලා තමයි ඊළඟ සැලසුම හැදුවේ. එහෙම තත්ත්වයක තමයි ඒ අය කටයුතු කළේ. ඒ ඔක්කොම කරන ගමන්, අනෙක් පැත්තෙන් අදත් ඇවිල්ලා සබ්මැරීනයේ වර්ගය මොකක්ද කියලා අහනවා. සබ්මැරීනයේ වර්ගය මොකක්ද, ටෝපිඩෝවේ වර්ගය මොකක්ද කියලා අහනවා. මොකටද? සබ්මැරීනයේ වර්ගය නොවෙයි, අපි ඔවුන් බේරා ගනිද්දී ගිලෙන නැවේ සිටි මිනිස්සුන්ගේ වර්ගයවත් හෙව්වේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මනුෂ්‍ය වර්ගයාට අයිති, ඕනෑම ජාතියකට අයිති මිනිස්සුන්ට අපි ඒ මැදිහත්වීම කරන රටක් බව අපි පෙන්නුවා.

මේ රාජ්‍යය අද වෙනකොට ගිලෙන නැවේ හිටපු මිනිස්සුන්ගේ වර්ගය, ජාතිය හොයන්නේ නැතිව මැදිහත් වෙච්ච රාජ්‍යයක්. එතකොට සබ්මැරීනයේ, ටෝපිඩෝවේ වර්ගය හොයන්නේ මොකටද? මේගොල්ලන් මොකක්ද මේ කියන්නේ, මොකක්ද මේ කරන සෙල්ලම කියලා මට තේරෙන්නේ නැහැ. අඩුම තරමින් ජාත්‍යන්තරව සංවේදී මේ වාගේ කාරණයකදීවත් වගකීම් සහගතව කටයුතු කරන්න කියලා අපි විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා. ඊට පස්සේ අහනවා, ගහනකල් දන්නේ නැද්ද කියලා. පසුගිය දවස්වල ආපු යුද්ධයේ ස්වභාවය හිතන්නකෝ. ගහනකොට දන්නවා නම් ඉරානයේ නායකයන් අද ජීවතුන් අතර ඉන්නවා නේ. ගහනකල් නොවෙයි, වෙනිසියුලාවේ නායකයාව - ජනාධිපතිතුමාව - උඩින් ඇවිල්ලා අරගෙන යනකල් දන්නෙත් නැහැ. ජාත්‍යන්තර දේශපාලනය තිබෙන්නේ ඒ ආකාරයෙන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කාලය තව විනාඩි දෙකකින් වැඩි කරනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ජාත්‍යන්තර දේශපාලනය තිබෙන්නේ එතැන. ලංකාව දැවැන්ත රාජ්‍යයක් නොවෙයි. ලංකාව ඉන්දියන් සාගරයේ තිබෙන පොඩි දූපතක්. අපේ නාවුක බලය, අපේ යුද බලය ගත්තාම යම් සීමාසහිත බලයක් තිබෙන්නේ. ඒක ඇත්ත. එතකොට ඉරාන නැවකට ඇමෙරිකාව පහරදෙන එක අපි දන්නේ නැද්ද කියලා මෙතැනට ඇවිල්ලා බෙල්ලෙන් අල්ලාගෙන මේ ආණ්ඩුවෙන් ප්‍රශ්න කරන එක මොන විකාරයක්ද කියන්නකෝ. ඕක තමයි තිබෙන තත්ත්වය. ඇත්තටම ජාත්‍යන්තරව සංවේදී කාරණා සම්බන්ධයෙන් කරන මේ ළමා හැසිරීම නවත්වා ගන්න ඕනෑ. හැබැයි, ඉරාන නැවට ඇමෙරිකාවෙන් ගහනකල් අපි දන්නේ නැද්ද කියලා දැන් අපෙන් අහන්නේ කවුද? එදා, පාස්කු ඉරිදා දිනයේ ලංකාව ඇතුළේ බෝම්බ පුපුරවලා යනකල් දන්නේ නැතිව හිටපු, ඒ කාලයේ ආණ්ඩු කරපු කට්ටිය. *[බාධා කිරීමක්]* ඔව්, පහර දෙනවා කියලා දන්නේ නැතිව හිටියා විතරක් නොවෙයි. ගැහුවාට පස්සේ ඇවිල්ලා කිව්වේ මොකක්ද? ඒකත් හිනා වෙවී කිව්වේ. "ගහනවා කියලා දැනගෙන සිටියා; ඔහොම ගහයි කියලා දැනගෙන සිටියේ නැහැ" කියලා කිව්වා. එහෙම කියපු කට්ටිය තමයි දැන් මේ කථා කරන්නේ. ඒ නිසා ලංකාව ඇතුළේ, තමන්ගේ ආණ්ඩු කාලයේ මේ ආකාරයේ සංහාරයක්, ප්‍රහාරයක් වෙනකල් ඒ ගැන මොකක්වත් කරන්න බැරි වෙච්ච, ආරක්ෂක මණ්ඩලයවත් රැස් කරන්න බැරි වෙච්ච මිනිස්සු දැන් අපෙන් අහනවා, "ඉරාන නැවට ගහනකල් දන්නේ නැද්ද?" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේගොල්ලන්ට හැමදාම වාගේ අපට මේ ගැන විහිළු කර කර ඉන්න පුළුවන්. නමුත්, මේක ජාත්‍යන්තරව සංවේදී කාරණයක්. උදාහරණයක් හැටියට, අද අපේ පාර්ලිමේන්තුව ජාත්‍යන්තර අවධානයට යොමු වෙච්ච දවසක්. එතකොට මේ රටේ ආණ්ඩුව තමන්ගේ මට්ටම සහ මේ රටේ රාජ්‍යයේ මට්ටම සලකුණු කරලා - mark කරලා- තිබෙනවා. අඩුම තරමින් රාජ්‍යයේ නම්බුව ගැන හිතලාවත් විපක්ෂය මේ රටේ තමන්ගේ මට්ටම - රටේ විපක්ෂය නේ - සලකුණු කරන්න ඕනෑ කියලා අපි හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. මේ ඉරාන නැවට ගහනවාද කියලා දන්නේ නැද්ද කියලා ඇහුවා. ඇත්තටම ගහනවාද කියලා දන්නේ නැහැ. දැනගෙන ඉන්න ඕනෑ නැහැ. හේතුව තමයි, මේකට ගහන්නේ නැහැ කියලා හිතාගෙන නේ අපි හැමෝම ඉන්නේ. ඉන්දියන් සාගරය තුළ යුද ප්‍රහාර වෙන්නේ නැහැ කියන එකඟතාව සහ දැනුම තමයි අපි හැමෝටම තිබෙන්නේ. 1971දී එවකට ශ්‍රී ලංකා රජයත්, ඒ වාගේම ටැන්සානියාවේ රජයත් මැදිහත් වෙලා එක්සත් ජාතීන්ගේ සංවිධානයේදී අපි සම්මත කර ගත්තා, ඉන්දියන් සාගරය සාම කලාපයක් කියලා. ඒ Convention එක ඇතුළේ තමයි අපි තවම ඉන්නේ. එතකොට, එදායින් පස්සේ ගත වෙච්ච අවුරුදු 50 ඇතුළත මේ වාගේ ප්‍රහාරයක් සිද්ධ වෙලා නැහැ. ලංකාවේ යුද්ධයට අදාළ සිදුවීම්, සෝමාලියානු මුහුදු කොල්ලකරුවන්ට අදාළ සිදුවීම්, අනෙකුත් මැද පෙරදිග කෙරුණු ගැටුම්වලදී වෙච්ච පොඩි ප්‍රහාර හැරුණු විට, රටවල් දෙකක් අතර මෙවැනි ප්‍රහාරයක් ඉන්දියන් සාගරයේ පුපුරා ගිහිල්ලා නැහැ. ඒක ලංකාවේ ආණ්ඩුව නොවෙයි, අපි කවුරුවත් නොසිතූ අනපේක්ෂිත තත්ත්වයක්; අපි කනගාටු විය යුතු තත්ත්වයක්. එවැනි තත්ත්වයකදීත් අපි අපේ මැදිහත්වීම කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි කුඩා රාජ්‍යයක් තමයි. ඉන්දියන් සාගරයේ සියලුම දේවල් කරන්න අදාළ යුද බලය, නාවුක බලය, එහෙම නැත්නම් වෙනත් බලයක් තිබෙන ඉන්දියන් සාගරයේ දැවැන්තයා අපි නොවෙයි. නමුත් අපට පුළුවන් මොහොතේ අපේ දොරකඩ ළඟදී, අපේ වෙරළ තීරය ළඟදී අපට ගලවා ගන්න; උදවු කරන්න; මුදාගන්න පුළුවන් වෙච්ච පළමුවැනි මොහොතේදී ජාතියක්, රටක් නොබලා ඒ මුදාගැනීමට, මානුෂීයත්වය වෙනුවෙන් මැදිහත්වීමට ලංකාව කටයුතු කර තිබෙනවා. ඉස්සරහටත් ඒක එහෙම කරනවා. අපේ රට, ලංකාව එවැනි ජාතියක් බවට අපි ලෝකය ඉදිරියේ සලකුණක් තැබිය යුතුයි. අසීරුම දේ තමයි, ඒ කියන්නේ මේ යුද්ධය සාමාන්‍ය වෙච්ච වෙලාවක -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

යුද්ධය සාමාන්‍ය වෙච්ච වෙලාවක, යුද්ධය සාමාන්‍යකරණය වෙච්ච ලෝකයක සාමය වෙනුවෙන් පෙනී සිටීම තමයි අමාරු, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක තමයි අසීරු තීරණය. සමහර වෙලාවට මේ ලෝකයේ දැවැන්තයන් දශක ගණන් තිබුණු සම්මුතීන්, නැත්නම් එක්සත් ජාතීන්ගේ සම්මුතීන් කඩ කරමින් සිටින අවස්ථාවක අපි කෙතරම් කුඩා රටක් වුණත් ඒ සම්මුතීන් රැක ගැනීම, ඒ ප්‍රමිතීන් රැක ගැනීම තමයි මේකේ තිබෙන දේශපාලනය. අසීරුම මොහොතේ ප්‍රමිතීන් රකින, සම්මුතීන් රකින, ඒ සාමකාමීත්වය රකින, ඒක නියෝජනය කරන, ඒ වෙනුවෙන් පෙනී ඉන්න රාජ්‍යයක් විධියට අද ලංකාව ඉතිහාසගත වෙලා තිබෙනවා. ඒකට නායකත්වය දෙන්න අපේ ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුවට පුළුවන් වෙලා තිබෙනවා. අන්න ඒ ගැන අපි සතුටු වෙනවා. අපි ජාතියක් වශයෙන් ඒ ගැන ආඩම්බර විය යුතුයි කියලා සඳහන් කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.49]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා පාස්කු ප්‍රහාරය ගැන කිව්වා. එතුමා දන්නේ නැහැ, එතුමන්ලාගේ ආණ්ඩුවේ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කරන ප්‍රධාන නිලධාරින් දෙදෙනාම යහ පාලන ආණ්ඩුව කාලයේ හිටපු නිලධාරින් බව. මේ පාස්කු ප්‍රහාරය සිදුවෙනකොට, එක්කෙනෙක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂතුමා. අනෙක් කෙනා හිටපු DIG මහත්මයා. ඒ දෙදෙනා තමයි අද තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් පරීක්ෂණ කරන ප්‍රධානම විමර්ශකයෝ දෙදෙනා. එහෙනම්, එතුමන්ලා දෙදෙනාවත් අයින් කරලා දමන්න. එතුමන්ලාව තබාගෙන අපට බණින්න එපා. එතුමන්ලාට තමයි news එක ආවේ, බෝම්බ පිපිරෙන්න යනවා කියලා. අපට නොවෙයි news එක ආවේ. දැන් එතුමන්ලා හොඳයි, යහ පාලන ආණ්ඩුව හොඳ නැහැ. ඒ නිසා නිකම් බොළඳ තර්ක ගෙනෙන්න එපා.

ඊළඟ කාරණය මේකයි. දැන් පැය 11ක් ගැන කිව්වා නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ ජනාධිපතිතුමා ප්‍රවෘත්ති සාකච්ඡාවක් පැවැත්වුවා නේ. ඒ ප්‍රවෘත්ති සාකච්ඡාවේදී ජනාධිපතිතුමා මොකක්ද කිව්වේ? ජනාධිපතිතුමා කිව්වා, "පෙබරවාරි 26වැනි දා නැව් 3ක් එන්න තිබෙනවා, ඉරාන රජය මේකට අවසර ඉල්ලුවා" කියලා. ඊයේ ජනාධිපතිතුමා එහෙම කිව්වා. කවදාද? පෙබරවාරි 26වන දා. ගාලු මුහුදු සීමාවේදී මේ ඉරාන නැවට පහර දුන්නේ කවදාද? ගාලු මුහුදු සීමාවේදී මේ ඉරාන නැවට ගැහුවේ මාර්තු 04වැනි දා පාන්දර. එතකොට දවස් 06ක්. දවස් හයක් ගිහිල්ලාත් ඇයි තීන්දුව නොගත්තේ? *[බාධා කිරීමක්]* අයියෝ කියන්න එපා. ඔයගොල්ලන්ට අයියෝ තමයි. ඔයගොල්ලන් විපක්ෂයේ හිටියා නම් අද පවතින්නේ මෙහෙම තත්ත්වයක් නොවෙයි. එහෙම නම් අද සබ්මැරීන් එකේ පාටත් කියාවි; සබ්මැරීන් එකේ බොත්තම ඔබපු කෙනාත් කියාවි. අද ඉතින් ඔහොම කටයුතු කරන්නේ ආණ්ඩු පක්ෂයේ ඉන්න නිසා නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පානදුර ප්‍රදේශය ආසන්න මුහුදේ තිබුණු නැවේ හිටපු අය ජනාධිපතිතුමාගේ නියමයෙන් ඊයේ බේරාගත්තා. ඒක හොඳ දෙයක්. ඒක අපි හෙළා දකින්නේ නැහැ. ඒක විය යුතු දෙයක්. ඒක තමයි අපි පෙරේදා ඉඳන් මෙතැන කෑ ගැහුවේ, ඒක කරන්න කියලා. ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරියක් ඊයේ කෑ ගහනවා, අපි කරපු ප්‍රකාශය මිලේච්ඡ ප්‍රකාශයක් කියලා. එහෙම නම් ජනාධිපතිතුමා කළේත් මිලේච්ඡ වැඩක් නේ. අපි ඊයේ පෙරේදා ඉඳන් මොකක්ද කිව්වේ? මේ නැවේ ඇවිල්ලා හිටපු මිනිස්සු ටික බේරාගන්න කියලා නේ අපි කිව්වේ. අපි කිව්වේ නැහැ, ඉරානයත් එක්ක එකතු වෙලා ඇමෙරිකාවට මිසයිල ගහන්න කියලා. අපි කිව්වේ, නැවක් ඇවිල්ලා තිබෙනවා, ඒකේ ඒගොල්ලන්ගේ නාවික නිලධාරින් ඉන්නවා, ඒ හින්දා මේ නැවට අපේ වරායකට එන්න ඉඩ දෙන්න කියන එක. නමුත් 26වෙනි දා ඉඳන් 4වෙනි දා වෙනකම් ඒ තීන්දුව ගත්තේ නැහැ; ගන්න බැරි වුණා. ජනාධිපතිතුමා ඊයේ ඒ තීන්දුව ගත්තා. ඒක හොඳ දෙයක්. ඒ තීන්දුව ගන්න කියලා තමයි අපි කලින් ඉඳන් ජනාධිපතිතුමාට කිව්වේ. ජනාධිපතිතුමා කලින් ඒ තීන්දුව අරගෙන තිබුණා නම්, අර ගාල්ලේදී මැරුණු සියයකට වඩා වැඩි පිරිසත් බේරාගන්න තිබුණා. ඊයේ නාවික හමුදාව ගිහිල්ලා බේරාගත්තා වාගේ ගාලු මුහුදේ නවතා තිබුණු නැවටත් නාවික හමුදාව යැවීමේ තීන්දුව ගත්තා නම්, ඒ නැවේ හිටපු නාවිකයෝ ටිකත් බේරාගන්න තිබුණා. එහෙම නම් ඒ ජීවිත ටික නැති වෙන්නේත් නැහැ. නමුත් ජනාධිපතිතුමාට කොහොම හරි දැන් හරි සත්ව කරුණාව පහළ වෙලා මේ දේ කරපු එක ගැන අපි එතුමාට ස්තුතිවන්ත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම ඉතා වගකීමෙන් කියනවා, ඉරාන තානාපති කාර්යාලයේ ඉහළ නිලධාරින් සහතික කරලා කිව්වා, මේ නැව් තුන ලංකාවට ආවේ ලංකාවේ නාවික හමුදාපතිතුමාගේ ඉල්ලීම අනුව කියලා. මම මේක කියන්නේ වගකීමෙන්. ඔබතුමන්ලා නාවික හමුදාපතිතුමාගෙන් අහන්න, එහෙම ආරාධනාවක් කළාද, නැද්ද කියලා. ඔබතුමන්ලා අහන්න. මම මේක කියන්නේ ඉතා වගකීමෙන්. මම මේ කියන්නේ ඉරාන තානාපතිතුමා කියපු දේ. එතකොට කවුද ඒ ආරාධනාව කළේ? එතකොට ආණ්ඩුව දන්නේ නැතුවද නාවික හමුදාපතිතුමා ඒ ආරාධනාව කළේ? එහෙම නම් ඒක ගැන හොයලා බලන්න. මේ ආණ්ඩුව දන්නේ නැතුව නාවික හමුදාපතිතුමා එහෙම ආරාධනාවක් කළාද කියන එක හොයලා බලන්න. *[බාධා කිරීමක්]*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ කරුණ මෙයයි. මෙතුමන්ලා කිව්වා, ආණ්ඩුව neutral position එකක ඉන්නවා කියලා. ඒ කියන්නේ මැද තැනක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ජනාධිපතිවරයා මාධ්‍ය නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා, අපේ අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා කියපු දෙයක් පිළිබඳව. එහි සඳහන්ව තිබෙනවා, "UAE President receives phone call from President of Sri Lanka condemning Iranian attacks" කියලා. මොකක්ද ඒ? ජනාධිපතිතුමා ඉරාන ප්‍රහාර හෙළා දැකලා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ජනාධිපතිතුමාට කථා කළා කියලා ඒගොල්ලන්ගේ මාධ්‍ය අංශය ප්‍රවෘත්තියක් නිකුත් කරලා තිබෙනවා. එතකොට ඒක කොහොමද neutral position එකක් වෙන්නේ? ඉරානයට විරුද්ධව එතුමා කථා කරලා තිබෙනවා. ළමයි 165ක් මැරුණා; ඒක ඔබතුමන්ලා හෙළා දැක්කේ නැහැ. රාජ්‍ය නායකයෙකු ඝාතනය කළා; ඒක ඔබතුමන්ලා හෙළා දැක්කේ නැහැ. ඒ දෙකේදීම ඔබතුමන්ලා නිශ්ශබ්දව හිටියා.

ජනතා විමුක්ති පෙරමුණ, විශේෂයෙන්ම ඔබතුමන්ලා දේශපාලනය කරන කාලයේ, ඔබතුමන්ලා මේ රටේ විපක්ෂයේ හිටපු කාලයේ මේ බලවත් රටවල් අනිකුත් රටවලට කරන අසාධාරණයට විරුද්ධව හැම තිස්සේ ම ලිප්ටන් වටරවුමේ, ඇමෙරිකානු තානාපති කාර්යාලය ඉස්සරහ හිටපු උදවිය. මේ ඉස්සරහ පේළියේ ඉන්න ඇමතිවරුන් ඔක්කෝම වාගේ එදා එහෙම හිටියා. මා ළඟ තිබෙනවා, ඒ video clips. ඔබතුමන්ලා එදා එහෙමයි හිටියේ. විජිත හේරත් ඇමතිතුමා, බිමල් රත්නායක, නලින්ද ජයතිස්ස එදා එහෙම හිටියා. මමත් ඉඳලා තිබෙනවා, ඒ පෙළපාළිවල මේ කරපු අසාධාරණවලට විරුද්ධව. එහෙම කරපු දේශපාලන ව්‍යාපාරයක් අද වනකොට ඉතාම නපුංසක විධියට හැසිරීම තමයි ප්‍රශ්නය තිබෙන්නේ. අපි කිව්වේ නැහැ, ඉරානයත් එක්ක එකතු වෙලා ගිහිල්ලා ඇමෙරිකාවට ගහන්න, ඊශ්‍රායලයට ගහන්න කියලා. අපි කිව්වේ ඒක නොවෙයි. අපි කිව්වේ, මීට පෙර මේ වාගේ ප්‍රශ්න මතු වුණාම, අසාධාරණයට විරුද්ධව යුක්තිය වෙනුවෙන් අපේ රටේ රාජ්‍ය නායකයන් හැමදාම පෙනී සිටි බව.

ඉරානයත් එක්ක යුද්ධය ඇති වුණු පළමුවැනි වතාව මෙය නොවෙයි. මීට කලින් ඉරාකය එක්ක යුද්ධයක් ඇති වුණා, සිරියාව එක්ක යුද්ධයක් ඇති වුණා, ලිබියාව එක්ක යුද්ධයක් ඇති වුණා. ඊයේ පෙරේදා ඊශ්‍රායලය කටාර් රාජ්‍යයට ප්‍රහාර එල්ල කළා. මේවා දිගටම ආපු ඒවා. අපේ රටේ හිටපු රාජ්‍ය නායකයෝ ඒ සම්බන්ධව හැමදාම යම් ප්‍රතිපත්තිමය තීන්දුවක හිටියා. ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්නකොට අධිරාජ්‍ය විරෝධීයි. අපටත් ඒ ගැන දේශපාලන අදහස් කියලා දීපු, මේ රටේ එහෙම දේශපාලන ව්‍යාපාරයක හිටපු අනුර කුමාර වාගේ කෙනෙක් බලයට ආවාම අධිරාජ්‍ය විරෝධී ගතිය නිසා අර රාජ්‍ය නායකයින්ට වඩා මෙතුමාගේ පාලන කාලයේ යටත්විජිතව ඉන්න රටවලට කෙරෙන අසාධාරණවලට එරෙහිව ඔබතුමන්ලා පෙනී සිටීවි කියලා අපි විශ්වාස කළා. ඒකයි අපි මේ කියන්නේ. ඒක තේරුම් ගන්න. එහෙම නැතිව ඔබතුමන්ලාගේ ආණ්ඩුව වට්ටන්නවත්, ඔබතුමන්ලාට විරුද්ධව නොයෙකුත් චෝදනා එල්ල කරන්නවත් නොවෙයි අපි මේ උත්සාහ කරන්නේ. මේ තුළ දේශපාලන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ දේශපාලන ප්‍රශ්නය මොකක්ද කියලා ඔබතුමන්ලා තේරුම් ගන්න.

ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්නකොට අපට වැඩිය මේ අධිරාජ්‍යවාදී ප්‍රහාර ගැන කථා කරපු උදවිය; ඒවා ගැන දේශනා කරපු උදවිය. එහෙම වෙලා ඔබතුමන්ලාගේ පාලන කාලය තුළ ඉරානයට ගහපු ප්‍රහාර ඔබතුමන්ලාට හෙළා දකින්න බැරි නම්, ළමයි 165ක් මරපු එක හෙළා දකින්න බැරි නම්, රටක රාජ්‍ය නායකයාව මරපු එක හෙළා දකින්න බැරි නම්, ඔබතුමන්ලා මෙච්චර කාලයක් කරපු මේ දේශපාලන ව්‍යාපාරය මොකක්ද කියලා අපි සියලුදෙනාටම හිතන්න වනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සමන්ත රණසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.57]

**ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා**
(மாண்புமிகு ஆர்.எம். சமந்த ரனசிங்ஹ)
(The Hon. R.M. Samantha Ranasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හදිසි නීතිය ගැන විවාද කරන මේ මොහොතේ වචන ස්වල්පයක් කථා කිරීමට මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ආරම්භයක් විධියට, මීට කලින් අදහස් දක්වපු මන්ත්‍රීතුමාගේ කථාවට උත්තරයකුත් දීගෙන යන්න ඕනෑය කියලා මට හිතුණා. ඇත්තටම අපි මේ පාර්ලිමේන්තුවට එන්න කලින් මෙතුමන්ලාව TV එකේ, පත්තරවල දැක්කේ මහා දේශපාලනඥයෝ විධියටයි. නමුත්, අද මොන්ටිසෝරි දරුවන්ටත් වඩා පහළ, දේශපාලන අපරිණතභාවයකින් කථා කරන නිසා අපට ඒවාට උත්තර බඳින්න වීම ගැන පුදුම ලජ්ජා සහගත හැඟීමක් තිබෙන්නේ. ඉරාන නැව මීට දවස් 6කට කලින් ආවා ලු; ගත්තේ නැති ලු. අනේ, අප්පේ! ප්‍රධාන යුද්ධයක් පවතින රටවල් දෙකකින් එක රටකට අයත් නැවක් අපේ මුහුදු තීරයට එන්න හදනකොට පරිණත රාජ්‍යයක් ඒ නැව ගන්නේ නැහැ තමයි. මේ මන්ත්‍රීතුමන්ලාට ඒක තේරෙන්නේ නැහැ.

නමුත්, ඊට පස්සේ අපි ක්‍රියාත්මක වුණේ කොහොමද? එතැනදී මිනිස් ජීවිතවලට හානියක් සිදු වුණාම ඒකට මානුෂීය ආධාර ලබා දීමක් හැටියට තමයි අපි මැදිහත් වුණේ. මන්ත්‍රීතුමනි, තමන්ගේ පක්ෂයයි, තමන්ගේ දේශපාලන අනාගතයයි ගැන පොඩ්ඩක් කල්පනා කරලා උත්තර දෙන්න. අපි විපක්ෂයේදී අධිරාජ්‍ය විරෝධීයි ලු. අපි අදත් අධිරාජ්‍ය විරෝධීයි. හැබැයි, අර මොකාද එකා වාගේ දකින දකින එකට ගිහිල්ලා හොටෙන් අනින්නේ නැහැ. ඒ දේශපාලන පරිණතභාවය නිසා තමයි අපි මෙහෙම කටයුතු කරන්නේ.

අපි තරුණ කාලයේදීත් හදිසි නීතිය කියනකොට, ඇඳිරි නීතිය කියනකොට ඇත්තටම අපේ ඇඟේ මයිල් කෙළින් වෙනවා, බය හිතෙනවා. මොකද, මෙතෙක් තිබුණු ආණ්ඩු හදිසි නීතිය පාවිච්චියට ගත්තේම මේ රටේ සාමාන්‍ය ජනතාව පෙළන්නයි. මට මතක හැටියට 1971දී හදිසි නීතිය පනවා තිබෙනවා. ඒ වාගේම 1983 කළු ජූලිය වෙලාවේ හදිසි නීතිය පනවා තිබෙනවා. 2000 සිට 2009 කාලය තුළත් හදිසි නීතිය පනවා තිබෙනවා. 2022දීත් හදිසි නීතිය පනවා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022දී අරගළය වෙලාවේ මම නියෝජනය කරන රඹුක්කන නගරයේ දැවැන්ත තෙල් පෝලිම්වල මිනිස්සු දවස් ගණන් කන්න නැතිව ඉන්න මොහොතක පැවති ආණ්ඩුව මොකක්ද කළේ? පොලීසිය කැඳෙව්වා. පොලීසිය ජනතාවට වෙඩි තියලා එක තරුණයෙක් ඝාතනය කළා. තව වටේ හිටපු මිනිස්සුන්ටත් වෙඩි තැබුවා. අදටත් ඒ මිනිස්සු ඇවිද ගන්න බැරිව, ජීවනෝපාය මාර්ග අහිමි වෙලා දුක්ඛිත ජීවිතයක් ගෙවනවා. එහෙම තමයි එදා හදිසි නීතිය පාවිච්චි කළේ. එතැනම, ඒ පෙට්‍රල් ෂෙඩ් එක ළඟම, තෙල් තිබියදීත් ඊයේ පෙරේදා තෙල් පෝලිමක් ඇති වුණා. අපි මිනිස්සුන්ට කිව්වා, තෙල් තිබෙනවා, දෙන්නම් කියලා. ඒත් මිනිස්සුන්ට යම් සැකයක් ඇති වෙනවා, ඉතිහාසයේ වෙච්ච දේවල් නිසා. කමක් නැහැ. වගකිව යුතු ආණ්ඩුවක් විධියට අපි මොකක්ද කළේ? පෙට්‍රල් ෂෙඩ් එක පැය 24ම විවෘතව තියලා, එක බවුසරයක් ගෙනාපු ෂෙඩ් එකට බවුසර් දෙක, තුන ගෙනැල්ලා මිනිස්සුන්ට තෙල් ටික දීලා මිනිස්සුන්ගේ අවිශ්වාසය අපි නැති කළා.

එහෙමයි වගකිව යුතු ආණ්ඩුවක් විධියට අපි වැඩ කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විපක්ෂය අද දවසම මේ හදිසි නීති විවාදය එක්ක ලොකුවට එල්ලෙයි කියලා අපි හිතුවා. නමුත්, විපක්ෂයට වැලේ වැල් නැහැ. මොනවාද කියන්නේ කියලා එතුමන්ලාට තේරෙන්නේ නැහැ. එළියට ගිහිල්ලා දබර වෙනවා. ආපසු කථා වෙනවා. කියන දේ තේරෙන්නේ නැහැ.

හදිසි නීතිය අවශ්‍ය ඇයි? බලන්න, මේ ගැසට් පත්‍රයේ බොහොම පැහැදිලිව තිබෙනවා, "දිට්වා" සුළි කුණාටුව නිසා හදිසි නීතිය පැනවීමේ අවශ්‍යතාව මතුව තිබෙන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදාහරණයක් වශයෙන් ගත්තොත්, මේ ආපදා

[ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා]

තත්ත්වය නිසා නැවත තමන්ගේ ගෙදරට යන්න බැරිව මම නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක 333ක්; මාවනැල්ලේ 272ක්; යටියන්තොට 262ක්; කෑගල්ලේ 292ක්; බුලත්කොහුපිටියේ 134ක්; රඹුක්කන 171ක්; වරකාපොල 134ක්; රුවන්වැල්ලේ 36ක්; ගලිගමුවේ 62ක්; දැරණියගල 6ක්; දෙහිඕවිට 7ක් වශයෙන් 1,756ක් ඉන්නවා. මේ අවුරුද්දේ දෙසැම්බර් 31වැනි දා වනකොට මේගොල්ලන් යළි පදිංචි කරන්න ඕනෑ. ඒ අයට නිවාස ඉදිකිරීම සඳහා අවශ්‍ය වන ඉඩම් හොයා ගන්න ඕනෑ. ජලය, විදුලිය, මාර්ග, වෛද්‍ය පහසුකම් ඇතුළු විවිධ සේවා සපයන්න ඕනෑ. මේ රට මේ තත්ත්වයෙන් මුදා ගන්න නම් අපි මේ රටේ තිබෙන ආයතන කළමනාකරණය කර ගන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ අවස්ථාවේදී විපක්ෂය පැත්තේ ඉස්සරහ පේළිවල කවුරුවත් නැහැ, මේවා අහන්න. ඒ නිසා මාධ්‍යවලින් හරි මේවා අහන්න.

යහ පාලන ආණ්ඩුව තිබුණු 2016දී තමයි මාවනැල්ල, අරණායක සාමසර කන්ද නාය ගියේ. අවුරුදු 7ක් ගත වෙලාත් ඒ මිනිස්සුන්ට අදටත් සුගතියක් නැහැ. මොනවාද ඔවුන් වෙනුවෙන් ඉෂ්ට කර තිබෙන්නේ? රඹුක්කන තිබෙනවා, රීදැල්ලවත්ත කියලා නැවත පදිංචි කරවීමේ ගම්මානයක්. ඒ ගම්මානය අමු කැලයක්. ඒ ගම්මානයට විදුලි බලය නැහැ; වතුර නැහැ; පාරවල් නැහැ. ඒ මිනිස්සුන්ගේ ප්‍රශ්න විසඳන්නත් අවශ්‍යයි. මේ හදිසි නීතිය යටතේ ආරක්ෂක අමාත්‍යාංශයට කථා කරලා, මුදල් වෙන් කරගෙන අපි තමයි දැන් ඒ කැලය සුද්ද කරන්නත් කටයුතු කරන්නේ. ඒ වාගේම පළාත් සභාවට කථා කරලා, රුපියල් ලක්ෂ 45ක් වියදම් කරලා, ඒ මිනිස්සුන්ට විදුලි බලය අරගෙන දෙන්නත් දැන් අපි ලෑහැස්ති වෙලා ඉන්නේ. ඒ වාගේම ඒ අයට පාරවල් ටික හදා දෙන්නත් තිබෙනවා. හදිසි නීතිය අපි පාවිච්චි කරන්නේ, "දිට්වා" ව්‍යසනයෙන් හානියට පත් මිනිසුන්ට සහන සලසන්න විතරක් නොවෙයි. මේ මහත්තුරු අත්හැරපු, මේ මහත්තුරු අමතක කරපු, මීට වසර ගණනාවකට කලින් ආපදාවට පත් වුණු මිනිස්සුන්ටත් සහන සේවා සලසන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අගමැතිතුමිය කිව්වා, මේ මාස තුන හතර තුළ හදිසි නීතිය පාවිච්චි කර අපි කරපු එක මර්දනකාරී සිද්ධියක් පුළුවන් නම් කියන්න කියලා. නමුත්, මේගොල්ලන්ට කියන්න දෙයක් නැහැ. මේගොල්ලන් කියනවා, අනාගතයේ අරගළ එනවා ලු, මොනවාද කළා කියලා, ඒවාට ලු මේ ලෑහැස්ති කර ගන්නේ කියලා. හත් ඉළවුවේ! දැනටත් එහෙම අරගළ තිබෙනවා නේ. ග්‍රාම නිලධාරින්ගේ අරගළයක් තිබුණා; GMOA අරගළයක් තිබුණා; ධීවරයන්ගේ අරගළයක් තිබුණා; පාසල්වල DOsලාගේ - Development Officersලාගේ - අරගළයක් තිබුණා. ඒ අවස්ථාවලදී හදිසි නීතිය පාවිච්චි කළාද? අනාගතයේදීත් එහෙම දේවල්වලට හදිසි නීතිය පාවිච්චි කරන්නේ නැහැ. මිනිස්සු අරගළවලට එන්නේ නැහැ. මොනවාටද මිනිස්සු අරගළවලට එන්නේ? වැටුප් වැඩි කර ගන්නද එහෙම නැත්නම් රස්සා ඉල්ලා ගන්නද? ඒ ඔක්කොම අපි දෙනවා. ඒ නිසා අරගළ ඇති වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මුජිබුර් මන්ත්‍රීතුමා කිව්වා, ආණ්ඩුව වට්ටන්න නොවෙයි ලු එතුමන්ලා විවේචන කරන්නේ කියලා. ආණ්ඩුව නොවෙයි, රටත් වට්ටන්න තමයි ඒගොල්ලන් විවේචන කරන්නේ කියන එකයි මම කියන්නේ. ජාත්‍යන්තරය තුළ අපිව හෑල්ලු කරන්නයි විවේචන කරන්නේ; ආණ්ඩු වට්ටන්න නොවෙයි, ජාත්‍යන්තරය තුළ අපිව අන්නන්නයි මේගොල්ලන් හදන්නේ. ඒක තමයි මේගොල්ලන්ගෙන් උපදෙස් ගත්තොත් වෙන්නේ. මේගොල්ලන්ට දේශපාලනය කරද්දි වැලේ වැල් නැතුව ඉන්නකොට ඕනෑම ජාතියේ දෙයක එල්ලෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පව්! ඇත්තටම අපි පාර්ලිමේන්තුව නියෝජනය කරන්න එද්දි අපට හිතුණේ දැවැන්ත දේශපාලන පතාකයන් එක්ක අපි මේ වාද විවාද තේරුම් ගන්නේ කොහොමද කියායි. හැබැයි, අවුරුද්දක් ගත වනකොට අපට පුළුවන් වුණා, ආණ්ඩු ක්‍රියාවලිය පිළිබඳව සෑහෙන දෙයක් ඉගෙන ගන්න, කථා බහ කර ගන්න සහ වේගයෙන් වැඩ කර ගන්න. අපි 159දෙනා වාගේම අපේ ප්‍රාදේශීය සභාවල සභාපතිවරු, මන්ත්‍රීවරු ඇතුළු අපේ කාර්ය මණ්ඩලත් ඉතා හොඳින්, ඉතාම වේගයෙන් ආණ්ඩුකරණ ක්‍රියාවලිය තුළට එනවා. හැබැයි, විපක්ෂයට බැරි වුණා, විපක්ෂයේ භූමිකාව මොකක්ද කියාවත් අඩුම ගාණේ තේරුම් ගන්න. ඒකට මැදිහත් වෙන්න තියා අඩුම ගාණේ විපක්ෂයේ කාර්යභාරය මොකක්ද කියලාවත් අද වනකොට එතුමන්ලා දන්නේ නැහැ. ජනතාවත් එක්කයි දේශපාලනය කරන්න වෙන්නේ. කුමන්ත්‍රණය කරලා ආණ්ඩු ගන්න බැහැ. එහෙම ආණ්ඩු ගත්තත් පවත්වාගෙන යන්නත් බැහැ. ඒ සඳහා ජනතාවගේ සිත් දිනා ගන්න ඕනෑ. වතු කම්කරුවන්ට රුපියල් 200ක් වැඩි කරනකොට ඒකට කොක්ක ඇද්දා; රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කරනකොටත් ඒකට කොක්ක ඇද්දා; "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත්වූවන්ට සහන දෙනකොට ඒකටත් කොක්ක ඇද්දා. විපක්ෂය ගැන ඇත්තටම අපි සතුටු වනවා. ඒ අයට බණින්නත් හොඳ නැහැ. මේ වාගේ විපක්ෂයක් තිබෙන එක අපට හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි රටේ ජනතාවට මේ කාරණය කියනවා. ඉතාම හොඳින් මේ හදිසි නීති අවශ්‍යතා පාවිච්චි කරලා, මේ නීති රෙගුලාසි අස්සේ මේ රටේ ජනතාවට සුබසිද්ධියක් ළඟා කර දීම සඳහාත්, ජීවිතයේ යහ පැවැත්ම ගොඩනඟා ගැනීම සඳහාත්, කොටින්ම කිව්වොත් ආපදාවට පත් වුණු සියලු ජනතාවගේ අවශ්‍යතා ඉෂ්ට කිරීම සඳහාත් ඉදිරි කාලය තුළ අපි උපරිමයෙන් මැදිහත් වන බව සපථ කරමින් මම නිහඬ වනවා.

මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.06]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Hon. Presiding Member, මට විනාඩි 7ක් තිබුණා. නමුත්, දැන් ඒක විනාඩි 6ක් වෙලා. ඒකට කමක් නැහැ.

අපි පොඩි කාලයේ පොත්වල තිබ්බා කියෙව්වේ, "I am Muru. I am from Africa" කියලා. මට දැන් කියන්න තිබෙන්නේ, "I am Dr. Ramanathan Archchuna. I am from '*hundu*' " කියලා. "Sri Lanka" කියලාත් කියන්න ලජ්ජා වෙලා තිබෙන්නේ අපේ ජනාධිපතිතුමාගේ කථාව නිසා. අපි සාමාන්‍යයෙන් දෙමළෙන් කියන්නේ, "සුණ්ඩු" කියලා. මම හිතන්නේ සිංහලෙන් "හුණ්ඩු" හරි "කුණ්ඩු" හරි කියන්නේ. අවුරුදු 76ක ශාපයක් කියලා අපේ රටේ බලයට ආපු මිනිස්සු දැන් දෙන උපරිම ආතල් තමයි, අපේ රට, රටක් කියලා පිළිගන්නේත් නැති එක. හැබැයි, දෙමළ ජනතාව විධියට අපි මේ රටට ගොඩක් ආදරෙයි. මේ රට ඇතුළේ වෙන රටක් තියා ගන්න ඕනෑ කියලා අපි රණ්ඩු වුණා තමයි. හැබැයි, මේ රටට අපි ආදරෙයි. මම වගකීමෙන් මේ කාරණය කියන්නේ. ජනාධිපති කෙනෙක්

ඇවිල්ලා මේ රටට "හුණ්ඩු" කියලා කියනකොට බොහොම දුකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

තව කාරණයක් මම කියන්න ඕනෑ. මෙච්චර කාලයක් අපි හිතාගෙන හිටියා, Clean Sri Lanka කියලා වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවා කියලා. හැබැයි, ඒ Clean Sri Lanka එකට වෙච්ච දෙයක් අපි දන්නේ නැහැ. ඊට පස්සේ "Rebuilding Sri Lanka" කියලා එකක් අපි බලාපොරොත්තු වුණා. හැබැයි, කිසි දෙයක් build වෙලා පාවිච්චි කරලා පොලීසියට හරි CID එකට ගෙන්වපු තිබෙනවා නම් මම කොහේවත් දැක්කේ නැහැ.

උදේ අපේ Prime Minister කථා කරනවා මම අහගෙන හිටියා. මේ රට තුළ හදිසි නීතිය කෙනෙකුගේ නමක් කියන්න පුළුවන්ද කියලා එතුමිය ඇහුවා. මම ඒ ගැන කියන්න කැමැති නැහැ. හැබැයි, ළඟදී මම දැක්කා, Facebook එකේ "Seda Bro" කියලා පොඩි කොල්ලෙක් ඉන්නවා. ඔහු සාමාන්‍යයෙන්

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ගහනවා ඇති වෙන්න. මම ඔහුගෙන් තමයි ගොඩක් සිංහල ඉගෙන ගන්නේ. හැබැයි, "Seda Bro"වත් CID එකට ගෙනැල්ලා තිබෙනවා මම දැක්කා. මම නම් විශ්වාස කරන්නේ නැහැ, මේ වාගේ රට ඇතුළේ,- අපි වාගේ කොටි අල්ලන්න තමයි ඒ කාලයේ හිටපු ජනාධිපතිතුමන්ලා හදිසි නීතිය පාවිච්චි කළේ. හැබැයි, මේ දවස්වල නම් මම හිතන්නේ "Seda Bro" සහ "Gadget Girl" කියලා එක්කෙනෙක් ඉන්නවා. ඒ, අර pen, pencil තියාගෙන රේඩාර් හදලා මේ දවස්වල වීඩියෝ දමන කෙනා. හදිසි නීතිය යටතේ ඊළඟට ඒ අයත් අල්ලයිද දන්නේ නැහැ. ඒ ගැන මට බොහොම දුකයි. හදිසි නීතිය ගෙනෙන්න එපා කියලා අපි කොච්චර කිව්වත්, 159ක් ඉන්න නිසා කොහොමත් ඔයගොල්ලන් මේක අඩු කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගල් අඟුරු ගැන මම කාරණයක් කියන්න ඕනෑ. මේ දවස්වල Trincomaleeවලින් ප්‍රශ්නයක් එනවාය කියනවා. අනෙක් තැන්වලින් ප්‍රශ්නයක් එනවාය කියනවා. ගල් අඟුරු වංචාවක් වෙලා තිබෙනවාය කියනවා. හැබැයි, කන්ටේනර් 323 ප්‍රශ්නයේ ඉඳන් ගල් අඟුරු වංචාව වෙනකල් අද වනතුරු කවුරුවත් ඇල්ලුවේ නැහැ. අනෙක, කවුරුවත් ඒ සම්බන්ධයෙන් උද්ඝෝෂණ කළේත් නැහැ. ඒකට හේතුව තමයි, උද්ඝෝෂණ කරන අය ඔක්කොම පාර්ලිමේන්තුවට ඇවිල්ලා වාඩි වෙලා ඉන්න එක. ඒ නිසා මේ දවස් ටිකේ පාරේ කවුරුවත් නැහැ, උද්ඝෝෂණ කරන්න.

තව කාරණා කීපයක් මම කියන්න කැමැතියි. මම ඒ ගැන දෙමළෙන් කියන්නම්.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அண்மைய தினத்திலே ஹட்டன், கிளங்கன் வைத்திய சாலையில் 23 வயது பெண்ணொருவர் இறந்த பின்னர், mortuaryஇல் வைக்கப்பட்டிருந்த அந்த இறந்த பெண்ணி னுடைய உடலம்மீது அங்கே வேலை செய்கின்ற 3 பேர் பாலியல் சேட்டைகள் செய்திருப்பதாகவும் தகாத உறவுக்கு உட்படுத்தியிருப்பதாகவும் அவருடைய சகோதரர்களும் குடும்பத்தாரும் கூறியதாக நான் கேள்விப்பட்டேன். கிட்டத் தட்ட ஒரு வருடம் நான்கு மாதங்களுக்கு முன்பு

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

நான் சொன்னபோது, அந்த நேரம் GMOA என்னை எதிர்த்து வைத்தியசாலையைவிட்டு என்னைத் துரத்த நடவடிக்கை எடுத்தது. பிரேத பரிசோதனைகளைத் தாமதிக்கின்ற விடயம் யாழ்ப்பாணம் வைத்தியசாலையிலும் நடக்கிறது. பிரேத பரிசோதனைக்காகச் சாவகச்சேரி வைத்தியசாலையிலிருந்து யாழ்ப்பாணம் வைத்தியசாலைக்கு அனுப்பப்படுகின்ற உடல்கள் மீதான பரிசோதனையை மேற்கொள்ளாமல் வேண்டுமென்றே தாமதிக்கிறார்கள். அது,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

மனச்சாட்சியில்லாமல் இறந்த பிணங்களை வைத்தும் இவர்கள் உழைக்கிறார்கள். நான் மனம் கேளாமல் இந்த விடயங்களைக் கதைத்தபோது, ஒட்டுமொத்த வைத்திய சமூகத்தையும் நோக்கி இவ்வாறு நான் கதைக்கிறேன் என்று கூறி, அந்த நேரம் நான் ஒரு பாராளுமன்ற உறுப்பினராவதற்கு இவர்கள் காரணமாக இருந்தார்கள். இப்போது அதே சம்பவம் கிளங்கன் வைத்தியசாலையில் நடைபெற்றிருக்கின்றது. சாதாரணமாக சிறிய வைத்தியசாலைகளில் இவ்வாறான விடயங்கள் நடைபெறுவதுண்டு.

இன்னுமொரு விடயத்தையும் சொல்லவேண்டும். சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களை நான் உண்மையாகவே நேசிக்கிறேன். அதேநேரம், எங்களுடைய நளிந்த ஜயதிஸ்ஸ அவர்கள் மாபெரும் பொய்யராக மாறியிருக்கிறார் என்பதுதான் எனக்குக் கவலை. ஏனென்றால், நான் நிலையியற் கட்டளை 27(2)இன் கீழ் கேட்ட கேள்விக்கு எங்களுடைய கௌரவ அமைச்சர் நளிந்த ஜயதிஸ்ஸ அவர்கள் - என்னுடைய ஹிதவதா - என்னுடைய நண்பர் - சொல்லியிருந்தார், "அக்கரைப்பற்று MSஇல் எந்தக் குறைபாடும் இல்லை; அவரிடம் எந்த விசாரணைகளும் இல்லை; அவரை நாங்கள் வைத்தியசாலையிலிருந்து அகற்ற மாட்டோம்" என்று. அவ்வாறு சொல்லிச் சிறிது நேரத்தில் அவரை அகற்றியிருக்கிறார்கள். இப்போது அவருக்கு எதிரான விசாரணைகள் நடந்து 2 மாதங்கள் ஆகின்றன. இன்றை வரைக்கும் அமைச்சர் வைத்தியர் நளிந்த ஜயதிஸ்ஸ அவர்களால் திரும்ப அக்கரைப்பற்று ஆதார வைத்தியசாலை அத்தியட்சகராக அவரை நியமிக்க முடியவில்லை. நீங்கள்தான் போராட்டங்களை நடத்துகின்ற மிகப் பெரிய போராட்டக் குழு! இன்றைக்கு எந்தப் பாதையிலும் எந்தப் போராட்டத் தையும் பார்க்க இயலாது, ஏனென்றால், நீங்கள் முழுப்பேரும் இங்கே இருக்கின்றீர்கள்! ஆனால், மாபியா என்று சொல்லக் கூடிய இந்தச் சின்னச் சின்ன விடயங்கள் தொடர்பாக - GMOA போன்றவர்களுடைய விடயங்களாக இருக்கலாம் அல்லது mortuaryஇல் நடக்கின்ற விடயங்களாக இருக்கலாம் - inquiry ஒன்றை நடத்தி, அவர்களைத் தண்டிக்க முடியாத நிலைமையில் இந்த அரசாங்கம் இருக்கின்றது என்பதை எங்களுடைய வைத்தியர் கௌரவ நளிந்த ஜயதிஸ்ஸ அவர்களுக்குக் கவலையுடன் நான் தெரிவித்துக் கொள்கின்ற அதேநேரத்தில், இன்னொரு விடயத்தையும் சொல்லி நான் நிறைவுசெய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඉවර කරනවා, සර්.

அண்மையிலே வடமராட்சியைச் சேர்ந்த இரண்டு மீனவர்கள் இந்தியாவிலே தஞ்சமடைந்து இருக்கிறார்கள். அது தொடர்பாகக்கூட எங்களுடைய கடற்றொழில் அமைச்சர் கௌரவ ராமலிங்கம் சந்திரசேகர் அவர்கள் இந்தப் பாராளு மன்றத்திலே எதையும் சொன்னதாகத் தெரியவில்லை. அதேநேரம், இன்றைய தினம் பாலைதீவு புனித அந்தோனியார் ஆலயத்திற்குக் குருநகர் இறங்குதுறையில் இருந்து படகில் போகின்றபோது, அது விபத்துக்குள்ளாகி மூவர் மரண மடைந்து இருக்கின்றார்கள். இந்த விடயம் பற்றியும் சற்று ஆழமாகப் பார்க்கும்படி கேட்டு, விடை பெறுகின்றேன். நன்றி! வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.12]

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද හදිසි නීතිය දීර්ඝ කිරීම සඳහා වන විවාදය අතරේ විපක්ෂය පැත්තෙන් සමහරු මතු කළ කරුණු කිහිපයක් ගැන කියාගෙන ගියොත් හොඳයි කියලා මට හිතුණා. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ආණ්ඩුවට චෝදනා ප්‍රමාණයක් කළා. එකක්, පාස්කු ප්‍රහාරයේ පරීක්ෂණ කරගෙන යන්නේ ඒගොල්ලන්ගේ කාලයේ හිටපු නිලධාරින්මයි කිව්වා. ඒ කාලයේ කරන්න නොදීපු සමහර පරීක්ෂණ මේ ආණ්ඩුව ඒ රජයේ නිලධාරින් එකතු කරගෙනම කරනවා. සමහරවිට එතුමා ඒ මතු කරන්න ඇත්තේ ඒක වෙන්න ඇති.

ඊළඟට, ඉරානය සහ ඇමෙරිකාව, ඊශ්‍රායලය මැදිහත් වෙලා කරන යුද්ධයේදී සිදු කළ ඉරාන ආධ්‍යාත්මික නායකතුමාගේ ඝාතනය අපි හෙළා දැක්කේ නැහැ, ඒ වෙනුවෙන් අපි මොකුත් කළේ නැහැ වාගේ අදහසක් මතු කරන්න හැදුවා. මම හිතන විදියට, අපි මේ වෙලාවේ කරපු වැඩේ අපි කරයි කියලා මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමන්ලා හිතුවේ නැහැ. මොකද, ගරු මන්ත්‍රීතුමනි, ඊයේ ඔබතුමන්ලා කථා කළේ ඔය විදියට නොවෙයි. විශේෂයෙන් ඔබතුමා. ඔබතුමා කථා කරගෙන යනකොට මට හිතුණා ඔබතුමා ලංකාවේ පුරවැසියෙක්ද කියලාත්. ඔබතුමා ලංකාව නොවෙයි නියෝජනය කරන්නේ කියලා මට හිතෙන්නේ. මට එහෙම අදහසක් ආවා. ඔබතුමා වෙන රාජ්‍යයක් වෙනුවෙන් පෙනී සිටිනවාද කියලා මට හිතුණා. *[බාධා කිරීමක්]* ඔව්, ඒක තමයි, ඇමෙරිකාව නොවෙයි, වෙන රටක් වෙනුවෙන් ඔබතුමා පෙනී සිටිනවා; ඔබතුමා දන්නවා ඒක. මට හිතෙන්නේ ඔබතුමා ඒක දන්නවා. මගේ කටින් කියා ගන්න ඕනෑ නැහැ කියලා මම හිතනවා. මට කථා කරන්න දෙන්න. *[බාධා කිරීමක්]* ඉරානය වෙනුවෙන් පෙනී සිටිනවා නම් කමක් නැහැ නේ. ඔබතුමා ඉරානය වෙනුවෙන් පෙනී සිටිනවා නම් කමක් නැහැ. *[බාධා කිරීමක්]* අපි කවුරුවත් වෙනුවෙන් පෙනී සිටින්නේ නැහැ, පැහැදිලිව අපි අපේ ස්ථාවරය ප්‍රකාශ කළා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ නම කිව්ව නිසා අවස්ථාව දෙන්න.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
නම කිව්වාට ඔබතුමාට මොකුත් අයුතු ආරෝපණයක් කළේ නැහැ. නම කිව්වේ, ඔබතුමා කියපු එක කියන්න. *[බාධා කිරීමක්]* එතුමාට පොඩි අවස්ථාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඔබතුමාට තත්පර 30ක් දෙන්නම්.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියපු දේවල් විකෘති කරලා කියන්න බැහැ. මේ ආණ්ඩුව මේ රටේ කරන්න ඕනෑ යම් යම් කරුණු සම්බන්ධව මම ඉල්ලීම් කළා, පැහැදිලි කිරීම් කළා. ඒ පැහැදිලි කිරීම්, ඒ කළ ඉල්ලීම් වෙන වෙන අර්ථවලින් දක්වලා එතුමාට එහෙම චෝදනා කරන්න බැහැ. මම මේ රටේ පුරවැසියෙක්, මම මේ රට වෙනුවෙන් පෙනී ඉඳලා තිබෙනවා, මම මේ රටේ ත්‍රස්තවාදී වැඩ කරලා නැහැ. මම සල්ලි අරගෙන ඉරානයේ නැව්වලට ගැහුවේ නැහැ 80 ගණන්වල; ඒවා මම කරලා නැහැ. මම මේ රටේ පුරවැසියෙක්. ඒ හින්දා අයුතු චෝදනා කරන්න, අපේ කථා විකෘති කරන්න ඉඩ දෙන්න එපා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ අදහස පැහැදිලියි.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
ස්තුතියි, මන්ත්‍රීතුමා. මන්ත්‍රීතුමාගේ කථාව ගැන මට හැඟෙන දේ මම කිව්වේ. ඔබතුමා දන්නවා ඔබතුමා කවුරු වෙනුවෙන්ද පෙනී සිටින්නේ කියලා. අපි ඉරානය වෙනුවෙන් පෙනී සිටින්නේවත්, ඇමෙරිකාව වෙනුවෙන් පෙනී සිටින්නේවත් නැහැ. අපි බලය ගන්න පෙර අපේ ස්ථාවරය කියලා තිබෙන්නේ, ඔබතුමාට මතක නැත්නම් සොයලා බලන්න. අපි බලය ගන්න පෙර කියලා තිබෙන්නේ අපි නොබැඳී පිළිවෙත අනුගමනය කරන රාජ්‍යයක් කියලා. අපේ ස්ථාවරය, අපේ විදේශ ප්‍රතිපත්ති ඒ මත පදනම් වෙලා ගොඩ නැඟෙන්නේ. ඒ වාගේම තමයි මේ යුද්ධය යන වෙලාවේ, ලෝකයේ බරපතළ යුද වාතාවරණයක් තිබෙන වෙලාවේත් අපි කවුරුවත් වෙනුවෙන් පෙනී සිටින්නෙත් නැහැ, කාටවත් හයත් නැහැ. ජනාධිපතිතුමා ඊයේ ඒක නිශ්චිතව කිව්වා. අපි කවුරුවත් වෙනුවෙන් පෙනී සිටින්නෙත් නැහැ, කාටවත් හයත් නැහැ. හැබැයි, ඉන්දියන් සාගර කලාපයේ සිදු වන ඕනෑම ක්‍රියාවලියකදී මානුෂික මෙහෙයුම් කරන්න අපි ස්වාධීනව මැදිහත් වෙනවා. ඒකට කාගෙන්වත් අහන්න ඕනෑ නැති බවත් අපි ඔබතුමාට කියන්න කැමැතියි. ඉරානයද, ඇමෙරිකාවද, වෙන රටක්ද කියලා නැහැ, ඕනෑම රටක් අපේ සාගර කලාපය තුළ, ඉන්දියන් සාගර කලාපය තුළ මොකක් හෝ අනතුරකට ලක් වෙනවා නම්, මොනවා හෝ මානුෂීය අවශ්‍යතාවක්, ආධාරයක් අවශ්‍ය නම් අපි ඒ වෙනුවෙන් පෙනී සිටිනවා. ඒ පිළිබඳව අපේ ස්ථාවරය අපි ඍජුව ප්‍රකාශ කර තිබෙනවා. අයුතු ආරෝපණ කරන්න එපා කියලා අපි ඔබතුමන්ලාට කියනවා. ඒක, පළමුවැනි කාරණය.

දෙවැනි කාරණය මේකයි. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මේ වෙලාවේ ගරු සභාවේ හිටියා නම් හොඳයි. එහෙම නම්, මම එතුමාටත් අවස්ථාවක් දෙනවා. මොකද, මම හිතන විධියට, එතුමා පළමුවෙනි වතාවට තමයි පාර්ලිමේන්තුවක ඉන්නේ; මේ පාර්ලිමේන්තුවේ. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට පළමුවැනි වතාවට තමයි මම හිතන විධියට එතුමා සිහියෙන් වාඩි වෙලා ඉන්නේ. මොකද, හදිසි නීතිය සම්මත කරද්දී රෙගුලාසි table කරලා නැහැ ලු. මම එතුමාට අභියෝග කරනවා, හැන්සාඩ් වාර්තා පීරලා අරගෙන ඇවිල්ලා රෙගුලාසි table කරපු දවසක් පුළුවන් නම් පෙන්වන්න කියලා. එතුමා මේ වෙලාවේ හිටියා නම් හොඳයි, මම අවස්ථාව දෙනවා. එතුමා නීතිඥවරයෙක්. මෙතැනදී කටට එන, හැඟෙන ඕනෑම එකක් කියන්න අයිතියක් නැහැ, මන්ත්‍රීවරයකු විධියට. අඩුම ගාණේ පාඩම් කරලා එන්න කියලා මම කියනවා. අවම වශයෙන් පාඩම් කරලා ඇවිල්ලා පාර්ලිමේන්තුවේ කථා කරන්න. දන්නේ නැත්නම්, අඩුම ගාණේ රෙගුලාසි ඉදිරිපත් කරනවාද නැද්ද කියලා අහගෙන එන්න. ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා වාගේ අත්දැකීම් තිබෙන, වගකීම් දරපු මන්ත්‍රීවරු ඉන්නවා නේ. එතුමන්ලාගෙන් ඇහුවා නම් මම හිතන විධියට කියලා දෙයි. මහ ලේකම්තුමිය ඉන්නවා. ඔය වචනය කියන්න ඉස්සෙල්ලා මහ ලේකම්තුමියගේ නමත් කිව්වා. මහ ලේකම්තුමියගෙන් ඇහුවා නම් ලේකම්තුමිය කියනවා, මේ ඉතිහාසයේ කවදාවත් මේ පාර්ලිමේන්තුවේ Regulations table කරලා නැහැ කියලා. ඒක දන්නේ නැතිව ඇවිල්ලා කියනවා, මේ ආණ්ඩුව දන්නේ නැහැ ලු. ඒ නිසා අපි කියනවා, පාඩම් කරලා ඇවිල්ලා කථා කරන්න කියලා. මොකද, කටට එන එන වචන කියන්න එපා.

ඊළඟට, මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා,- නම කිව්වාට සමාවෙන්න. ඔබතුමාට නැඟිටින්න නොවෙයි කිව්වේ. ගරු මන්ත්‍රීතුමා, ගරු ජනාධිපතිතුමා ඊයේ කියපු කථාවක් quote කරලා ඔබතුමා කිව්වා, ඉරාන නැව අපේ රටට එන්න ඉල්ලීම කළේ 28වැනි දායි, නැවට ගැහුවේ 04වැනි දා කියලා. මන්ත්‍රීතුමා, තේරුම් ගන්න- *[බාධා කිරීමක්]* අපේ රට නොවෙයි, කිසිදු රටක්- *[බාධා කිරීමක්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
මම කියලා ඉවරත් නැහැ නේ. *[බාධා කිරීමක්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම එහෙම දෙයක් කිව්වේ නැහැ.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
මම කියලා ඉවරත් නැහැ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක වැරැදියි. එතුමා මම කියපු දෙයක් ගැනයි කියන්නේ. මම කියන්නම් හරි දේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමාට කථාව කරගෙන යන්න ඉඩ දෙන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මා කිව්වාය කියලා එතුමා කියන්නේ, මම කියපු දේ නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමා අසත්‍ය කියනවා නම්, ඔබතුමා පසුව කථා කරන්නකෝ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
එතුමා මගේ නම කිව්වා නේ.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
අයියෝ මන්ත්‍රීතුමා, මේක තේරුම් ගන්න. විපක්ෂයේ මන්ත්‍රීවරුන් ඔක්කෝටමයි මම මේ කියන්නේ. විපක්ෂයේ මන්ත්‍රීවරුන් ගණනාවක් මේ කාරණය මතු කළා. *[බාධා කිරීමක්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මගේ නම කිව්වා නේ. මට අයිතියක් තිබෙනවා ඒකට උත්තර දෙන්න. මගේ නම කියන්නේ නැතුව ඕනෑම දෙයක් කියන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නම් ප්‍රකාශ කිරීමෙන් ඔබතුමා වළකින්න කියලා මම යෝජනා කරනවා, ගරු ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ඒකට උත්තර දෙන්න ඉඩ දෙන්න.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොරුවට මේ- [බාධා කිරීමක්] අවස්ථාව දෙන්නේ නැහැ, මම. [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා කථා කරන දේ දන්නවා නේ, ඉතින්.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
ගරු කථානායකතුමනි, මම එතුමාට මොකුත් ආරෝපණයක් කළේ නැහැ. මගේ අවස්ථාව එතුමාට දෙන්නේ නැහැ, මම. මේ පාර්ලිමේන්තුවේ නිකම් නම කිව්වාට නැඟිටින්න බැහැ. *[බාධා*

[ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා]

*කිරීමක්]* ඒ නිසා විපක්ෂයේ මන්ත්‍රීවරුන් දැන ගන්න ඕනෑ, යම් රටකට ඇතුළු වෙන්න ඉල්ලූ පමණින් ඒ රටට ඇතුළු වෙන්න අවස්ථාව දෙන්නේ නැති බව. *[බාධා කිරීමක්]* එහෙම අවස්ථාව දෙන්නේත් නැහැ; අවස්ථාව දෙන්නත් බැහැ. *[බාධා කිරීමක්]* මොකද, ජාත්‍යන්තර නීති කියලා එකක් තිබෙනවා. ඕනෑම කණ්ඩායමක්, ඕනෑම පාර්ශ්වයක් යම් රටකට ඇතුළු වෙන්න ඉල්ලීම් කරද්දී ඒ අය ඒ රටට ඇතුළු කර ගැනීම සඳහා වන ජාත්‍යන්තර නීති කියලා එකක් තිබෙනවා. ඒ නීති අනුගමනය කරලා තමයි ඕනෑම පාර්ශ්වයක්, ඕනෑම පුද්ගලයෙක් රටකට ඇතුළු කර ගන්න පුළුවන්කම තිබෙන්නේ. ඒ නිසා දන්නේ නැතුව කථා කරන්න එපා. දන්නේ නැහැ නොවෙයි මේ; දන්නවා. නමුත් මේ ආණ්ඩුවට තේරෙන්නේ නැහැ කියලා බොරු කියනවා.

ඊළඟට, තවත් මන්ත්‍රීවරයෙක් කිව්වා, ළමයි 300ක් නැවක හිර වෙලා ඉන්නවා කියලා. කනගාටුයි, මන්ත්‍රීතුමා! ඒ නැව ලංකාවට ගෙනාවාද දන්නේ නැහැ. මම ඒ මන්ත්‍රීතුමාගේ නම කියන්නේ නැහැ. නම කිව්වාට පස්සේ ඒක පාවිච්චි කරලා විවාද කරනවා නේ. ළමයින් 300 ඉන්න නැව මේ ලංකාවට ගෙනාවාද දන්නේ නැහැ. දන්නේ නැතුව කියවන්න එපා, පත්තරයක හෝ කොහේ හරි මොකක් හරි දැක්ක ගමන්. අනෙක් එක තමයි පව පත්තරවල, පව නාළිකාවල, බොරු කියන නාළිකාවල තොරතුරු දැක්ක ගමන්, 300 ඉලක්කම දැක්ක ගමන්, "ළමයි 300ක් නැවක හිර වෙලා ඉන්නවා, ගේන්න බැහැ" කියලා කියන්න එපා, මන්ත්‍රීතුමා. ඔබතුමන්ලා දන්නවාට වඩා ගොඩක් කරුණු අපි දන්නවා; ආණ්ඩුව දන්නවා. මොකද, ඉරානය විතරක් නොවෙයි මෙහෙට එන්න ඇහුවේ. ඔබතුමන්ලා දන්නේ නැති වුණාට තවත් රටවල් ඇහුවා. ඒත් අපි අවසර දුන්නේ නැහැ; ආණ්ඩුව අවසර දුන්නේ නැහැ. අපට ඒකට ක්‍රමයක් තිබෙනවා, අවසර දෙනවාද නැද්ද කියලා තීරණය කරන්න. අප මේ වෙලාවේ ඒ සම්බන්ධයෙන් තීරණය කළේ කාගෙන්වත් අහලා නොවෙයි; තීරණය කළේ අපිමයි. අපි මානුෂික මෙහෙයුමක් කළා. අර හෙළා දැකීම කළේ නැහැ, අරක කළේ නැහැ, මේක කළේ නැහැ කියලා ඔබතුමන්ලා කිව්වත් අපි ඊට වඩා ලොකුම වැඩේ කරලායි තිබෙන්නේ. මා හිතන විධියට, ඔබතුමන්ලා ආණ්ඩු බලයේ හිටියා නම් මේ ගැන හිතා ගන්නවත් බැහැ. එහෙම වුණා නම් අඬනවා, දැන් ඇඳන් යටයි ඉන්නේ. ඒ නිසා මොකුත් කරුණු නොදැන, කිසිවක් නොදැන, කරුණු හොයන්නේ බලන්නේ නැතුව, කොහේ හරි තිබෙන එකක් දැකලා ආණ්ඩුවට චෝදනා කරන්න එන්න එපා. මොකද, ඒ දවසේම අතේ පත්තු වෙනවා. දැන් මේ කියන දෙකතුනම අතේ පත්තු වෙලායි තිබෙන්නේ; විපක්ෂයට කර ගන්න දෙයක් නැති වෙලායි තිබෙන්නේ. ඉබාගාතේ යනවා වාගේ ඔහේ කියවනවා. විපක්ෂය එතැනට වැටිලායි තිබෙන්නේ.

ආණ්ඩුව හැටියට අපට, ලෝකයත් එක්ක ගනුදෙනු කරන්න ඕනෑ විධිය, කටයුතු කරන්න ඕනෑ විධිය සම්බන්ධයෙන් හොඳම අදහසක් තිබෙනවා. ඒ නිසා අපි ජාත්‍යන්තරයත් ආරක්ෂා කර ගනිමින්, ඉන්දියානු සාගර කලාපයත් ආරක්ෂා කර ගනිමින්, රටේ ජනතාවගේ ආරක්ෂාවත්, ජාතික ආරක්ෂාවත් පිළිබඳව කටයුතු කරමින් ඉතා දියුණු ආකාරයට වැඩ කරමින් ඉන්නවා; සංවේදී විධියට වැඩ කරමින් ඉන්නවා. ඒ නිසාම අපි හිතනවා, ලෝකයේ හොඳම තැනකට අප මේ රට රැගෙන යමින් තිබෙනවා කියලා. ඒක ඉවසා ගන්න බැරි විපක්ෂය දැන් කලබල වෙලා, ඉබාගාතේ දුවන්න පටන් ගෙන තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමා මා මෙම ගරු සභාවේ නැති වෙලාවේ - මා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ රාජකාරි කරන වෙලාවේ - මගේ නම සඳහන් කරලා යමක් සඳහන් කර තිබුණා. මම ඒකට කෙටියෙන් උත්තරයක් දෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තත්පර 30ක කාලයක් දෙන්නම්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හොඳමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊයේ දින මම සඳහන් කළා, අපේ රටට ආසන්නයේ දරුවන් 300කට ආසන්න ප්‍රමාණයක් නැවක ඉන්නවා, අපේ පිහිට බලාපොරොත්තුවෙන් කියලා. මම ඒක සඳහන් කළේ, ඒගොල්ලෝ cadetsලා. මම කිව්වේ නැහැ, අවුරුදු පහේ හයේ දරුවෝ කියලා, අත දරුවෝ කියලා. ඒගොල්ලෝ cadetsලා. *[බාධා කිරීම්]* ඒ cadetsලා 300 නොවෙයි, 208යි කියලා කිව්වා. හැබැයි, අවසානයේ මා කියපු දේයි කළේ. අවසානයේ අප ඉල්ලපු දේයි කළේ. ගරු හසාරා ලියනගේ මන්ත්‍රීතුමිය කිව්වේ ඒ අයට සහන දෙන්න එපා කියලායි; වරායට ගන්න එපා කියලායි. අප කිව්වේ ඒ අය අරගෙන එන්න කියලායි. අප කිව්වේ උදව් කරන්න කියලායි. අප කිව්වේ, මිලේච්ඡ වෙන්න එපා කියලායි. 300, 208 වෙච්ච එක අප දන්නා දෙයක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක සංඛ්‍යාවක්. හැබැයි, ඒ අයත් දරුවෝ. ඒගොල්ලෝ cadetsලා. ඒගොල්ලෝ නාවික ශිෂ්‍යයෝ. ඒ තරම් අසාධාරණ වෙන්න එපා. ඒ පුද්ගලයන් විදේශිකයන් වුණත්, ශ්‍රී ලාංකිකයන් වුණත් ඒ අයගේ අයිතිවාසිකම් වෙනුවෙන් අපි කථා කරනවා; ඒ අය වෙනුවෙන් අනුකම්පා කරනවා. ඉරානයේ වුණත්, ඇමෙරිකාවේ වුණත්, ඉන්දියාවේ වුණත්, චීනයේ වුණත් අපි ඒ අය වෙනුවෙන් පෙනී ඉන්නවා; ඒ රටවල සාමාන්‍ය මිනිසුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී ඉන්නවා. ඒ අප හැමෝගේම දරුවෝ. මේ රටේ අපි මනුෂ්‍යත්වයෙන් සලකන්න ඕනෑ; මනුෂ්‍යත්වයට ඉඩ දෙන්න ඕනෑ. මනුෂ්‍යත්වය තමයි පළමුවැනි දේ. ඒ නිසා ගරු ජනාධිපතිතුමාට ස්තුතියි, අවසාන මොහොතේ හෝ ඒ පියවර ගත්තු එක ගැන. හැබැයි මා පිළිතුරු දුන්නේ, ගරු නීතිඥ හසාරා ලියනගේ මන්ත්‍රීතුමිය, එහෙම කරන්න එපා කියලා අමානුෂික විධියට කියපු නිසා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තත්පර 30ක් පමණක් දෙනවා. ඉන් එහාට දෙන්න බැහැ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කරපු ප්‍රකාශය එතුමා දිගින් දිගටම වැරැද්දුවා. ඒ ප්‍රකාශය වරද්දමින් එතුමා අන්තිමට කිව්වා, ඒ අය පෙබරවාරි මාසයේ 26, 27, 28 දිනවල එන්න හිටියා කියා මම ප්‍රකාශ කළ බව. ගරු ජනාධිපතිතුමා ඊයේ ප්‍රකාශ කළා, පෙබරවාරි මාසයේ 26වැනි දා ඉරාන රජය විසින් මේ නැව් ටිකට ලංකාවට එන්න අවසර ඉල්ලා තිබුණා කියලා. ඒකයි මම කිව්වේ. මම කිව්වේ ජනාධිපතිතුමා කිව්ව දේ. එතුමන්ලා කොයි තරම් අසත්‍ය කියනවාද බලන්න. මේ දැන් කියපු දේ වෙනස් කළා නේ. ඉතින්, කවුද පවයෝ? අපිද පවයෝ? ඒගොල්ලන්ද පවයෝ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රකාශයට ලබා දුන් කාලය අවසානයි.

මීළඟට, ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.26]

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)

Hon. Presiding Member, firstly, I would like to thank the Hon. President for the humanitarian effort made in saving those Iranian cadets.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "දිට්වා" සුළි කුණාටු ආපදාව සිදු වෙලා දැනට මාස තුනක් වෙනවා. දැන් හදිසි නීතියේ අවශ්‍යතා මොනවාද? අපි දන්නවා, හදිසි නීතිය තුළින් රටේ සාමාන්‍ය නීතිය අත්හිටුවා එම රෙගුලාසිවලට ප්‍රමුඛත්වය දෙනවා කියලා. ආණ්ඩුව කියන්නේ, "දැන් 'දිට්වා' ඉවරයි. හැබැයි, රාජ්‍ය යන්ත්‍රණය කාර්යක්ෂම කිරීමට හදිසි නීතිය අවශ්‍යයි" කියලා. මා කලින් කිව්වා වාගේම හදිසි නීති කියලා ගෙනාවේ අරගළය කාලයේ ගෙනාපු රෙගුලාසිමයි. ඒ නිසා මේ අවස්ථාවේදී එම හදිසි නීති රෙගුලාසිම ගෙන ඒම සදාචාරාත්මකද කියන එකයි මා අහන්නේ. සාමාන්‍ය පුරවැසියාගේ සාමාන්‍ය නෛතික රැකවරණය නැති කරන එක තමයි හදිසි නීතිය තුළින් කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය යන්ත්‍රණය කාර්යක්ෂම කිරීමට, "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් ජනතාවට සහන ලබා දීමට හදිසි නීතිය අවශ්‍යද කියා මම මේ අවස්ථාවේ වගකීමෙන් යුතුව රජයෙන් අහනවා.

Sir, the Hon. President has declared certain services to be essential public services; ගරු ජනාධිපතිතුමා විසින් අත්‍යවශ්‍ය මහජන සේවා හැටියට සමහර සේවා ගැසට් පත්‍රිකාවක් මඟින් ප්‍රකාශයට පත් කර තිබෙනවා. මම මේ අවස්ථාවේදී එම සේවාවන්ගෙන් කිහිපයක් මේ ගරු සභාවේ දැන ගැනීමට කියවන්නම්. මුලින්ම තිබෙන්නේ, විදුලි බලය සැපයීම සම්බන්ධව සියලු සේවාවන්. ඛනිජ තෙල් නිෂ්පාදන, ගෑස් ඇතුළුව ඉන්ධන සැපයීම හෝ බෙදාහැරීම; රෝහල්වල, සාත්තු නිවාසවල, බෙහෙත් ශාලා සහ වෙනත් සමාන ආයතනවල රෝගීන් නඩත්තු කිරීම .... සම්බන්ධව අවශ්‍ය හෝ කළ යුතු ඕනෑම විස්තරයක සියලු සේවා, වැඩ හෝ ශ්‍රමය; මඟීන් හෝ බඩු ප්‍රවාහනය සඳහා වූ පොදු ගමනාගමන සේවා; මංමාවත්, පාලම්, බෝක්කු, ගුවන් තොටුපළවල්, වරාය සහ දුම්රිය මාර්ග ඇතුළුව.... ගමනාගමන සේවා, සංචාරක සේවා සඳහා පහසුකම් සැලසීම සහ පවත්වාගෙන යාම; ජලය සැපයීම සහ ජලාපවහනය සම්බන්ධ සියලු සේවාවන්; ආහාර හා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයීම, ආරක්ෂා කිරීම සහ බෙදාහැරීම සම්බන්ධ සියලු සේවාවන්; සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරින් ඇතුළු අදාළ සියලු නිලධාරින් විසින් ඉටු කළ යුතු සේවාවන් ආදිය; ගිලන් රථ සේවාවන්; ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළුව සියලුම රාජ්‍ය බැංකු හා රක්ෂණ සේවා කටයුතු; ජලය සැපයීම, විදුලි බලය, ජලාපවහනය .... පළාත් පාලන ආයතන මඟින් සිදු කරන සියලුම සේවාවන්; වාරිමාර්ග සම්බන්ධ සියලු සේවාවන්; දුරකථන, විදුලි සංදේශ සහ මාධ්‍ය සම්බන්ධ සියලු සේවාවන්; පහත් බිම් ගොඩ කිරීම සහ සංවර්ධනය කිරීම සම්බන්ධ සියලුම සේවාවන්; කෘෂි සහ කෘෂි රක්ෂණ සේවා සම්බන්ධ සියලු සේවාවන් ආදිය ද ඒ යටතට ඇතුළත් කර තිබෙනවා. මා හිතන විධියට, රාජ්‍ය යන්ත්‍රණයට ඇතුළත් වන සියලු සේවා අත්‍යවශ්‍ය සේවා හැටියට ආණ්ඩුව විසින් ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඒ කියන්නේ ආණ්ඩුවේ යන්ත්‍රණය පවත්වා ගෙන යෑම සඳහා රජය සපයනු ලබන සෑම සේවාවක්ම අත්‍යවශ්‍ය සේවා වශයෙන් සඳහන් කර තිබෙනවා.

මෙම සේවා අත්‍යවශ්‍ය සේවා හැටියට ගැසට් කිරීම සම්බන්ධයෙන් වන නෛතික රාමුව මම මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න කැමැතියි. මෙම සේවා අත්‍යවශ්‍ය සේවා හැටියට නම් කළාට පසුව, එම සේවාවල නියැළෙන සේවකයන් වැඩට ආවේ නැත්නම් ඔවුන් අවුරුදු 2 සිට අවුරුදු 5 දක්වා වන සිර දඬුවමකට ලක් කරන්න පුළුවන්. ඒ වාගේම ඒගොල්ලන්ගේ දේපළ රාජසන්තක කරන්න පුළුවන්. ඊළඟට, ඒගොල්ලන්ගේ වෘත්තිය ලියාපදිංචිය, ඒ කියන්නේ වෛද්‍යවරයෙක් හෝ නීතිඥවරයෙක් හෝ වශයෙන් professional body එකක ලියාපදිංචි වෙලා ඉන්නවා නම්, ඒ ලියාපදිංචිය තහනම් කරන්න පුළුවන්. ඒ නිසා මම මේ ආණ්ඩුවට කියන්න කැමැතියි, මේක ජනතාවගේ නිදහසට, වෘත්තිය සමිතිවල නිදහසට වදින ලොකු පහරක් හැටියට මා දකින බව. ඒකට හේතුව මොකක්ද දන්නවාද? ඔබතුමන්ලා බලයට ගෙනාවේ වෘත්තිය සමිති. මේ සේවා අත්‍යවශ්‍ය සේවා හැටියට ප්‍රකාශ කිරීම හරහා ඒ උදවිය වැඩට ගියේ නැත්නම් ඒගොල්ලන්ගේ දේපළ රාජසන්තක කරන්න පුළුවන්, ඒගොල්ලන් හිරේ යවන්න පුළුවන්, ඒගොල්ලන්ගේ වෘත්තිය ලියාපදිංචි සහතිකය නැති කරන්න පුළුවන්. ඒ නිසා මම ආණ්ඩුවෙන් අසා සිටිනවා, "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් මෙම සේවා සියල්ලක්ම අත්‍යවශ්‍ය සේවා හැටියට ප්‍රකාශයට පත් කරන්නේ මොන අරමුණින්ද කියලා.

තමුන්නාන්සේලා කියා තිබෙනවා, අපි අද වෙනකම් මර්දනය කරලා නැහැ කියලා. මම පිළිගන්නවා. ඔබතුමන්ලා මර්දන කරලා නැහැ. හැබැයි, මර්දනය කළේ නැහැ කියන එකත්, මර්දනය කිරීමට අවශ්‍ය කරන නෛතික රාමුවක් තිබීම කියන එකත් දෙකක්. මම තමුන්නාසේලාගෙන් අහනවා, to rebuild what was damaged by Cyclone "Ditwah", do you have to make all these services - there are 15 services; සේවා 15ක් - essential public services? ඒ කියන්නේ රජයේ සියලු සේවා අත්‍යවශ්‍ය මහජන සේවා හැටියට ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඒ නිසා මම තමුන්නාන්සේලාට කියා සිටිනවා, මෙම සේවා අත්‍යවශ්‍ය සේවා හැටියට ප්‍රකාශ කිරීම තුළින් එම සේවකයන්ට ලොකු පහරක් එල්ල වෙන බව. ඒ නිසා ඒ අදාළ ක්ෂේත්‍රවලට වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයකට යෑමට නෛතික වශයෙන් කිසිම ඉඩක් නැහැ. ඒ නිසා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා. මොකද, මම විශ්වාස කරන පරිදි එම සේවා අත්‍යවශ්‍ය මහජන සේවා හැටියට ප්‍රකාශයට පත් නොකර රජයේ ආයතනවල කාර්යක්ෂමතාව වැඩි කිරීමට අවශ්‍ය ක්‍රියාදාමයට එන්න තමුන්නාන්සේලාට ශක්තියක් තිබෙනවා. ඒ නිසා මෙවැනි දෙයක් සිදු කිරීම අත්‍යවශ්‍යද කියා මා අසා සිටිනවා. තමුන්නාන්සේලාට

[ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා]

වගකීමකින් ප්‍රකාශ කරන්න පුළුවන්ද, අපට මේ ක්‍රියාදාමය ගෙනියන්න බැහැ. මේ ක්‍රියාදාමය කඩාකප්පල් කරන්න කට්ටිය සැරසෙනවා කියලා? එවැනි තර්ජනයක්වත් නැති අවස්ථාවක මේ ආකාරයට හදිසි නීතිය දීර්ඝ කිරීමට අදාළව කටයුතු කරන්න එපා කියා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.32]

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. අද දවසේ හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳව පැවැත්වෙන මේ විවාදය තුළ උදේ වරුවේ අදහස් දැක්වූ අපේ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් ගණනාවක් විසින් ඉදිරිපත් කළ කාරණා කිහිපයක් පිළිබඳව පළමුව අදහසක් ප්‍රකාශ කරන්න මා කැමැතියි.

එක් මන්ත්‍රීවරයෙක් සඳහන් කළා, හදිසි නීතිය දීර්ඝ කිරීම සඳහා රජය පියවර ගන්නේ සමහර කණ්ඩායම්වල වෘත්තිය ක්‍රියාමාර්ගවලට බාධා කිරීමට, නැත්නම් ඒවා වැළැක්වීමට කියලා. උදාහරණයක් හැටියට ගත්තොත්, ග්‍රාම නිලධාරිවරුන්ගේ වෘත්තිය සමිති ක්‍රියාමාර්ගය මර්දනය කිරීම සඳහා හදිසි නීතිය උපයෝගී කර ගැනීමට කටයුතු කරන බවටත්, ඒ වාගේම ඇමතිවරුන් සාකච්ඡා මාර්ගයෙන් ඒ ප්‍රශ්න විසඳනවා වෙනුවට, මර්දනය කැඳවමින් හදිසි නීතිය යටතේ ඔවුන්ට බලපෑම් කිරීමට උත්සුක වන බවටත් අදහසක් ඉදිරිපත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන කියන්න අවශ්‍යයි. ග්‍රාම නිලධාරින් වෘත්තීය ඉල්ලීමක් කරලා තිබුණා, තාක්ෂණික ගැටලුවක් මුල් කරගෙන. මේ වන විට අපි ඔවුන් සමඟ සාකච්ඡා කරලා ඒ ගැටලුව නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. ඒගොල්ලොත් අපේ විසඳුමට එකඟ වෙලා තිබෙනවා. ඒ නිසා අපට මේ වෘත්තීය ක්‍රියාමාර්ග මර්දනය කිරීම සඳහා හදිසි නීතිය භාවිත කිරීමේ කිසිම අවශ්‍යතාවක් නැහැ. අපි සාකච්ඡා මඟින් ඒ වෘත්තීය ගැටලු නිරාකරණය කිරීමට රජය හැටියට මැදිහත් වෙනවා.

ඒ වාගේම ආපදා කළමනාකරණ නිලධාරින්ගේ ගැටලුවකුත් තිබුණා. මේ වන විට ඒ ගැටලුවත් විසඳීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒ නිසා හදිසි නීතිය වෘත්තීය ක්‍රියාමාර්ග මර්දනය කිරීම සඳහා භාවිත කරනවා කියන කාරණය මුළුමනින්ම ප්‍රතික්ෂේප කරනවා. ඒක කියන්න කාරණාවක් නැතුව ගෙනෙන තර්කයක් හැටියට තමයි මම දකින්නේ.

ඒ වාගේම විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කිහිපදෙනෙක්ම සඳහන් කළා, ජාතික ආරක්ෂාව දැඩි ලෙස අභියෝගයට ලක් වෙලා තිබෙන බවත්, විශේෂයෙන්ම පසුගිය දා ඉරාන නැවට එල්ල වුණු ප්‍රහාරය ගැන රජය හැටියට අපි දැනගෙන හිටියේ නැති බවත්, අපි එය නොදැන සිටීම නිසා ජාතික ආරක්ෂාව බරපතළ අර්බුදයකට මුහුණ දී තිබෙන බවත්. එක අතකින් අපි ඒ ගැන සතුටු වෙනවා. මොකද, පසුගිය දවස්වල රටේ කොතැනක හරි වෙඩි තැබීමක් සිද්ධ වුණා නම් ඒක ජාතික ආරක්ෂාවට බලපාන ප්‍රධාන ප්‍රශ්නයක් හැටියට හුවා දක්වපු විපක්ෂයට මේ වන විට ජාත්‍යන්තර සිදුවීම් පදනම් කරගෙන ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි බවට අදහස් දක්වන්න සිදු වී තිබීම ම මම හිතන හැටියට දෛවයේ සරදමක් විය හැකියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ නැව ගිල්ලවීම පිළිබඳව පමණක් නොවෙයි, ඉරානයට එල්ල කළ ප්‍රහාරය පිළිබඳවත් මම කියන්න කැමැතියි. ඉරානය ඉතාම ඉහළ මට්ටමේ යුධ සූදානමකින් හිටපු රටක්. තාක්ෂණය අපට වැඩිය බොහොම දියුණු මට්ටමක තිබෙන්නේ. ඒ ගොල්ලන්ට තමන්ගේම අවි ආයුධ ඇතුළු සියලු නිෂ්පාදන තිබෙනවා. පසුගිය නිදහස් දවසේ ආයුධ ප්‍රදර්ශනය කරන්නේ නැත්තේ ඇයි කියලා අපෙන් ඇහුවාම, මම කියපු ප්‍රකාශයක් අල්ලාගෙන විපක්ෂයේ කට්ටිය විවිධ චෝදනා කළා. එහෙම නොවෙයි. ඒ ගොල්ලන්ගේම රටේ නිෂ්පාදනය වූ අවි ආයුධ සහ තාක්ෂණය තිබියදීත්, ඒගොල්ලන්ගේ නායකයා ඝාතනය කිරීම සඳහා තිබුණු තොරතුරු දැන ගන්න බැරි වුණු තත්ත්වයක් අපි දකිනවා. ඊට කලින් වෙනිසියුලාවේත් ඒ වාගේ තත්ත්වයක් තිබුණා. එහෙම තත්ත්වයක් තිබියදී තමයි විපක්ෂයෙන් අපට කියන්නේ, රජය මේවා ගැන දැනගෙන හිටියේ නැහැ, තොරතුරු ලැබිලා තිබුණේ නැද්ද, මේවා කොහොමද සිද්ධ වෙන්නේ, මේවා ජාතික ආරක්ෂාවට තර්ජනයක් කියලා. අපට වැඩිය ඉහළ මට්ටමේ යුධ අවි ආයුධ සහ තාක්ෂණය තිබුණු පාර්ශ්වවලටත් ඍජුවම ඒවා හඳුනාගන්න බැරි වුණා නම්, මේ කාරණය ගැන ප්‍රශ්න කරන එකම වෙනත් චුවමනාවක් වෙනුවෙන් කරන එකක් හැටියට තමයි අපි දකින්නේ.

ඒ වාගේම, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු මේ කාරණය ගැන කියනකොට සඳහන් කළා, තෙල් මිල වැඩි වෙනවා, ගෑස් මිල වැඩි වෙනවා, ඖෂධවල, ආහාරවල මිල ඉහළ යනවා, අපේ තේ අපනයනයට බාධා වෙනවා කියලා. ඒක ඇත්ත. ඒ කාරණය තමයි, ජනාධිපතිතුමා පසුගිය දවසක මෙතැනට ඇවිල්ලා සඳහන් කළේ. දැනට තිබෙන තත්ත්වය මේකයි. හැබැයි මේ යුද්ධය දිග් ගැස්සුනොත් අනාගතයේදී අපට පවතින අභියෝග මීට වඩා වෙනස් වෙනවා කියන කාරණය එතුමා සඳහන් කළා. හැබැයි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ body language එක දිහා බැලුවාම වාචිකව කියන කාරණයට වඩා දෙයක් පෙනී යනවා. වාචිකව පේන්නේ මේක නිසා රටට වෙන හානිය පිළිබඳව ඒගොල්ලන්ට කනගාටුවක්, දුකක් තිබෙනවා වාගේ දෙයක්. හැබැයි ඒගොල්ලන්ගේ body language එකෙන් පේන්නේ මෙහෙම වෙලා හරි මාලිමා ආණ්ඩුවට ලොකු අර්බුදයකට මුහුණ දෙන්න වෙනවා කියලා ඒගොල්ලන්ට තිබෙන ප්‍රීතිය, නැත්නම් සතුට. මම වැරදි නම් ඒක නිවැරදි කරන්න පුළුවන්.

ඊළඟට මම සඳහන් කරන්න ඕනෑ, මේ කාරණයත්. පසුගිය දවසක "අයිරිස් ඩේනා" නැවට සිදු වුණු ප්‍රහාරය පිළිබඳව දැන් විවිධ කථාබහ නිර්මාණය කරමින් තිබෙනවා. සමහර වෙලාවට යම් යම් පාර්ශ්ව රටේ ජනතාව භීතියට පත් වන ආකාරයේ තොරතුරු ඉදිරිපත් කරනවා, අපට දකින්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ සිදුවීමේදී රජය හැටියට ජාත්‍යන්තර සම්මුතීන්වලට අනුකූලව තමයි අපි මැදිහත් වෙන්නේ. උදාහරණයක් හැටියට කියනවා නම්, UNCLOS Article 98 යටතේ මුහුදේදී අනතුරට පත් ඕනෑම පුද්ගලයෙකුට සහාය වීම වෙරළබඩ රාජ්‍යයක වගකීමක්. ඉතින්, අපි ඒ සඳහා

නීතියෙන් බැඳිලා ඉන්නවා. ඒ වාගේම SAR සම්මුතිය, සමුද්‍රීය සෙවීම් සහ මුදා ගැනීම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය අනුව පුද්ගලයෙකුගේ ජාතිකත්වය, තරාතිරම, අනතුරට පත් වීමට හේතුව නොසලකා ඔවුන් බේරා ගැනීමේ වගකීම ඒ ආසන්න රටවලට තිබෙනවා. එතකොට ඒ වගකීම තමයි අපි මේ අවස්ථාවේදී රජය හැටියට ඉෂ්ට කරන්නේ. ඒ වාගේම 1949 ජිනීවා සම්මුතිය අනුවත් මුහුදේදී අනතුරට පත් හෝ තුවාල ලැබූ සන්නද්ධ බළකා සාමාජිකයන් ආරක්ෂා කළ යුතු පුද්ගලයන් හැටියට සලකා, ඔවුන්ට අවශ්‍ය කරන වෛද්‍ය ආධාර වාගේ දේවල් ලබා දීම ජාත්‍යන්තර මානුෂීය නීතියට අනුකූලයි. ඒ නිසා අපි මේ රටේ පුරවැසියන්ගෙන්; මේ රටේ ජනතාවගෙන් ඉල්ලීමක් කරනවා. මේ විපතට පත් නැවට පිහිට වීම සහ ඊළඟට දෙවනුව ආපු නැවට අදාළව කරපු මැදිහත් වීම නිසා ලංකාවේ රජය බරපතළ වැරැද්දක් කළාය වාගේ කියන කථා, සමහර කරුණු ඉදිරිපත් කිරීම් මුළුමනින්ම සාවද්‍යයයි. එහෙම තත්ත්වයක් නැහැ. ජාත්‍යන්තර නීතියට අනුකූලව තමයි අපි කටයුතු කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කථාබහෙන් මට මතක් වුණා, කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයේ සඳහන් වන මණ්ඩල න්‍යාය ගැන. මණ්ඩල න්‍යාය කියන්නේ, අන්තර් රාජ්‍ය සම්බන්ධතා පවත්වා ගැනීමේ ක්‍රමවේදය. අන්තර් රාජ්‍ය සම්බන්ධතා පවත්වා ගැනීමේදී එක තැනක ඉන්නවා ආක්‍රමණයට අවශ්‍ය කරන මැදිහත් වීම කරන පාලකයා, විජිගීෂු. එතැනින් පස්සේ බල කේන්ද්‍ර දෙකක් බෙදෙනවා. එක පැත්තක ඉන්නවා, එයාට සතුරු පාර්ශ්වය. අනෙක් පැත්තෙන් ඉන්නවා, එයාට මිතුරු පාර්ශ්වය. අරි - සතුරා - ඉන්නවා. මිත්‍ර - මිතුරා - ඉන්නවා. අරි මිත්‍ර - සතුරාගේ මිතුරා - ඉන්නවා. මිත්‍ර මිත්‍ර - මිතුරාගේ මිතුරා - ඉන්නවා. ඒ විධියට ලොකු බෙදීමක් වෙනවා. හැබැයි ඒ බෙදීම අතරේ තවත් ඉන්නවා එක කණ්ඩායමක්. කෞටිල්‍ය ඒ කණ්ඩායම හඳුන්වා තිබෙන්නේ උදාසීන කියලා. උදාසීන කියන්නේ, අර පාර්ශ්ව දෙකක් අතර ඇති වන යුද්ධය මෙහෙයුමට මැදිහත්වීමක් නැතුව මධ්‍යස්ථව කටයුතු කරන කණ්ඩායම. සරලව කිව්වොත්, වර්තමානයේ නොබැඳි ප්‍රතිපත්තිය. අපි මෙන්න මේ නොබැඳි ප්‍රතිපත්තිය තුළ ඉඳගෙන තමයි මේ ගැටුම දකින්නේ. එතකොට ඒ ගැටුමට කිසිම ආකාරයකින් සම්බන්ධ වීමට රජය හැටියට අපි කටයුතු කරන්නේ නැහැ. විශේෂයෙන්ම අපි දකිනවා, ඉන්දියන් සාගරයේ සාමය ආරක්ෂා කර ගන්න අවශ්‍යයි කියලා. නොබැඳි ප්‍රතිපත්තිය තුළ ඉඳගෙන, ඒ වෙනුවෙන් අපට කරන්න පුළුවන් උපරිම මැදිහත් වීම අපි කරනවා. ඒ වාගේම ඒ මණ්ඩල න්‍යායේ තවත් කට්ටියක් ඉන්නවා, ආක්‍රන්ද, පාර්ශ්නිග්‍රාහ වාගේ. ආක්‍රන්ද කියන්නේ, පැත්තක ඉඳලා කෑ ගහන අය. ඒ පැත්තක ඉඳලා කෑ ගහන්නේ, කෞටිල්‍යගේ මණ්ඩල න්‍යායට අනුව නම් තමන්ගේ සතුරු පාර්ශ්වයට විරුද්ධව. හැබැයි දැන් අපි ලංකාවේ ගත්තොත් එහෙම මේ කෑ ගැසීම කරන - ආක්‍රන්ද - රජයට විරුද්ධව මහ හයියෙන් කෑ ගහන පිරිසක් ඉන්නවා. එතකොට මෙන්න මේ තත්ත්වයත් අපි තේරුම් ගන්න අවශ්‍ය වෙනවා. මේ තත්ත්වය තේරුම් ගනිමින්, රජය හැටියට ජාත්‍යන්තර ගිවිසුම්වලට, සම්මුතිවලට අනුකූල වන විධියට මේ ක්‍රියාවලියේදී අපේ මැදිහත්වීම කරන්න අපි කටයුතු කරනවා.

මේ සිදුවීම් සම්බන්ධව කථා කරනකොට, ලංකාවේ මේ මැදිහත් වීම සම්බන්ධව ප්‍රශ්න කරන අයට මම මේ කාරණයත් කියන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මීට පෙර ජාත්‍යන්තර මුහුදේදී, මේ වාගේ සිදුවීම්වලදී වෙච්ච මැදිහත්වීම් පිළිබඳව අපට ඕනෑ තරම් උදාහරණ තිබෙනවා. 1980-1988 ඉරාන -ඉරාක යුද්ධය අතරතුර පර්සියානු ගල්ෆ් කලාපයේ යාත්‍රා කළ බොහෝ තෙල් නැව්වලට දෙපාර්ශ්වයෙන්ම පහරදීම් සිදු වුණා. ඒ අවස්ථාවේදී මධ්‍යස්ථ රටවල්, විශේෂයෙන්ම ඉන්දියානු වෙළෙඳ නැව්, ප්‍රංශ නාවික යාත්‍රා, ඒ වාගේම ජපානයේ නාවික යාත්‍රා, විපතට පත් පාර්ශ්ව කුමන රටකට අයිතිද කියන කාරණය නොසලකා ඒ අයව බේරා ගැනීම සඳහා කටයුතු කළා. ඒ වාගේම තමයි 1982 බෙල්ග්‍රානෝ නාවික අනතුර. ෆෝක්ලන්ත යුද්ධයේදී බ්‍රිතාන්‍ය "HMS Conqueror" කියන සබ්මැරීනය මඟින් ආර්ජන්ටිනාවට අයිති ජනරාල් බෙල්ග්‍රානෝ නැව ගිල්වා දැමුවා. එම ප්‍රහාරය එල්ල කළ අවස්ථාවේදී බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදාව පවා දිවි ගලවා ගත් සතුරු නැවියන් බේරා ගැනීමට කටයුතු කළා. ඒ කියන්නේ, තමන්ගේ පාර්ශ්වයෙන් එල්ල කළ ප්‍රහාරයකින්ම විපතට පත් වූ නාවිකයන් බේරා ගැනීම සඳහා බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදාව පවා කටයුතු කර තිබෙනවා. මම ඒ කාරණය සඳහන් කළේ, විශේෂයෙන්ම ලංකාව මේ මැදිහත්වීම සිදු කළ ආකාරය පිළිබඳව සමහර අය මතු කරන ප්‍රශ්න, ඇති කරන්න හදන භීතියට පිළිතුරු දෙන්නයි. රජය ජාත්‍යන්තර නීතිවලට, සම්මුතීන්වලට අනුකූලව කටයුතු කළ බවට මම උදාහරණ දෙකක් පමණයි මෙතැනදී සඳහන් කළේ. මේ රටේ ජනතාවට මම විශේෂයෙන් මතක් කරන්න කැමැතියි, රජය කෙරෙහි ඔබ තැබූ විශ්වාසය එලෙසම ආරක්ෂා කරමින් අපි මේ අවස්ථාවේදී නොබැඳි ප්‍රතිපත්තියක ඉඳගෙන මේ තත්ත්ව කළමනාකරණය කිරීමට අපට හැකි උපරිමයෙන් කටයුතු කරනවා කියලා. අපි උපරිම වශයෙන් මානුෂීය මෙහෙයුම් ක්‍රියාත්මක කරනවාය කියන කාරණය සඳහන් කරන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අර්ජුන සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Hon. Presiding Member, I had nine minutes, originally.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
No, ඔබතුමාට වෙන් වී තිබෙන්නේ විනාඩි 8යි.

[අ.භා. 3.46]

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මට විනාඩි 9ක් තිබුණා. විනාඩියක් අඩු වුණේ කොහොමද දන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයේ ඇමතිවරු සහ මන්ත්‍රීවරු කථා කළා. ඇත්තෙන්ම ඒ කථා අහගෙන ඉන්නකොට දැනුණේ, ජේ.ආර්. ජයවර්ධන මහත්මයා කථා කරනවා වාගෙයි. ගාමිණී දිසානායක මහත්මයා කථා කරනවා වාගෙයි. මහින්ද රාජපක්ෂ මහත්මයාත් ඒවාට විරුද්ධව තමයි ඒ දවස්වල කථා කළේ. ඇමෙරිකාවට පහර දෙන්න, ඉන්දියාවට පහර දෙන්න වශයෙන් බටහිර රාජ්‍යවලට විරුද්ධව තමයි වාමාංශික පක්ෂ කථා කළේ. මම හිතන විධියට, ඔබතුමන්ලාත් දීර්ඝ වශයෙන් ඒ මතයේ සිටියා. මම දැක්කා, 'වෙනිසියුලාවට අත නොතබනු' කියලා යටි ගිරියෙන් කෑ ගැහුවා. පරණ කණ්ඩායමේ අයගෙන් ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා මෙතැන

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

ඉන්නවා. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා, 'හැප්පිලා බලමු' කියලා තමයි ඒ දවස්වල කිව්වේ. දැන් ඔබතුමන්ලා සැහෙන්න වෙනස් වෙලා. හොඳයි, අපි ඒ පැත්තෙන් ඔබතුමන්ලාගේ ලොකු වෙනසක් දකිනවා. ඒ දවස්වල ඇමෙරිකාවට පහර දෙන්න ඕනෑ, පලස්තීනය බේරා ගන්න ඕනෑ, ඉරානය බේරා ගන්න ඕනෑ කියලා තමයි කිව්වේ. As a small country, Sri Lanka must have a non-aligned attitude, I believe that.

මන්ත්‍රීවරියක් කියනවා මම අහගෙන සිටියා, 'ඇයි, ඉරාන නැවට එන්න දුන්නේ? ඒක ම්ලේච්ඡ ක්‍රියාවක්' කියලා. ඒ, එතුමියට තේරෙන විදිය. ඒ කියපු දේ මම විවේචනය කරන්න යන්නේ නැහැ. මේක සංකීර්ණ ප්‍රශ්නයක්. එක එක දේශපාලන පක්ෂ, එක එක මන්ත්‍රීවරු, එක එක දේවල් කියයි. ඒවාට අංගොහාමි වාගේ උත්තර දිදී ඉන්න නොවෙයි, ජනාධිපතිතුමාට තිබෙන්නේ. ඒ ප්‍රශ්නය නිරාකරණය කරලා අවශ්‍ය වැඩ ටික කරගෙන යන්නයි එතුමාට තිබෙන්නේ. කියන කියන දෙයට ජනාධිපතිවරයෙක් උත්තර දෙන්න ඕනෑ නැහැ. ඔබතුමන්ලා උත්තර දුන්නාට කමක් නැහැ. හැබැයි, ඔබතුමන්ලා කලින් කටයුතු කළේ එහෙම නොවෙයි. කලින් හිටියේ වෙනම මතයක. 'ඇමෙරිකාවට ගහන්න ඕනෑ, වෙනිසියුලාවට අත තැබුවොත් බලා ගනිමු' කියලායි කිව්වේ. දැන් ඒ කථා නැහැ.

දැන් ඉරානය ගැන කථා කරන්නේ නැහැ; පලස්තීනය ගැන කථා කරන්නේ නැහැ. අපි අහන්නේ මේකයි. අමාත්‍යවරයෙක් හැටියට ඔබතුමා කිව්වා non-aligned policy එක ගැන. That is the best attitude we must have as a country, and we have been maintaining that attitude for a long time because we are a small country. We cannot align with anybody. අපි කියන්නේ, මේකයි. ඉතිහාසයේම අපි හිටියේ non-aligned ප්‍රතිපත්තියක. හැබැයි, දැන් ඔබතුමන්ලා ඉන්නේ non-aligned ප්‍රතිපත්තියක නොවෙයි. ඒකයි අපි ඇහුවේ, ඔබතුමන්ලා ඇමෙරිකාවත් එක්ක අත්සන් කරලා තිබෙන ගිවිසුම් මොනවාද කියලා. ඒ නැව එනකොට අපි දන්නේ නැහැ නේ, ඒ ගිවිසුම්වල මොනවාද තිබෙන්නේ කියලා. අපි දන්නේ නැහැ, ජනාධිපතිවරයා තමයි දන්නේ. කවුරුවත් දන්නේ නැහැ. ඔබතුමන්ලා දන්නවාද දන්නේ නැහැ. ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. අපේ මුහුදු තීරයේදී ගැහුවොත් අපි කට වහගෙන ඉන්නවාද, අපේ රට තුළට ඒගොල්ලන්ගේ හතුරෙක් ආවාම පහර දුන්නොත් අපි මොනවාද කරන්නේ? අපි දන්නේ නැහැ, මේ වාගේ දේවල් සම්බන්ධයෙන් කොහොමද ක්‍රියා කරන්නේ කියලා. හැබැයි, ඇමෙරිකාව අපෙන් අවසර ඉල්ල ඉල්ලා ඉන්නේ නැති වෙයි. ඇමෙරිකාව අද ලොකු බලවතෙක්. හැබැයි, ඒ ලොකු බලවතාත් එක්ක ඔබතුමන්ලා අත්සන් කළ ගිවිසුම් මොනවාද කියලා මේ රටට කියන්න ඕනෑ. අපි කවදාවත් එවැනි ගිවිසුම් අත්සන් කළේ නැහැ. අපි කවදාවත් බෙල්ල තිබ්බේ නැහැ. දැන් ඔබතුමන්ලා ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. ඒ ගිවිසුම් අවලංගු කරන්න ගියොත් අපට ගහනවා. ඉන්දියාවත් එක්ක ගිවිසුම් 8ක් ද කොහේද අත්සන් කරලා තිබෙනවා; මම හිතන විදියට, ගිවිසුම් 6ක්. ඒ ගිවිසුම් මොනවාද කියලා අපි දන්නේ නැහැ. අපි පරිත්‍යාග කරලා තිබෙන්නේ මොනවාද? රටේ ස්වෛරීභාවයද, ස්වාධිපත්‍යද? අපි පුංචි රටක්. අපට align වෙන්න බැහැ.

ඒ කාලයේ චීනය සහ ඉන්දියාව අතර ප්‍රශ්න ඇති වුණාම අපට ආ ගැටලු නිරාකරණය කළා. පාකිස්තානය සහ ඉන්දියාව අතර ප්‍රශ්න ඇති වුණාම අපට ආ ගැටලු නිරාකරණය කළා. අපි ඉතා වාසනාවන්ත රටක්. පිහිටීම අනුව බැලුවොත්, මේ රට ඉතා වැදගත් රටක්. ඇමෙරිකාව, රුසියාව, චීනය, ඉන්දියාව ආදී බොහෝ රටවලට අපේ රට ඉතා වැදගත් රටක්. අපේ රට ඉන්දියාවට පහළින් තිබෙන්නේ. ඉන්දියාව අපේ සහෝදර රටක්. අපේ ඉතිහාසය ගත්තොත්, ඉන්දියාවට අපිත් එක්ක හොඳ සහෝදරකමක් තිබෙනවා. අපේ රටේ බෞද්ධ ආගම අදහන ජනතාව මෙන්ම හින්දු ආගම අදහන ජනතාවත් විශාල වශයෙන් ඉන්නවා. ඉන්දියාවෙන් අපට natural buffer එකක් තිබෙනවා, මේ South Asiaවල. අපට ඉන්දියාව ගොඩාක් ආදරෙයි. ඉන්දියාව එක්ක අපි ගිවිසුම් ගහලා අපේ ස්වාධිපත්‍ය පාවා දෙන්න ඕනෑ නැහැ. අපි ඒකයි කියන්නේ.

දේශපාලනඥයෝ වශයෙන් එක්සත් ජාතික පක්ෂයෙන් තමයි අපි ආවේ. අපි ඒ කාලයේ ඉඳලාම ප්‍රතිපත්තිගරුකයි. අපි ඇමෙරිකාවට ගහන්න කිව්වේ නැහැ, අත තිබ්බොත් බලාගනිමු කිව්වේ නැහැ, කෙඳිරිගාන්න එපා කිව්වේ නැහැ. මොකක්ද කියන්නේ? ජනාධිපතිතුමා හොල්මන් වෙලා ඉන්නේ. "දිට්වා" සුළි කුණාටුව ආවට පස්සේත් ජනාධිපතිතුමා දවස් හතරක්, පහක් යනකම් හොල්මන් වෙලා හිටියේ. එතුමාගේ හැකියාව තුළ එතුමා කටයුතු කරනවා ඇති. හැබැයි, එතුමා අපට ප්‍රහාර එල්ල කරලා හරියන්නේ නැහැ. "දිට්වා" සුළි කුණාටුව ඇවිල්ලා දවස් හතරක්, පහක් යනකම් එතුමාට කර ගන්න දෙයක් නැතිව හිටියා. ඊට පස්සේ එතුමා ඇවිල්ලා විශාල පොරොන්දු ප්‍රමාණයක් දුන්නා. තවමත් "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් 4,700ක පිරිසක් displaced. ඒ අය තවම ඉන්නේ අනාථ කඳවුරුවල. අපි කියන්නේ බොරු කියන්න එපා කියලායි. රුපියල් බිලියන 1,000ක් බෙදනවා කිව්වා. රුපියල් 25,000ක් බෙදාගෙන හෙමින් හෙමින් ගියා. එතැනින් ඒක ඉවරයි. IMF එක කිව්වා, මේ මුදල බිලියන 500කට පහළට දාන්න කියලා. එතැනින් එහාට දෙන්න එපා කිව්වා. ඊට පස්සේ ඒකට මොකක් වුණාද දන්නේ නැහැ. හැබැයි, මේ වනකොට බිලියන 100ක්වත් දීලා නැහැ. මේ වන විට ව්‍යාපාරිකයෝ, දුප්පත් ජනතාව විශාල පිරිසක් අපහසුතාවට පත් වෙලා ඉන්නවා. හැබැයි, පොරොන්දු දෙනවා. *[බාධා කිරීම්]* ඔබතුමන්ලා ඔබතුමන්ලාගේ වෙලාවේදී කථා කරන්න.

බලන්නකෝ, දිගින් දිගටම වෙන දේවල්. දැන් සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා මොකක්ද කියන්නේ? MAS Holdings එක වැහීගෙන යනවා. ජනාධිපතිතුමා කියනවා, මේ රට "හුණ්ඩුවක්" කියලා. හුණ්ඩුවක් කරන්නේ එතුමා. එතුමන්ලා තමයි මේ රට හුණ්ඩුවක් කළේ. ඊයේ ඉන්දියානු තානාපති කාර්යාලයේදී මට කර්ණාටක ප්‍රාන්තයේ පිරිසක් හමුවුණා. ඒගොල්ලන් 90 දශකයේදී රට දියුණු කළේ මන්මෝහන් සිං ලා එක්ක එකතු වෙලා ඉන්දියාව විවෘත කිරීමෙන් කියලා කිව්වා. ඒ කාලයේත් ඔබතුමන්ලා එවැනි දේවලට විරුද්ධ වුණා. පෞද්ගලික විශ්වවිද්‍යාල, පෞද්ගලික රෝහල් වැනි දේවල් තුළින් තමයි කර්ණාටක ප්‍රාන්තය දියුණු වෙන්න පටන් ගත්තේ. ඒ දියුණුවීමෙන් පසුව තමයි අනෙකුත් කර්මාන්ත ඉන්දියාවට ආවේ. අපේ රටේ ඒ දේවල් කරන්න දුන්නේ නැහැ නේ. Private medical college එක පටන් ගන්නකොටම කෑ ගහලා, සටන් පාඨ කියලා ඒක වැහුවා නේ.

දැන් ටිල්වින් මහත්තයා කියනවා, ඉන්දියාවේ එහෙම ව්‍යාප්තවාදයක් නැහැ කියලා. විශාල පිරිසක් සටන් කරලා, ඒ කාලයේ ත්‍රස්තවාදී කණ්ඩායම් ඇති කරලා ඒ සහෝදරවරුන් 60,000ක විශාල පිරිසක් මිය ගියේ ඒ නිසා නේ. ටිල්වින් සිල්වා මහත්තයා රතුපාට සාටක දාගෙන ඉන්දියාවට ගිහිල්ලා තිබෙනවා. ඔබතුමන්ලා හිනාවෙනවා. මම දන්නේ නැහැ, ඔබතුමන්ලා මොන පක්ෂයේද කියලා. පිටුපස පේළිවල ඉන්න අය ගැන නම් මම දන්නේ නැහැ, කොහේ හිටපු අයද කියලා, ජේවීපී එකේ හිටියාද, මාලිමාවේ හිටියාද කියලා. වටගල මහත්තයලා, අපි ඒ කාලයේ ඉඳන් එකට සටන් කරනවා, අධිරාජ්‍යවාදයට විරුද්ධව. ඒ වෙනුවෙන් ඔබතුමන්ලා සටන් කරන කාලයේ අපිත් මේ පැත්තේ හිටියේ. සමහර අය දැන් මෙතැනට ඇවිල්ලා හිනාවෙමින්

ඉන්නවා. බලයේ ඉන්නකොට චුන්. ඔය බලය තවත් අවුරුදු දෙක තුනක් තිබේවි. ඒක නොවෙයි අපි කියන්නේ. රට විනාශ කරන්න, හුණ්ඩුව බවට පත් කරන්න කටයුතු කළේ අනුර කුමාර දිසානායක ඇතුළු කණ්ඩායම. ඒ කාලයේ කිසිම සංවර්ධන ව්‍යාපෘතියකට අවස්ථාව ලබා දුන්නේ නැහැ. දැන් බලන්න, මහ බැංකු අධිපතිතුමා ආණ්ඩුව බොරුවට හෙමින් උඩට දාලා කියනවා, "Sri Lanka has room to cut rates, if growth slows" කියලා. දැන් මේ growth එක තුනයි දශම ගණනකට පහළට වැටෙනවා. MAS Holdings එක වහලා දාන්න යනවා. කවුරු හරි කිව්වා, ග්‍යෑයිට් පටන් ගන්නවා කියලා. ඉදිරි මාස තුන ඇතුළත පොහොර නිෂ්පාදනය අරඹනවා කිව්වා. දැන් ගෝමික මහත්තයා හොයා ගන්නත් නැහැ. එප්පාවල පොස්පේට් පොහොර පටන් ගන්නවා කිව්වා, ග්‍යෑයිට් පටන් ගන්නවා කිව්වා, ග්‍රැෆීන් පටන් ගන්නවා කිව්වා. මේවා කොහේවත් නැහැ. මොනවාවාත් මේ ආණ්ඩුවෙන් කෙරෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ඒකයි කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාත්‍යන්තරය සම්බන්ධයෙන් ගන්නා වූ ප්‍රතිපත්තිය මොකක්ද කියන්න දන්නේ නැහැ. චීනය දැන් එන්නේ නැහැ. චීනයේ නැවට එන්න දෙනවා කියලා ටිල්වින් මහත්තයා කිව්වා. දැන් චීනයේ නැවට එන්න දෙන්නේ නැහැ. චීනයේ ආයෝජන ඔක්කෝම නවත්වලා. අපි කියන්නේ නිසි ප්‍රතිපත්තියක් තියාගන්න කියලායි. ඔබතුමන්ලා ඇත්තටම lost. ඔබතුමන්ලා ඇත්තටම ධනවාදය, විවෘත ආර්ථිකය කියන මේ concept එකට කැමැතියි. වටගල මහත්තයා හිනාවෙනවා. මම හිතන විධියට, දැන් ඒක ලස්සනට ඇවිල්ලා තිබෙනවා. ඔබතුමන්ලාගේ ඇඳුමෙන්, කථා බහෙන්, කෑමෙන් විතරයි වෙනස් වෙලා තිබෙන්නේ. හැබැයි, අධ්‍යාත්මික බවෙන්, ප්‍රතිපත්තිමය වශයෙන් ලෝකයත් එක්ක ගනුදෙනු කිරීම තුළින් එය වෙනස් වෙලා නැහැ. මේ අය ලස්සන වෙනවා, සමහරුන් දියුණු වෙනවා. ඒක අපට පෙනෙනවා. ප්‍රතිපත්තිගරුක වනකොට ඔබතුමන්ලාට විශාල ප්‍රශ්නයක් ඇති වනවා, ජාත්‍යන්තරයත් එක්ක කටයුතු කිරීම සම්බන්ධයෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංවර්ධනය සම්බන්ධයෙනුත් මම කියන්න ඕනෑ. අද ඒ සංවර්ධනය රට තුළට ගෙනෙන්නේ නැහැ. අද රටට ආයෝජන ගෙනෙන්නේ නැහැ. චීනය ඔක්කෝම වහලා යන්න යනවා. අධිවේගී මාර්ග ඉදිකිරීමෙන් ඉවත් වනවා. මේ වනකොට චීනය ඔක්කෝම ව්‍යාපෘතිවලින් ඉවත් වෙලා. ඉන්දියාව එක්ක ඇති කර ගත් ඒ ගිවිසුම් මොකක්ද කියන එක ගැන අවබෝධයක් නැහැ. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කියනවා වාගේ, අනුර කුමාර මහත්තයා UAE ජනාධිපතිට කියනවා, ඉරානයේ පහර දීම හෙළා දකිනවා කියලා. ඊට පස්සේ මෙතැනට ඇවිල්ලා non-aligned කියනවා. අපි non-aligned වීම තමයි වෙන්න ඕනෑ. මේක සංකීර්ණ යුද්ධයක්. ඉරාන නැවක් එනකොට අපේ ඇඟ හිරි වැටෙනවා. ඒ නැව ගන්නවා ද, නැද්ද අපි දන්නේ නැහැ. මේක අමාරු වැඩක්. අපි දන්නවා, ඒක සංකීර්ණ වැඩක් කියලා. එක එක මන්ත්‍රීවරුන් එක එක අදහස් ප්‍රකාශ කරයි. ඔබතුමන්ලා ඒ දවස්වල හිටපු නායකයින්ව කොච්චර විවේචනය කළා ද? අනුර කුමාරලා, හඳුන්නෙත්තිලා, විජිත හේරත් මහත්තයලා ඉරානයේ සටන සම්බන්ධයෙන් ඇමෙරිකාවට විරුද්ධව කොච්චර කෑ ගැහුවාද? මන්ත්‍රීවරුන් කියන කියන දේවල්වලට උත්තර දෙන්න නොවෙයි, ජනාධිපතිවරයා ඉන්නේ. ප්‍රතිපත්තිගරුක වෙන්න. ජාත්‍යන්තරයත් එක්ක ගනුදෙනු කරන්න හරි ප්‍රතිපත්තියක් හදාගන්න. ආර්ථිකය සම්බන්ධයෙන් හරි ප්‍රතිපත්තියක් හදාගන්න. එහෙම නැති වුණොත් තව අවුරුද්දක්, දෙකක් යනකොට මේ රට විනාශ වෙලා යයි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි හතරක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.54]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

நன்றி! கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று மத்திய கிழக்கில் இடம்பெறுகின்ற யுத்தத்தில் அப்பாவிப் பொதுமக்கள் இலக்கு வைக்கப்படுவது உண்மை யிலே வன்மையாகக் கண்டிக்கத்தக்கது. சர்வதேச சட்ட விதிகளை மீறி, குழந்தைகள் மற்றும் பெண்கள் கொல்லப் படுவது எவராலும் ஏற்றுக்கொள்ள முடியாத ஒரு விடயமாகும். அமெரிக்காவின் முழு ஆதரவுடன் இஸ்ரேல் முன்னெடுக்கும் இந்த மனிதாபிமானமற்ற தாக்குதலை நான் வன்மையாகக் கண்டிக்கின்றேன்.

நாம் ஒன்றைத் தெளிவாகப் புரிந்துகொள்ள வேண்டும். அதாவது, ஈரான் தனது தாக்குதலை அரபு நாடுகளுக்கு எதிராக மேற்கொள்ளவில்லை என்பதையும், மத்திய கிழக்கிலுள்ள அமெரிக்க இராணுவத் தளங்களையும் இஸ்ரேலையும் இலக்காகக்கொண்டே மேற்கொள்கின்றது என்பதையும், இது அந்தப் பிராந்தியத்திலுள்ள ஏனைய முஸ்லிம் நாடுகளுக்கு எதிரான போர் அல்ல என்பதையும் உலகம் புரிந்துகொள்ள வேண்டும்.

மிகவும் கவலையான விடயம் என்னவென்றால், இலங்கை அரசாங்கமானது இன்று அமெரிக்கா மற்றும் இஸ்ரேலுக்குச் சார்பாகச் செயற்படுவதுதான். ஒரு நாடு என்ற ரீதியில், நாம் எப்போதும் பலஸ்தீன் போன்ற நாடுகளின் உரிமைக்காகவும் நீதிக்காகவும் குரல்கொடுத்தவர்கள். இலங்கை நீண்ட காலமாகப் பின்பற்றி வந்த அணிசேரா கொள்கையையும் நீதியின் பக்கம் நிற்கின்ற நிலைப்பாட்டையும் இந்த அரசாங்கம் கைவிடக் கூடாது. நாம் உலக அமைதிக்காகப் போராட வேண்டுமே ஒழிய, அநீதி இழைப்பவர்களுக்குத் துணைபோகக் கூடாது. இலங்கை அரசாங்கமானது, உடனடி யாக அமெரிக்கா - இஸ்ரேல் சார்பான போக்கைக் கைவிட்டு, நீதியின் பக்கம் நின்று, உரிய செயற்பாடுகளை முன்னெடுக்க வேண்டும் என்பது எங்களுடைய எதிர்பார்ப்பாகக் காணப்படு கின்றது.

இப்பொழுது நடைபெறுகின்ற இந்த யுத்தம் காரணமாக நாங்கள் எதிர்காலத்தில் பல்வேறு பிரச்சினைகளை எதிர்நோக்கவேண்டி ஏற்படும். இது இரு நாடுகளுக்கு இடையேயான பிரச்சினையா? ஒரு சமூகத்தின் பிரச்சினையா? இரண்டு இனங்களுக்கு இடையிலான பிரச்சினையா? என்ற கண்ணோட்டத்தில் நாங்கள் இதனைப் பார்க்கக் கூடாது. ஏனென்றால், இன்று உலகிலுள்ள எல்லா நாடுகளும் இந்த யுத்தத்தால் ஏதோவோர் அடிப்படையில் பாதிக்கப்படுகின்ற ஒரு சூழல் ஏற்படுத்தப்பட்டு இருக்கின்றது. இந்த யுத்தம் நீடிக்கின்றபோது, இலங்கை போன்ற நாடுகள் மிகவும் பாரதூரமான பிரச்சினைகளை எதிர்கொள்ள வேண்டிய ஒரு சூழலுக்குள் தள்ளப்படும்.

இந்த யுத்தம் தொடர்பில் எங்களுடைய நாடு என்ன நிலைப்பாட்டை எடுக்கின்றது, யார் பக்கம் நிற்கின்றது, யுத்தத்தை நிறுத்துவதற்காக என்னென்ன விடயங்களை

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

முன்னெடுக்கின்றது என்பதை இன்று எல்லோரும் பார்த்துக்கொண்டு இருக்கின்றபொழுது, நீங்கள் அமைதியாக இருப்பது உண்மையிலே வேதனைக்குரிய விடயமாகும். இது முஸ்லிம் சமூகம் சம்பந்தமான பிரச்சினை என்றோ, இரு சமூகங்களுக்கு இடையிலான பிரச்சினை என்றோ, இரண்டு நாடுகளுக்கு இடையிலான பிரச்சினை என்றோ நாங்கள் சிந்திக்கக் கூடாது. இப்பொழுது இருக்கின்ற நிலைப்பாட்டில், இந்தப் பிரச்சினை தொடர்பில் எங்களுடைய நாடு எவ்வாறான தீர்மானத்தை எடுக்கின்றது என்பதை நாங்கள் விளங்கிக் கொள்ள வேண்டும். ஆளும் தரப்பில் இருக்கின்ற நீங்கள், இன்று எதிர்க்கட்சியில் இருந்திருந்தால் என்ன செய்திருப்பீர்கள் என்பதை நீங்களே உங்களிடம் கேட்டுப் பாருங்கள்! இந்த யுத்தம் எங்களுடைய நாட்டில் பாரிய பாதிப்புகளை ஏற்படுத்துவதற்கான வாய்ப்புகள் இருக்கின்றது என்பதைத் தெளிவாகப் புரிந்துகொண்டு, எதிர்காலச் செயற் பாடுகளைத் திட்டமிடுவதிலும், யுத்தத்தை நிறுத்துவதற்கான செயற்பாடுகளிலும் நாங்கள் கவனம் செலுத்த வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
මම කථාව අවසන් කරනවා.

நீதியின் பக்கம் நின்று, இந்தப் பிரச்சினை தொடர்பில் சரியானதொரு தீர்மானத்தை எடுத்து, ஒற்றுமையை ஏற்படுத்து கின்ற ஒரு நாடாக எங்களுடைய நாடு இருக்க வேண்டும் என்பதே எங்களுடைய எதிர்பார்ப்பாகும். மாண்புமிகு சனாதிபதி அவர்கள் கூறிய விடயம் உண்மையிலே வரவேற்கத் தக்கதாக இருந்தாலும், எதிர்காலத்தில் நாங்கள் எதிர்நோக்க இருக்கின்ற சவால்களுக்கு எவ்வாறு முகங்கொடுப்பது என்பது தொடர்பில் சரியாகச் சிந்தித்து, ஆளும்கட்சி, எதிர்க்கட்சி என்ற வேறுபாடு இல்லாமல், ஒரு செயற்றிட்டத்தை வகுக்க வேண்டுமெனக் கேட்டு, விடை பெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අබූබකර් අතම්බාවා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.59]

**ගරු අබූබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இச்சபையில் பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டத்தின் கீழான தீர்மானம் தொடர்பான விவாதம் நடைபெறுகின்றது. அந்த வகையில், அவசரகாலச் சட்டத்தை நீடிப்பது தொடர்பான வாதப் பிரதிவாதங்கள் இங்கு நடைபெறுகின்றன. நாட்டின் பாதுகாப்பை உறுதி செய்தல், பொது அமைதியைப் பேணுதல், சமூக வாழ்வுக்குத் தேவையான அத்தியாவசியப் பொருட்கள் மற்றும் சேவைகளைத் தடையின்றி வழங்குதல் என்பவற்றுக்கான அதிகாரங்களை வழங்குகின்ற ஒரு முக்கிய சட்ட ஏற்பாடாகவே நாங்கள் இதனைப் பார்க்கின்றோம்.

வளைகுடா நாடுகளில் ஏற்பட்டிருக்கின்ற அசாதாரண நிலைமை பற்றி இன்று பேசப்படுகின்றது. குறிப்பாக, அமெரிக்கா - இஸ்ரேல், ஈரான் நாடுகளுக்கு இடையில் நடைபெறுகின்ற பாரிய யுத்த நிலைமை பற்றி பேசப்படுகின்றது. 'தித்வா' புயலால் ஏற்பட்ட அனர்த்தத்தால் பாதிக்கப்பட்ட மக்களை பழைய நிலைக்குக் கொண்டு வருவதற்காக எமது அரசாங்கம் பல்வேறு செயற்றிட்டங்களை முன்னெடுத்து வருகின்றது; பாதிக்கப்பட்ட மக்களைப் பொருளாதார ரீதியாக முன்னேற்றும் முகமாக நிதி உதவிகளை வழங்கி வருகின்றது. மேலும், உயிர்களைக் காப்பாற்றி மக்களுக்குத் தேவையான நிவாரணங்களை வழங்கி வருகின்ற இந்தச் சந்தர்ப்பத்தில், பேரழிவால் பாதிக்கப்பட்ட நாட்டை மீண்டும் கட்டியெழுப்புவதற்காக "Rebuilding Sri Lanka" என்ற நிகழ்ச்சித்திட்டத்தை நடைமுறைப்படுத்துகின்ற இந்தச் சந்தர்ப்பத்தில், எதிர்க்கட்சியில் இருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்கள் தொடர்ந்தும் அரசாங்கத்தை விமர்சித்துக் கொண்டு இருக்கின்றார்கள். எதிர்க்கட்சியில் இருப்பவர்கள் ஆதரவு வழங்குவதன்மூலம் இந்த நாட்டில் 'தித்வா' புயலால் பாதிக்கப்பட்ட மக்களுடைய வாழ்க்கையை மீண்டும் பழைய நிலைக்குக் கொண்டுவர முடியுமென எதிர்பார்க்கப் படுகின்றது. எனினும், எனக்கு முன்னர் பேசிய பாராளுமன்ற உறுப்பினர் அவர்கள், இந்த நாட்டின் அரசாங்கமும் மாண்புமிகு சனாதிபதி அவர்களும் இஸ்ரேல் - அமெரிக்கா சார்பான நிலைப்பாட்டைக் கொண்டிருப்பதாகக் கூறினார். எமது அரசாங்கம் இது தொடர்பான எந்தவிதமான அறிவிப்பையும் விடுக்காத சந்தர்ப்பத்திலே, நாங்கள் அணிசேரா கொள்கையின் அடிப்படையில் பயணித்துக் கொண்டு இருக்கின்ற சந்தர்ப்பத்திலே, வீழ்ச்சியடைந்த பொருளாதாரத்தைக் கட்டியெழுப்பி முன்னேறிக்கொண்டு இருக்கின்ற சந்தர்ப்பத்திலே இந்தக் கருத்து முன்வைக்கப்பட்டு இருக்கிறது.

இந்தியாவில் பயிற்சியை முடித்துவிட்டு, சர்வதேச கடற்பரப்பில் பயணித்துக்கொண்டு இருந்த சந்தர்ப்பத்திலே ஈரானிய கப்பல் தாக்கப்பட்டு இருக்கின்றது. இரண்டாவது கப்பலில் பயணித்தவர்களை மனிதாபிமான அடிப்படையில் மாண்புமிகு சனாதிபதி அவர்கள் எமது நாட்டுக்குக் கொண்டுவந்து இருக்கின்றார். அதற்காக இந்தச் சந்தர்ப்பத்தில் ஈரான் மக்கள் சார்பாகவும், இலங்கையில் இருக்கின்ற முஸ்லிம் மக்கள் சார்பாகவும் மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன். எதிர்த்தரப்பில் இருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்கள் பேசுகின்ற விதத்தைப் பார்க்கும்போது, அவர்கள் இவ்வாறான சந்தர்ப்பங்களைத் தமக்குச் சாதகமாகப் பயன்படுத்திக் கொள்வதுபோல் தெரிகின்றது. இந்த நாட்டில் முஸ்லிம் மக்களுக்கு மிகப் பொருத்தமான ஓர் அரசியல் கட்சி இருக்குமாக இருந்தால், அது தேசிய மக்கள் சக்திதான் என்று எங்களுடைய கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்கள் அடிக்கடி கூறுவதை நான் கேட்டிருக்கின்றேன். இன்று இந்த நாட்டில் இருக்கின்ற முஸ்லிம்கள், குறிப்பாக வட, கிழக்கில் இருக்கின்ற முஸ்லிம்கள் இந்தக் கட்சியோடுதான் இருக்கின் றார்கள். ஏனெனில், அவர்கள் கடந்த காலங்களில் அரசியல்வாதிகளால் ஏமாற்றப்பட்டவர்களாக இருக்கின் றார்கள்.

இப்போது நாங்கள் புனித ரமழான் மாதத்திலே இருந்துகொண்டு இருக்கின்றோம். கடந்த காலங்களை நீங்கள் சற்று சிந்தித்துப் பாருங்கள்! இந்த நாட்டிலுள்ள முஸ்லிம் மக்கள் ரமழான் மாதத்தில் நிம்மதியாக நோன்பு நோற்பதற் குரிய சந்தர்ப்பத்தை அப்போதிருந்த ஆட்சியாளர்கள் ஏற்படுத்திக் கொடுக்கவில்லை. உதாரணத்துக்கு, "grease man"ஐ முஸ்லிம் சமூகத்துக்குள் அனுப்பி, அவர்கள் ரமழான்

மாதத்தில் இரவு நேர அமல்களைச் சிறப்பாகச் செய்ய முடியாத சூழலை ஏற்படுத்தினார்கள். அதுபோன்றுதான் சஹ்ரானுடைய பிரச்சினை காலத்திலும் செய்தார்கள். இவ்வாறு கடந்த காலங்களில் இந்த நாட்டில் முஸ்லிம்களுக்கு ரமழான் மாதத்தில் நோன்பை நிம்மதியாக நோற்பதற்குரிய சந்தர்ப்பத்தை வழங்கவில்லை. இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்த பிற்பாடு - 2025, 2026ஆம் ஆண்டுகளில் - இந்த நாட்டில் முஸ்லிம்கள் ரமழான் மாதத்தில் நிம்மதியாக நோன்பு நோற்றுக்கொண்டு இருக்கின்றார்கள். இந்த சந்தர்ப்பத்தை ஏற்படுத்திக் கொடுத்தமைக்காக மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு முஸ்லிம் சமூகம் சார்பாக நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இப்போது இந்த நாட்டில் சுயாதீனமான நடைமுறை காணப்படுகின்றது; நிம்மதியான சூழல் காணப்படுகின்றது. கடந்த காலங்களில் இந்த நாட்டில் மக்களுக்கு நிம்மதி இருக்கவில்லை. காலையில் எழுந்து பார்த்தால், ஏதோவொரு பிரதேசத்தில் இன முறுகல் நிலை ஏற்பட்டிருக்கும். இதனால் மக்கள் நிம்மதியை இழந்திருந்தார்கள்.

இன்று அமெரிக்காவினதும் இஸ்ரேலினதும் ஆதிக்கம் காரணமாக ஈரான் நாடு தாக்கப்பட்டுக்கொண்டு இருக்கின்றது. அந்த நாட்டின் ஆன்மீக உச்ச தலைவர் உட்பட அரசியல்வாதிகள், புத்திஜீவிகள், விஞ்ஞானிகள் எனப் பலர் கொல்லப்பட்டு இருக்கின்றார்கள். இதை நாங்கள் ஏற்றுக்கொள்ள முடியாது. இவை சர்வதேச சட்டத்துக்கு இணங்கவா நடைபெறுகின்றன என்ற கேள்வி எழுகின்றது. எனவே, நாங்கள் இதனை முற்றாக எதிர்க்கின்றோம். இந்த உலகத்தில் மக்கள் நிம்மதியாக வாழ்வதற்கான ஏற்பாடுகள் எல்லா சமூக மட்டங்களிலும், எல்லா நாடுகளிலும் ஏற்படுத்தப்பட வேண்டும். அது எங்களுக்குச் சாதகமானதொரு நிலையை ஏற்படுத்தும். ஏனெனில், நாங்கள் சர்வதேச வர்த்தகத்தில் தங்கியிருக்கின்றோம். எனவே, இவ்வாறான செயற்பாடுகள் இங்கும் இருக்கின்ற பட்சத்தில் எங்களுடைய நாட்டின்மீதும் சர்வதேச நம்பிக்கை ஏற்படுவதற்கான சந்தர்ப்பத்தை அது ஏற்படுத்தும் என்பதை நான் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

எதிர்க்கட்சியில் இருக்கின்றவர்கள் தேர்தலை அடிப்படையாகக்கொண்டு, இந்த அரசாங்கத்தோடு இருக்கின்ற முஸ்லிம்களை மீண்டும் பிரிப்பதற்கு முயற்சிக்கிறார்கள். அதற்காக இவர்கள் எதிர்காலத்தில் அரசியல் நாடகங்களை நடத்தலாம். அதன்மூலம் முஸ்லிம்களை இணைத்துக்கொண்டு, அவர்களின் வாக்குகளைப் பெற்று, தங்களுடைய இருப்பைத் தக்கவைத்துக் கொள்ளலாமென நினைத்துக்கொண்டு இருக்கின்றார்கள். இவர்கள் நினைப்பதை ஒருபோதும் அடைந்துவிட முடியாது என்பதை நான் இந்தச் சந்தர்ப்பத்தில் கூறிக்கொள்கின்றேன். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உண்மையிலே இன்று இந்த நாட்டில் நிம்மதியான சூழல் ஏற்படுத்தப்பட்டு இருக்கின்றது. அவசரகால சட்டத்தை நீடிப்பதன்மூலம் 'தித்வா' புயலால் பாதிக்கப்பட்ட மக்கள் எதிர்பார்க்கின்ற அடைவுமட்டத்தை அடைய முடியுமெனக் கூறி, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

Order, Please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු සාගරිකා අතාවුද මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සාගරිකා අතාවුද මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and THE HON. (MRS.) SAGARIKA ATHAUDA took the Chair.*

[අ.භා. 4.07]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මූලාසනය මාරු වීමේදී ගත වූ කාලය මගේ වේලාවට බලපාන එකක් නැහැ කියලා මම බලාපොරොත්තු වෙනවා.

හදිසි නීතිය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් පවත්වන මේ විවාදයේදී මම කියන්න ඕනෑ, මෙය පැනෙව්වේ "දිට්වා" සුළි කුණාටුව අවස්ථාවේදී ඇති වූ තත්ත්වය නිසා බව. ඇත්තවශයෙන්ම මේ හදිසි නීතිය පැනවීමට අවශ්‍ය වන්නේ ඇයි කියන එක අපි එදා පෙන්වා දුන්නා. දැන් කාලයක් ගත වෙලා තිබෙනවා. නමුත්, මේක අන්තිම හදිසි නීතිය දීර්ඝ කිරීමේ අවස්ථාව වෙයි කියා මම සලකනවා. මොකද, එදා ආණ්ඩුව අකැමති වුණාම අපි තමයි කිව්වේ මේක කළ යුතුයි කියලා.

හැබැයි, මේ "දිට්වා" සුළි කුණාටුවෙන් හානියට පත් වූ ව්‍යාපාර වෙනුවෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට තවම වන්දි ගෙවලා නැති බව අපට පෙනෙනවා. හානි වූ ගෙවල් සඳහා රුපියල් 50,000ක මුදලක් ගෙව්වාට, රුපියල් ලක්ෂ 5, රුපියල් ලක්ෂ 50, රුපියල් ලක්ෂ 100 බැගින් ලබා දෙනවා කියපු වන්දි මුදල් ලබා දීම ගැන තවම හිතලාවත් නැහැ. තවම නුවරඑළියේ මිනිස්සු කූඩාරම්වල ඉන්නවාය කියලා අපට දර්ශන තුළින් පෙන්වා තිබෙනවා.

මම 2026.02.06 දිනැති "ලංකාදීප" පුවත් පතින් උපුටා ගන්නවා, "දිට්වා බිලිගත් බාගයකට තවම වන්දි නෑ" කියන පුවත. ඒ වාගේම, 2026.02.05 දිනැති "අරුණ" පුවත් පතින් උපුටා ගන්නවා, "කොළඹ දිට්වාවෙන් විපතට පත් සිසුන්ගේ දීමනාව 11,964කට ගෙවා නැහැ" කියන පුවත. මම හිතන විධියට, අද ගරු අගමැතිනියගේ උපන් දිනය. එතුමියට සුබ උපන් දිනක් වේවායි කියා ප්‍රාර්ථනා කරන අතර, මේ අහිංසක දරුවන්ට ඒ වන්දි මුදල් පුළුවන් තරම් ඉක්මනට ලබා දිය යුතුයි කියලා මම මේ වෙලාවේදී මතක් කරනවා.

ඒ වාගේම, "Daily Mirror" පුවත් පතේ තිබෙනවා, “Cyclone Ditwah forces families to sell cattle, jewellery and vehicles to survive, UNDP survey finds” කියලා. මේක UNDP Survey එකක්. විපක්ෂයෙන් නොවෙයි මේවා කියන්නේ. ඔබතුමන්ලා

[ගරු රවී කරුණානායක මහතා]

අනුගමනය කරන UNDP සමීක්ෂණය තුළින් තමයි කියන්නේ, මේවා හෙළිදරව් කර තිබෙනවාය කියලා. ඇත්තවශයෙන්ම මේගොල්ලන් කියනවාට වැඩිය, ඒගොල්ලන් ලංකාවට ඇත්ත ප්‍රකාශ කරනවාට වැඩිය මේවා පෙන්වා දෙන්න අවශ්‍යයි. මොකද, පිට රටින් මේ වාගේ ප්‍රකාශ සිදු කළාම ඒක ඒ තරම් ලංකාවට ඔබින්නේ නැහැ. තවත් පුවත් වාර්තාවක් තමයි, "Colombo ranked as world's most unaffordable city for homebuyers in 2026". මේ, ඉරානයට මිසයිල ගහන්න කලින් පැවති තත්ත්වය. එම නිසා ඒක දැන් තව සියයට 10කින්, 15කින් වැඩි වේවි. මොකද, දැනටම රුපියල සියයට 15ක් විතර අවප්‍රමාණ වෙලා තිබෙනවා.

මේ අවස්ථාවේදී මම ඉතාම ඕනෑකමින් කියනවා, "දිට්වා" සුළි කුණාටුව සම්බන්ධයෙන් කථා කළා වාගේම අපේ ආර්ථිකය ශක්තිමත් කරන්නත් අවශ්‍යයි කියන එක. හැම අවස්ථාවේදීම අපේ ආර්ථිකය ශක්තිමත්ව තිබෙනවා නම් මේවාට ඔරොත්තු දීමේ තත්ත්වයක් වාගේම දරා ගන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙනවා. නමුත්, අපට පෙනෙන්නේ නැහැ, ඒ ශක්තිය ලංකාවේ වාසියට අපි උපයා ගන්නවා කියලා. මේ අවස්ථාවේදී මේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා කරන්න පුළුවන් හොඳම දේ මේකයි. දැන් "දිට්වා" සුළි කුණාටුව තුළින්, there was a capital destruction beyond restitution. Capital destruction කියන්නේ, ප්‍රාග්ධනය විනාශ වීමක්. ඒ කියන්නේ, හදා ගන්න පුළුවන් ප්‍රමාණයට වැඩිය අපේ ප්‍රාග්ධන වියදම නැති වුණා. එම මුදල ඩොලර් බිලියන 4.1ක්. මම නම් හිතන විධියට, ඒ ප්‍රමාණය ඊට වැඩියි. නමුත්, ඩොලර් බිලියන 4.1ක් ලෙස තමයි ලෝක බැංකුව සහ UNDP එක සඳහන් කර තිබෙන්නේ. නමුත්, ඒ නැති වීම ගත්තාම, අපට වාසියක් ඇති නොවන විධියට තමයි ඒ නැති වීම සිදු වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ අවස්ථාවේදී අපි හරියාකාරව අපේ තිබෙන ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම හදා ගන්න අවශ්‍යයි. ලංකාවට අවශ්‍යව තිබෙන්නේ ඩොලර්. මේ ප්‍රාග්ධනය අපට උපයා ගන්න තිබෙන්නේ ණය තුළින් නොවෙයි, ප්‍රදාන කිරීමක් තුළින් හෝ ආයෝජනය - Foreign Direct Investment - තුළින්. ආදායමක් උපයා ගන්න පුළුවන් මාර්ග තමයි මම මේ කියන්න හදන්නේ.

ඒක කිරීමට නම් අපි ප්‍රථමයෙන්ම කරන්න අවශ්‍ය වන්නේ අපේ රුපියල ශක්තිමත් කිරීමයි. අද අපේ මහ බැංකුව ස්වාධීන කර තිබෙනවා. මහ බැංකුව ස්වාධීන කළාට අපේ රටේ ස්වාධීනත්වය තවම තහවුරු වෙලා නැහැ කියන එක අද වනකොට ඔප්පු වෙලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ දීලා තිබෙන උත්තර තුළින් අපේ ස්වෛරීභාවය මේ පාර්ලිමේන්තුවේදී නැති වෙලා තිබෙනවා. මොකද, මහ බැංකුව 2022 අප්‍රේල් මාසයේ 12වැනි දා මේ රටේ debt standstill එකක්, ඒ කියන්නේ යම් විධියක බංකොලොත්භාවයක් ප්‍රකාශ කළා, පාර්ලිමේන්තුවේ අවසර නැතුව. එහෙම පාර්ලිමේන්තුවේ අවසරයක් නැතුව එවැනි දෙයක් ප්‍රකාශ කරන්න පුළුවන් නම්, මොකටද පාර්ලිමේන්තුවක් අවශ්‍ය වන්නේ? ඒ විධියට ඒගොල්ලන්ට ඕනෑ දෙයක් කරන්න පුළුවන්. ඒ වාගේ නොවෙයි, ස්වාධීන කළාම හැසිරෙන්න ඕනෑ. දැන් මම කියන්නේ, අපි රුපියල ශක්තිමත් කරන්න අවශ්‍යයි කියන එකයි. මේ අවස්ථාවේදී අපේ රුපියල ශක්තිමත් වුණේ නැත්නම් අපි සියයට 65ක් භාණ්ඩ ආනයනය කරන රටක් නිසා අපේ රටේ cost-push inflation එකක් ඇති වෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පටන් ගන්නත් ඉස්සෙල්ලා කථාව අවසන් කරන්න කියනවා වාගේ නේ. අපේ ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා හරි වෙලාවට මේ සභාවට ආවා. අඩු ගණනේ එතුමා මට තව මිනිත්තු 15ක්වත් ලබා දෙයි, භය නැතුව.

ඉතින්, මේ සම්බන්ධයෙන් cost-push inflation ඇති නොවන විධියට කටයුතු කරන්න අවශ්‍යයි, අපි සියයට 65ක් භාණ්ඩ ආනයනය කරන නිසා.

එතකොට ආදායම සම්බන්ධව ගත්තොත්, "Daily Mirror" පුවත් පතේ සඳහන්ව තිබෙනවා, සංචාරක කර්මාන්තයට අදාළව සුමානයකට ඩොලර් මිලියන 15ක් නැති වෙනවා කියලා. සංචාරක කර්මාන්තයෙන් ඩොලර් බිලියන 5.5ක් ඉපැයීම රජයේ ඉලක්කය වුණත් ඒ මුදල මෙපමණ කාලයක් ලැබිලා නැත්තේ ඇයි? අපි පුළුවන් තරම් මේ ඉලක්කයට යෑම සඳහා උදවු කරන්න අවශ්‍යයි. අපි කොහොමද ඒක තහවුරු කරන්නේ?

ඊළඟ කාරණය තමයි, තේ අපනයනය. ඉරානයට දැන් තේ අපනයනය කරන්න බැරි නිසා තේ දලු කඩන්න එපා කියලා තේ නිෂ්පාදනය කරන companiesවලින් යම් යම් තැන්වලට නිර්දේශ කරලා තිබෙනවා. මේ දේවල් රුපියලේ ශක්තිමත්භාවයට බලපාන්නේ නැති විධියට කටයුතු කරන එක තමයි අපට අවශ්‍ය වෙන්නේ. අපේ රටේ ආදායම් අපි සුරක්ෂිත කරන්න අවශ්‍යයි. අපි පුළුවන් තරම් ඒ ආදායම් ලැබෙන මාර්ග ගැන තහවුරු කරන්න අවශ්‍යයි. අපි මේ රටට පුළුවන් තරම් ඩොලර් ගෙනෙන්න අවශ්‍යයි.

ඒ වාගේම බලශක්තිය සුරක්ෂිත කිරීම අත්‍යවශ්‍යයි. Energy security is absolutely essential because that is the way through which we can actually move forward to the next level. Every crisis has an opportunity. The Middle East may be in flames, but that is not a creation by us. When they raise fuel rates, that affects us. So, this is an opportunity before us and we must seize that opportunity. We must ensure that we market ourselves to get possible foreign investment.

Last year, you mentioned that we were supposed to get US Dollars 891 million, but I do not see that that mount has physically come into this country. So, Madam, I would emphasize in this House at this moment that the Government must take that opportunity. Hon. Prime Minister, ensure that you all fly to the Middle East and get down investments. It is not a bomb that fell just into Iran. Whether it be Saudi Arabia, Qatar, Kuwait, Jordan, Lebanon or Cyprus, all those countries have been engulfed in a situation where there is a protracted war going on.

Now, I guess there is a capital outflow. So, Hon. Prime Minister, seize the opportunity at this moment to get those investments to come into Sri Lanka. Look at the Port City, look into the financial system we could adopt to bring investments into Sri Lanka and into sea and air concepts that are there. Sri Lanka is very well located to outbeat ports like Fujairah or Salalah. So, we must ensure that we have a selling tool. But, the problem we face is that we have got caught up in a bureaucratic process,

which Sri Lanka is unable to disentangle itself from to be a good selling point.

So, I would take this opportunity to remind the Government that this is an opportunity we could seize. We must ensure that we get investments financially as well as physical investments to Sri Lanka. The IMF wants us to pay US Dollars 6 billion in debt servicing in 2028. That is what you all have got through the process of agreements. But, tell the IMF that this is an opportunity and that we want incentives for qualifying for payments to get investments. The Managing Director of the IMF, Ms. Kristalina Georgieva came to Sri Lanka last week. Ensure that we basically tell them, “There is a problem in the Middle East. Please ensure that we get incentive qualifications so that we could attract investments into this country." Since there is a time constraint, I call upon the Hon. Prime Minister, who is seated there at this moment, to tell the Government to get the IMF to give you that benefit because this Agreement is effective only till the end of this year. Then, by March, 2027, we have to start paying and the opportunity for Sri Lanka reduces. So, we have to give incentives to get investments into the country. By the time, construction comes, you need not ask the IMF to give it, but you could basically take it on.

I take this opportunity to request you to please ensure that the Port City is made absolutely competitive. Give necessary and meaningful support to the BoI to take investments forward and bring the country to a level where we could basically ensure that our debt servicing due in 2028 is not impossible.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.16]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද විවාදයේදී කථා කරන්න මට අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් ඉරානය සහ ඇමෙරිකාව අතර ඇති වෙලා තිබෙන ගැටුම්කාරී තත්ත්වය සහ ඒ අනුව ලංකාවේ Exclusive Economic Zone එකෙන් එළියේ තිබුණු නැව් දෙකක් සම්බන්ධයෙන් ලංකාව ගත් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අද ලොකු සාකච්ඡාවක් මතු වෙලා තිබෙනවා. මේ සාකච්ඡාවේදී වැදගත්ම දේ තමයි, අපේ විපක්ෂය හැම දාම වාගේ තේරුම් ගන්නේ නැහැ, කුමන පදනමකින්ද, කුමන නීතිමය රාමුවකින්ද රජය කටයුතු කරන්නේ කියලා.

අද උදේ වරුවේත් විපක්ෂ නායකතුමා ඇවිල්ලා කියනවා, "එක නැවක් ගත්තා. අනෙක් නැවේ 84දෙනෙක් මිය ගියා" කියලා. ඒ කාරණය highlight කරලා එතුමා ප්‍රකාශ කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මුලින් තේරුම් ගන්න ඕනෑ, ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය කුමක්ද කියලා. ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය තමයි අපි නොබැඳි රාජ්‍යයක් කියන එක. මේ වෙලාවේ ඇමෙරිකාව සහ ඉරානය අතර ගැටුම්කාරී තත්ත්වයක් තිබෙනවා. ඒ ගැටුම්කාරී තත්ත්වයේ -ඒ යුද්ධයේ- නිශ්චිතවම පාර්ශ්වකරුවෙකු නොවෙයි, ලංකාව. ඒක තමයි අපේ විදේශ ප්‍රතිපත්තිය; නොබැඳි විදේශ ප්‍රතිපත්තිය. මධ්‍යස්ථ බව - neutrality - කියන්නේ මෙන්න මේක. අපි යුද්ධයේ පාර්ශ්වකරුවෙකු නොවෙයි. ඒක, පළමුවැනි කාරණය. යුද්ධයේ පාර්ශ්වකරුවෙකු නොවෙන රටක් මේ අවස්ථාවේ ක්‍රියාත්මක වෙන්න ඕනෑ කොහොමද කියන කාරණය මත තමයි අපි මේ ඉරාන නැව් සම්බන්ධයෙන් හෝ මේ වෙලාවේ ඇතිවෙන ඕනෑම කාරණයක් සම්බන්ධයෙන් සාකච්ඡා කරන්නට අවශ්‍ය වන්නේ.

මෙතුමන්ලා කියපු විධියට ගරු ජනාධිපතිතුමාම ඊයේ ප්‍රකාශ කළා, නැව් තුනක් ලංකාවට එන්න පෙබරවාරි මාසයේ 26වැනි දා අවසර ඉල්ලුවා කියලා. ඇයි අපි ඒවාට අවසර ලබා දුන්නේ නැත්තේ? "අපේ රටට එන්න ඒ නැව් තුනට අවසර ලබා දුන්නා නම් මේ ප්‍රහාරය සිද්ධ වෙන්නේ නැහැ, එහෙම නම් අර මැරිච්ච 84දෙනාත් මැරෙන්නේ නැහැ" කියන එක තමයි විපක්ෂයේ තර්කය. ඒක තමයි ඒගොල්ලන් ගෙනෙන තර්කය. නමුත්, අපේ මේ තර්කයේ පදනම මොකක්ද? ඔවුන්ට තේරෙන්නේ නැහැ, අපි ඒ නැව්වලට එන්න දුන්නේ ඇයි කියන එක. ඒ නැව අපේ භාරයට ගත්තේ ඇයි, ඒ නාවිකයන් අපේ රට තුළට ගත්තේ ඇයි කියන කාරණය, ඒ පදනම නොතේරෙන නිසා තමයි ඔවුන් ඒ ප්‍රශ්නය අහන්නේ. ඇත්තටම neutral රටක් - මධ්‍යස්ථ රටක් - හැටියට අපි මේ යුදමය අවස්ථාවේ ඉරාන නැවක් හෝ ඇමෙරිකානු නැවක් හෝ යුද්ධයේ පාර්ශ්වකරුවෙකු වන කිසිම රටක නැවක් අපේ රට ඇතුළට ගන්නේ නැති එක තමයි neutrality කියලා කියන්නේ. ඒක තමයි neutrality; ඒක තමයි මධ්‍යස්ථභාවය. අපේ රට අපි යුදමය කටයුතු සඳහා පාවිච්චි කරන්න දෙන්නේ නැහැ. ගරු ජනාධිපතිතුමා බොහොම පැහැදිලිව ප්‍රකාශ කළා, අපි අපේ රට යුදමය කටයුතු සඳහා පාවිච්චි කරන්න දෙන්නේ නැහැ කියලා. එහෙම නම්, යුද නෞකාවක්, යුදමය කටයුතුවලට භාවිත කළ හැකි නෞකාවක් අපේ දේශ සීමාවට, අපේ මුහුදු සීමාවට ඇතුළු කර ගන්න කොට අපි ප්‍රවේශම්සහගත වෙන්න ඕනෑ. මොකද, යම් යම් රටවල් ඒක නිර්වචනය කරන්න පුළුවන්, අප neutrality කඩ කළා කියලා. විපක්ෂයේ සියලු දෙනාම දැන් මේ කථා කරන්නේ neutrality කියන සංකල්පය ගැන කිසිම තේරුමක් නැතිවයි. අපට neutrality කඩ කරන්න බැහැ. අපේ විදේශ ප්‍රතිපත්තිය තමයි නොබැඳි බව; මධ්‍යස්ථභාවය - neutrality. ඒකයි අපේ විදේශ ප්‍රතිපත්තිය. මම අවසානයේදී පැහැදිලි කරන්නම්, ඒක ඉරාන නාවිකයන්ටත් වාසිදායක වුණේ ඇයි කියලා.

ඇමෙරිකාව වේවා, ඉරානය වේවා, වෙනත් ඕනෑම රටක් වේවා මේ වෙලාවේ ගැටුම්කාරී තැනක ඉන්න රටවල් දෙකක් හෝ කිහිපයක් අතර යුද්ධයක් තිබෙන තත්ත්වයකදී ඒ ගැටුම්කාරී පාර්ශ්වයන්ගේ නැව් ලංකාවට නොගෙන්වා ගන්න එක තමයි හොඳම දේ. අපි ඒකට එකඟයි. ඒක තමයි neutrality කියන්නේ. එහෙම නම් මේ මාර්තු 04වැනි දා තිස්දෙදෙනෙකුත්, ඊයේ රාත්‍රි වනකොට තවත් 208දෙනෙකුත් අපි ලංකාව තුළට බාර ගන්නේ ඇයි? ඒ වාගේම, ඉරානයේ ඒ නැව ලංකාව භාරයට ගන්නේ ඇයි? අපි ත්‍රිකුණාමලය වරායේ ඒ නැව රඳවන්නේ ඇයි? මොකක්ද හේතුව? මාර්තු 04වැනි දා උදේ ඉන්දියන් සාගරයේදී - ලංකාවේ මුහුදු සීමාවේදී නොවෙයි - ඇමෙරිකානු සබ්මැරීනයක් ඉරානයට අයත් එම නැවට ප්‍රහාරයක් එල්ල කරනවා. ඒ අනුව එම නැවේ හිටපු පිරිස distress call එකක් ලංකාවට එවනවා. Distress call එකක් කියන්නේ මොකක්ද? Distress call එකක් කියන්නේ SOS පණිවුඩයක් වාගේ දෙයක්. "අපේ නැව අනතුරේ තිබෙන්නේ. අපේ නාවිකයෝ අනතුරේ ඉන්නේ. ඒ අනතුරේදී අපට උදව් කරන්න" කියන දේ තමයි distress call එකකින් කියන්නේ. මාර්තු 04වැනි දා උදේ ඒ නැව ප්‍රහාරයට ලක් වුණාම ඔවුන්

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

ලංකාවට distress call එකක් එවනවා. Hague Convention එක යටතේ අපි, ඕනෑම neutral රටක්, යුද්ධයට පාර්ශ්වකරුවෙකු නොවන රටක් බැඳී සිටිනවා, distress call එකක් ආවාම ඒ නැවට ගිහිල්ලා ඒ නාවිකයන් බේරා ගන්න. ඒක තමයි ජාත්‍යන්තර නීතිය. Neutral party එකක් විතරක් නොවෙයි, ප්‍රහාරය එල්ල කරපු රටත් බැඳී සිටිනවා, නැවේ සිටින නාවිකයන් බේරා ගන්න. අපි ඒක මතක තියා ගන්න ඕනෑ.

බලවත් රටවල් තමන්ගේ ඒ නීතිමය වගකීම් ඉටු නොකරද්දී, ලංකාවේ නාවික හමුදාව තමන්ගේ නීතිමය වගකීම ඉෂ්ට කරනවා. ඔවුන් ගිහිල්ලා මේ distress වෙලා ඉන්න, එහෙම නැත්නම් අනතුරට පත් වෙලා ඉන්න නාවිකයන් ලංකාව තුළට අරගෙන එනවා. ඒක තමයි අප කරන්නේ. ඒක කරන්න පුළුවන් වෙන්නේ ඇයි? අපි neutral රටක් හින්දා; අපි මධ්‍යස්ථ රටක් හින්දා. අපි මේ රටවල් එක්ක පාර්ශ්වකරුවෙකු වෙලා හිටියා නම් අපි වෙනත් තැනක ඉන්නේ. නමුත්, අපි neutral රටක්, මධ්‍යස්ථ රටක්. ඒ අනුව අපි අපේ වගකීම ඉෂ්ට කරනවා. ඒ පදනමින්ම තමයි අපි ඊයේ දවසේදී "IRIS Dena" නැවේ තිස්දෙදෙනා බේරාගෙන ආවේ. ඒ වාගේම, "IRIS Bushehr" නැවේ සිටි 208 දෙනාවත් අප රට තුළට අරගෙන ආවේ, නැවත් අපේ භාරයට ගත්තේ මෙන්න මේ distress call එකට ප්‍රතිචාර දක්වමින්. ඒ කියන්නේ, නැව අනතුරට පත් වී තිබෙනවා, ඒ අනතුරට පත් වී තිබෙන පදනම මත අපි රට තුළට නාවිකයන් සහ නැව භාර අරගෙන ඔවුන් ආරක්ෂා සහිත ලෙස රඳවා ගන්නවා.

ඉරානයේ ඒ නාවිකයන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීමට - 32දෙනෙකුගේ සහ 208දෙනෙකුගේ ජීවිත ආරක්ෂා කර ගැනීමට - උදවු වෙන්නේ, ඒකට දායක වෙන්නේ ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය තමයි. ඒ නොබැඳි ප්‍රතිපත්තිය, ඒ මධ්‍යස්ථභාවය, අප යුද්ධයේ පාර්ශ්වකරුවෙකු නොවීම නිසා තමයි ඒ නැවට මෙහේට එන්න පුළුවන් වුණේ; ඔවුන්ගේ ආරක්ෂාව සලසා ගන්න පුළුවන් වුණේ. අපේ විදේශ ප්‍රතිපත්තියයි ඔවුන්ට උදවු වෙන්නේ. මෙන්න මේ කාරණය තේරුම් ගන්න ඕනෑ.

අපේ මේ විදේශ ප්‍රතිපත්තිය මොකක්ද, අප ඒ නැවට එන්න දුන්නේ මොන පදනම මතද, ඉරානයේ නැවක් හෝ ඇමෙරිකාවේ නැවක් මෙතැනින් යනකොට ඇතුළට ගන්නවා කියන්නේ මොකක්ද, ඒකෙන් එන්න පුළුවන් ප්‍රතිඵල මොනවාද, ඉරානයේ නැවක් රට ඇතුළට ගත්තාම ඇමෙරිකාව ඒක දකින්නේ කොහොමද, ඇමෙරිකාවේ නැවක් රට ඇතුළට ගත්තාම ඉරානය ඒක දකින්නේ කොහොමද, එහෙම වුණාම අප ගැටුමේ පාර්ශ්වකරුවෙකු බවට පත් වෙනවාද කියන කාරණා තේරුම් ගන්න ඕනෑ. මේ කිසිම දෙයක් ගැන කිසිම අදහසක් නැතුව විපක්ෂය මෙතැනට ඇවිල්ලා කථා කරන්නේ, අපි ගහලා ඉරානයේ නැවක් ගිල්ලුවා වාගෙයි. ඔබතුමන්ලා කියන්නකෝ, කවුද ඒ නැවට ගැහුවේ කියලා. ඒක කියන්නේ නැහැ. අපි ගහලා ඒ නැව ගිල්ලුවා වාගේ මෙතැනට ඇවිල්ලා බොරුවට කෑ ගහනවා. මොකක්ද මේ අහවන්න හදන්නේ? මේ අහවන්න හදන දේ තේරුම් ගන්න.

මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඊයේ පාර්ලිමේන්තුවේ කරපු කථාව අද ඉන්දියාවේ සමාජ මාධ්‍යවල viral වෙලායි තිබෙන්නේ. මිලියනයකට අධික පිරිසක් බලලා තිබෙනවා, ඒ tweet එක. මොකක්ද ඒකෙන් කියන්නේ? බේරා ගන්න පුළුවන් වෙලාවේ අපි එය බේරා ගත්තේ නැහැ කියලා කියනවා. අද ඉන්දියාවේ newspapersවල ඒ news එක යනවා. මෙච්චර වීර ක්‍රියාවක් ලංකාවේ නාවික හමුදාව කරලාත්, මෙච්චර අවදානමක් අරගෙන, අප මෙච්චර විශිෂ්ට විදේශ ප්‍රතිපත්තියක් ලෝකයට පෙන්වලාත්, අප මනුෂ්‍යත්වය මත පදනම්ව කටයුතු කරලාත්, විපක්ෂයේ හැසිරීම නිසා අපට අවසානයේ කළු පැල්ලමක් - black mark එකක් - ඇවිල්ලා නැද්ද? එහෙම වෙන්නේ, විපක්ෂයේ අය බොරු කියපු හින්දා නේ. ළමයි 300ක් හිටියා ලු. අපි පැය 11ක් ඒක තියාගෙන හිටියා ලු. කවුද මේවා කියන්නේ? මේවා විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා ඇවිල්ලා කියන කතන්දර. ඇයි අප එය ගත්තේ, මොන අවස්ථාවේද ගන්න පුළුවන්, මොන පදනමින්ද අප එය ගත්තේ කියන කාරණා අපි තේරුම් ගන්න ඕනෑ. ඒක මානුෂීය තීරණයක්. අපේ රටේ ජනතාව ජීවත් වන, අප අනෙකුත් රටවල් සමඟ බෙදා ගන්නා ඉන්දියන් සාගරයේදී මනුෂ්‍යයෙකු අප බලාගෙන සිටිද්දී මැරෙන්නේ නැහැ කියන කාරණයට මේ අවස්ථාවේ අප මැදිහත් වුණේ, ගරු ජනාධිපතිතුමා, නාවික හමුදාව, ලංකාවේ ආණ්ඩුව ඉතාම දක්ෂ ලෙස ජාත්‍යන්තර නීතිය සහ අපේ විදේශ ප්‍රතිපත්තිය හසුරුවපු නිසා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, කාලය අවසන්.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව පොඩි වෙලාවක් දෙන්න, කථාව අවසන් කරන්න.

අවසාන කාරණය මේකයි. ඉන්දියන් සාගරය කියන්නේ සාම කලාපයක්. ඉන්දියන් සාගරය සාම කලාපයක් කියන අදහස අප තමයි රටක් හැටියට ඉදිරිපත් කරන්නේ. එය එක්සත් ජාතීන්ගේ සම්මුතියක්; Resolution එකක්. එහෙම නම්, ඉන්දියන් සාගරය තුළ කිසිදු නැවකට ප්‍රහාරයක් එල්ල වෙන්න බැහැ. ඒක තමයි ඇත්ත කථාව. නමුත් රටක් හැටියට ඒක නවත්වන්නට තරම්, ඉන්දියන් සාගරය ආරක්ෂා කිරීම ලංකාවේ වගකීම කර ගන්නට තරම් අපට naval fleet එකක් ඇත්තේ නැහැ; නාවිකයන් ඇත්තේත් නැහැ; ඒ මිලිටරිමය හැකියාව ඇත්තේත් නැහැ. සමස්ත ඉන්දියන් සාගරයේ ආරක්ෂාව සපයා ගන්න අපට අපේ රටට තිබෙන මිලිටරිමය හැකියාවේ අඩුවක් තිබෙනවා. අඩුවක් තිබෙනවා කියන්නේ, අප එහෙම ගොඩනැගිච්ච රටක් නොවෙයි. ඒක නේ ඇත්ත කථාව. අපට අපේ මුහුදු සීමාව ආරක්ෂා කර ගන්න පුළුවන්. අපට අපේ EEZ එක ආරක්ෂා කර ගන්න පුළුවන්. නමුත් මේ අවස්ථාවේදී අපට සමස්ත ඉන්දියන් සාගරය ආරක්ෂා කළ නොහැකියි. ඒක කරන්න ඕනෑද කියන එකත් ප්‍රශ්නයක්. හැබැයි අපට පුළුවන්, මනුෂ්‍යත්වය පෙන්වන්න. මිලිටරිමය මැදිහත්වීමක් කරන්න අපට බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අපට මිලිටරිමය මැදිහත්වීමක් කරන්න බැරි නමුත් මානුෂීය මැදිහත්වීමක් කළ හැකියි. අප ඒ මැදිහත්වීම තමයි කරලා තිබෙන්නේ. ජාත්‍යන්තර නීතියට මානුෂීයත්වය ඉතාම ඉහළ මට්ටමින් පෙන්වීම තමයි අප කරලා තිබෙන්නේ. ඒක අගයන්න බැරි විපක්ෂයක් තමයි ඉන්නේ. අපේ විපක්ෂය කියන දේවල් සමහර රටවල් පාවිච්චි කරනවා. ඒවා අපට විරුද්ධවත් පාවිච්චි

කරනවා, සමහර සමාජ මාධ්‍යවලත්. ඒක තේරෙන්නේ නැතුව මේගොල්ලන් රටට ද්‍රෝහී ලෙස ක්‍රියා කරනවා. මෙච්චර විශිෂ්ට වැඩක් කරලාත්, ජනාධිපතිතුමා කරපු දේ හෝ නාවික හමුදාව කරපු දේ හෝ අප රටක් හැටියට කීර්තියට පත්වීම, ප්‍රසාදයට පත්වීම හෝ පිළිගන්නේ නැතුව අපි ඇමෙරිකාවත් එක්ක එකතු වෙලා ඉරාන නැව ගිල්වූ සයිස් එකට තමයි මෙතැන ඇවිල්ලා කථා කරන්නේ. ඉතාම කනගාටුදායකයි! අපි දැඩිව ප්‍රතික්ෂේප කරනවා, ඒ කතන්දරය. අපි කියන්න කැමැතියි, රටක් හැටියට අමාරුම වෙලාවේදී අපි මනුෂ්‍යත්වය ඉහළටම ඔසවා තිබෙන බව. ලංකාව අද වනකොට මානුෂීය ජාතියක්. ඒ credit එක අපි හැමෝම බෙදා ගත යුතුයි; රටක් හැටියට බෙදා ගත යුතුයි. ජනතාව ඒ ගැන ආඩම්බර විය යුතුයි. අපි ඒ ආඩම්බරයෙන් ජීවත් වෙමු. මේ විපක්ෂයේ විකාරවලට නම් ඇහුම්කන් දෙන්න එපා කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.28]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த அவசரகாலச் சட்ட நீடிப்பு விவாதத்தின் முடிவில் நாங்கள் ஒரு வாக்கெடுப்பைக் கோரி, அந்த நீடிப்புக்கெதிராக எங்களுடைய வாக்குகளைச் செலுத்தவிருக்கின்றோம் என்பதை முதலில் குறிப்பிட விரும்புகின்றேன். ஏனென்றால், இந்த அவசரகாலச் சட்ட நீடிப்பு என்பது உண்மையிலேயே நியாயப்படுத்த முடியாத ஒரு காரியம்; இன்றைக்கு அவசரமாக விடயங்களை அணுகுவதற்கான எந்தவொரு தேவையும் இல்லை. சில சம்பவங்கள் நடைபெற்ற காலத்தை அண்டிய நாட்களின்போது இந்தச் சட்டம் தேவைப்பட்டது என்பதில் மாற்றுக் கருத்தில்லை. அப்போது நாங்கள்கூட அரசாங்கத்திடம் அவர்கள் அவசரகாலச் சட்டத்தைப் பிரகடனப்படுத்தப்படாமல் இருந்த நேரத்தில் அதைப் பிரகடனப்படுத்துமாறு கேட்டிருந்தோம். ஆனால், சூறாவளியைக் காரணம் காட்டிக் கொண்டுவரப்பட்ட அவசரகாலச் சட்டத்தை, அதற்குப் பல மாதங்களுக்குப் பிற்பாடும் தொடர்ந்து நீடிப்பதற்குச் சொல்கின்ற நியாயங்கள் ஏற்றுக்கொள்ளப்பட முடியாதவை.

உண்மையிலேயே நீங்கள் இன்று இந்த அவசரகாலச் சட்டத்தை நீடிப்பதற்கான பிரதான காரணம், ஜனநாயக ரீதியாக மக்களும் அரச உத்தியோகத்தர்களும் செயற்படுவதைத் தடுப்பதாகும். அதற்காக, எத்தனையோ மாதங்களுக்கு முன்பு ஏற்பட்ட ஒரு சூறாவளியைக் காரணங்காட்டி இந்த அவசரகாலச் சட்டத்தைத் தொடர்ந்தும் நீங்கள் பயன்படுத்துகிறீர்கள் என்பதுதான் உண்மை. எங்களைப் பொறுத்தவரையில், இந்தத் தேசிய மக்கள் சக்தி அரசாங்கம் மக்களின் புரட்சியால், அரச அதிகாரத் துஷ்பிரயோகங்கள் நடைபெறக் கூடாதென்று வெறுப்படைந்த தெற்கிலே வாழ்கின்ற சிங்கள மக்கள், அடிப்படை மாற்றமொன்று அவசியமென நினைத்து உங்களுக்கு வாக்களிக்களித்ததால் உருவானதாகும். இவர்களாவது ஏதோவொரு வகையில் மாற்றத்தைச் செய்யவார்களா என்ற எதிர்பார்ப்போடு இந்த அரசாங்கத்துக்கு நம்பி வாக்களித்த மக்களுக்கு இன்று நீங்கள் செய்யும் வயிற்றிலடிக்கின்ற பல செயற்பாடுகளில் ஒரு மோசமான செயற்பாடாகவே இதனையும் நாங்கள் பார்க்கின்றோம்.

நாங்கள் இந்த அவசரகால நீடிப்பை எதிர்ப்பதற்கு இன்னுமொரு பிரதான காரணம் இருக்கின்றது, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இந்த அவசரகாலச் சட்டம் பிரகடனப்படுத்தப்பட்ட சூழலிலேதான் தமிழர்களுக்கு எதிரான ஓர் இன அழிப்பு இந்த நாட்டிலே நடைபெற்றது. போர்க்காலம் முழுவதும் இந்த அவசரகாலச் சட்டம் பிரகடனப்படுத்தப்பட்ட ஒரு சூழலில்தான் அநியாயமாகப் பொதுமக்கள் படுகொலை செய்யப்பட்டார்கள். எந்தவிதமான பொறுப்புக்கூறலும் இல்லாத ஒரு கலாசாரம், இராணுவம் உட்பட முப்படையினராலும் பொலிசாராலும் கடைப்பிடிக்கப் பட்டது. அதே இராணுவம்தான் இன்றைக்கும்கூட வடக்கு, கிழக்கில் இருக்கின்றது. எந்தவோர் இராணுவச் சிப்பாய்க்கும் எதிராகக்கூட பொறுப்புக்கூறல் சம்பந்தமாக எந்தவொரு நடவடிக்கையும் எடுக்காத நிலையில், மாறாக ஸ்ரீலங்கா அரசு அவர்களைப் பாதுகாக்கும் என்ற வாக்குறுதிகள் தொடர்ச்சி யாக வழங்கப்பட்டுக் கொண்டிருக்கின்றதொரு சூழலில், அந்த அநியாயங்களை நடத்துவதற்குப் பின்னணியாக இருந்த அவசரகாலச் சட்டம் இன்றைக்கும் நீடிக்கப்படுகின்றது. Security sector reforms எதுவுமே நடக்காதவொரு சூழலில், இந்த அவசரகாலச் சட்டம் நீடிக்கப்படுவதன் காரணமாக இன்றைக்கு வட, கிழக்கிலே அப்பாவி மக்கள் குறிவைக்கப் படுகின்ற ஓர் அபாய நிலையில் இருக்கின்றார்கள்.

அல்லைப்பிட்டியில் நடைபெற்ற சம்பவத்தை எடுத்துப் பார்த்தால், மாடு கடத்தினார்கள் என்ற குற்றச்சாட்டை அதற்காக முன்வைக்கப் பார்க்கிறார்கள். அவர்கள் சொல்வதுபோலவே நடந்ததாக வைத்துக்கொள்வோமே! அப்படி நடந்திருந்தாலும்கூட யுத்தமில்லாத ஒரு காலகட்டத்தில் ஒருவரை அவ்வாறு கொல்ல முடியுமா? தெற்கில் இது நடைபெற்றிருக்குமா? இது ஏன் நடைபெறு கின்றதென்றால், அது ஒரு கலாசாரமாக மாறியிருக்கிறது. அவகரகாலச் சட்டம் நடைமுறையில் இருக்கின்றபொழுது முப்படைகளும் பொலிசாரும் தாங்கள் விரும்பியதைச் செய்யலாம்; தாங்கள் பாதுகாக்கப்படுவோமென்ற ஒரு நம்பிக்கை அவர்களுக்கு இருக்கிறது. உங்களுக்குச் சிலவேளை இங்கே தெற்கில் எதிர்ப்பு நடவடிக்கைகள் நடக்கக் கூடாது, அதைக் கட்டுப்படுத்த வேண்டும், ஏதோவொரு வகையில் ஜனநாயகத்தை மறுக்க வேண்டும் என்ற எண்ணம் இருக்கலாம். அவ்வாறு நினைத்து இந்த முடிவுகளை எடுக்கலாம். ஆனால் வடக்கு, கிழக்கில் இது உயிர் சம்பந்தப்பட்ட விஷயம்! ஆகவே, நாங்கள் இதைக் கடுமையாக எதிர்க்கின்றோம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
මම අවසන් කරනවා.

கடற்றொழிலுக்குப் பொறுப்பான அமைச்சர் இந்தச் சபையிலே இருக்கின்ற நேரத்திலே ஒரு விடயத்தைச் சொல்லி முடிக்க விரும்புகின்றேன். கடந்த புதன்கிழமை நான் பேசியபோது குறிப்பிட்டிருந்தேன், யாழ்ப்பாணத்தைச் சேர்ந்த இரண்டு மீனவர்கள் அவர்களுடைய படகு பழுதடைந்த

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

நிலையில் கச்சதீவை அண்டிய பிரதேசத்தில் காணாமற் போனார்கள் என்று. கடந்த வெள்ளிக்கிழமை அது நடந்தது. அவர்களை இந்தியக் கடற்படையினர் காப்பாற்றி மண்டபம் முகாமிற்குக் கொண்டு சென்றிருக்கிறார்கள் என்று இன்றைக்கு எங்களுக்கு உறுதிப்படுத்தப்பட்ட தகவல் கிடைத்திருக்கிறது. ஆனாலும், அவர்கள் இன்னமும் இலங்கைக்குத் திருப்பி அனுப்பப்படவில்லை; அவர்களுடைய படகும் விடுவிக்கப் படவில்லை. அவர்கள் செய்தது ஒரு சட்டவிரோதமான செயல் அல்ல; அதைத்தான் இங்கு சொல்ல வருகிறேன். ஆகவே, கௌரவ அமைச்சர் அவர்கள் அதனைச் சரியான கோணத்தில் விளங்கிக்கொண்டு, அவர்களுக்கு எதிராக இந்தியாவில் வழக்குகள் எதுவும் தாக்கல் செய்யப்படாமல், அவர்களுடைய படகு மற்றும் சொத்துகள் அனைத்தையும் இங்கு பாதுகாப்பாகக் கொண்டுவந்து சேர்க்க அரசாங்க ரீதியில் தலையிட வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன். ஏனென்றால், படகு பழுதாகிய காரணத்தினால்தான் அவர்கள் இந்திய கடற்பரப்பினுள் நுழையவேண்டி வந்தது; அது உறுதிப்படுத்தப் பட்டிருக்கின்றது. அப்படிப்பட்ட ஒரு சூழலிலே கௌரவ அமைச்சர் அவர்கள் அதில் தலையிட்டு அதையாவது செய்து கொடுக்க வேண்டுமென்று நான் கேட்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.34]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි මේ අවස්ථාව ලබා දුන්නාට.

හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳව විවාද කරන මේ මොහොතේ, සාමාන්‍ය නීතිය යටතේවත් තමන්ට පැවරුණු කටයුතු ඉෂ්ට නොකරන ආණ්ඩුවක් හදිසි නීතිය පනවලා ඒ කටයුතු කරයි කියන විශ්වාසය අපි තුළ නැහැ කියන කාරණය පළමුව සිහිපත් කරන්න ඕනෑ. පසුගිය කාලයේ හදිසි නීතිය පැනවීම තුළින් "දිට්වා" සුළි කුණාටුවෙන් අවතැන් වුණු ජනතාවට යුක්තිය, සාධාරණය, ඉටු වුණාද කියන ප්‍රශ්නයත් අපි මේ ආණ්ඩුවට යොමු කරනවා. මීට පෙර කථා කරපු කථික මහත්වරුත්, අතිගරු ජනාධිපතිතුමාත්, ඒ වාගේම මේ ආණ්ඩුවේ සෞඛ්‍ය ඇමතිතුමා වන නලින්ද ජයතිස්ස මැතිතුමාත් විපක්ෂයට යෝජනා කළා, වගකීම් සහිත විපක්ෂයක් විධියට කටයුතු කරන්න කියලා. වගකීම් විරහිත කථා කියන්න එපා, අර්ධ සත්‍ය දේවල් කියන්න එපා, හිතලු කියන්න එපා, වෛරය පිරිමහගන්න දේවල් කියන්න එපා, දේශපාලනමය වශයෙන් වාසිගන්න විධියට කථා කරන්න එපා කියලා තමයි ජනාධිපතිතුමාත්, නලින්ද ජයතිස්ස මැතිතුමාත්, මීට පෙර කථා කරපු කථික මහත්වරුත් කිව්වේ. නමුත් මම අහනවා, මේ ආණ්ඩුවේ අයට එහෙම කියන්න අයිතියක් තිබෙනවාද කියන කාරණය.

අපට මතකයි, මේ ආණ්ඩුව විපක්ෂයේ ඉන්නකොට ඒ දවස්වල කටයුතු කරපු ආකාරය. "ඔබාමා ලොක්කට එන්න කියාපිය, මේවාට උත්තර දෙන්න කියාපිය" කියලා තමයි එදා නලින්ද ජයතිස්ස මැතිතුමා, විජිත හේරත් මැතිතුමා ඇතුළු මේ ආණ්ඩුවේ ඉදිරි පෙළ ඉන්න අනෙකුත් මැති ඇමතිවරු කථා කළේ. එතුමන්ලා ඇමෙරිකානු තානාපති කාර්යාලය ඉදිරිපිටට ගිහිල්ලා "ඔබාමා ලොක්කට එන්න කියාපිය, මේවාට උත්තර දෙන්න කියාපිය" කියලා තමයි කිව්වේ. අද ඒවා එතුමන්ලාට අමතක වෙලා. මැද පෙරදිග විවිධ යුද්ධ තිබෙන වෙලාවේ එතුමන්ලා එදා පැවැති ආණ්ඩුවලට යෝජනා කළා, ඒ යුද්ධවලට විරුද්ධව පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත කරන්න කියලා, ඒ යුද්ධවලට විරුද්ධව විරෝධතා දක්වන්න කියලා. එතුමන්ලා විපක්ෂයේ ඉන්නකොට එහෙම කිව්වාට, අද විපක්ෂයක් විධියට අපි ඒ විධියට කටයුතු කරන්නේ නැහැ කියන කාරණය ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ. අපි දන්නවා, මේක රාජ්‍ය තාන්ත්‍රික ප්‍රශ්නයක් කියලා. රටක් ගනුදෙනු කරනකොට, ඒ ගනුදෙනු කරන්න ඕනෑ ආකාරය පිළිබඳව අපට හොඳ වැටහීමක් තිබෙනවා. එම නිසා අපි ආණ්ඩුව අපහසුතාවට පත් කරමින් කථා කරන්නේ නැහැ කියන කාරණයත් මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ.

ඒ වාගේම නෞකා දෙකක හිටපු ඉරාන ජාතිකයන් බේරාගන්න ගත්තු උත්සාහයට, ඒ කැප කිරීමට අපි මේ ආණ්ඩුවේ සියලුදෙනාට අපේ ස්තුතිය පුද කරන්න ඕනෑ. ඒ වාගේම අපි ගාලු ජනතාවටත් ස්තුතිවන්ත වෙනවා. අපි දැක්කා, ඒ සිද්ධිය වුණාම රජය ඒ කටයුත්තට මැදිහත් වෙලා ඒ රෝගීන් කරාපිටිය රෝහලට ගෙනාපු අවස්ථාවේදී කරාපිටිය රෝහලේ වෛද්‍යවරු ඇතුළු ගාලු ජනතාව මේ රටට ඉතාම හොඳ ආදර්ශයක්, පණිවුඩයක් ලබා දුන් බව. කෘතවේදී ජනතාවක් විධියට ගාල්ලේ ජනතාව ඒ යුතුකම ඉටු කළාය කියන කාරණයත් මේ මොහොතේ මම සිහිපත් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මැද පෙරදිග කලාපය තමයි අපේ ප්‍රධානම තේ ගැනුම්කරුවා. අද ඒ රටවල ඇති වෙලා තිබෙන අර්බුදය එක්ක අපේ රටේ තේ කර්මාන්තයට, විශේෂයෙන්ම කුඩා තේ වතු හිමියන්ට කොයි වාගේ බලපෑමක් එල්ල වෙයිද කියන සැකයකින් තමයි ඒ ගොවි මහත්වරු කටයුතු කරන්නේ. මේ ආණ්ඩුව ඒකට පැහැදිලි පිළිතුරක් තවම දීලා නැහැ. ඒත් එක්කම කියන්න ඕනෑ, මේ කාරණයත්. මා නියෝජනය කරන දකුණු පළාතේ, ඒ වාගේම සබරගමුව පළාතේ ජනතාව වැඩි වශයෙන් කුඩා තේ වතු කර්මාන්තයේ යෙදී සිටිනවා, අද ඔවුන් දැඩි දෙගිඩියාවකින් පසු වෙනවා, අමු තේ දලුවලට තිබෙන ඉල්ලුම අඩු වෙයිද කියලා. එම නිසා එවැනි අවදානමක් ඇති වෙන්න පුළුවන්ද, එවැනි අවදානමක් ඇති වුණොත් ආණ්ඩුවේ තිබෙන සැලසුම මොකක්ද කියන කාරණයත් ආණ්ඩුවක් විධියට ඔබතුමන්ලා මේ සභාව හමුවේ කිව යුතුයි කියන කාරණයත් මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ.

ඊළඟට, අපට මේ ආණ්ඩුවෙන් අහන්න ප්‍රශ්නයක් තිබෙනවා. අපට මතකයි, ඇමෙරිකාව ආර්ථික සම්බාධක පනවපු වෙලාවේ ඔබේ ආණ්ඩුවේ ජනාධිපතිවරයා මේ පාර්ලිමේන්තුවටත් කියන්නේ නැතිව, ඔබටවත් කියන්නේ නැතිව ඇමෙරිකාවත් සමඟ ආරක්ෂක ගිවිසුමක් අත්සන් කළ බව. ඇමෙරිකාව සමඟ ගහපු ඒ ආරක්ෂක ගිවිසුම්වල තිබුණේ මොන කොන්දේසිද, ඔබ එකඟ වුණේ මොනවාටද, මොන කාරණාවලටද ඔබ එකඟ වෙලා තිබෙන්නේ කියන එක මේ පාර්ලිමේන්තුව හමුවේ කියන්න ඕනෑ. ඒක, ඔබතුමන්ලාවත් දන්නේ නැහැ. මොකද, ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා තමයි ඇමෙරිකාවත් සමඟ ගිවිසුම් ගැහුවේ. අපි ඒ පිළිබඳව ඔබතුමන්ලාගෙන් විමසන්න, දැනගන්න කැමැතියි කියන කාරණයත් මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ.

විපක්ෂය විධියට අපි ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරන්න කැමැතියි, අපේ අපනයන භාණ්ඩවලට - තේ, ඇඟලුම් නිෂ්පාදන ආදියට - ඉදිරියේදී යම් යම් ප්‍රශ්න මතුවෙන්න පුළුවන් කියන කාරණය. ඒ වාගේම ඉන්ධන සහ ගෑස් ආනයනයටත්

යම්කිසි බාධා ඇති වෙන්න පුළුවන්. සංචාරක ව්‍යාපාරයට වාගේම මේ රටේ ආර්ථිකයටත් යම් යම් බලපෑම් ඇතිවෙන්න පුළුවන්. අපි ඒ දේවල් පිළිබඳව කථා කරන්නේ සතුටින් නොවෙයි. අපි මේ මොහොතේදී ඉතාම ගෞරවයෙන් ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, ඒ පිළිබඳව මීට වඩා අවධානය යොමු කරලා කටයුතු කරන්න කියලා.

එසේම රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු ප්‍රධානී සලේ මහතාව අත්අඩංගුවට ගැනීම පිළිබඳවත් මම කථා කරන්න ඕනෑ. එතුමා, මේ රටේ ත්‍රස්තවාදය නැති කරන්න බුද්ධි නිලධාරියෙක් විධියට සුවිශේෂී කාර්යභාරයක් ඉෂ්ට කරපු නිලධාරියෙක්. රටක බුද්ධි අංශය කඩාගෙන වැටුණාම ඒ රටට සිද්ධ වෙන්නේ මොකක්ද කියලා අපි දන්නවා. ඉරානයට යම් යම් ප්‍රහාරවලට ලක්වෙන්න සිද්ධ වුණේ, බුද්ධි අංශයෙන් සිදු වුණු අතපසුවීම් නිසායි. අපේ රටේ බුද්ධි අංශයේ කටයුතු කරන නිලධාරීන් යම්කිසි අපහසුතාවකට පත්වෙමින් සිටිනවා. මේ රටේ බුද්ධි අංශයේ කටයුතු කරපු විශිෂ්ට නිලධාරීන්ට අත්වෙන ඉරණම මේකද කියලා හිතන තැනට අද රට පත්වෙලා තිබෙනවා. ඔබතුමන්ලාගේ පක්ෂයේ ජාතික ලැයිස්තුවෙන් යෝජනා වුණු ඊබ්‍රාහිම් මහතාට පාස්කු ප්‍රහාරයට සෘජු සම්බන්ධතාවක් තිබුණා. ඔබතුමන්ලාගේ පක්ෂයේ ජාතික ලැයිස්තු අපේක්ෂකයා විධියට ඉදිරිපත් වුණු ඊබ්‍රාහිම් මහතාට චෝදනා එල්ල වී තිබියදීත් එතුමාව නිදහස් කරලා තිබෙනවා. ඒ වාගේම එදා, නැඟෙනහිර හිටපු ආඥාපති ලෙස කටයුතු කරපු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිවරයාටත් චෝදනාවක් එල්ල වුණා. ඒ වාගේම මේ වෙනකොට CID එකේ ලොක්කා බවට පත් වී සිටින ශානි අබේසේකර මහතාටත් චෝදනා එල්ල වුණා. ඒ වාගේම රවී සෙනෙවිරත්නට - ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට - චෝදනා එල්ල වුණා. එහෙම චෝදනා එල්ල වුණු කණ්ඩායමක් තමයි අද පාස්කු ප්‍රහාරයේ වූදිතයන් සෙවීමට කටයුතු කරන්නේ. අද මේ සිදු කරන්නේ එල්ටීටීඊ හිතවාදී ඩයස්පෝරාව සතුටු කිරීමද කියන කාරණය අපි මේ ආණ්ඩුවෙන් අහනවා. මේ රටේ කතෝලික ජනතාව බලාපොරොත්තු වෙන්නේ පාස්කු ප්‍රහාරයට සම්බන්ධ සැබෑ වගකිව යුත්තන් ඇල්ලීම බව අපි කියන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට වැඩිපුර විනාඩියක කාලයක් ලබා දෙන්න කියලා ඔබතුමියගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඊයේ දවසේ කාන්තා අයිතිවාසිකම් පිළිබඳව කථා කළා. මේ පාර්ලිමේන්තුව වැඩිම කාන්තා නියෝජනයක් සහිත පාර්ලිමේන්තුවක් වීම ගැන අපි සතුටු වෙනවා. ඔබතුමිය මූලාසනයේ සිටින වෙලාවේ කාන්තාවකට සිදුවුණු අසාධාරණයක් පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරවන්න කැමැතියි. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවය කරන ඩී.ඩී.එස්. සෙනෙවිරත්න නම් සහකාර ආරක්ෂක කාන්තා නිලධාරිනියව ගාල්ලේ සිට සපුගස්කන්දට ස්ථාන මාරු කර තිබෙනවා. එතුමිය මාස කිහිපයකට පෙර තමයි සපුගස්කන්දේ සිට ගාල්ලට ස්ථාන මාරුවීමක් ලබා තිබුණේ. හැබැයි, එතුමියව නැවත වරක් ගාල්ලේ සිට සපුගස්කන්දට ස්ථාන මාරුකර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඛේදනීයම තත්ත්වය නම් ඔටිසම් රෝගයෙන් පෙළෙන අවුරුදු 3ක් වයසැති දරුවෙක් එතුමියට සිටීමයි. කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කරන රජයක් හැටියට ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
අවුරුදු 50ට වැඩි කාන්තා පොලිස් නිලධාරිනියන් යාපනය වැනි දුෂ්කර දිස්ත්‍රික්කවලට මාරු කර යවා තිබෙනවා. ඔවුන්ගේ කාකි ඇඳුමට යටින් ඉන්නේ මවක්. ඔබතුමන්ලා කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින ආණ්ඩුවක් විධියට එම කාන්තා පොලිස් නිලධාරිනියන්ට තමන්ගේ නිවසේ සිට පහසුවෙන් සේවා ස්ථානයට යාමට හැකි - යන්න පුළුවන් දුරකින් - සේවා ස්ථානයක් ලබා දෙන්න කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා. මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක් කාලයක් තිබෙනවා.

[පි.ව. 4.44]

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று காலையிலிருந்து இங்கு பேசப்படுகின்ற முக்கியமான விடயமாகக் காணப்படுவது நாட்டில் அவசரகாலச் சட்டத்தை நீடிப்பது தொடர்பான விவாதமாகும். எங்கள் எல்லோருக்குமே தெரியும், கடந்த வருடம் ஏற்பட்ட 'தித்வா' புயலானது நாங்கள் யாருமே எதிர்பார்க்காதவொரு சந்தர்ப்பத்தில் ஏற்பட்டதென்று. அதன்போது நாம் பல்வேறு இன்னல்களைச் சந்தித்தோம்; சுமார் நூற்றுக்கணக்கான உயிரிழப்புகள் நமது நாட்டில் ஏற்பட்டன; பலர் காணாமல் போயுள்ளனர். அவ்வாறான சூழலில், எமது நாட்டில் ஒட்டுமொத்தமாக, 4.2 பில்லியன் அமெரிக்க டொலர் மதிப்புள்ள பெரும் பேரிழப்பை அது ஏற்படுத்தியிருந்தது. அந்தப் பேரிழப்பிலிருந்து எமது நாட்டை மீட்டெடுக்க வேண்டிய தேவையிருந்தது. அந்தத் தேவை கருதி, அதனைக் கருத்திற்கொண்டு இந்த அவசரகால நிலை பிரகடனப்படுத்தப்பட்டது. இதனைத் தொடர்ந்தும் நீடிப்பது எங்களுடைய அரசாங்கத்தினுடைய நோக்கமல்ல. அதாவது, அவசரகாலச் சட்டம் சம்பந்தமாக எடுத்துக் கொண்டாலும் சரி, பயங்கரவாத தடைச் சட்டம் சம்பந்தமாக எடுத்துக் கொண்டாலும் சரி, இந்தச் சட்டங்கள் எங்களுடைய நாட்டுகோ அல்லது எங்களுக்கோ உகந்ததல்ல. இவைகளை மாற்றியமைத்தே தீரவேண்டும் அல்லது அவை நீக்கப்பட வேண்டும் என்பதில் எந்தவிதமான மாற்றுக் கருத்தும் எங்களிடம் இல்லை.

அதேபோன்று எங்கள் எல்லோருக்குமே தெரியும், இந்த அவசரகாலச் சட்டம் பிரகடனப்படுத்தப்பட்டதற்கான பிரதான மான காரணம் வேறெதுவுமல்ல, 'தித்வா' புயலின்போது

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

ஏற்பட்ட நிலைமைகளே என்பது. ஆனால், அந்த 'தித்வா' புயலினால் ஏற்பட்ட தாக்கத்திலிருந்து மீண்டெழுந்து, அதனால் ஏற்பட்ட நிலைமைகளில் ஒரு மாற்றத்தை ஏற்படுத்தி வருகின்றபோது, இன்று நாங்கள் யாருமே எதிர்பார்க்காத இன்னுமொரு பிரச்சினையும் உருவாகியிருக்கின்றது. அதாவது, இன்று மத்திய கிழக்கு நாடுகளில் ஏற்பட்டிருக்கின்ற அசாதாரண சூழ்நிலை - யுத்த சூழ்நிலை! இந்த யுத்த சூழ்நிலையின் காரணமாக ஏற்பட்டுள்ள அசாதாரண நிலைமை யால் எங்களுடைய இந்து சமுத்திரப் பிராந்தியத்திலும்கூட பதற்றமானதொரு நிலைமை தோற்றம் பெற்றிருக்கின்றது. இவ்வாறு தோற்றம் பெற்றிருக்கின்ற இந்தப் பதற்றமான நிலைமை தொடர்பாக எங்களுடைய நிலைப்பாட்டை அல்லது எங்களுடைய கருத்தை நாங்கள் சரியான முறையில் முன்வைக்க வேண்டிய தேவையிருக்கின்றது.

எங்கள் எல்லோருக்குமே தெரியும், யுத்தம் என்பது கொடியது; அதில் மாற்றுக் கருத்துக் கிடையாது. அது மனிதாபிமானம் அற்றது என்பதிலும் மாற்றுக் கருத்துக் கிடையாது. இருந்தபோதிலும்கூட இந்த மனிதாபிமானமற்ற யுத்தத்தின்பொழுது பாதிக்கப்படுகின்ற மக்களை மீட்கக் கூடியவர்கள் அல்லது அவர்களுக்கு உதவி செய்யக் கூடியவர்கள் மனிதாபிமானிகள் ஆவர். இன்றைக்கு இந்த இந்து சமுத்திரப் பிராந்தியத்திலே பெரிய ஜாம்பவான்கள் இருக்கின்றபோதும்கூட, உண்மையிலே அந்த மனிதாபிமான நடவடிக்கைகளுக்குக் கரம் கொடுக்கின்ற ஓர் அரசாங்கமாக நாங்கள் மாறியிருக்கின்றோம். நாங்கள் ஒன்றை விசேடமாக இந்த இடத்தில் கூற வேண்டும். எங்களுடைய நாடு ஓர் இறைமையுள்ள, சுயாதீனமான நாடு; அதேநேரத்தில் மனிதாபிமானமுள்ள ஒரு நாடு. எங்களுடைய அரசாங்கத்தின் நோக்கம், குறிக்கோள், வெளியுறவுக் கொள்கை என்பன மனிதாபிமானத்தோடு தொடர்புடையதாகும். அதேநேரத்தில், எந்தவொரு நாட்டுக்கும் பக்கச் சார்பாக இல்லாது, அணிசேராக் கொள்கையைக் கடைப்பிடிக்கின்ற, அனைவரை யும் வரவேற்கின்ற, அனைவருக்கும் கரம் கொடுக்கின்ற, மனிதாபிமானம் நிறைந்த செயற்பாடுகள்தான் எங்களுடைய அரசாங்கத்தினால் முன்னெடுக்கப்படுகின்றது. இவ்வாறிருக் கின்றபொழுது இன்று காலையிலிருந்து இது தொடர்பாக நமது எதிர்க்கட்சியினர் கூறுகின்ற கருத்துகளைப் பார்க்கின்றபோது, இவர்கள் இலங்கையில்தான் இருக்கின்றார்களா என்று எண்ணத் தோன்றுகின்றது.

கடந்த காலங்களில் இந்த அவசரகாலச் சட்டத்தை நிர்மாணித்தவர்கள் யார் என்று பார்த்தாலும்கூட, அதனை நடைமுறைப்படுத்தியவர்கள் யார் என்று பார்த்தாலும்கூட, கடந்த 40 வருடங்களுக்கும் மேலாக அதை நடைமுறையில் வைத்திருந்தவர்கள் யார் என்று பார்த்தாலும்கூட, இந்தச் சட்டத்தின்கீழ் ஆயிரக்கணக்கான இளைஞர்களைத் தமிழரா, சிங்களவரா, முஸ்லிம்களா என்ற பேதம் இல்லாது கொன்றொழித்தவர்கள் யார் என்று பார்த்தாலும்கூட, ஊடகவியலாளர்கள் பலரைக் கொன்றவர்கள் - விசேடமாக வடக்கு, கிழக்கில் வாழ்ந்த தமிழ் ஊடகவியலாளர்களைக் கடத்திக் கொன்றவர்கள் - யார் என்று பார்த்தாலும்கூட, ஊடக நிறுவனங்களைத் தீ வைத்துக் கொளுத்தியவர்கள் யார் என்று பார்த்தாலும்கூட, அவர்கள் வேறு யாரும் அல்லர், இன்றைக்கு இந்தப் பாராளுமன்றத்திலிருந்துகொண்டு நீலிக்கண்ணீர் வடிக்கின்ற நபர்களான அன்றைய ஆட்சியாளர்கள்தான். இவர்கள் அன்று ஆட்சியாளர்களாக இருந்தபொழுது அவசரகாலச் சட்டத்தைக் கொண்டுவந்து, அதை மக்கள்மீதான ஒடுக்குமுறைக்கும் ஜனநாயகத்தைக் குழிதோண்டிப் புதைப் பதற்கும் தேர்தல்களைப் பிற்போடுவதற்கும் அரசியல் கட்சிகளைத் தடைசெய்வதற்கும் பயன்படுத்தினார்கள்.

அந்த வகையில், ஜனநாயகத்தைக் குழிதோண்டிப் புதைத்து, தேர்தல்களைப் பிற்போட்டு, தேர்தலுக்காகக் குரல் கொடுத்த, தேர்தலுக்காகப் போராடிய இளைஞர்கள்மீது, விசேடமாக வடக்கில் இருந்த இளைஞர்கள்மீது 'வோட்'டுக்குப் பதிலாக வேட்டுக்களைத் தீர்த்தவர்கள் யாரென்று பார்க்கின்ற போது, அன்றைய காலகட்டங்களில் யாழ். நூலகத்தை எரித்து 97,000 புத்தகங்களைக் கொளுத்திச் சாம்பலாக்கியவர்கள் யார் என்று பார்க்கின்றபோது, இன்று இந்த நீலிக்கண்ணீர் வடிக்கின்ற எதிர்க்கட்சியினரே அன்றைய இந்த அழிவு களுக்கான காரணகர்த்தாக்களாவர் என்பது புரியும். அதன் பிறகு தொடர்ச்சியாக இவர்கள் அவசரகாலச் சட்டத்தைப் பயன்படுத்தி இந்த நாட்டை நாசமாக்குகின்ற அல்லது மக்கள்மீது ஒடுக்குமுறையைக் கட்டவிழ்த்து விடுகின்றவர் களாக இருந்தார்கள்.

எமது ஆட்சியின் கடந்த ஒன்றரை வருடங்களில் இந்த அவசரகாலச் சட்டம் நடைமுறைக்குக் கொண்டுவரப்பட்டுத் தற்போது சுமார் 3 மாதங்கள் ஆகின்றது. இந்த 3 மாதங் களுக்குள் நாங்கள் தேடிப் பார்க்கின்றபொழுது, உண்மையிலேயே, இந்த அவசரகாலச் சட்டத்தினால் நாட்டில் இருக்கின்ற அப்பாவி இளைஞர், யுவதிகள் மற்றும் அப்பாவி மக்கள் எவரும் எவ்வித பாதிப்புக்கும் உள்ளாகவில்லை என்பதைப் பார்க்கக்கூடியதாக இருக்கின்றது. கடந்த காலங்களில் இந்த அவசரகாலச் சட்டத்திற்குக் கூடுதலாக இரையானவர்கள் யாரென்றால், அது வேறு யாருமல்லர், குறிப்பாக வட, கிழக்குப் பிரதேசங்களில் அதிலும் விசேடமாகத் தமிழர் வாழுகின்ற பிரதேசங்களில் உள்ள தமிழ் இளைஞர், யுவதிகள் ஆவர். ஆனால், கடந்த ஒன்றரை வருடங்களில் இந்த அவசரகாலச் சட்டத்தைப் பயன்படுத்தியோ அல்லது பயங்கரவாதத் தடுப்புச் சட்டத்தைப் பயன்படுத்தியோ எந்த ஒரு தமிழ்க் குடிமகனுக்கோ அல்லது சாதாரண அப்பாவிக் குடிமகனுக்கோ அல்லது அவனது நிழலுக்கேனும் தீங்கு விளைவிக்கப்பட்டு இருக்கின்றதா என்று தேடிப்பார்க்கின்ற பொழுது, அவ்வாறு எதுவும் கிடையாது என்பதை எங்களால் மிகவும் மகிழ்ச்சியாகச் சொல்ல முடியும்.

ஆனால், மிகவும் கவலைக்குரிய விடயம் ஒன்றும் இருக்கிறது. என்ன சொல்வதென்று எனக்குத் தெரியவில்லை! அது வேறெதுவும் அல்ல, இன்றைக்குத் தமிழ்க் கட்சிகள் - தமிழ் மக்களின் பிரதிநிதிகள் என்று கூறுகின்றவர்கள் - சிறிய பிரச்சினைகளைப் பூதாகாரமான பிரச்சினைகளாக மாற்றி, எமது அரசாங்கம் அடக்குமுறையைச் செய்கின்ற அரசாங்கம் என்று கூறுகின்ற எதிர்க்கட்சிகளுக்கு ஒத்தூதுகின்ற, எதிர்க்கட்சிகளுக்கு 'ஜால்ரா' போடுகின்ற நிலைக்கு மாறியிருப்பதாகும். ஆனால், நாங்கள் ஒரு விடயத்தில் தெளிவாக இருக்கின்றோம். அதாவது, நாங்கள் இந்த நாட்டைக் கட்டியெழுப்புகின்ற பணியிலே முன்னணியில் நிற்கின்றோம். நீங்கள் சொல்வதைச் சொல்லிக்கொண்டே இருங்கள்! அவ்வாறு சொல்வதைத் தவிர வேறெதுவும் உங்களுக்கு முடியாது! அதேநேரத்தில், தமிழர்கள் வாழுகின்ற வட, கிழக்குப் பிரதேசங்களை, மலையகப் பிரதேசங்களைக் கட்டியெழுப்புகின்ற நடவடிக்கைகளை மிகவும் துரிதமாகவும் வேகமாகவும் நாங்கள் முன்னெடுக்கின்றோம் என்பதை இந்த இடத்தில் நான் மிக ஆணித்தரமாகச் சொல்லிவைக்க வேண்டும்.

இந்த நாட்டில் யுத்தம் முடிவடைந்து 17 வருடங்கள் ஆகின்றன. இந்தப் 17 வருடங்களிலும் சரி, கடந்த ஆட்சியில் இருந்தவர்களை எடுத்துக்கொண்டாலும் சரி, அதற்கு முன்னர்

இருந்த ஆட்சியாளர்களை எடுத்துக்கொண்டாலும் சரி, அவர்களோடும் இந்த நாட்டில் இருக்கின்ற எங்களுடைய தமிழ்க் கட்சிகள் உறவாடினார்கள்தான்! அவர்களோடும் சுத்துமாத்து விளையாட்டு விளையாடினார்கள்தான்! அவ்வாறு சுத்துமாத்து விளையாடுகின்றபொழுது, சுத்துமாத்துகளைச் செய்கின்றபொழுது, தமிழ் மக்களுடைய உண்மையான கஷ்டங்கள் இவர்களுக்குப் புரியவில்லையா? அவ்வகையான சுத்துமாத்துச் செயற்பாடுகள் எதையுமே தேசிய மக்கள் சக்தி அரசாங்கமான நாங்கள் நிச்சயமாகச் செய்யவில்லை என்பது உங்களுக்கு நன்றாகத் தெரியும்; அதில் நாங்கள் மிகவும் தெளிவாக இருக்கின்றோம்.

கௌரவ கஜேந்திரகுமார் பொன்னம்பலம் அவர்களே, உங்களுடைய அரசியல் என்பது வேறெதுவும் அல்ல, ஆளும் கட்சிகளுக்கு எதிராக, விசேடமாக சிங்களக் கட்சிகளைக் கொண்ட ஓர் அரசாங்கம் என்ற தோரணையில் ஆளுங் கட்சிக்கு எதிராகக் கருத்துகளைச் சொல்வது மாத்திரமே! அதனால் நீங்கள் சொல்வதைச் சொல்லிக்கொண்டு இருங்கள்! கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நிச்சய மாக இந்த நிலைமையில் இருந்து எங்களுடைய தமிழர்கள் வாழுகின்ற பிரதேசத்தை மீட்டெடுப்பதற்கான நடவடிக்கையை எடுப்போம் என்று கூறிக் கொள்கின்றேன்.

இன்று வடக்கிலே பெரிய படகு விபத்து ஒன்று ஏற்பட்டது என்பது எங்கள் எல்லோருக்குமே தெரியும். குருநகர் இறங்கு துறையில் இருந்து கோவில் ஒன்றுக்குச் செல்கின்றபொழுது, படகு புரண்டு விபத்துக்கு உள்ளானதன் காரணமாக அதிகமானவர்கள் காயப்பட்டுள்ளதுடன், மூன்று பேர் இறந்து விட்டதாகவும் இப்பொழுது எங்களுக்கு அறியக் கிடைத்திருக் கின்றது. அந்த வகையில், அவர்களுக்கு எங்களுடைய ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றோம். இந்த விபத்துப் பற்றி அறிந்தவுடன் உடனடியாக எங்களுடைய கடற்படையினர், எங்களுடைய கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்களத்தின் ஊழியர்கள், அதன் பணிப் பாளர்கள் என அனைவரும் விபத்திற்கு உள்ளானவர்களைப் பாதுகாப்பதற்கான நடவடிக்கையை எடுத்திருந்தார்கள். அதே நேரத்தில், தொடர்ந்தும் அந்த ஆலயத்திற்கு வழிபாட்டுக்குச் செல்கின்றவர்களுக்கான அனைத்து வசதிகளையும் பெற்றுக்கொடுத்து, அவர்களைப் பாதுகாப்பாக அனுப்பி வைப்பதற்கு ஏதுவான நடவடிக்கைகளை எங்களுடைய அரசாங்கமும், எங்களுடைய பாதுகாப்புப் பிரிவும் முன்னெடுத் திருக்கின்றது என்பதையும் தெரிவித்துக் கொள்கின்றேன். அந்த இடத்திலும் மனிதாபிமானமே மேலோங்கி இருந்ததை நாங்கள் பார்க்க முடிகின்றது.

இன்று நடைபெறுவது ஒரு கொடிய யுத்தம் என்பது உண்மை. அந்த யுத்தத்தின்பொழுதும் எமது மனிதாபிமானமே மேலோங்கி இருக்கின்றது. எமது மனிதாபிமானச் செயற் பாடுகள் தொடர்பாக இன்றைக்கு உலகமே புகழ்ந்து போற்றுகின்றது. மனிதாபிமானத்தில் முதலிடத்தை வகிக்கின்ற ஒரு நாடாக இலங்கையை இன்று உலக நாடுகளும் உலகத் தலைவர்களும் கூறுகின்ற ஒரு நிலைமை வந்திருக்கின்றது. அதனால், எது எவ்வாறாயினும் எங்களுடைய மனிதாபிமான ரீதியான நடவடிக்கையை நாங்கள் தொடர்ந்தும் முன்னெடுத்துக் கொண்டு செல்வோம் என்று கூறிக்கொண்டு, விடை பெறுகின்றேன். நன்றி! வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.56]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் கிளிநொச்சி மாவட்டத்தினுடைய பூநகரி பிரதேச செயலாளர் பிரிவின் எல்லைக்குள் இருக்கின்ற பாலைதீவு புனித அந்தோனியார் ஆலயத்துக்கு, குருநகரில் இருந்து சென்ற படகு விபத்துக்குள்ளானதில் இரண்டு பேர் காலமாகியிருக்கிறார்கள். ஒருவர் 57 வயதுடைய ஸ்டீபன் பிரான்சிஸ் - நாவற்குழியைச் சேர்ந்தவர்; மற்றவர் 80 வயதுடைய யோசப் - பழைய பூங்காவீதி, குருநகரைச் சேர்ந்தவர். இன்னும் கிட்டத்தட்ட 10பேருக்கும் மேல் படுகாய மடைந்த நிலையில் யாழ்ப்பாணம் போதனா வைத்திய சாலையில் அனுமதிக்கப்பட்டிருக்கிறார்கள். அவர்கள் சென்ற படகு சரியான முறையில் பாதுகாப்பாக அனுப்பப்படாமை யால் விபத்துக்கு உள்ளானதெனச் சொல்லப் படுகிறது. யாழ்ப்பாணப் போதனா வைத்தியசாலையினுடைய பணிப்பாளர் மருத்துவக் கலாநிதி சத்தியமூர்த்தி அவர்களுடைய தகவலின்படி, இரண்டு பேருடைய இழப்புகள் நடந்திருக்கின்றன. அவர்களுக்கு இந்த உயரிய சபையின் ஊடாக நாங்கள் எங்களுடைய அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கிறோம்.

மிக முக்கியமாக, இந்த நாட்டில் ஏற்பட்ட 'கொரோனா' தாக்கமானது நாட்டின் பொருளாதாரத்தை அதல பாதாளத் துக்குக் கொண்டுசென்றது. தொடர்ந்து, உக்ரைன் - ரஷ்யா விற்கு இடையிலான யுத்தம், 'தித்வா' புயல், இப்பொழுது வளைகுடா யுத்தம் என்பன இந்த நாட்டினுடைய பொருளாதாரத்தில் தாக்கத்தைச் செலுத்தியிருக்கிறது. தனியாக அது இலங்கையின் வடக்கு, கிழக்கு மற்றும் மலையகத்தில் வாழுகின்ற தமிழ் மக்களுடைய பொருளா தாரத்திலும் அதிகப்படியான தாக்கங்களை ஏற்படுத்தி யிருக்கிறது என்பதை நாங்கள் புரிந்து கொள்கிறோம். இன்று இந்த நாட்டில் ஓரிலட்சத்துக்கும் மேற்பட்ட பட்டதாரிகள் - இளைஞர்கள் - 7 ஆண்டுகளுக்கும்மேல் நியமனம் வழங்கப்படாமல் வேலையில்லாப் பட்டதாரிகளாக இருக்கிறார்கள். GCE A/L - உயர்தரம் படித்தவர்கள் பலருக்கு வேலை வாய்ப்புக்களில்லை; பல இளைஞர்கள் இந்த நாட்டைவிட்டு ஓடுவதற்குக் காரணமே வேலையில்லாப் பிரச்சினை! இதனால்தான் வடக்கு, கிழக்கை மையப்படுத்திய காங்கேசன்துறைத் துறைமுகத்தை உடனடியாகப் புனரமைப்பதற்கு ஏற்பாடு செய்யுங்கள் என்று பல தடவை நாங்கள் இந்த உயர்ந்த சபையில் கோரிக்கையை முன்வைத்திருக்கிறோம். மிக முக்கியமாக, இந்தியா 61 மில்லியன் அமெரிக்க டொலர்களை மானியமாக வழங்கி யிருக்கிறது. அதனைவிட, அவர்கள் இன்னும் அதற்குத் தேவையான நிதியை வழங்குவதற்கும் தயாராக இருக்கிறார்கள். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தியாவோடு அந்த MoUஐ - Memorandum of Understanding - செய்வதற்கு இலங்கை தயாராக இல்லை. காரணம், வடக்கு, கிழக்கில் இருக்கின்ற இளைஞர்களுக்கு வேலைவாய்ப்புக்கள் கிடைத்துவிடும் அல்லது அதன்மூலம் அவர்களுடைய வாழ்வு முன்னேற்றமடையும் என்ற எண்ணமும் இந்த அரசிடம் இருப்பதாகும். குறிப்பாக, வர்த்தகம் மற்றும் முதலீட்டு வாய்ப்புகளை மேம்படுத்தவும், போக்குவரத்து மற்றும் பிராந்திய இணைப்புகளை அதிகரிக்கவும், வேலை வாய்ப்புகளை எதிர்பார்க்கவும் இலங்கை - இந்திய பொருளாதார உறவுகள் வலுப்பெறவும் இந்தியாவுடனான இந்த MoUவை இலங்கை அரசு உடனடியாகச் செய்ய வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! අද දින විවාදයේ කටයුතු අවසන් වනතෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

நீங்கள் நீண்டகாலக் குத்தகை அடிப்படையில் இந்தியா விடம் காங்கேசன்துறைத் துறைமுகத்தை ஒப்படைத்தால்கூட, மிகப் பெரியளவிலான ஒரு வேலைத்திட்டத்தை இந்தியா ஊடாகச் செய்ய முடியும். அதனைச் செய்வதற்கு இந்தியா தயாராக இருக்கிறது. ஆனால், இலங்கை அந்த வாய்ப்புகளைப் புறக்கணிக்கிறது அல்லது கிடைக்கக்கூடிய வாய்ப்புகளை நிராகரிக்கிறது என்பதுதான் உண்மை. ஆகவேதான் திரும்பத் திரும்ப நாங்கள் இந்த உயர்ந்த சபையில் பல தடவை இதைக் கேட்கிறோம். இந்தியா எமது அண்டை நாடு, பிராந்திய வல்லரசு, அது இலங்கைக்குப் பல கட்டங்களில் உதவியிருக்கிறது, இப்பொழுதும் உதவத் தயாராக இருக்கிறது. அவர்கள் இதற்காக இனாமாக 61 மில்லியன் அமெரிக்க டொலர்களை வழங்குவதற்குத் தயாராக இருக்கிறார்கள்; இதனைவிட இன்னும் வழங்குவதற்கும் தயாராக இருக்கிறார்கள். இந்தச் சந்தர்ப்பத்தைப் பயன்படுத்தி, ஒரு காலத்தில் பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதில் செழிப்பானதாக இருந்த காங்கேசன்துறைத் துறைமுகத்தின் பங்கு எந்தளவுக்கு இருந்ததோ, அதேபோல அந்தத் துறைமுகத்தை மீண்டும் கட்டியெழுப்புவதற்கு உடனடியாக அரசு முனைய வேண்டும். அதற்கான சந்தர்ப்பத்தை உருவாக்க வேண்டுமென்பதை நான் மீண்டும் மீண்டும் இந்த இடத்தில் வலியுறுத்துகிறேன். இந்த விடயத்தில் இந்தியாவினுடைய நல்லெண்ணத்தை நீங்கள் சரியாகப் பயன்படுத்த வேண்டுமென்பதே மிக முக்கியமானது.

இன்று வளைகுடா யுத்தம் தொடர்பிலே இங்கே பலர் பேசியதை நான் அவதானித்தேன். வளைகுடாவில் யுத்தம் நடைபெறுகிறது. ஈரான்மீது அமெரிக்காவும் இஸ்ரேலும் யுத்தம் புரிகின்றன. ஈரான் பல அரபு நாடுகள்மீது யுத்தம் புரிகிறது. இன்று இவையெல்லாம் நடந்து கொண்டிருக் கின்றன. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இதேபோலதான் 2009ஆம் ஆண்டு இறுதி யுத்தத்தின்போது முள்ளிவாய்க்காலில் 'மனிதாபிமானப் போர்' என்ற பெயரில் 146,000க்கும் மேற்பட்ட மக்கள் மிகக் கொடூரமாகக் கொலை செய்யப்பட்டும் காணாமல் ஆக்கப்பட்டும் உள்ளார்கள். இதனை மறைந்த பேராயர் இராயப்பு ஜோசப் அவர்கள் கற்றுக்கொண்ட பாடங்கள் மற்றும் நல்லிணக்க ஆணைக் குழுவின் முன்னால் ஆதாரங்களோடு சொல்லியிருந்தார். அதேபோல, 2006ஆம் ஆண்டு மட்டக்களப்பு மாவட்டத்தின் வாகரையிலே 20,000க்கும் மேற்பட்ட மக்கள் கொல்லப் பட்டார்கள். ஆனால், இவற்றுக்கான நீதி இந்த நாட்டிலே கிடைக்கவில்லை.

'மனிதாபிமான யுத்தம்' என்ற பெயரில் 22 நாடுகளின் உதவியுடன் இந்த நாட்டிலே யுத்தத்தை நடத்தியபொழுது, விமானத் தாக்குதல்களை நடத்தியபோது, multi-barrel குண்டுகளை வீசித் தாக்குதல் நடத்தியபோது, இந்த உலகத்திலே யாரும் எங்களுக்காகப் பேசவில்லை; எங்களுக்காக யாரும் குரல் கொடுக்கவில்லை. அது 'மனிதாபிமான யுத்தம்' என்றால், இப்பொழுது உலகத்தி னுடைய ஒழுங்கைத் தீர்மானிப்பதற்கும் ஒழுங்குபடுத்து வதற்குமான தலைவராகத் தன்னை அடையாளப்படுத்துகின்ற அமெரிக்கா நடத்துகின்ற யுத்தமும் நியாயமானதுதானே! ஏன், நீங்கள் அந்த யுத்தத்தைப் பிழையாகப் பார்க்கிறீர்கள்? அப்படியென்றால், இந்த நாட்டிலே நடந்த இழப்புகளுக்கு ஏன் இன்னும் நீதி வழங்கப்படவில்லை? ஏன், பொறுப்புக் கூறப்படவில்லை? ஆனால், எமது மக்களுக்குரிய நீதியை வழங்குவதற்குப் பதிலாக உங்களுடைய அரசாங்கம் அமைச்சரவையிலே - Cabinetஇலே "அப்படி ஓர் இனப்படுகொலை நடக்கவில்லை; அது தொடர்பில் வெளிநாட்டிலே விசாரணை நடத்த முடியாது" என்று தீர்மானம் எடுத்திருக்கின்றது. அப்படியென்றால், இந்த நாட்டினுடைய நியாயம் என்ன? நல்லிணக்கம் என்ன? பொறுப்புக்கூறல் என்ன? இந்த நாட்டினுடைய நீதி எவ்வாறு இருக்கப் போகிறது? ஆகவே, "தனக்கு வந்தால்தான் தலைவலியின் அருமை தெரியும்" என்பார்கள்.

இந்த நாட்டில் நடந்த யுத்தத்தின்போது படிந்த அந்த மக்களின் இரத்தக் கறைகள் இன்னும் கழுவப்படவில்லை. அந்த மக்கள் இன்றும் தெருக்களிலே போராடிக்கொண்டு இருக்கிறார்கள். அவர்களுடைய உண்மையான போராட்டங்களுக்கான மதிப்பைக்கூட இந்த அரசு வழங்கத் தயாரில்லை. அந்த யுத்தத்தைப் புரிவதற்குப் பல வழிகளிலே இந்த அரசாங்கத்திலே இருக்கின்றவர்கள் அன்று JVPஆக இருந்தபோது - இன்று நீங்கள் NPPஆக இருக்கலாம் - பூரண ஆதரவை வழங்கியிருந்தீர்கள். இன்றைய சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் தலைமையில், 40,000 பேர் படைகளுக்குச் சேர்க்கப்பட்டார்கள், தமிழர்கள்மீது யுத்தம் புரிவதற்காக! ஆகவேதான் நீங்கள் நீதியை வழங்குவதற்குத் தயக்கம் காட்டுகின்றீர்கள். இன்று கொண்டுவரப்படுகின்ற இந்த அவசரகாலச் சட்டத்தின்மூலம் நீங்கள் தொடர்ந்தும் எமது மக்களை ஒரு வன்முறைக்குள் வைத்திருக்க விரும்புகிறீர்கள். குறிப்பாக, யாழ்ப்பாணப் பல்கலைக்கழக மாணவர்கள் சுதந்திர தினத்தை எதிர்த்தார்கள். அந்த மாணவர்கள்மீது பயங்கரவாத தடைச் சட்டத்தின்கீழ் விசாரணைகள் இப்பொழுது அரசால் முன்னெடுக்கப் படுகின்றது. இலங்கையினுடைய சுதந்திர தினம் என்பதைத் தமிழர்களாகிய நாங்களும் நினைப்பதற்கான வழிவகைகள் இன்னும் உருவாக்கப்படவில்லை. அந்தச் சிங்கக் கொடிக்குக் கீழே நிற்கக்கூடிய தகுதியை இன்னும் தமிழர்களுக்கு நீங்கள் கொடுக்கவில்லை.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

இரண்டு நிமிடங்கள் தாருங்கள்! தயவுசெய்து எங்களுக்கும் நேரம் தாருங்கள்! நாங்கள் இந்தப் பாராளுமன்றத்தில் மூன்றாவது பெரிய கட்சி. எங்களுக்கு உரிய நேரம் தரப்படவில்லை. தயவுசெய்து எங்களுக்கு உரிய நேரத்தைத் தாருங்கள் என்று நான் உங்களிடம் கேட்கின்றேன்.

இன்றும் எமது இளைஞர்கள் வஞ்சிக்கப்படுகின்றார்கள். இளைஞர்களின் இருப்பு கேள்விக்குட்படுத்தப்படுகின்றது. அவர்களுடைய முகநூல் பக்கங்கள் ஆராயப்படுகின்றன; அவர்கள் அடிக்கடி விசாரணைக்கு அழைக்கப்படுகிறார்கள். அவர்களுடைய சமூக வலைத்தளங்கள் தொடர்பாக விசாரணை என்ற போர்வையில், நீதிமன்றங்களிலும்

அரசினுடைய உளவுத் துறை நிலையங்களிலும் அவர்கள் விசாரணைக்கு உட்படுத்தப்படுகின்றார்கள். இந்த அவசரகாலச் சட்டம் அந்த மக்களுக்கு எதிரானது என்பதைக் காட்டுவதற்கு இன்று இதனை நாங்கள் எதிர்க்கிறோம். காரணம், நீங்கள் இந்த நாட்டிலே இவ்வாறான சட்டங்களினூடாக எமது மக்கள்மீது கொடூரத்தைப் புரிகின்றீர்கள். ஏற்கெனவே நடைபெற்ற கொடூரமான யுத்தத்தின் காரணமாகப் பாதிக்கப்பட்டிருக்கின்ற எமது மக்களுடைய உண்மைகளைப் புரிந்து, நீதியை நிலைநாட்டு வதற்கு இலங்கை அரசு தயாரானால், நீங்கள் இவ்வாறு செய்யத் தேவையில்லை. நீங்கள் எல்லோரும் மற்றவர்களுக் காகக் கண்ணீர் வடிக்கத் தேவையில்லை. ஆகவே, இந்த நாட்டிலே நடைபெற்ற அவலங்களுக்கு முதலில் பதில் சொல்லத் தயாராகுங்கள்! அப்பொழுதுதான் நீதி கிடைக்கும் என்று நான் நம்புகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.05]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද මේ විවාදය පවත්වන්නේ හදිසි නීතිය දීර්ඝ කර ගැනීමට අදාළවයි. කාරණා දෙකක් පදනම් කරගෙන හදිසි නීතිය දීර්ඝ කරන්න කියලා ජනාධිපතිවරයා ඉල්ලා සිටිනවා. "දිට්වා" සුළි කුණාටුවට අදාළව අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයාට මැදිහත් වීමට අදාළ තවත් කටයුතු ප්‍රමාණයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇත්තවශයෙන්ම හදිසි නීතිය දීර්ඝ කරන්න රජයේ අවශ්‍යතාවක් තිබුණේ නැහැ. නමුත්, මේ පවතින තත්ත්වයන් හේතු කොටගෙන තමයි හදිසි නීතිය දීර්ඝ කරන්න සිදු වුණේ.

විශේෂයෙන්ම මේ වෙලාවේදී ලෝකයේ රටවලට යුදමය වාතාවරණයකට මුහුණපාන්න සිද්ධ වුණා. අපේ රටටත් එහි යම් යම් මානුෂීය කාරණාවලට අදාළව මැදිහත්වීම් කරන්න සිද්ධ වුණා. අපි කියා සිටින්නේ මේ කාරණා දෙකට යටත්ව අපට හදිසි නීතිය දීර්ඝ කිරීමට වරමක් අවශ්‍යයි කියායි. අපි එක දෙයක් කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අද විපක්ෂය සහභාගි වුණා, මේ විවාදයට. මන්ත්‍රීතුමෙක් ඉන්නවා, හැම දාම division එකක් ඉල්ලන. දැන් මේ කාරණය ඡන්ද විමසීමකට ගෙනියන්නයි හදන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (MRS.) SAGARIKA ATHAUDA left the Chair, and THE HON. SPEAKER took the Chair.*

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ඒ Division එකක් ඉල්ලන කාරණයට අදාළව ගත්තොත්, අපි හදිසි අවස්ථා රෙගුලාසි අයුතු ලෙස පාවිච්චි කළා යැයි කියලා විපක්ෂයට එකදු කරුණක්වත් මේ සභා ගර්භය තුළ සනාථ කරන්න පුළුවන් වෙලා නැහැ. මම පසුව උදාහරණ ටික කියන්නම්, එතුමන්ලා මේ සභාව තුළ කථා කරපු ඒවා පිළිබඳව. අපි අකමැති තත්ත්වයක් තුළ වුණත් යම් යුදමය තත්ත්වයකට රට වැටී තිබෙනවා. ඒ ආකාරයට ගත්තොත්, මෑත ඉතිහාසයේ අන් කවරදාටත් වඩා බිහිසුණු ක්‍රියාවලියක් දෙස බලා සිටින්නන් පිරිසක් බවට අපි පත් වෙලා, ගරු කථානායකතුමනි. ඒ යුද්ධය කවදා, කෙලෙස නිම වේද යන්න පිළිබඳව අදහස් පළ කිරීම නිෂ්ඵල දෙයක් බවට පත් වෙලා; කවදා, කොතැන ඇවිළේ දැයි අනුමාන කිරීමක් කළ නොහැකි දෙයක් බවට පත් වෙලා; කවුරු, කොහොම වින්දිතයන් බවට පත් වේ දැයි පුරෝකථනය කළ නොහැකි තත්ත්වයකට පත් වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, අපි ප්‍රේක්ෂකයන් පමණයි කියා හිතුවත් මේ ගෝලීය වපසරිය තුළ කවදා, කොහොම, කොයි විධියෙන් අප මේ චිත්‍රයේ කොටසක් වේදැයි අප දන්නේ නැහැ. පසුගිය දා ගාලු මුහුදු සීමාවේදී අනතුරට පත් "අයිරිස් ඩේනා" නෞකාවේ සිද්ධිය ඊට හොඳම උදාහරණයක්. අපට, අපේ රට මෙන් විසිහත් ගුණයක් විශාල සමුද්‍රික කලාපයක් අයිතියි. මේ සිද්ධිය සිදු වන්නේම එම කලාපයට අයත් පරීක්ෂා සහ ගලවා ගැනීම් වගකීමට යටත් කොටසේයි. ඒ අනතුරට පත් කවුරුන් හෝ ගලවා ගැනීම, ඔවුන් පිළිබඳව පරීක්ෂා වීම ජාත්‍යන්තර නාවික නීතිය අනුව අපට පැවරී ඇති කාර්යයක්; ඒක මානුෂික කාර්යයක්. ඒක යුද්ධයේ කොටසක් නොවෙයි, යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන තත්ත්වයකට අප සතු වගකීම ක්‍රියාවේ යෙදවීමක්, ගරු කථානායකතුමනි. ඒ වාගේම, මේ අවිනිශ්චිත තත්ත්වය තුළ තමයි අද අපට හදිසි නීතිය දීර්ඝ කිරීමට හේතු වී තිබෙන්නේ. කරාපිටිය රෝහලට හදිසියේ භාර ගන්නට සිදු වුණු වගකීම වැනි වගකීම් කවදා, කොහොම, කොයි ආකාරයෙන් තව කාට භාර ගන්නට සිදු වේ දැයි අපට අනුමාන කිරීමේ හැකියාවක් නැහැ. එවැනි තත්ත්වයක් අපේ රටේ ජන ජීවිතයට කළ හැකි බලපෑම අපට කල් තියා අනුමාන කරන්නට බැහැ. ඉරානය වට කොට තිබෙන කැස්පියන් මුහුද, ටර්ක්මෙනිස්තානය, ඇෆ්ගනිස්ථානය, පාකිස්තානය, අරාබි මුහුද, ඉරාකය, තුර්කිය, ආර්මේනියාව, අසර්බයිජානය පමණක් නොවෙයි මේ යුද උණුසුමෙන් රත් වෙන්නේ කියන එක දැන් හොඳටම පැහැදිලියි. ඒ වාගේම ඊශ්‍රායලය, සවුදි අරාබිය, ජෝර්දානය, සිරියාව, ලෙබනනය, පාකිස්තානය පමණක් නොවෙයි, සැතපුම් දහස් ගණනක් ඈත තිබෙන කරාපිටිය රෝහලත් මේ යුද්ධයේ මෘත ශරීරවලින් පිරී යන්න ගත වුණේ දවසයි, ගරු කථානායකතුමනි. ඒ නිසායි අපි සූදානම් විය යුත්තේ, ඒ නිසායි අපි පූර්ව ආරක්ෂක උපක්‍රම භාවිත කළ යුත්තේ, ඒ නිසායි අපි ඊට ගැළපෙන නීති රීතිවලින් සන්නද්ධ විය යුත්තේ. අපේ රටේ ජනතාවගේ ජීවිත පමණක් නොවෙයි, ලෝකවාසී ජනතාවගේ ජීවිත පවා අපේ වගකීමට යටත් වන දිනය, වේලාව සහ ආකාරය පිළිබඳ අපට අනුමාන කරන්න බැහැ. මේ ආකාරයට හදිසි නීතිය පැනවීම මඟින් අපට Iron Dome එකක් ලැබෙනවා නොවෙයි, හැකි පමණින් සූදානම් වීමට අපට අවස්ථාව සැලසෙනවා. ගරු කථානායකතුමනි, යථාර්ථය ඕකයි. හැබැයි, මේ යථාර්ථය ඇතුළේ අද විපක්ෂයේ හැසිරීම සම්බන්ධයෙන් මම අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි.

දැන් මොකක්ද විපක්ෂය පැත්තෙන් ගෙනෙන්නේ? විපක්ෂ නායකතුමා අහනවා, "ලොකු information ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙනවා. අපේ රටේ ආරක්ෂක කවුන්සලය රැස් වෙලා

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

තිබෙනවා. මෙච්චර information ප්‍රමාණයක් ඇවිල්ලා තිබියදී ප්‍රහාරයට ආපු submarine එක අපේ ආරක්ෂක කවුන්සලයට පෙනුණේ නැත්තේ ඇයි?" කියලා. ගරු කථානායකතුමනි, එතුමන්ලාත් හිටපු කැබිනට් එකේ පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තර තියාගෙන සමස්ත රටක් ව්‍යසනයට ඇද දැමුවා. එහෙම මහත්වරු අපට ඇඟිල්ල දිගු කරලා අහනවා, "Submarine එක දැක්කේ නැද්ද, මාර වැඩේ නේ, submarine එක දැක්කේ නැද්ද?" කියලා. මොනවාද මේ කියන්නේ, ගරු කථානායකතුමනි?

තව මහත්මයෙක් නැඟිටලා කියන්නේ මොකක්ද? ඇමෙරිකානු යානා දෙකක් අපේ කලාපය ඇතුළේ කරකැවුණා ලු. එහෙම කියන්නේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඇමෙරිකානු යානා දෙකක් කරකැවිලා තිබෙනවා, ඒක ගැන විස්තර තවම රටට කියලා නැහැ කියලා එතුමා කියනවා. ඊළඟට, මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කියනවා, ඔය අනතුරට පත් නැව දවස් හයක් තිස්සේ අපේ රටට තොරතුරු දීලා තිබෙනවා කියලා. එතුමා අහනවා, තොරතුරු දීපු ගමන් අපි ගත්තේ නැත්තේ ඇයි කියලා. මොළය කොපමණ ප්‍රමාණයක් ද කියන කාරණය අපට හිතාගන්න පුළුවන්. ගරු කථානායකතුමනි, බෙහෙත් තෙල් වෙළෙඳාම් කරන මහත්වරු කියන ඔක්කොම වචන අපි භාර ගන්නේ නැහැ නේ. ඒ වාගේ තමයි. බෙහෙත් තෙල් වෙළෙඳාම් කරන මහත්වරු වාගේ තමයි ඔහේ කියවනවා. කිසිදු පදනමක් නැහැ.

ඊළඟට, කළුතර දිස්ත්‍රික් මන්ත්‍රී, අපේ අජිත් පී. පෙරේරා මහතා ඊයේ දමපු බෝම්බය දැක්කාද? නීතිඥ අජිත් පී. පෙරේරා. *[බාධා කිරීමක්]* අධිනීතිඥ. අම්මෝ! බොරු අධිනීතිඥ. එතුමා මොකක්ද කියන්නේ? අනේ, කිරි සප්පයෝ 300ක් අන්න කිරි උර උරා නැවක ඉන්නවා; මේ කිරි සප්පයින්ව මේ රජය බේරා ගන්නේ නැහැ; පුදුම ප්‍රශ්නයක්; පව් අනේ! කිරි සප්පයෝ ටික බේරා ගන්නේ නැද්ද කියලා අහනවා. අන්න, පැය කිහිපයයි යන්නේ කියපු බොරුව දැන් දිරවා ගන්න බැරුව කොහේදෝ ඉඳලා දුවගෙන ඇවිල්ලා මෙතැන අත හැරියා, "මම ළමයින් යනුවෙන් හැඳින්වූයේ නාවික භටයෝ" කියලා. බලන්න, පැය 24යි ගියේ කිරි සප්පයෝ නාවික බටයෝ බවට පත් වෙලා. ගරු කථානායකතුමනි, "ගලේ පැහැරු බළලා වගේ" කියන උපහැරණය අපි දන්නවා නේ. දැන් අජිත් පී. පෙරේරා මහත්තයාගේ නිය පොතු ඔක්කෝම ගෙවිලා මේක වහන්න ගිහිල්ලා. *[බාධා කිරීමක්]* ගල උඩ. අජිත් පී. පෙරේරා මහත්තයාගේ නිය පොතු ඔක්කෝම ගෙවිලා. ඊට පස්සේ මේ සභාවට දුවගෙන ඇවිල්ලා කියනවා ඒ නාවික භටයෝ කියලා.

පසුගිය කාලයේ අපේ ශාන්ත පද්ම කුමාර මහත්මයා සම්බන්ධයෙන් setup කථාවක් දැම්මා නේ. මොකක්ද? ගංජා කථාවක් දැම්මා ශාන්තට. දුවගෙන ඇවිල්ලා press conference එකක් තියලා කිව්වා, "මල් පැළ වල් පැළ වෙලා, මෙන්න ශාන්ත ගංජා වවලා" කියලා. ඊට පස්සේ මොකක්ද වුණේ? පැය 24ක් ගියේ නැහැ, සම්පූර්ණයෙන් ඔප්පු කරලා පෙන්නුවා ශාන්ත පද්ම කුමාර ඒවාට සම්බන්ධ නැහැ කියලා.

ඒ වාගේම මරික්කාර් මන්ත්‍රීතුමා මේ සභාවේ බෝම්බයක් අත ඇරියා, බලශක්ති ඇමතිතුමාගේ නැන්දම්මාගේ ගිණුමක් තිබෙනවා හෝමාගම, ඒ ගිණුමට තමයි සල්ලි ඇවිල්ලා තිබෙන්නේ කියලා. ගිණුම් අංකය සහ විස්තර දෙන්න කිව්වාම, නැහැ නැහැ ඒවා පස්සේ දෙන්නම් කියලා මේ සභාවෙන් දිව්වා. ගරු කථානායකතුමනි, පවයක් අත හැරියොත් පස්සවත් බලන්නේ නැහැ, මේ පැත්තවත් බලන්නේ නැහැ ඔහේ යනවා. එදා කල්තැබීමේ යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමා වෙලාත් එතුමා පිළිතුරු කථාව අහන්නවත් ආවේ නැහැ. ගරු කථානායකතුමනි, මේ තරම් ටොන් පව කෙළින්න දෙන්න පුළුවන්ද මේ වාගේ සභාවක් ඇතුළේ? වරප්‍රසාදවලට යට වෙලා මේ ගරු සභාවේ කියන පදනම් විරහිත කථා සැලකිය යුතු ප්‍රමාණයක් තිබෙනවා.

ඒ වාගේම දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මහා ලොකු කථාවක් විධියට මේ සභාවට අත හැරියා, "අද ගැසට් පත්‍රයක් විතරක් අපට දීලා තිබෙනවා, මෙන්න ගැසට් පත්‍රය, කෝ Regulations?" කියලා; ලොකු කථාවක් මැව්වා. ගැසට් පත්‍රය මේ සභාවට පෙන්නලා, "කෝ රෙගුලාසි?" කියලා ඇහුවා. මම මහ ලේකම්තුමියගෙන් ඇහුවා, මේ කියන කථාවට පදනමක් තිබෙනවාද කියලා. එතුමිය කිව්වා, practice එකක් විධියට මේ ගරු සභාවේ ගැසට් පත්‍රය සභාගත කරනවා හැරෙන්න කවදාවත් Regulations සභාගත කරන්නේ නැහැ කියලා. හැබැයි, එතුමා නීතිඥයෙක්, දක්ෂ නීතිඥයෙක් කියලාත් කියනවා නේ. එතුමා දැනගන්න ඕනෑ මේ එන්නේ හදිසි අවස්ථාව දීර්ඝ කිරීමේ විවාදය, කලින් හදිසි අවස්ථා රෙගුලාසිම තමයි මේ ගැසට් වෙලා තිබෙන්නේ කියලා. දයාසිරි මන්ත්‍රීතුමාට දැනගන්න ඕනෑ නම් මෙන්න තිබෙනවා හදිසි අවස්ථා රෙගුලාසි, සජබය ඔච්චර දූප්පත් නම් මෙන්න මේක අරගෙන ගිහිල්ලා දයාසිරි මන්ත්‍රීතුමාට දෙන්න. සජබය ඔච්චර දූප්පත්ද? නැහැ, ඒ අය දන්නවා ගරු කථානායකතුමනි. නමුත් වංක, කපටි චේතනාවෙන් මේ ගරු සභාව නොමග යවන්න ඒ කථා කියනවා.

එතුමා තව කථාවක් කිව්වා. චෛතිය රජ්ජුරුවෝවත් කියලා නැහැ මෙච්චර බොරු. එතුමා කිව්වා, සලේව බලන්න යන ඕනෑම කෙනෙකුගෙන් පොලිස් වාර්තාවක් ඉල්ලනවා ලු. ගරු කථානායකතුමනි, සලේ ඉන්නේ DO ගහලා. DO ගහපු ඕනෑම කෙනෙක් බලන්න යනකොට පොදු තත්ත්වයක් තිබෙනවා. DO ගහපු ඕනෑම කෙනෙක් බලන්න යනකොට එයාගේ අනන්‍යතාව තහවුරු කරන්න ඕනෑ. ඒ අනන්‍යතාව තහවුරු කළාට පස්සේ සැකකරුගේ අවසරය මත බලන්න පුළුවන්. නීතිඥ මහත්වරුන්ට එහෙම සහතික අවශ්‍ය වන්නේ නැහැ. නීතිඥ මහත්වරුන්ට legal visit එකක් විධියට අදාළ සැකකරු කැමති නම් පමණක් බලන්න පුළුවන්කම තිබෙනවා. එහෙම නම් ඒ වාගේ බොරුවක් ඇයි මේ ගරු සභාවේ කියන්නේ?

ඒ විතරක් නොවෙයි. දයාසිරි මන්ත්‍රීතුමා කිව්වා පත්තර පඩංගුවක තිබුණා කියලා අපි රජයක් විධියට මේ ප්‍රහාරය හෙළා දැක්කා කියලා. මම අහනවා විපක්ෂය මේ තරම් දූප්පත්ද කියලා. ජනාධිපතිවරයා ඊයේ රාත්‍රියේ මුළු ජාතියම අමතලා කිව්වා මොකක්ද අපේ ස්ථාවරය කියලා. අපේ ස්ථාවරය තමයි, අපි ස්වාධීනයි කියන එක. ඒ විතරක් නොවෙයි, අපි මානුෂිකයි, මධ්‍යස්ථයි. ඒ ස්ථාවරයේ සිටිමින් අදාළ නෞකාවට අපි මැදිහත් වුණා. මුජිබුර් මන්ත්‍රීතුමා කිව්වා වාගේ දවස් 6කට කලින් මේ නැව අපි අරගෙන ආවා නම්, ගරු කථානායකතුමනි, ඒ තරම් මෝඩ ක්‍රියාවක් තවත් තිබෙනවාද? අද ඉතාම පරිණතව මේ ආණ්ඩුව කටයුතු කරලා තිබෙනවා. ඒක ඉවසා ගන්න බැරි තරමට මේ විපක්ෂය ඊර්ෂ්‍යාවන්තයි, කුහකයි. අද මේ ගරු සභාවේ මේ තරම් පව ඇද බාන්නේ, විපක්ෂයට දරා ගන්න බැරි තත්ත්වයක් ඇති වී තිබෙන නිසායි.

ඊළඟ කාරණය, ඊබ්‍රාහිම් නිදහස් කිරීම ගැන කියපු කථාව. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා තොරතුරු සොයා බලා ඇවිල්ලා කියන්න. මට ආණ්ඩු පක්ෂයේ අපේ මේ ගරු මන්ත්‍රීතුමා හරි තොරතුර දුන්නා. මොකක් ගැනද? ඊබ්‍රාහිම් නිදහස් කිරීම ගැන. ගරු මන්ත්‍රීතුමා, 2022 මැයි 25වැනි දා, ඔබතුමාගේ ලොක්කා තමයි ඊබ්‍රාහිම් නිදහස් කළේ. අන්න ඒක දැන ගන්න. තේරුණාද? මොනවාද විපක්ෂය කියපු ඒ කථා! මේ සභාව ඒ තරමට නොමඟ යවන්න ඉඩ දෙන්න බැහැ, ගරු කථානායකතුමනි. මම පොදුවේයි

මේක විපක්ෂයට කියන්නේ. මෙසේ පදනම් විරහිතව කටයුතු කරන එකේ සීමාවක් තිබෙන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අයුතු ලෙස භාවිත කරලා, විපක්ෂයේ සමහරු මේ ගරු සභාව මොන තරම් නම් නොමඟ යවමින් සිටිනවාද?

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මා කියන්නේ මේකයි. ජනාධිපතිවරයා ගැසට් නිවේදනයක් මඟින් පනවපු හදිසි නීතිය දීර්ඝ කරවා ගැනීමේ අවශ්‍යතාවක් අපට තිබෙනවා. ඊට අදාළ විවාදයයි මේ පැවැත්වෙන්නේ. අපි දැනුත් විපක්ෂයට කියනවා, මේ හදිසි අවස්ථා රෙගුලාසිවලට පිටින් ගමන් කරපු අවස්ථාවකට එක උදාහරණයක් හෝ පුළුවන් නම් අපට පෙන්වන්න කියලා. ගරු කථානායකතුමනි, දවස් දෙකක් අපි මේ ගරු සභාවේ මේ කාරණය සම්බන්ධයෙන් විවාද කරලා තිබෙනවා. හදිසි අවස්ථා රෙගුලාසිවලට පිටින් ගමන් කරපු බවට එකම තොරතුරක්වත් අදටත් විපක්ෂයට දී ගන්න බැරි තත්ත්වයක් ඇති වෙලායි තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව අනාගන්නා ආණ්ඩුවක් නොවෙයි. අපි හරි පරිණත විධියට මේ සිද්ධීන් හසුරුවා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ මෙහා පැත්තේ හිටපු මන්ත්‍රීවරයා ස්ථාවර නියෝග අනුව අවස්ථාවක් අරගෙන කිව්වා, මේ ජනාධිපතිවරයා කටයුතු කරපු ආකාරය, වචන හයකින්. ජනාධිපතිවරයා කටයුතු කරපු ආකාරය ඉතාම පරිණතයි. ඉතාම පරිණත ආකාරයෙන් ජනාධිපතිවරයා මේක handle කරලා තිබෙනවා. නමුත්, විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීතුමන්ලා අපට ඇඟිල්ලක් දිගු කළත්, ඇඟිලි හතරක් ඔබතුමන්ලාගේ පැත්තට දිගු වෙලායි තිබෙන්නේ.

අවසාන වශයෙන් මා කියන්නේ මේකයි. අපි මේ තත්ත්වය කළමනාකරණය කරලා තිබෙනවා. අපි ලෝකයට ආදර්ශයක් වන විධියට මේ යුද්මය තත්ත්වය කළමනාකරණය කරලා පෙන්වා තිබෙනවා. ඒ අනුව අපි ජාතික ජන බලවේගය ආණ්ඩුවට ඇඟිලි දිගු කරන්න තමුන්නාන්සේලාට කිසිසේත් අවස්ථාවක් තියලා නැහැ.

ගරු කථානායකතුමනි, මා හිතන විධියට, විපක්ෂය අද Division එකක් ඉල්ලනවා. හැමදාම සුපුරුදු ලෙස පොන්නම්බලම් මන්ත්‍රීවරයා පමණක් අද විපක්ෂය වෙනුවෙන් මේ ගරු සභාවේ රැඳී සිටිමින්,- *[බාධා කිරීමක්]* සමාවෙන්න, තවත් මන්ත්‍රීවරයෙක් ඉන්නවා. *[බාධා කිරීමක්]* ආ, දෙන්නෙක් ඉන්නවා නේ. මැදයි! අපේ 159යි; විපක්ෂයේ දෙන්නෙක් විතරයි. හරිද? *[බාධා කිරීමක්]* අයියෝ, ලොකු වැඩියි 3ක්.

ගරු කථානායකතුමනි, ඒගොල්ලන් සුපුරුදු පරිදි දැන් Division එකක් ඉල්ලන්නයි යන්නේ. Division ඉල්ලලා බලන්නකෝ. අද මේ ගරු සභාවේ මුසාවාද කියපු මන්ත්‍රීවරු එක්කෙනෙක්වත් දැන් මෙහි නැහැ. මුසාවාද කියලා මෙහි ඉන්න බැරි නිසා දුවනවා. මේ ගරු සභාවේ මොකක් හරි බොරුවක් අත් හරිනවා; දුවනවා. ඒක තමයි ස්වභාවය.

ගරු කථානායකතුමනි, ජාතික ජන බලවේගය ආණ්ඩුව ඉතාම පරිණතව මේ ප්‍රශ්නය කළමනාකරණය කරලා තිබෙනවා; "දිට්වා" සුළි කුණාටුවත්, පශ්චාත් යුද්මය තත්ත්වයත් නිසි පරිදි කළමනාකරණය කරලා තිබෙනවා. ඒ නිසා අපි සඳහන් කර සිටිනවා, මේ හදිසි අවස්ථාව තවත් කාලයකට දීර්ඝ කළ යුතුයි කියලා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 81, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතය අනුමත කිරීමට සභාව එකඟද?

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I call for a Division, Sir.

***බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -***
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*At the conclusion of the Division Bell -*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව.

න්‍යාය පත්‍රයේ විෂය අංක 81, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතය, සම්මත කිරීමට පක්ෂ මන්ත්‍රීවරුන් කොළ පැහැති බොත්තමත්, විරුද්ධ මන්ත්‍රීවරුන් රතු පැහැති බොත්තමත්, ඡන්දය දීමෙන් වැළකී සිටින මන්ත්‍රීවරුන් කහ පැහැති බොත්තමත් භාවිත කර ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

ගරු මන්ත්‍රීවරුනි, දැන් ඡන්දය දීම ආරම්භ කරන්න.

***මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*
*(At this stage, the Voting commenced.)*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරැදිව සටහන් වී ඇත්දැයි තහවුරු කර ගන්න.

මගේ දකුණු අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර නැඟී සිට දන්වන්න.

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ටී.කේ. ජයසුන්දර මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂවද, විපක්ෂවද?

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
පක්ෂයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මගේ වම් අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර නැඟී සිට දන්වන්න.

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂවද, විපක්ෂවද?

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)
පක්ෂයි

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ තවත් ගරු මන්ත්‍රීවරු ඉන්නවාද?

කිසිවෙකු නැති බවයි පෙනෙන්නේ.

ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සහා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***

*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது.)*

*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 106; විරුද්ධව 08; වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.***

*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 106; எதிராக 08; விலகியிருந்தோர் 0.*

*According to Electronic Voting, Parliament divided: Ayes 106; Noes 08; Abstain 0.*

| | |
|---|---|
| G 002. Sunil Handunnetti | Yes |
| G 003. K.D. Lal Kantha | Yes |
| G 005. Nalinda Jayathissa | Yes |
| G 006. Bimal Rathnayake | Yes |
| G 007. Harini Amarasuriya | Yes |
| G 009. Ramalingam Chandrasekar | Yes |
| G 010. Wasantha Samarasinghe | Yes |
| G 011. A.H.M.H. Abayarathna | Yes |
| G 013. Anil Jayantha | Yes |
| G 014. Harshana Nanayakkara | Yes |
| G 015. Dammika Patabendi | Yes |
| G 016. Saroja Savithri Paulraj | Yes |
| G 017. Ananda Wijepala | Yes |
| G 018. Hiniduma Sunil Senevi | Yes |
| G 019. Sunil Kumara Gamage | Yes |
| G 020. Kumara Jayakody | Yes |
| G 021. Rizvie Salih | Yes |
| G 023. Upali Pannilage | Yes |
| G 025. Nihal Galappaththi | Yes |
| G 026. Nihal Abeysinghe | Yes |
| G 030. R.M. Jayawardhana | Yes |
| G 031. Sunil Watagala | Yes |
| G 032. Rathna Gamage | Yes |
| G 033. Mahinda Jayasinghe | Yes |
| G 034. Chathuranga Abeysinghe | Yes |
| G 035. Eranga Gunasekara | Yes |
| G 036. Upali Samarasingha | Yes |
| G 041. Hemali Weerasekara | Yes |
| G 044. Muneer Mulaffer | Yes |
| G 045. Hansaka Wijemuni | Yes |
| G 046. Eranga Weeraratne | Yes |
| G 047. Namal Sudarshana | Yes |
| G 048. P. Ruwan Senarath | Yes |
| G 049. Madhura Senevirathna | Yes |
| G 050. Arun Hemachandra | Yes |
| G 053. Sugath Thilakaratne | Yes |
| G 054. Kaushalya Ariyarathne | Yes |
| G 055. Arkam Ilyas | Yes |
| G 058. Nishantha Jayaweera | Yes |
| G 059. Asoka Ranwala | Yes |
| G 060. Lakshman Nipuna Arachchi | Yes |
| G 062. Najith Indika | Yes |
| G 063. Lakmali Hemachandra | Yes |
| G 064. Samanmali Gunasingha | Yes |
| G 065. R.M. Gamini Rathnayake | Yes |
| G 067. K. Ilankumaran | Yes |
| G 068. Shantha Pathma Kumara Subasingha | Yes |
| G 069. Ajith Agalakada | Yes |
| G 070. Sagarika Athauda | Yes |
| G 072. U. P. Abeywickrama | Yes |
| G 076. Oshani Umanga | Yes |
| G 077. Krishnan Kalaichelvi | Yes |
| G 078. Upul Kithsiri | Yes |
| G 080. Chaminda Lalith Kumara | Yes |
| G 081. Sarath Kumara | Yes |
| G 082. Nilanthi Kottahachchi | Yes |
| G 083. M.A.C.S. Chathuri Gangani | Yes |
| G 084. Darmapriya Wijesinghe | Yes |
| G 085. Thilanka U. Gamage | Yes |
| G 086. Nilusha Lakmali Gamage | Yes |
| G 087. Ajantha Gammeddage | Yes |
| G 088. Ajith Gihan | Yes |
| G 089. Jagath Gunawardana | Yes |
| G 090. Aboobucker Athambawa | Yes |
| G 091. Ruwanthilaka Jayakody | Yes |
| G 095. Rajeevan Jeyachandramoorthy | Yes |
| G 097. Sugath Wasantha de Silva | Yes |
| G 098. Anushka Thilakarathne | Yes |
| G 100. Thanura Dissanayake | Yes |
| G 102. Sujeewa Dissanayake | Yes |
| G 103. Kanthasamy Prabu | Yes |

| | |
|---|---|
| G 104. Susantha Kumara Nawarathna | Yes |
| G 105. Sena Nanayakkara | Yes |
| G 106. Aruna Panagoda | Yes |
| G 107. Nimal Palihena | Yes |
| G 108. Nishantha Perera | Yes |
| G 109. Stepni Fernando | Yes |
| G 111. Lal Premanath | Yes |
| G 112. Nanda Bandara | Yes |
| G 113. Padmasiri Bandara | Yes |
| G 114. Ravindra Bandara | Yes |
| G 116. Sri Bavanandarajah | Yes |
| O 014. Amirthanathan Adaikkalanathan | No |
| O 015. G.G. Ponnambalam | No |
| O 018. Dilith Jayaweera | No |
| O 019. Sivagnanam Shritharan | No |
| O 039. Kaveenthiran Kodeeswaran | No |
| O 040. Gnanamuththu Srineshan | No |
| O 066. Wijesiri Basnayake | Yes |
| O 067. S. Sandaruwan Madarasinghe | Yes |
| O 069. Jagath Manuwarna | Yes |
| O 071. Nandana Millagala | Yes |
| O 079. Elayathamby Srinath | No |
| O 080. Pathmanathan Sathiyalingam | No |
| O 081. Danushka Ranganath | Yes |
| O 082. Sanjeewa Ranasingha | Yes |
| O 083. Sunil Rathnasiri | Yes |
| O 086. Manoj Rajapaksha | Yes |
| O 088. Hasara Liyanage | Yes |
| O 090. Kanchana Welipitiya | Yes |
| O 091. R. G. Wijerathna | Yes |
| O 094. Ruwan Wijeweera | Yes |
| O 095. Lasith Bhashana Gamage | Yes |
| O 100. Ambika Samivel | Yes |
| O 101. Dewananda Suraweera | Yes |
| O 102. Chandana Sooriyaarachchi | Yes |
| O 105. Janaka Senarathna | Yes |
| O 106. Chandima Hettiaratchi | Yes |
| O 107. Champika Hettiarachchi | Yes |
| O 108. Dinesh Hemantha | Yes |
| O 110. Bhagya Sri Herath | Yes |
| O 112. Ashoka Gunasena | Yes |
| O 113. Nandana Pathmakumara | Yes |
| O 115. Samantha Ranasingha | Yes |

Electronic Voting Results:

**Participants:**

| | |
|---|---|
| Present | 114 |

**Votes:**

| | |
|---|---|
| Yes | 106 |
| No | 08 |
| Abstain | 0 |

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්ද 106යි; විරුද්ධව 08යි.

නැඟී සිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 02යි. ඒ අනුව, පක්ෂව ලබා දුන් මුළු ඡන්ද සංඛ්‍යාව 108යි.

විරුද්ධව ඡන්ද 08යි.

ඒ අනුව, න්‍යාය පත්‍රයේ විෂය අංක 81, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතය, වැඩි ඡන්ද 100කින් සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

න්‍යාය පත්‍රයේ විෂය අංක 82, අනුමත කිරීම සඳහා ඉදිරිපත් කිරීම, ගරු අගමැතිතුමිය.

## අත්‍යවශ්‍ය මහජන සේවා පනත: යෝජනා සම්මතය
## அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டம்: தீர்மானம்
## ESSENTIAL PUBLIC SERVICES ACT: RESOLUTION

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Hon. Speaker, I move,

"That the Proclamation made and published in Extraordinary Gazette Notification No. 2477/47 and dated 28th February, 2026 and schedule thereto, by virtue of the powers vested in President in terms of Section 2 of the Essential Public Services Act, No. 61 of 1979, which was presented on 03.03.2026 be approved."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***
***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.34ට, 2026 මාර්තු 17වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*
*இதன்படி, பி.ப. 5.34க்கு, 2026 மார்ச் 17, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. SPEAKER adjourned Parliament without Question put.*
*Parliament adjourned accordingly at 5.34 p.m until 9.30 a.m. on Tuesday, 17th March, 2026.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau at the Department of Government Information, No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.